# ලංකා විදුලිබල මණ්ඩලය

*වාර්ෂික වාර්තාව 2012*



# පටුන


| | |
|---|---|
| 2012 වසරේ උද්දීපනයන් | 5 |
| ආයතනික තොරතුරු | 8 |
| සංවිධාන ව්‍යුහය | 10 |
| සභාපති තුමාගේ සමාලෝචනය | 14 |
| සාමාන්‍යාධිකාරීවරයාගේ සමාලෝචනය | 16 |
| සම්ප්‍රේෂණ ජාලය | 21 |
| ජනන අංශය | 24 |
| සම්ප්‍රේෂණ අංශය | 30 |
| බෙදාහැරීමේ අංශය 01 | 42 |
| බෙදාහැරීමේ අංශය 02 | 52 |
| බෙදාහැරීමේ අංශය 03 | 63 |
| බෙදාහැරීමේ අංශය 04 | 70 |
| ව්‍යාපෘති අංශය | 78 |
| වත්කම් කළමණාකරන සහ මධ්‍යගත සේවා අංශය | 88 |
| ආයතනික ක්‍රමෝපාය අංශය | 97 |
| මූල්‍ය අංශය | 106 |
| මූල්‍ය සමාලෝචනය | 107 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 108 |
| ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය | 109 |
| ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 110 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 111 |
| සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 112 |
| මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 114 |
| ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 115 |
| මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් | 116 |
| විගණකාධිපති වාර්තාව | 164 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 179 |



# අපගේ ඉදිරි දැක්ම

සසිරිමත් දිවියකට විදුලිය

# අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට අනුගත වෙමින්, සමස්ථ ශ්‍රී ලංකාවට, කාර්යක්ෂම, සමායෝජිත සහ සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කර පවත්වා ගෙන යාම

# අපගේ සාරධර්ම

- ගුණාත්මකබව
- ජාතියට සේවා සැලසීම
- කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය
- කැපවීම
- සුරක්ෂිතබව
- වෘත්තීය නිපුණතාව
- තිරසාරබව

2010 ජූනි මාසයේදී, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශය උදෙසා, ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම ද අරමුණු තරගත්, කරුණු පහළවකින් සමන්විත න්‍යාය පත්‍රයක් ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙම න්‍යාය පත්‍රයට අදාළවන්නාවූ වැඩසටහන් පහත විස්තර කෙරේ.

**1 . නංවමු ලංවිම**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් මෙම විශේෂිත අරමුණ ඉටුකර ගැනීම පිණිස ක්‍රියාත්මක කරනු ලබන නව සැලැස්ම යටතේ, ඉදිරි පස් වසර තුළ, ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ස්ථාවර සහ තාක්ෂණික වශයෙන් මනා ක්‍රියාකාරිත්වයකින් යුත් ආයතනයක් ලෙස වැඩිදියුණු කරනු ලැබේ. නව ආදායම් මාර්ග ඇති කිරීම, වියදම් අවම කිරීම, කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, දූෂණය පිටු දැකීම, ආයතනයේ මෙහෙයුම් පිරිවැය දැරීම සහ ණය අඩුකර ගැනීම මෙමගින් සැලසුම් කෙරෙනු ඇත. ජාතික ආර්ථිකයට පීඩාකාරී වැය බරක් නොවීමටත් තම කාර්යසාධනය පිළිබඳ අභිමානයක් ඇතිව කටයුතු සාර්ථකව පවත්වා ගෙන යාමේ හැකියාවෙන් යුත් ආයතනයක් බවට පත්වෙමින් ජනතාවගේ ගෞරවයට ලක්වූ ආයතනයක් බවට පත්වීමටත් ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කරයි.

**2 . විදුලමු ලංකා**

මෙම වැඩසටහනේ අරමුණ වනුයේ, 2012 වසර වන විට සෑම ශ්‍රී ලාංකිකයකුටම විදුලිබලය ලබා ගැනීමේ අවස්ථාවක් සැලසීම සහතික කිරීමයි. ශ්‍රී ලංකාවේ සෑම ගෘහ ඒකකයකටම විදුලිබලය ලබාගැනීමට හෝ විද්‍යුත් ශක්තිය ජනනය කිරීමේ වෙනත් විකල්ප මාර්ගයන් අත්කර ගැනීමට හැකි වන පරිදි දුෂ්කර ප්‍රදේශයන්හි යටිතල ව්‍යුහය සහ අනෙකුත් පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන මගින් කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන මගින් ඵලදායිතාව ඉහළ නංවනු ඇති අතර දැනට තම නිවෙස් සඳහා විදුලිය සැපයුම ලබා ගැනීමට නොහැකිව ඇති 12 %ක් වන ශ්‍රී ලාංකේය ජනතාවගේ ජීවන තත්ත්වය විශාල වශයෙන් වැඩි දියුණු කරනු ඇත.

මෙම වැඩසටහන යටතේ 2012 වසර අවසන් වීමට පෙර ශ්‍රී ලංකාවේ ගම්මාන බහුතරයකට ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය සැපයුම ලැබෙනු ඇත. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම පිණිස, ඉදිරි දෙවසක කාලය තුළ ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘති 4,593 ක් සැලසුම් කරනු ලැබ ඇති අතර ඒවායේ කටයුතු සම්පූර්ණ කරනු ඇත. මෙම වැඩසටහන යටතේ විදුලිබලය සැපයීමට නොහැකි වන ගම්මාන ඇතොත්, ජාතික විදුලිබල පද්ධතියට පරිබාහිරව, ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ එම ගම්මානයන්ට විදුලිබලය සපයනු ලැබේ.

**3 . විදුලි අත්වැල**

මෙම වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් ඒකකයන් සඳහා ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලි සම්බන්ධතා ලබා ගැනීමට ශුද්‍ර ණය සැපයුම් මගින් සහයෝගය දැක්වීමට ලංකා විදුලිබල මණ්ඩලය පියවර ගනු ඇත. විදුලි සැපයුම ලබා ගැනීමට අවශ්‍ය වන නමුත් විදුලි රැහැන් සම්බන්ධකිරීමට ගෙවිය යුතුව ඇති ඉහළ පිරිවැය දැරීමට නොහැකිව ඇති ජනයා සඳහා අවශ්‍ය මුදල් සපයා විදුලිබලයෙහි ප්‍රතිලාභ අත්විඳීමට විදුලි සැපයුම ලබාදීම පිණිස සහනදායි ක්ෂුද්‍ර මූල්‍යාධාර යෝජනා ක්‍රමයක් විධිමත්ව සකසනු ලැබ ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය මගින් දැනටමත් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබ ඇත. මෙම යෝජනා ක්‍රමය, විශේෂයෙන් අඩු ආදායම් ලාභී කාණ්ඩායම් සහ සමෘධි ප්‍රතිලාභ ලබන්නන් ඉලක්ක කොට යොමු කරනු ලැබ ඇත. විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමේ වියදම් පියවා ගැනීම පිණිස රුපියල් 30,000 ක ණය මුදලක් විදුලිබල මණ්ඩලය මගින් ඔවුනට සපයනු ලබන අතර මාසික විදුලි බිල හරහා වාරික හැටකින් මෙම ණය මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කරනු ඇත.

**4 . ග්‍රාම ශක්ති**

ජාතික විදුලි පද්ධතිය ආර්ථිකමය ලෙසින් දීර්ඝ කළ නොහැකි අවස්ථාවන්හිදී ග්‍රාමීය හා අනෙකුත් ස්ථානයන්හි පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් පිහිටුවනු ඇත. ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලි සැපයුම ලබා දිය නොහැකි පරිදි ජාතික විදුලි ජාලයෙන් දුරස්ථව පිහිටි ගෘහ ඒකකයන්ට, 2012 වන විට විදුලිබල සැපයුම මගින් ලැබෙන ප්‍රතිලාභ අත්කර ගත හැකි වන පරිදි, විකල්ප පුනර්ජනනීය බලශක්ති උත්පාදන ක්‍රම යොදා ගැනීමේ අවස්ථාවන් සලසාලනු ඇත. මෙම වැඩසටහන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූලික විෂය පථයට අන්තර්ගතවී ඇති අතර මෙම වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශය සහ බෙදාහැරීමේ අංශ මගින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දෙනු ඇත.

**5 විදුලි සැරය**

සියලුම විමසීම්, සහායක සේවාවන්, පාරිභෝගික සහාය සහ බිඳවැටීම් පිළිබඳව වාර්තා කිරීම යන කටයුතු මෙහෙයවීම පිණිස වේගවත් සහ විදුලි පාරිභෝගිකයන් ඉලක්ක කොටගත් ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කෙරේ. විදුලි පාරිභෝගිකයනට විශ්වාසනීය සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකි වන පරිදි මෙම වැඩසටහන තවදුරටත් වැඩිදියුණු කෙරේ. මෙම ඇමතුම් මධ්‍යස්ථානයට පටිගත කිරීමේ පහසුකම් සැපයෙන අතර එකී ඇමතුම් සම්බන්ධයෙන් පෙරළා කාර්යාලීය සහාය ලබා දෙනු ඇත. මෙම පහසුකම්වලට අමතරව, ප්‍රාදේශීය බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන පිහිටුවීම, සේවා අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම, බිඳවැටීම් සම්බන්ධයෙන් පිළියම් යෙදීම පිණිස අමතර වෑන් රථ යෙදවීම සහ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සිදු කරනු ඇත. විදුලි සැරය වැඩසටහන සඳහා නව අන්තර්ජාල වෙබ් අඩවියක් ද නිර්මාණය කරනු ඇත. විදුලි පාරිභෝගිකයනට සිය විදුලි සැපයුමට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීම පිණිස 1987 යන කෙටි කේත (hortcode) දුරකථන ඇමතුම් අංකයක් ද දැනටමත් ලංකා විදුලිබල මණ්ඩලය මගින් හඳුන්වා දී ඇත. 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක, ලංකා විදුලිබල මණ්ඩලයේ මෙම ඇමතුම් මධ්‍යස්ථානයට, මේ වන විට ඉහත කී දුරකථන අංකය සම්බන්ධ කොට ඇති අතර මෙම මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලංකාවේ සියලුම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන් සම්බන්ධීකරණය කරමින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**6 . ජනබලය**

විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාත්, සියලුම පාරිභෝගික කාණ්ඩයන් ආවරණය කිරීම සඳහාත්, 2012 වන විට පාරිභෝගික සේවා සමිති ජාලයක් සථාපනය කරනු ලැබේ. විදුලි පාරිභෝගිකයන් සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර වැදගත්

සම්බන්ධතාවයක් ඇති කිරීමේ මෙවලමක් ලෙස සෑම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් සඳහාම ඒ ඒ විදුලිබල කොට්ඨාසයන් තුළ බොහෝ පාරිභෝගික සමාජ පිහිටවනු ලැබ ඇත.

7 ජනහිත

මෙම වැඩසටහන යටතේ, සාධාරණ, මිල අඩු සහ සංරක්ෂණ හිතකාමී පාරිභෝගික අයක්‍රමයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට, ලංකා විදුලිබල මණ්ඩලය පියවර ගනු ඇත. ලංකා විදුලිබල මණ්ඩලය (එවැනි අයකිරීම් නිර්ණය කිරීමේ අධිකාරී බලය දරන්නාවූ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග විවිධ විදුලි පාරිභෝගික කාණ්ඩයන්ට අදාළ ගාස්තු ලේඛනයන් පිළිබඳව තොරතුරු විමසීමේ යෙදී ඇත. මහජන උපයෝගිතා කොමිසම මගින් රජයේ උපදෙස් ලබා ගනිමින්, අයක්‍රමයන් සංශෝධනය පිළිබඳව ක්‍රියා කළ යුතු අන්දම සම්බන්ධයෙන්, ඉහත දක්වා ඇති පරිදි, උපදෙස් හා යෝජනා මාලාවක් සකස් කරනු ලැබ ඇත. 2011-2015 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු අය ක්‍රමයන් නිර්ණය කිරීම පිණිස, ලංකා විදුලිබල මණ්ඩලය මගින් 2010 ජූලි මාසයේදී ස්වකීය ආදායම් අවශ්‍යතාවන් පිළිබඳව මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබීය. ජාතික විදුලිබල අයක්‍රමය ඒකාකාරීව පවත්වා ගෙන යාමේ ප්‍රතිපත්තිය හේතුවෙන්, බලපත්‍රලාභියාගේ ආදායම් අවශ්‍යතා සහ පිරිවැය පරාවර්ථක ක්‍රමවේදය මත පදනම්ව, නීතිය මගින් දක්වා ඇති ආකාරයට, කොමිෂන් සභාව මගින් අයක්‍රමය නිර්ණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

8 . මානව ජවය

අපගේ සේවාවන් ඉහළ නැංවීමටත්, අපගේ සේවාවන්ගේ ගුණාත්මකබව ඉහළ නැංවීමටත් බලපාන ප්‍රධාන සාධකය වනුයේ ඒ සඳහා අපගේ ශ්‍රම බලකාය දරන්නාවූ උත්සාහයයි. විදුලි පාරිභෝගිකයනට සපයන්නාවූ සේවා තත්වයන්හි කැපී පෙනෙන වෙනසක් සිදු කිරීම තහවුරු කර ගැනීම පිණිස, සේවයට කැපවූ, කාර්යක්ෂම හා දූෂිත නොවූ, ශ්‍රම බලකායක් ගොඩනගා ගැනීමට, ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරනු ඇතැයි, අපේක්ෂා කෙරේ. කාර්යක්ෂම හා ලාභදායී කාර්ය සාධනයක් සාක්ෂාත් කරගනු පිණිස ලංකා විදුලිබල මණ්ඩලයේ වැඩ කටයුතුවල ක්‍රියාකාරීත්වය අගැයීමට ලක් කරනු ලැබේ.

9 . සම්පත් සේවා

ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි, එකී වත්කම් පිළිබඳව සැළකිලිමත්වීම පිණිස 2010 සැප්තැම්බර් මාසයේදී නව ඒකකයක් නිර්මාණය කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයට අතිරේක ආදායම් ගෙන දෙමින්, මෙම වත්කම් උපරිම මට්ටමින් ප්‍රයෝජනයට යොදා ගන්නා ආකාරයෙන්, මෙම අංශය මගින් මහජනතාවට අනෙකුත් සේවාවන් සපයනු ඇත.

10 . ලංකා ජනනී

රජයේ ආයතනයක් මගින් පාලිත උප ආයතනයක් සථාපනය කිරීම මගින් සම්ප්‍රේෂණ ජාලය වැඩි දියුණු කිරීමට හා පුළුල් කිරීමටත්, සුළං බලය, ජීව වායුව, සූර්ය තාපය, ඩෙන්ඩ්‍රෝ බලශක්තිය (Dendro), ජල තරංග බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති ව්‍යුහයන් සංවර්ධනය කිරීමටත්, දේශීය ඉංජිනේරු කුසලතාවන් උපයෝගී කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කරයි.

නව ඉඩප්‍රස්ථාවන් ගවේෂණය කිරීමට හා පිරිවැය සුරකින නවෝත්පාදන සංකල්පයන් අනාවරණය කරගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමට රජයේ සහාය සුරක්ෂිත කර ගැනීමටත් අනාගතයේදී තිරසාර වෘද්ධියක් අත්කර ගැනීම සඳහා විකල්ප බලශක්ති උත්පාදන මූලාශ්‍රයන් උපයෝගී කර ගැනීමටත් මෙගින් දේශීය ඉංජිනේරුවන්ට හැකියාව ලබා දෙනු ඇත.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වැඩි දියුණු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට අයිතිය ඇතිව ක්‍රියාත්මක වන සමාගමක් ස්ථාපනය කිරීමටත්, සම්ප්‍රේෂණ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා දේශීය ඉංජිනේරුවන්ගේ කුසලතාවන් උපයෝගී කර ගැනීමටත්, මූලික පියවර ගනු ලැබ ඇත.

11 . සුපිරි විදුලි ජාල

පුද්ගලික සහ රජයේ ආයතනයන් මගින් ඔවුන්ට අවශ්‍ය බලශක්තිය, සුළං බලය, තාප බලය, ඩෙන්ඩ්‍රෝ සහ ජීව වායු තාක්ෂණයන් මගින් තමන් විසින්ම නිපදවා ගැනීමටත්, ප්‍රයෝජනයට ගැනීමෙන් පසු ඉතිරි වන අතිරේක බලශක්තිය ජාතික බලශක්ති ජාලයට අලෙවි කිරීමටත් එකී ආයතනයන් දිරිගන්වන ශුද්ධ මනුගතකිරීමේ (Net Metering) ක්‍රමයක්, ලංකා විදුලිබල මළණ්ඩලය විසින් හඳුන්වා දෙනු ඇත.පෙර ගෙවුම් මීටර හඳුන්වා දීම මගින් විදුලි පාරිභෝගිකයන්ට ඔවුන්ගේ විදුලි බිල්පත් පාලනය කර ගැනීමට උපකාරී වනු ඇත. ස්වයංක්‍රීය මනු කියවීම්, භාවිතා කළ කාලය සඳහා අයක්‍රම, පාරිභෝගිකයන් සමග සංනිවේදනය කිරීම, පාරිභෝගිකයා විසින් ප්‍රයෝජනයට ගන්නා භාරය පාලනය කිරීම (customer load control) වැනි වෙනත් කැපී පෙනෙන ජාල සංකල්පයන් ද ක්‍රමානුකූලව හඳුන්වා දෙනු ලැබේ.

# ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිසරික ප්‍රතිපත්තිය



### බලශක්තිය නිදහසේ ගලා යයි

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලූ වානිජ ක්‍රියාකාරකම් ඉටුකරන්නේ ස්වභාවික සහ මිනිසා විසින් සාදන ලද පරිසරය ආරක්ෂා කරමින් එහි සංවර්ධනයට ස්ථිරසාර සහභාගීත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව පාරිභෝගික, අධිකාරීන්, සේවකයන් සහ රජය තුල අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත් කමින් යුත් දේවල් අන්තර්ගත කරගැනීම සඳහා වූ ප්‍රතිපත්තියකට අපි ක්‍රියාශීලී ලෙස උත්සහ දරන්නෙමු.

# 2012 වර්ෂයේ උද්දීපනයන්



- **ඉහල කොත්මලේ ජල විදුලි බලාගාරය ජාතික විදුලිබල ජාලයට එක්කිරීම**

  මෙගාවොට් 150 ඉහල කොත්මලේ ජල විදුලි බලාගාරය නියමු ව්‍යාපෘතිය සාර්ථකව නිම කර 2012 ජුලි මස 14 වන දින ජාතික විදුලිබල ජාලයට සම්බන්ධ කළ විට ලංකා විදුලි බල මණ්ඩලයේ සිහිනයක් සැබෑවිය. බලශක්ති ඒකක මිලියන 409 ක් වාර්ෂිකව ජාතික විදුලිබල ජාලයට එක් කිරීමට මෙමගින් අපේක්ෂිතයි.

- **කිලිනොච්චි කොටුවා උපපොළ බලගැන්වීම**

  කිලිනොච්චි කොටුමා උපපොළ බලගැන්වීම ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශ වලට විදුලිය රැගෙන යමින් තවත් සුවිශේෂී ජයග්‍රහණයක් සනිටුහන් කරමින් 2012 සැප්තැම්බර් මස 10.14 පැයට කිලිනොච්චි කොටුමා උපපොළ බලගන්වනු ලැබීය.

# 2012 වර්ෂයේ උද්දීපනයන්

### ගෘහ ඒකකයන්ට විදුලි බලය ලබාදීම

වසර 2012 අවසානය වන විට, රටේ සමස්ථ ගෘහ ඒකකයන්ගෙන් 94% කට විදුලිබලය සපයනු ලැබීය. මෙම වර්ෂය තුළ දී, සාමාන්‍ය ඒක පුද්ගල විදුලි පරිභෝජනය කි.වො.පැ.(kWh)/ පුද්ගල ඒකක 480 සිට ඒකක 515 දක්වා ඒකක 35 කින් වර්ධනය වීය.

### පද්ධති බලශක්ති හානි (System Energy Losses)

වර්ෂ 2000 සිට ගතවූ වර්ෂයන් තුළ දී පද්ධති බලශක්ති හානි ක්‍රමානුකූලව අඩුවීය. 2012 වර්ෂයේ පද්ධති බලශක්ති හානිය 10.67% මට්ටමෙ පැවතිණි.




**පද්ධති බලශක්ති හානි**

### විදුලි පාරිභෝගිකයන්ගේ වර්ධනය

5.6 % වාර්ෂික වර්ධනයක් සමග 2012 වර්ෂය අවසානයේදී සමස්ථ විදුලි පාරභෝගික සංඛ්‍යාව 4,979,862

| පාරිභෝගික වර්ගය | ලංවිම පාරිභෝගික සංඛ්‍යාව |
|---|---:|
| ගෘහස්ථ | 4,391,445 |
| ආගමික | 30,009 |
| පොදු කාර්‍යය | 507,247 |
| කර්මාන්ත | 50,760 |
| හෝටල් | 399 |
| එකතුව | 4,979,862 |

2012 වර්ෂය තුළ, ලංකා විදුලිබල මණ්ඩලය මගින් ලබා දෙන ලද සමස්ථ විදුලි සම්බන්ධතා සංඛ්‍යාව 262,414ක් වීය. මෙය මාසයකට නව පාරිභෝගිකයන් 21,868 ක සාමාන්‍ය වර්ධනයක්වීය.




**විදුලිය විකුණුම්**

2011 වර්ෂයේ පැවති විදුලි විකුණුම් ප්‍රමාණය ගි.වො.පැ. 10,023 සිට 2012 දී ගි.වො.පැ. 10,474 දක්වා 4.5% කින් වර්ධනය වීය. 2011 වර්ෂයේ පැවති ගි.වො.පැ./දින (GWh/day) 27 සමග සසඳා බැලීමේදී 2012 වර්ෂයේ සාමාන්‍ය දෛනික විදුලි පරිභෝජනය ගි.වො.පැ./දින (GWh/day) 29 ක් වීය.




**අයකුම අනුව අලෙවිය - 2012**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ 34.2 % ක් පමණ වූ ඉහළම බලශක්ති පරිභෝජනය, ගෘහස්ත හා ආගමික කටයුතු සඳහා විදුලිය ප්‍රයෝජනයට ගැනීම මගින් සිදුවූ අතර ඊළඟට වැඩි බලශක්ති පරිභෝජනය කාර්මික අංශය මගින් වාර්තා කෙරෙයි. 6.0 % ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් මුළු විදුලි විකුණුම්වලින් 19.5 % ක් පොදු කාර්‍යය ප්‍රවර්ගයේ විදුලි පරිභෝජනය මගින් නියෝජනය කෙරෙයි.

### ආදායම

2012 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක කරන ලද නව අයකිරීම් ක්‍රමය යටතේ විදුලි විකුණුම් 2011 පැවති රුපියල් මිලියන 132,373 සිට 2012 දී රුපියල් මිලියන 162,956 දක්වා 23.1 % කින් වර්ධනය වීය. 2012 වර්ෂයේදී විදුලිය ගැලපුම් ගාස්තු ක්‍රියාත්මක කරනු ලැබීය.




**අයකුම අනුව ආදායම - 2012**

# 2012 වර්ෂයේ උද්දීපනයන්




**විදුලිය විකුණුම් ආදායම**

ඉහළම ආදායම පොදුකාර්යය පාරිභෝගිකයන් වෙතින් ද ඊළඟට වැඩිම ආදායම කාර්මික අරමුණු සඳහා විදුලිය පරිභෝජනය කරන විදුලි පාරිභෝගිකයන් වෙතින් ද වාර්තා විය. 2012 වර්ෂයේ, මුළු විදුලි ආදායමින් 26.5 % ක් ගෘහස්ත හා ආගමික අරමුණු සඳහා විදුලිය පාරිභෝජනය කරන්නන් වෙතින් නියෝජනය වීය.

## සමස්ථ බලශක්ති සංචිතය

2011 වර්ෂයේ මෙන්ම 2012 වර්ෂයේ පළමුවන, දෙවන හා තුන් වන කාර්තුවල ද අඛණ්ඩව වියලි දේශගුණයක් පැවතිණි. නමුත් 2012 දෙසැම්බර් මස 29 වන දින ගි.වො.පැ. 1072.7 ක වාර්තා ගත උපරිම ජල සංචිතයක් රැස්වන පරිදි ජලාශ තුළට ගලා ආ ජල ප්‍රමාණය 2012 වර්ෂයේ අවසාන කාර්තුව තුළ දී ඉහළ ගියේය.

## විදුලිබල උත්පාදන මූලාශ්‍ර

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරයන් ඇතුළු ජලවිදුලි බලාගාර, 2012 වර්ෂයේ මුළු විදුලි උත්පාදනයෙන් 29 % ක් නිෂ්පාදනය කිරීමට දායක වීය. මෙය වසර පුරා 27 % ක පහළ යෑමක් වීය.




**විදුලි බල උත්පාදන මූලාශ්‍ර 2011**




**විදුලි බල උත්පාදන මූලාශ්‍ර 2012**

ලංකා විදුලිබල මණ්ඩලයේ ජලාශයන්හි අඩු ජල මට්ටමක් පැවතීම නිසා, 2012 වර්ෂයේදී නිෂ්පාදනය කළ සමස්ථ විදුලි බලයෙන් 71 % ක් ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම තාප විදුලි බලාගාර සහ පුද්ගලික විදුලිබල නිෂ්පාදකයින් මගින් නිෂ්පාදනය කරනු ලැබීය. මෙය පසු ගිය වර්ෂයේ පැවති මට්ටමට වඩා 23 % ක ඉහළ යාමකි.

## දළ බලශක්ති උත්පාදනය




2011 වර්ෂයේ පැවති ගි.වො.පැ. 11,528 ක සිට 2012 වර්ෂයේදී ගි.වො.පැ. 11,801 දක්වා ඉහළ නංවමින් 2012 වර්ෂයේ සමස්ථ විදුලිබල නිෂ්පාදනය 2.4 % කින් වර්ධනය විණි.

## උපරිම ඉල්ලුම




0.77 % ක පහළයාමක් පෙන්නුම් කරමින් 2012 වර්ෂයේදී උපරිම ඉල්ලුම මෙ.වො. 16.7 කින් පහත බැස ඇත. 2012 වර්ෂයේ වාර්තා වූ උපරිම ඉල්ලුම මෙ. වො. 2146.4 ක් වූ අතර එම ප්‍රමාණය 2011 දී මෙ.වො. 2163.1ක් වීය.

# ආයතනික තොරතුරු

### නෛතික ව්‍යුහය
1969 අංක 17 පාර්ලිමේන්තු පනත යටතේ හා අංක 1969 අංක 31,
1979 අංක 29, 1988 අංක 32 හා 2009 අංක 20 දරණ පනත්වලින්
සංශෝධනය කළ පරිදි ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරන ලද සංස්ථාපිත මණ්ඩලයකි.

### මණ්ඩලයේ සාමාජිකයෝ
මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මහතා (සභාපති)

ඩබ්.ඩී. අනුර සේනක විජයපාල මහතා (උප සභාපති)

පී.පී. ගුණසේන මහතා (සාමාජික)
ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා (සාමාජික)
ඩබ්.ඩී. ජයසිංහ මහතා (සාමාජික)

| | |
|---|---|
| වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක මහතා | (සාමාජික) (2012.07.16 දක්වා) |
| ආර්. ඒ. ඒ. කේ. රණවක මහතා | (සාමාජික) (2012.07.16 දින සිට) |
| කේ.ඩී. රණසිංහ මහතා | (සාමාජික) (2012.07.23 දක්වා) |
| සී. පී.ජේ. සිරිවර්ධන මහතා | (සාමාජික) (2012.08.13 දින සිට) |

### මණ්ඩලයේ ලේකම්

| | |
|---|---|
| එස්. සී. රොබට්සන් මහතා | (2012.04.30 දක්වා) |
| මිහිරි සේනාරත්න මහත්මිය | (2012.05.02 දින සිට) |

### සාමාන්‍යාධිකාරී
බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා

### ප්‍රධාන කාර්යාලය
අංක:50,
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
දුරකථනය (011) 232 4471 (මාර්ග 8)
ෆැක්ස් (011) 244 9572
වෙබ් අඩවිය:www.ceb.lk

### විගණකයන්
විගනකාධිපති
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

### බැංකුකරුවන්
මහජන බැංකුව,
අංක:75
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

# ආයතනික තොරතුරු

## ආයතන කලමනාකරණය

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**(ජනන)**
එම්.සී. වික්‍රමසේකර මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**(සම්ප්‍රේෂණ)**
ආර්.එච්.ආර්.ලොකුබාලසූරිය මහතා (2012.04.10 දක්වා)
වයි.එම්. සමරසිංහ මහත්මිය (2012.04.11 දින සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**බෙදාහැරීමේ අංශය 1**
ඊ.පී. අබේසේකර මහතා (2012.01.26 දක්වා)
එල්.ඩී.එස්. ප්‍රනාන්දු මහතා (2012.04.11 දින සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**බෙදාහැරීමේ අංශය 2**
ආර්.ජේ. ගුණවර්ධන මහතා (2012.07.16 දක්වා)
වී. දන්තනාරායන මහතා (2012.09.15 දින සිට 2012.11.29 දක්වා)
ටී.ඩී. හඳගම මහතා ((2012.11.30 දින සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**බෙදාහැරීමේ අංශය 3**
එෆ්.කේ මොහිදීන් මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**බෙදාහැරීමේ අංශය 4**
ඩී.පී.සී. රත්නපාල මහතා (2012.02.01 දක්වා)
එම්.ජී. තිලකරත්න මහතා (2012.03.01 දින සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**වත්කම් කලමණාකරණ හා මධ්‍යගත සේවා**
එම්.ජී. ලියනගේ මහතා (2012.04.03 දක්වා)
කේ.ඩබ්.එල්. විජේවර්ධන මහතා (2012.04.04 දින සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**ආයතනික ක්‍රමෝපාය**
ඩී.කේ.බී.එස්. තිලකසේන මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**ව්‍යාපෘති**
ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා

**මූල්‍ය කළමණාකරු**
එන්.ආර්. මහමුද් මෙනෙවිය (2012.10.13 දක්වා)
ආර්.එම්.එස්. තිලකවර්ධන මහතා (2012.10.30 දින සිට වැඩබලන පදනම මත)

# ලංකා විදුලිබල මණ්ඩලයේ

## සංවිධාන ව්‍යුහය - 2012



**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**

- නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති විකුණුම්)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාපබල සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මහවැලි සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලක්ෂපාන සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාඩ (ජනන ව්‍යාපෘති)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වෙනත් ජලවිදුලි)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විද්‍යුත් නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්ෂණ)
- අතිරේක මූල්‍ය කලමනාකරු (ජනන)

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති මිලදී ගැනුම්)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්කරන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික හා නියාමන සබඳතා)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සන්නිවේදන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති අලෙවිකරණ)
- අතිරේක මූල්‍ය කලමනාකරු (සම්ප්‍රේෂණ)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු මැද පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු පළාත)
- අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 01)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 2)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත උතුර)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම වෝල්තතා ඉදිකිරීම හා නඩත්තු)
- අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 02)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 3)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 11)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව පළාත)
- අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 03)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 4)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 1)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත)
- අතිරේක මූල්‍ය කලමනාකරු (බෙදාහැරීම් කලාප 04)

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ හා මධ්‍යගත සේවා)**

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කලමනාකරණ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල් වැඩ හා ගොඩනැගිලි)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩපොළ හා උපකාරක සේවා)
- ආරක්ෂක කලමනාකරු
- අතිරේක මූල්‍ය කලමනාකරු

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**

- ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ (පුත්තලම ගල් අඟුරු බලශක්ති ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (කොළඹ නගර විදුලිබල DD ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (ත්‍රිකුණාමල ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
- අතිරේක මූල්‍ය කලමනාකරු (ව්‍යාපෘති)

**මූල්‍ය කලමනාකරු**

- අතිරේක මූල්‍ය කලමනාකරු (මූලස්ථාන)
- අතිරේක මූල්‍ය කලමනාකරු (ආයතනික)
- ලේකම් - විශ්‍රාම වැටුප් අරමුදල
- ලේකම් - අර්ථසාධක අරමුදල

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)
- කලමනාකරු - විමර්ශන



# සමාලෝචනය


| | |
|---|---|
| සභාපතිතුමාගේ සමාලෝචනය | 14 - 15 |
| සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය | 16 - 20 |
| ලංවිම සම්ප්‍රේෂණ ජාලය | 21 |

# සභාපතිතුමාගේ සමාලෝචනය



විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා ලෙස, සුක්කානම අතැතිව ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යවරයා සමඟ ගෙවී යන අනුක්‍රමික තෙවන වසර වූයේ, 2012 වසරයි. “මහින්ද චින්තන ඉදිරි දැක්ම” ට අනුව, ශ්‍රී ලංකාව, “කලාපීය බලශක්ති කේන්ද්‍රස්ථානය” බවට පත් කිරීම කෙරෙහි කේන්ද්‍රගත කරනු ලැබූ ක්‍රියාකාරී සැලැස්ම අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබිණි.

> **“2012 වර්ෂය තුළ, ලංකා විදුලිබල මණ්ඩලය මුහුණ දුන් ප්‍රධාන අභියෝගයන්ගෙන් එකක් වූයේ, මුළු ලෝකය විසින් අත්දකිනු ලැබූ, දේශගුණික විපර්යාසයන් නිසා ඇතිවූ නියඟයේ බලපෑම් සමග සටන් කිරීමයි.”**

2012 වර්ෂය තුළ, ලංකා විදුලිබල මණ්ඩලය මුහුණ දුන් ප්‍රධාන අභියෝගයන්ගෙන් එකක් වූයේ, මුළු ලෝකය විසින් අත්දකිනු ලැබූ, දේශගුණික විපර්යාසයන් නිසා ඇතිවූ නියඟයේ බලපෑම් සමග සටන් කිරීමයි. පසු ගිය දශක දෙකක කාලය තුළ, විදුලිබල ජලාශ වෙත ගලා ආ අඩුම ජලප්‍රමාණයත්, අඩුම ජල විදුලිබල ජනනයත්, 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වාර්තා කරනු ලැබීය. “රට අඳුරේ නොතැබීමේ” අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෘෂ්ටියට ගරු කරමින්, සංචාරක කර්මාන්තයෙහි සිඝ්‍ර වර්ධනයක් ඇති වෙමින් පවත්නා අතරතුර, උතුරේ සහ දකුණේ සිදු කෙරෙන සංවර්ධන ව්‍යාපෘති සැලකිල්ලට ගනිමින්, ජල විදුලිබල උත්පාදනය විශාල ලෙස පහත වැටීමත් සමග පසුගිය වසරවල මෙන් විදුලිබල සැපයුම කපා හැරීමක් සිදු නොවිය යුතු බව සහතික කිරීමට විදුලිබල මණ්ඩලය තීරණය කරනු ලැබීය. ඉන්දියාව හා පකිස්තානය වැනි කලාපීය රටවල් පවා ඔවුන්ගේ බලශක්ති ඉල්ලුම සපුරාලීමට ජල විදුලිබල ජනනය ප්‍රමාණවත් නොවූ බැවින් 2012 වර්ෂය තුළදී, ජල විදුලිබල සැපයුම සීමා කිරීම නැවත ක්‍රියාත්මක කරනු ලැබීය.

කෙසේ වෙතත්, සුදුසුකම්ලත් ඉංජිනේරුවරයෙකු ද වන, ගරු අමාත්‍යවරයා විසින් ඇතිකරන ලද ප්‍රේරණය හා මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා සකස් කරන ලද නව සැලැස්ම මත, ක්‍රියාශීලී බලශක්ති සුරැකීමේ ව්‍යාපාරයන් සංවිධානය කරනු ලැබීය. වැඩි පුරම බලශක්තිය පරිභෝජනය සිදුවන කාලය වන ප.ව.6.30 සිට ප.ව. 9.30 දක්වා සැම දිනකම අවම වශයෙන් එක් විදුලි පහණක්වත් නිවා දැමීමට විදුලි පාරිභෝගිකයන් උනන්දු කරවනු ලැබීය. බලශක්තිය ඉතිරි කිරීමේ හෝඩුවාවන් ගැන ජනතාවට උපදෙස් දෙනු ලැබීය. අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් බලශක්ති සංරක්ෂණය

## සභාපතිතුමාගේ සමාලෝචනය

පිළිබඳ, "හෙට දිනය සඳහා අද ඉතිරි කරමු" යන පණිවිඩය පතුරුවාලීමට, රටේ අනාගත වැඩිහිටියන් ලෙස, පාසල් දරුවෝ ක්‍රියාකාරීව සහභාගී වූහ. තව ද, පාසල් ළමෝ, බලශක්තිය ඉතිරි කිරීමට ප්‍රතිඥා දුන්හ. රජයේ සේවකයන් සහ පූජ්‍ය පක්ෂය වැනි බලවත් විවිධ ජන කොටස්, පාරිභෝගිකයනට බලශක්ති සංරක්ෂණය පිළිබඳව ගුරුහරුකම් දීමට, උපකරණයක් ලෙස යොදා ගනු ලැබීය.

"අපි එක්සත් වෙමු. පෙළ ගැසෙමු. බලශක්ති සංරක්ෂණයට සූදානම් වෙමු" යන තේමාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය සමග එක්ව සංවිධානය කරනු ලැබ, පූජ්‍ය පක්ෂය, අධ්‍යාපනඥයින්, වෛද්‍ය සේවක මණ්ඩලය, ගොවීන් සහ කම්කරුවන් ආදීන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලද පා ගමනට, අතිගරු ජනාධිපති, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා රටේ ප්‍රථම පුරවැසියා ලෙස සහභාගී වෙමින්, මෙම වටිනා හේතු සාධකය වෙත ඇති තම වගවීම පෙන්නුම් කරනු ලැබීය.

විදුලි බිල්පත් නිරවුල් කිරීම සම්බන්ධයෙන් ගාස්තුවෙන් 20% සිට 10% දක්වා අඩුකිරීමේ සහනයන් ලබා දෙමින් බලශක්ති සංරක්ෂණය සඳහා පාරිභෝගිකයන් තවදුරටත් පොළඹවනු ලැබීය. තමන්ට පමණක් නොව ලංකා විදුලිබල මණ්ඩලයට ද ප්‍රතිලාභ අත්කර දෙන්නා වූ, විදුලි බිල්පත් ගාස්තුව අඩුකර ගැනීම පිළිබඳව මහත් සැලකිල්ලක් දැක්වූ පාරිභෝගිකයන් ඒ කෙරේ දැක්වූ උනන්දුව නිසා මෙය ඉතා සාර්ථක වැඩපිළිවෙලක් බවට පත්වීය.

ජාතික බලශක්ති සංරක්ෂණ වැඩසටහන ආරම්භ කරන තෙක්, පාරිභෝගිකයන් වැඩි කොටසක් දරන ලද අදහස වූයේ, ආලෝකමත් කිරීම සඳහා, සීඑෆ්එල් විදුලි බුබුළු ලෙස ප්‍රසිද්ධ, බලශක්තිය ඉතිරි කරන එකම මාර්ගය වනුයේ, බලශක්තිය ඉතිරි කරන විදුලි බුබුළු යොදා ගැනීම පමණක් වන බවය.

බලශක්ති සංරක්ෂණය සඳහා ගනු ලැබූ, ඉහත දැක්වූ එවැනි සියළු ප්‍රයත්නයන්හි සාර්ථකත්වය තහවුරු වූ අතර බලශක්තිය සඳහා වන ඉල්ලුම සෑහෙන ප්‍රමාණයකින් පාලනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවීය. තාප බලශක්ති ජනනය සඳහා වැය කළ යුතු වූ අතිරේක ඉන්ධන පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉතිරි කර ගැනීමට මෙමගින් ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවිය.

විදුලිබල අර්බුදයක් පැවතිය ද, ලංකා විදුලිබල මණ්ඩලයේ සංවර්ධන ව්‍යාපෘති, කිසිදු බාධාවකින් තොරව ඉදිරියට කර ගෙන යනු ලැබිණි. උතුරු පලාතේ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය වූ, "උතුරු වසන්තය" වැඩසටහන කෙරේ සහයෝගය දක්වමින් හා දායකවෙමින්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාකාරී භූමිකාවක් රඟ දක්වනු ලැබීය. මේ අනුව, කිලිනොච්චි කොටුමා උප පොලට බලශක්තිය ලබා දෙමින් වසර විසි පහකට පසු නැවත වරක් යාපනය අර්ධද්වීපය, ජාතික විදුලි ජාලයට සම්බන්ධ කරනු ලැබීය. කොටි ත්‍රස්තවාදීන් විසින් උතුරු පලාතේ බලශක්ති ජාලය, 1987 දී සම්පූර්ණයෙන්ම විනාශයට පත් කළ දින සිට උතුරු අර්ධද්වීපය ජාතික බලශක්ති ජාලයට සම්බන්ධ කරනු ලැබ නොතිබිණි. උතුරු අර්ධද්වීපය ජාතික බලශක්ති ජාලයට සම්බන්ධ කිරීම පිණිස, ව්‍යාපෘතියේ ප්‍රථම අදියර 2012 වර්ෂයේ දී නිම කරමින්, සමතලා නොවූ භූමි භාගයක විදුලි සම්ප්‍රේෂණ කුළුණු 238 ක් ගොඩනගා, වව්නියා - කිලිනොච්චි විදුලි සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ ඊළඟ අදියර වනුයේ, කිලිනොච්චි සිට චුන්නාකම් දක්වා කිවො 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කොට, චුන්නාකම්හි තවත් කොටුමා උප පොලක් ගොඩනැගීමයි.

මෙගාවොට් 24 ක බැර ඉන්ධන බලශක්ති තාප බලාගාරයක් යාපනයේ ඉදිකිරීමට තීරණය කිරීම මෑත අතීතයේ ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ තවත් ජයග්‍රහණයක් වීය. එහිදී, යාපනය අර්ධද්වීපයට විදුලි සැපයුම ලබාදීම සඳහා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් මත තවදුරටත් රඳා පැවතීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදු නොවනු ඇති අතර විදුලිබලය සැපයීම සඳහා වැය වන අතිවිශාල වියදම අවසන් කිරීමට ද එමගින් හැකි වනු ඇත. දේශීය ඉංජිනේරුවන්ගේ විශේෂඥ දැනුම ද රුපියල් මිලියන 3,500 ක දේශීය ආයෝජනයන් ද යොදා ගනිමින් බලාගාරයේ ඉදිකිරීම් කටයුතු 2012 අප්‍රේල් මාසයේ දී ඇරඹිණි. විදුලි බලාගාරය, "උතුරු ජනනී" යනුවෙන් නම් කරනු ලැබූ අතර ලංකා විදුලිබල මණ්ඩලයට වසරකට රුපියල් මිලියන 1,350 ක් ආසන්න වශයෙන් ඉතිරිකර දෙමින්, විදුලිබල ඒකක මිලියන 176 ක් වාර්ෂිකව ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. පරිසර හිතකාමී අපද්‍රව්‍ය බැහැරලීමේ පද්ධති වැනි ඉන්ධන ගබඩාව, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම්, යනාදී පරිසර හිතකාමී බොහෝ අංගයන්ගෙන් සමන්විත වන පරිදි බලාගාරය නිර්මාණය කෙරේ.

තාප බලශක්තිය ජනනය වඩ වඩාත් මිල අධික වන නිසාත් අනාගතයේ දී තෙල් සම්පත් ලෝකයේ හිඟවෙමින් පවතින නිසා ද ස්වාභාවික ගෑස්(LNG), පුනර්ජනනීය බලශක්තිය සහ න්‍යෂ්ටික බලශක්තිය වැනි විකල්ප බලශක්ති මූලාශ්‍රයන් යොදා ගැනීමේ හැකියාව ගවේෂණය කෙරෙහි අඛණ්ඩ උද්යෝගයකින් විදුලිබල හා බලශක්ති ගරු ඇමතිතුමා කටයුතු කරයි. මේ අනුව, සුළං බලශක්තිය, සූර්ය බලශක්තිය සහ ඩෙන්ඩ්‍රෝ බලශක්තිය වැනි බලශක්ති උත්පාදනය යන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපාරයන් කෙරේ වාණිජමය සමපේක්ෂණයන් ඇති කිරීමට පෞද්ගලික ව්‍යවසායයන් උනන්දු කරවා පහසුකම් සලසනු ලැබීය.

චීන රජයේ ආධාර ඇතිව ශ්‍රී ලංකාව මේ වනවිටත් පුත්තලම් දිස්ත්‍රික්කයේ, නොරොච්චෝලේ ලක් විජය ගල්අඟුරු විදුලි බලාගාරය සමග ගල්අඟුරු විදුලිබල ජනනය සඳහා ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබ ඇත. දෙවන ගල්අඟුරු විදුලි බලාගාරය ඉන්දියාවේ එන්ටීපීසී ආයතනය සමග ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාම්පූර්හිදී පිහිටුවීමට සැලසුම් සකස් කරනු ලැබ ඇත. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය හා ඉන්දියාවේ එන්ටීපීසී ආයතනය අතර හවුල් ව්‍යාපාර සමාගමක් සංස්ථාගත කරනු ලැබූ අතර තවදුරටත් ප්‍රගතියක් අත්කර ගැනීම පිණිස 2012 දී කාර්ය මණ්ඩල සාමාජිකයන් පත්කරනු ලැබීය.

බොහෝ කාලයක් බලා සිටි මෙගාවොට් 150 ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාරය, 2012 වර්ෂයේ ජූලි මාසයේදී, ජාතික විදුලි ජාලයට මෙගාවොට් 150 විදුලි බලයක් එකතු කරමින්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබීය. 1960 ගණන්වලදී මුලින්ම සැලසුම් කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති තනතුරෙහි රාජකාරී භාර ගෙන මාස කිහිපයකට පසු, 2006 මාර්තු මාසයේ 03 වැනි දින නැවත වැඩ ආරම්භ කරනු ලැබීය. ව්‍යාපෘතියේ පරිසර හිතකාමී ලක්ෂණ එකතු කරමින් ද ස්වාභාවික දසුන හා දර්ශණයේ සුන්දරත්වය රැකෙන පරිදි ද අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා විශේෂ ප්‍රයත්නයන් දරණු ලැබීය.

රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා 2012 වර්ෂය තුළ රජය විසින් නියම කරනු ලැබූ ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කිරීමේදී, ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකාරිත්වය හා සමස්ථ කාර්ය මණ්ඩලය සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය සමග දැඩි ලෙන්ගතු කමකින් යුතුව කටයුතු කළ බව සඳහන් කිරීම වැදගත්වේ. ඔවුන්ට අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තිකයන් හා විශේෂඥයන් වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, අගනා හා ඵලදායී තීරණයන් කරා එළඹීමට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දක්වනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු ප්‍රසන්නව නිසි මඟ යොමු කිරීම සඳහා ඔවුන් විසින් ලබා දෙන ලද අගනා මෙන්ම අතිමහත්වූ සහයෝගය මෙහිදී බොහෝ සෙයින් පිළිගැනිමට ද අගැයීමට ද ලක් කෙරේ.



**මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

# සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය



දීර්ග කාලයක් සඳහා දින ගණින ලද මායාවරුන්ගේ දින දර්ශණය අවසානයේ අඟවනු ලැබූ, අනිෂ්ට ලෙසින් සමීපවන ලෝක විනාශ දිනයක් පිළිබඳ අවිනිශ්චිතතාවන් මධ්‍යයේ සහ විදුලිබල ජලාශයන්හි අඛණ්ඩව ක්ෂය වෙමින් පැවති ජල සංචිතය මගින් ඇතිකරනු ලබන විදුලිය කපා හැරීමේ තර්ජනයන් මැද, 2012 ජනවාරි 1 වන දින ශ්‍රී ලාංකිකයන් තවත් නව වසරක් සඳහා අවදිවනු ලැබීය. කෙසේ වෙතත්, මෙම අභියෝග දෙකෙන්ම අනතුරු නොලැබ, මේ ආකාරයෙන් තවත් අභියෝග යක අවසානය සළකුණු කරමින් ජයග්‍රාහී නව වසරක් සමග ශ්‍රී ලංකාව 2012 වසරින් පිටමන් වීය.

> “ මේ රටේ සියළුම පාරිභෝගිකයන්ට, අවම වශයෙන් ඔවුන්ගේ නිවෙස්වලින් පිටතට නොගොස් එක් දිනක් තුළ විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට අවස්ථාව සලසාලීම අපේ අභිප්‍රායයි. අනෙකුත් අය ඔවුන්ගේ කාර්යාල "පාරිභෝගික හිතෛෂී" බවට පත් කිරීමට ප්‍රයත්න දරණ විට, ලංකා විදුලිබල මණ්ඩලයේ දැක්ම වනුයේ, කාර්යාල "පාරිභෝගිකයාට පැමිණීමකින් තොරව සේවා ලබාගත හැකි හැකි ස්ථාන" බවට පත් කිරීමයි. ”

**අතථ්‍ය සංචාරයේ ඇරඹුම * ලංකා විදුලිබල මණ්ඩලයට නව ආයතනික වෙබ් අඩවියක්**

2012 ජනවාරි 2 වන දින අපගේ නව ආයතනික වෙබ් අඩවිය, www.ceb.lk දියත් කරමින් ලංකා විදුලිබල මණ්ඩලය වසර අරඹනු ලැබීය. වඩ වඩාත් පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් අංග ඉදිරිපත් කිරීමේ පහසුකම් සමග නව පෙනුමින් යුත් වෙබ් අඩවිය, කලින් පැවති වෙබ් අඩවියේ වැඩි දියුණු කරන ලද්දාවූ පිටපතක් වේ. තාක්ෂන බුද්ධියෙන් පිරිපුන් පාරිභෝගිකයන් සඳහා අද මෙන්ම හෙට දිනයේ ද, වඩ වඩාත් පරිඝණක තොරතුරු සංනිවේදන ජාලයන් හා ජංගම සේවා පදනම් කරගත් පහසුකම් පිරිනැමීමේ අවශ්‍යතාවය ලංකා විදුලිබල මණ්ඩලය හඳුනාගනු ලැබ ඇත. නූතන සමාජයේ පොදු ජනයා ලෝක දෙකක ජීවත් වෙයි. එනම්, භෞතික ලෝකය සහ තථ්‍ය නොවන ලෝකයයි. ප්‍රවනතාවය වනුයේ, වඩ වඩාත් පසුව සඳහන් කළ ලෝකය කරා ''සංක්‍රමණයවීමය''. මෙම දෙලොවටම සේවය කිරීමේ අවශ්‍යතාවය, ලංකා විදුලිබල මණ්ඩලය හඳුනා ගෙන ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ වෙබ් අඩවිය, අතථ්‍ය ලෝකය කරා පිවිසීමේ අපගේ වාහල්කඩ, අලුතින් සකස් කිරීමට තීරණය කෙරිණි.

## සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

මාර්ගගතව පුද්ගල විදුලි ගිණුම් කරා පිවිසීම හා බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ අතීත තොරතුරු නිරීක්ෂණය කිරීම, අතීත පරිභෝජන රටාව පරීක්ෂා කර බැලීම සහ මාර්ග ගත බිල්පත් ගෙවීමේ හැකියාව වැනි පහසුකම් ඇතුලත්, නවාංග පරාසයක් වසර තුළ දී අපි, ලංකා විදුලිබල මණ්ඩල වෙබ් අඩවියට එකතු කළෙමු. ඕනෑම ආගන්තුකයෙකුට පවා දෛනික විදුලි ජනනය, පෙරදා රාත්‍රියේ පැවති වැඩිම විදුලි ඉල්ලුම, විදුලිබල ජලාශයන්හි ඇති දෛනික ජල සංචිතය, රටේ ඕනෑම ප්‍රදේශයක විදුලිය සැපයුම ඇණහිටවන කාලවේලාවන් සහ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රසිද්ධ කරනු ලබන ටෙන්ඩර් දැන්වීම් පිළිබඳ විස්තර නිරීක්ෂණය කළ හැකිය.

### "පාරිභෝගික හිතෛෂී" කාර්යාල වෙනුවට "පාරිභෝගික අබාධිත" කාර්යාල

නව විදුලි සැපයුමක් ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තරාත්මක කාර්ය පරිපාටිය, ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙබ් අඩවියට එක් කරනු ලැබ ඇත. සියල්ල කොළඹ නගර සීමාවේ පාරිභෝගිකයන් සඳහාය යන්න, වෙනුවට අන්තර් ජාලයෙන් ඉල්ලුම් පත්‍රයක් පිටපත් කර ගැනීමෙන් ලංකා විදුලිබල මණ්ඩල කාර්යාලයට එක් වරක්වත් නොගොස්, නව සම්බන්ධතාවයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ කාර්ය පරිපාටිය ඇරඹීම දක්වා දැන් වෙනස්වී ඇත. මේ රටේ සියළුම පාරිභෝගිකයන්ට, අවම වශයෙන් ඔවුන්ගේ නිවෙස්වලින් පිටතට නොගොස් එක් දිනක් තුළ විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට අවස්ථාව සලසාලීම අපේ අභිප්‍රායයි. අනෙකුත් අය ඔවුන්ගේ කාර්යාල ''පාරිභෝගික හිතෛෂී'' බවට පත් කිරීමට ප්‍රයත්න දරණ විට, ලංකා විදුලිබල මණ්ඩලයේ දැක්ම වනුයේ, කාර්යාල ''පාරිභෝගිකයාට පැමිණීමකින් තොරව සේවා ලබාගත හැකි හැකි ස්ථාන'' බවට පත් කිරීමයි. විසිතුරු නැරඹීමේ සංචාරයකදී හැර, ලංකා විදුලිබල මණ්ඩල පරිශ්‍රය වෙත පැමිණීම වළකාලීමට හැකි වන සේ පාරිභෝගිකයා වෙත සැපයෙන සියළුම සේවාවන්, වෙබ් අඩවිය හරහා පිරිනැමීමට ලංකා විදුලිබල මණ්ඩලය අදහස් කරයි. එය තවමත් ළඟා කරගත නොහැකි වූ ඉලක්කයක් වන නමුදු, 2012 වර්ෂයේදී අපි තැබූ කුඩා පියවර නිශ්චිතවම එම දිශාවට පනින ලද යෝධ පිම්මක් වනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය ඔවුන්ගේ පහසුකම් මහජනතාවට විවෘත කරති ත්‍රස්තවාදී යුද්ධය පැවති සමයේ, රටේ බලශක්ති පහසුකම් අධි ආරක්ෂිත කලාප ලෙස වර්ගීකරණය කරනු ලැබූ අතර ඒ අනුව, ශ්‍රී ලාංකිකයනට අපේ විදුලි බලාගාර නැරඹීමට, අධ්‍යයනය කිරීමට සහ ලංකාවේ විදුලිබල උත්පාදනය සිදුකරනු ලබන්නේ කෙසේ ද යන්න නිවැරදිව තේරුම් ගැනීමට විදුලි බලාගාර වෙත යාමේ අවස්ථාව අහිමි කරනු ලැබීය. යුද්ධය අවසාන වීමත් සමගම, අපගේ දොරටු මහජනයා සඳහා විවෘත කර ඇත්තෙමු. වික්ටෝරියා විදුලි බලාගාරය, සමනල වැව, ලක්ෂපාන සහ කැළණිතිස්ස අතුලත් තොරාගත් විදුලි බලාගාරයන් සඳහා ''නියමු සංචාරයන්'' ලංකා විදුලිබල මණ්ඩලය මගින් දැන් පවත්වා ගෙන යයි. මහජනයාට දැන් සංචාරය සඳහා ඉල්ලුම් කර දින වෙන් කරවා ගත හැකි අතර එය කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තර වෙබ් අඩවියෙහි දක්වා ඇත.

### ළකුණු පත්‍රය සංතුලණය කිරීම

ආයතනික මට්ටමේ තුලිත ළකුණු පත්‍රයක් සකසා නිම කරමින්, 2012 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය ඉතා වැදගත් පියවරක් තබනු ලැබීය. මෙම වසර තුළදී, ආයතනික ළකුණු පත්‍රය සම්පූර්ණ කිරීම, ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මුළුමනින්ම නව සංචාරයක සමාරම්භය වේ. තුලිත ළකුණු පත්‍රය යනු සතර දිග්භාගය වසා පැතිරී කාර්යසාධනය ගෙන දෙන හා ප්‍රතිඵල මැන දක්වන දර්ශක සමූහයක් මගින් සංවිධානයේ වර්තමාන මෙන්ම අනාගත ''ස්වස්ථතාව'', උද්දීපනය කර පෙන්වන, ප්‍රවේශමෙන් තෝරාගත් බලගතු මෙවලමකි. ආයතනික ක්‍රමෝපාය අංශය මගින් සත්කාරකත්ත්වය ලබා දෙමින්, 2012 අප්‍රේල් මාසයේ දී, කලවාන පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද, සාමූහිකව ගැටළු විසඳීමේ කටයුත්තකට, ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතනික කළමනාකරණ කාණ්ඩායම සහභාගීවීය. මෙම කටයුත්ත කෙරී ගෙන යන අතරතුර කාලයේදී, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රථම ක්‍රියාකාරිත්ව තුලිත ළකුණු පත්‍රයේ නිල උපත සළකුණු කරමින්, ලංකා විදුලිබල මණ්ඩල ළකුණු පත්‍රයේ සතර අභික්ෂාව (perspectives) හරහා පැතිරෙන ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන්ට අවසාන අනුමැතිය දක්වනු ලැබීය. ගැටළු සම්බන්ධයෙන් කෙටිකාලීන විසඳුම් සෙවීම හෝ ගැටළු ඇති කරන්නාවූ සාධක අවබෝධ කර ගෙන ඒවාට පිළියම් නොකර රෝග ලක්ෂණ මැඩ පැවැත්වීමට ක්‍රියා කිරීම වැනි එදිනෙදා කෙරෙන චර්යානුගත කටයුතු වලින් (firefighting) ඔබ්බට ගොස් ආයතනයේ සමස්ථ සුභ සිද්ධිය පිළිබඳ සොයා බැලීමට කළමනාකරණයට උපකාරී වන, තුලිත ළකුණු පත්‍රය පිළිබඳ ''මෙහෙයුම් සමාලෝචන රැස්වීම'', 2012 දෙසැම්බර් මස 11 දින පවත්වනු ලැබීය.

### චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ අංක 50 සිට විදුලක්පායට පිවිසීම

2012 ජනවාරි මස 19 දින නාරාහේන්පිට, එවර්ග්‍රීන් උද්‍යානයේ මංගලශිලා ප්‍රතිෂ්ඨාපනයත් සමග, ලංකා විදුලිබල මණ්ඩලයේ යෝජිත ප්‍රධාන කාර්යාල සංකීර්ණය ගොඩනැගීමේ කටයුතු ආරම්භ වීය. මහල් බොහෝ ගණනකින් සමන්විත, පරිසර හිතකාමී ගොඩනැගිල්ල ඉදි කර සම්පූර්ණ කිරීමෙන් පසු, දශක ගණනක කාලයක් කොළඹ වාණිජ මධ්‍යස්ථානයේ රැඳී සිටි කාලය අවසන් කරමින්, කොළඹ 2 පිහිටි ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ සිට ලංකා විදුලිබල මණ්ඩලය ඉවත්ව යනු ඇත. එසේ වුවත්, තාක්ෂණික විෂයයක නව්‍ය සංවර්ධන තත්වය ඇති, රැස්වීම් සහ විද්‍යුත් මාධ්‍ය සාකච්ඡා සඳහා රැස්වන ස්ථානයන් සහ වාහන නවතා තැබීමේ පහසුකම් වලින් සමන්විත, ලංකා විදුලිබල මණ්ඩලයේ නව මූලස්ථාන පරිශ්‍රය, ලංකා විදුලිබල මණ්ඩලයට ඉතාමත් අවශ්‍යව ඇති නවීන පෙනුම ලබා දෙයි.

### ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර සිහිනය සැබෑවීම

නියමු ව්‍යාපෘතිය, මෙගාවොට් 150 ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාරය සාර්ථකව සම්පූර්ණ කළ විට හා 2012 ජූලි 14 වන දින ජාතික ජාලයට සම්බන්ධ කළ විට, ලංකා විදුලිබල මණ්ඩලයේ සිහිනයක් සැබෑවීය. ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි ආයතනයේ මූල්‍ය ආධාර ඇතිව මෙම බලාගාරය ඉදි කරනු ලැබූ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ, ජල විදුලි බලාගාර නාවික බල ඇණියට මෑතදී එක් කළ විශාලතම ජලවිදුලි බලාගාර වලින් එකකි. වඩාත් අවශ්‍යව ඇති බලශක්ති ඒකක මිලියන 409 ක් වාර්ෂිකව ජාතික ජාලයට එක් කිරීමට මෙම බලාගාරය මගින් අපේක්ෂා කෙරෙයි.

### උතුරු සිහිනය - වසර 22 කින් අනතුරුව කිලිනොච්චි කොටුමා උපපොල බලගැන්වීම

ශ්‍රී ලංකාවේ උතුරු කොටස් වලට විදුලි බලය ගෙන එමින් තවත් සුවිශේෂී ජයග්‍රහණයක් සළකුණු කරමින්, 2012 සැප්තැම්බර් 13 වන දින 10.14 පැයට කිලිනොච්චි කොටුමා උපපොල බලගන්වනු ලැබීය. පැරණි කිලිනොච්චි කොටුමා උපපොල හා රටේ සෙසු කොටස් සමග කිලිනොච්චිය සම්බන්ධ කරනු ලැබූ සම්ප්‍රේෂණ රැහැන්, 1990 දී ත්‍රස්තවාදීන් විසින් විනාශ කරනු ලැබීය. එතැන් පටන් රටේ සෙසු ප්‍රදේශ ආවරණය කරනු ලබන්නාවූ ජාතික ජාලය හා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශ අතර සම්බන්ධයක් නොවීය. වව්නියා කොටුමා උපපොල පොලේ සිට, කිවො 132 ද්විත්ව පරිපත, කිලෝ මීටර 73 ක් දිග සම්ප්‍රේෂණ මාර්ගය දිගේ විදුලි සැපයුම ගෙන එමින්, කිලිනොච්චි කොටුමා උපපොල බලගැන්වීමත් සමග දැනට ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවත්නා චුන්නාකම් කොටුමා උපපොල දක්වා ජාතික විදුලි ජාලය ව්‍යාප්ත කිරීමේ ආසන්න තත්ත්වයකට පැමිණීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවීය. මේ අතරතුර, කිලෝ වොට් 33 කිලෝ මීටර් 29 ක් දිග සීඝ්‍රගාමී මාර්ගයක් අලිමන්කඩ හරහා පද්දුක්කාඩු දක්වා ඉතා කෙටි කාලයක් තුළ ඉදිකරමින්, බෙදාහැරීමේ අංශය අංක 1 හි කිලිනොච්චි කොටුමා උපපොලෙහි ජාලක විදුලිබලය, යාපනය අර්ධද්වීපයේ පොයින්ට්පේද්‍රුරු හා චාවාකච්චේරි දක්වා ගෙන ඒමට ද පියවර ගනු ලැබීය.

## සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

### "උතුරු ජනනී" බලශක්ති ජනනයේ නව පරිච්ඡේදයක් විවෘත කරයි

මෙගාවොට් 8 බැගින් වූ ඒකක තුනකින් සමන්විත, මෙගාවොට් 24 ''උතුරු ජනනී'' විදුලි බලාගාරය ස්ථාපනය කිරීමේ කටයුතු, 2011 අගෝස්තු මාසයේ ඇරඹූ අතර කඩිනමින් ඉදිකිරීමේ පදනමින්, 2012 දෙසැම්බර් වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබීය. මෙම බලාගාරය මගින් වාර්ෂිකව ආසන්න වශයෙන් විදුලි ඒකක මිලියන 176 ක් ජනනය කිරීමට හා චුන්නාකම්හි ක්‍රියාත්මකව පැවති අධික වියදම් සහිත හදිසි විදුලි බලාගාරය ප්‍රතිස්ථාපනය කරමින්, විශ්වාසනීය හා අඩු වියදම් විදුලි සැපයුමක් යාපනයට ලබා දීමට අපේක්ෂා කරනු ලැබීය. වසරක දී ලංකා රුපියල් මිලියන 1,350 ක් ඉතිරි කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ. අන්තර්ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් මගින් ව්‍යාපෘතිය සඳහා EPC කොන්ත්‍රාත්කරු තෝරාගනු ලැබූ අතර ව්‍යාපෘති අද්මිනිස්ත්‍රාසිකරු හා ව්‍යාපෘතියේ උපදේශක ලෙස ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරනු ලැබීය. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2012 මැයි මාසයේ ආරම්භ කෙරුණ අතර රුපියල් බිලියන 3.5 ක් වූ ව්‍යාපෘතිය සඳහා අරමුදල් ගොඩනැගීම, ලංකා විදුලි (පුද්) සමාගමේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් මගින් සිදු කරණු ලැබිණි. ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ, කිසියම් කාලයක ඉදි කළ වේගවත්ම විදුලි බලාගාර ව්‍යාපෘතිය, නියම කරගත් පරිදි, මාස අටකින් නිම කරනු ලැබූ අතර බලාගාරය ජාතික විදුලි ජාලයට සම්බන්ධ කිරීම සඳහා 2012 සැප්තැම්බර් මාසයේදී, යාපනයේ බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධ කරනු ලැබීය.

### ජනන සංකලනය

2011 වසරේ නිරිත දිග මෝසම් වැසි සහ ඊසාණ දිග මෝසම් වැසි සතුටුදායක ලෙස ක්‍රියාත්මක නොවීම, 2011 වර්ෂයේ පැවති 88.1% කට සාපේක්ෂව මුළු සංචිතයෙන් 52.3% ක, එනම් ගිවොපැ 658.4 ක සමස්ථ ජල සංචිතයක් සමගින්, 2012 වර්ෂය ආරම්භ වීමට හේතුවීය. නිරිත දිග මෝසම් වැසි අසාර්ථක වීම හේතුවෙන් තත්වය තවදුරටත් උග්‍ර වූ අතර ගිවොපැ 236.6 (සමස්ථ ජල රැඳුමෙන් 18.8%) වාර්තාගත අවම ජල සංචිතයක් ඇති කරමින් 2012 වර්ෂයේ ඊසාන දිග මෝසම් වැසි ආරම්භය ද පමාවීය. වර්ෂයේ පළමු හය මාසය තුළ ගලා ආ ජල ප්‍රමාණය ගිවොපැ 700 ක් ලෙස වාර්තා වී ඇති අතර එය ප්‍රථම හය මාසය සඳහා වාර්තා වූ අවම ජල සංචිතය වීය. එය, කලින් වාර්තා වී ඇති අවම ජල සංචිතයෙන් 64%ක් පමණ වීය. පළමු මාස 9 තුළ ජල විදුලිබල ජනනය, මුළු විදුලි ජනනයෙන් 18%ක් පමණ දක්වා පහත වැටිණි.

ලංකා විදුලිබල මණ්ඩලය සතුව පද්ධතිය තුළ ප්‍රමාණවත් තරම් අවම ජල සංචිතයක් පැවති නමුදු, ලංකා විදුලිබල මණ්ඩලයේ මෙන්ම නිදහස් විදුලිබල නිෂ්පාදකයන්ගේත් ඇතැම් තාප විදුලි බලාගාර, සැලසුම් කළ පරිදි හෝ ප්‍රකාශයට පත් කළ පරිදි, ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගත නොහැකිවූ බැවින් පද්ධති ස්ථායිතාව පවත්වා ගෙන යාම විශාල අභියෝගයක් වීය. ප්‍රයෝජනය සඳහා ඇති විදුලි බලාගාර පරීක්ෂාකාරීව සැලසුම් කිරීම හා මෙහෙයවීම සහ ජාලකයේ විබර කළමනාකරණ වැඩසටහන මගින් අවදානම් සහිත කාලය පුරා විදුලිබල පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගෙන යාමට, ලංකා විදුලිබල මණ්ඩලයේ පද්ධති කළමනාකරණ මධ්‍යස්ථානයට හැකිවිය. ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර සඳහා අවශ්‍ය ඉන්ධන සපයමින්, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එහි පූර්ණ සහයෝගය ලබාදුන් බව සැලකිල්ලට ගත යුතුය. ඊසාන දිග මෝසම ඇරඹීමත් සමගම, විදුලිබල ජලාශයන් තුළට ගලා එන ජල ප්‍රමාණය 2012 මුල් මාස හතර තුළ ඉහළ ගියේය. වාර්තා ගත ඉහළම ජල සංචිතය 2012 දෙසැම්බර් 29 වන දින පැවති අතර එම ප්‍රමාණය ගිවොපැ 1072.7 (මුළු ජල සංචිතයෙන් 85.1%) වීය. ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදු කළ සමස්ථ ජල විදුලි ජනනය ගිවොපැ 2726.7 වූ අතර පසු ගිය වර්ෂයේ පැවති සමස්ථ ජනනය වූ ගිවොපැ 4017.7 ට සාපේක්ෂව එම ප්‍රමාණය 23.1% ක් වීය.

### ලංකා විදුලිබල මණ්ඩලය බලශක්ති සංරක්ෂණ එළැවුම දියත් කරයි

2012 අප්‍රේල් මාසයේ ආරම්භයේදී, ඇතිවිය හැකි අර්බුදයක් පිළිබඳව ඉඟි කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ ජල සංචිතය සම්පූර්ණ ධාරිතාවෙන් 33.9% ක් දක්වා පහත වැටී තිබුණි. කාලගුණ දෙවි දේවතාවුන්ට මුහුණ දීම සඳහා, බලශක්ති සංරක්ෂණය කිරීමට මහජනයාගේ පිහිට පැතීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කළේය. මෙම ප්‍රයත්නයන්ගේ කොටසක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩලය මගින් බලශක්ති පරිභෝජනය අවම වශයෙන් 10% කින් අඩු කර ඇති ගෘහස්ත පාරිභෝගිකයන් අතර තරඟයක් ආරම්භ කරනු ලැබූ අතර ගෘහස්ථ පාරිභෝගිකයන් ගේ මාසික බිල්පත මණ්ඩලය මගින් ගෙවීමෙන් ඔවුන්ට තිළින ප්‍රදානය කරනු ලැබීය. මේ සඳහා ඉතා දිරිගන්වන සුළු ප්‍රතිචාරයක් මහජනයාගෙන් ලද අතර අර්බුදය වැළැක්වීමට එමගින් දායකත්වය දක්වනු ලැබීය.

බලශක්ති සංරක්ෂණය සඳහා තවත් නව සැලැස්මක් ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකරණය විසින් 2012 ජූනි මාසයේදී ක්‍රියාත්මක කරනු ලැබීය. කොළඹ නගරයේ වැදගත් ස්ථානයන්හිදී පාරට බැස මහජනතාව මුණගැසී, ලංකා විදුලිබල මණ්ඩලය මගින් දියත් කරනු ලැබ ඇති බලශක්ති සංරක්ෂණ තරඟයට එක්වන ලෙස ඔවුනට ආරාධනය කරනු ලැබීය.

### නුපුහුණු නුපුරුදු සේවකයන්ගේ යුගය අවසන් කිරීමට මනාව පුහුණු කළ නවකයන් ආදේශ කිරීම

පුහුණු සේවකයන් ක්‍රමානුකූලව සේවයෙන් විශ්‍රාම යාමත් ශක්තිමත් ශ්‍රම බලකාය වයස්ගත වීමත් සමග, විශේෂයෙන් ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල හා වැඩහල්වල යන්ත්‍ර ක්‍රියා කරවීමේ රාජකාරී කටයුතුවල යෙදවීමට පුහුණු තාක්ෂණික සේවක මණ්ඩලයේ හිඟයක් පවතින බව ලංකා විදුලිබල මණ්ඩලයට හැඟෙන්නට වීය. කාර්ය මණ්ඩලයේ හිඟය නැවත පිරවීමට වසර ගණනාවක් පුරා පිටතින් අලුතින් බඳවා ගනු ලැබූ නුපුරුදු නවක සේවකයින්, විදුලි උපයෝජ්‍යතාවයක කටයුතු ඉටුකිරීමට තරම් අවශ්‍ය කුසලතාවන් සතුව නොසිටී. කිසියම් ආකාරයක තාක්ෂණික අධ්‍යාපනයක් ලැබීමෙන් පසු පැමිණි අයවළුන් පවා වෘත්තීය පුහුණු ආයතනයන් තුළ ඔවුන් හදාරා ඇති මොඩියුලයන්, ලංකා විදුලිබල මණ්ඩලයේ කුසලතා අවශ්‍යතාවන්ට සරිලන මට්ටමක නොමැත. පුළුල් වන කටයුතුවලට සාර්ථකව මුහුණ දිය හැකි, ගුණාත්මක බවින් යුත් නවකයන්ගේ හිඟයක් ලංකා විදුලිබල මණ්ඩලයට දැනී ඇත.

සාවධාන අධ්‍යයනයකින් අනතුරුව, වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සමග කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන්, තාක්ෂණික ආයතන සහ වෘත්තීය අධ්‍යයන හා පුහුණු ආයතනයන්හි, ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවන් සඳහා කැපවූ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට එකඟවී ඇත. මෙම වැඩසටහන යටතේ, න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම බෙදා දෙන, ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ එක් අවුරුදු පාඨමාලාවක්, වෘත්තීය අධ්‍යයන හා පුහුණු ආයතනයන්හි දී පිරිනැමීමට නියමිතව ඇත. මෙම පාඨමාලාවේ පළමු අවුරුද්ද සම්පූර්ණ කිරීමෙන් පසු, ආධුනිකයන් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින්, ආයතනය තුළ සිදු කෙරෙන තුන් අවුරුදු ආධුනිකත්ව පුහුණුවක් ලබා දීමට නියමිත අතර එම කාලය තුළ අභ්‍යාසලාභීන් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් දීමනාවක් ගෙවනු ඇත. මෙම වැඩසටහනේ ප්‍රථම ඉලක්කය වනුයේ, විදේශගත කිරීමට හෝ පුද්ගලික අංශයේ හා විදුලි උපයෝගීතාවන් සඳහා රට තුළ යොදා ගත හැකි, විදුලි උපයෝගිතාවන් සම්බන්ධ විවිධ දක්ෂතාවන් ඇති නිපුණ තරුණ කම්කරු බලකායක් බිහි කිරීමයි. මෙකී යෝජිත වැඩසටහන සම්බන්ධයෙන්, විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය, කුසලතා සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර ත්‍රෛපාක්ෂික අවබෝධතා ගිවිසුමක් 2012 වර්ෂයේ දී අත්සන් කරනු ලැබීය. මෙම අවබෝධතා ගිවිසුම අනුව පුහුණුව සැපයීමට හා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරන්නා වූ අභ්‍යාසලාභීන්ගෙන් කොටසක්, ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ තනතුරු උසස්වීම් ලබාදීමේ යෝජනා ක්‍රම

## සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

සංශෝධනය කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා ඇබෑර්තු සඳහා අවශෝෂණය කර ගැනීමට, ලංකා විදුලිබල මණ්ඩලය වගකීම දරණු ලැබීය.

2012 මැයි 13 දින ලංකාවේ ඉරිදා ඔබ්සවර් හා අනෙකුත් පුවත්පත්වල, මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලාංකේය තරුණයන් වෙතින් අයදුම්පත් කැඳවමින් ඓතිහාසික දැන්වීමක් පල කළ අතර පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍යයන් 500 ක් තෝරා ගනු ලැබිණි. ඔවුන් අතරින් පනස් දෙනෙක් දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට නියමිත විය. වසර කිහිපයකින් අනතුරුව, ලංකා විදුලිබල මණ්ඩලය මෙම ඓතිහාසික ජයග්‍රහණයේ ඵල නෙලා ගැනීම අරඹනු ඇති අතර මෙමගින් නිසැකවම ලංකා විදුලිබල මණ්ඩලයේ කුසලතාව, ගුණාත්මකබව හා ශිල්ප කෞෂල්‍යය වැඩි දියුණු වනු ඇත.

### මිනිස්බල සැපයුම් ආයතනයන්ගෙන් සැපයෙන කාර්යමණ්ඩල සඳහා බලාපොරොත්තුවේ අංශු මාත්‍රයක්

මිනිස් බල සැපයුම් ආයතන හරහා සේවය ලබා ගෙන ඇති, ලංකා විදුලිබල මණ්ඩල කාර්යමණ්ඩලය පිළිගැනීමට ලක්වීම, 2012 වසර තුළ ලැබූ තවත් සැලකිය යුතු ජයග්‍රහණයක් වනු ඇත. මිනිස් බල සැපයුම් ආයතන හරහා 4,500 ක පමණ සේවක මණ්ඩලයක් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතුව සිටින අතර ඔවුන්ගෙන් ඇතැමෙක් වසර හතකට අධික කාලයක් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා සිය සේවය සපයමින් සිටී. ඔවුන්ගේ රැකියාවන්හි අනාරක්ෂිත භාවය නිසා, ඔවුන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලයට ඈඳා ගන්නා ලෙස ඉල්ලා ඔවුහු විවිධ බලධාරීන් වෙත අඛණ්ඩව අභියාචනයන් ඉදිරිපත් කරමින් සිටී. අවසානයේදී, ඔවුන්ගේ දිගු කාලීන සේවය සැලකිල්ලට ගෙන, අනෙකුත් බාහිර අයදුම්කරුවන් සමග සෑම වසරකම ඇබෑර්තු සඳහා අයදුම් කිරීමේ අවස්ථාවක් සලසාලීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ, ඔවුන්ගේ සේවා කාලය පුරා ඔවුන් ලද පළපුරුද්ද මගින්, අනෙකුත් බාහිර අයදුම්කරුවන්ට වඩා ඔවුනට මද වාසියක් සැළසෙන අතර ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ඉහළ ගිය රැකියා සුරක්ෂිතතාවයක් හා පිළිගැනීම් මට්ටමක් සමග, ඔවුන්ගේ සේවය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ ඉඩ ප්‍රස්ථාවක් ද ඔවුනට ලැබෙනු ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

සේවක මණ්ඩල අවශ්‍යතාවන් සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම සහ සමස්ථයක් වශයෙන් රට පුරා එහි ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ හදිසි ඇබෑර්තු පිරවීම සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම ඉතා වැදගත් වේ. කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත් අතර ඉංජිනේරුවන් 96 දෙනෙක්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් 133 දෙනෙක්, කාර්යාල සේවකයන් හැත්තෑ පස් දෙනෙක්, රියැදුරන් 88 දෙනෙක් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 658 දෙනෙක් වශයෙන් 1,059 සේවක මණ්ඩලයක්, 2012 වර්ෂයේ දී බඳවා ගන්නා ලදී.

### අන්ධකාරය විජයග්‍රහණය කළ රණ සුරයන් රැක බලා ගැනීම

ශ්‍රී ලංකා බලශක්ති සංතුලනයෙහි නවතම සංස්කරණයේ, එහි මුල්ම පිටුවේ, පහත සඳහන් වචන යොදා ගනිමින්, උත්කර්ෂවත් ප්‍රසංශාවක් පිරිනමයි. ''ජාතික විදුලි ජාලයේ වේගවත් ප්‍රසාරණය, ග්‍රාමීය විදුලි සැපයුම් යෝජනාක්‍රම වලියක්, ප්‍රචලිතව පවත්නා ආකාරයෙන් ග්‍රාමීය විදුලිබල සැපයුම් යෝජනා ක්‍රමය මගින් මුදුන්පත් කර ගනු ලැබිණි. මෙම යෝජනා ක්‍රමයන්හි සාර්ථකත්වය, මඳ වශයෙන් විපරමට ලක්වූ රටේ අහුමුළුවල, ඇතැම් අවස්ථාවන්හි දී, අතපය හා ජීවිත කැප කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් කළ අනුපමේය කැපකිරීම සහ කැපවීම කෙරේ මුළුමණින්ම ආරෝපනය වනු ඇත''.

වරක් ළඟා කර ගත නොහැකි ඉලක්කයක් ලෙස සිතූ, සම්පූර්ණ විදුලිබල සැපයුම සාර්ථක කර ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩල සේවකයෝ, සිය තුරුණු විය වැස්සේ හා අව්වේ පවා වෙහෙස මහන්සිවී වැඩ කළහ. එසේ වුවත්, සිය සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, තම ජීවිතයේ ඉතිරි කොටස ගත කිරීම සඳහා, පිරිහෙමින් පවතින ශරීර සෞඛ්‍ය ඇතිව නිරතුරුව ජීවිතය සමග පොර බැදීමට, ඔවුන්ගේ අර්ථ සාධක අරමුදලේ සුළු ඉතිරිකිරීම් අතැතිව, තම සේවය ඉතා හොඳින් ඉටුකිරීමේ මහත් තෘප්තියකින්, ඔවුහු සිය නිවෙස් කරා ආපසු පැමිණෙති. ඔවුන් ගැන සැළකිලිමත් වීමට, 1994 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලයේ, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර සේවකයනට ඔවුන් අවසාන වශයෙන් ලැබූ වැටුපෙන් නිශ්චිත ප්‍රතිශතයක් විශ්‍රාම වැටුප් ලෙස ගෙවනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ, ඔවුන්ගේ සක්‍රීය සේවය මත පදනම්ව, මෙම ප්‍රමාණය 30%, 32% හෝ 34% ක් වේ. ඔවුන්ගේ විශ්‍රාමික ජීවිතය පුරා මෙම ප්‍රමාණය, ජීවන වියදම් දීමනාවේ හානිපූරණය සඳහා ගෙවන යම් ස්ථිර දීමනාවක් හැර, කිසිදු වෙනස් කිරීමකින් තොරව නිශ්චිත ආකාරයෙන් පවත්වා ගෙන යනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, කාලයකට පෙර සේවයෙන් විශ්‍රාම ලැබූවන්, එකල ක්‍රියාත්මකව පැවති අඩු වැටුප් ව්‍යුහය නිසා, මෑතදී විශ්‍රාම ලැබූවන්ට සාපේක්ෂව, ඉතා අඩු විශ්‍රාම වැටුපක් ලබයි. මේ අනුව විශ්‍රාම වැටුප් විෂමතාවයන් පවතී.

ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාමිකයන් සහ විශ්‍රාමිකයන්ගේ සුභ සාධක සංගමය මගින් නැවත නැවතත් කළ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, විශ්‍රාම අරමුදලේ සුභසාධනයට බල නොපාන පරිදි, අධ්‍යයනය කිරීමට හා නිර්දේශ ඉදිරිපත් කිරීමට ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබීය.

ඉදිරිපත් වූ එවැනි නිර්දේශයන් පදනම් කරගෙන, 1994 සිට ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කරන ලද, සියලු වැටුප් වර්ධකයන්ගේ අගයෙන් 50% බැගින් ගෙන, විශ්‍රාම ගන්නා අවස්ථාවේ ලබමින් සිටි වැටුප් පරිමානය මත පදනම්ව, විශ්‍රාම වැටුප් දීමනාව සංශෝධනය කිරීමට, ලංකා විදුලිබල මණ්ඩලය තීරණයක් ගනු ලැබීය. තව ද, අවම විශ්‍රාම වැටුප් ගෙවීම රුපියල් 5,000 දක්වා වැඩි කිරීමට තීරණය කරනු ලැබිණි. මෙලෙස ඉහළ නංවනු ලැබූ විශ්‍රාම වැටුප් ගෙවීම, 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබූ අතර වැඩි කරන ලද විශ්‍රාම වැටුප් දීමනාව පිළිබඳව විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයා විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට හා වැඩි කරන ලද විශ්‍රාම වැටුප් දීමනාව විශ්‍රාමිකයන් වෙත ඔහු විසින් ප්‍රදානය කිරීමට උත්සවයක් සංවිධානය කරනු ලැබීය. විශ්‍රාමිකයන් ලද මේ විශේෂ ජයග්‍රහණය බොහෝ පැරණි ලංකා විදුලිබල මණ්ඩල සේවකයන්ගේ නෙතගට සතුටු කඳුළු ගෙන ඒමටත් වර්තමාන සේවකයනට ශක්තියක් ගෙන දීමටත් නිසැකවම හේතු වනු ඇත.

### 2012 වර්ෂයේ ක්‍රියාත්මක වූ වැටුප් වර්ධනය

වසර තුනකට වරක් ලංකා විදුලිබල මණ්ඩල සේවකයන්ගේ වැටුප් ප්‍රතිශෝධනය කරනු ලබන අතර 2012 වර්ෂයේදී ද එවැනි වැටුප් සංශෝධනයන් සිදුවිය යුතුව තිබිණි. සියලුම සේවකයන්ගේ වැටුප්, ඔවුන්ගේ මූලික වැටුපෙන් 25% ක් වන පරිදි වැඩි කළ අතර 2012 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, වැඩි කළ වැටුප් ගෙවනු ලැබීය. වෘත්තීය සමිතිවලින් වැඩි සංඛ්‍යාවක්, 25 % කට වැඩි සමතල වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටි අතර, එන් 5 ශ්‍රේණියේ සිට සාමාන්‍යාධිකාරීවරයා දක්වා, වර්ධක අනුපාතයක් පදනම් කරගත් වැටුප් ව්‍යුහයක් ලබා දෙන ලෙස, ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරුවරුන්ගේ සංගමය මගින් ඉල්ලා සිටිනු ලැබීය. සමතල වැටුප් වර්ධනයක් ලබා දීම රජය මගින් අනුමත කිරීමෙන් පසුව ද ඔවුන් තම ඉල්ලීම පිළිබඳ නියෝජනයන් අදාළ බලධාරීන් වෙත අඛණ්ඩව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබූහ. එවකට පැවති 1.3 සිට 1.6 දක්වා අඩුම වැටුපේ සිට ඉහළම වැටුප දක්වා පැවති වැටුප් අනුපාතය ඉහළ නැංවීමටත් විධායක ශ්‍රේණියේ සේවකයන්ගේ කේ 6 සහ ඉහළ ශ්‍රේණිවල) පමණක් වැටුප් ප්‍රතිශෝධනය කිරීමටත්, 2012 අප්‍රේල් මාසයේදී රජයේ අනුමැතිය ලබා දෙනු ලැබීය.

## සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

2012 අප්‍රේල් මාසයේ සිට වැටුප් ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කරනු ලැබූ විට, විධායක නොවන ශ්‍රේණියේ වෘත්තීය සමිති එයට විරුද්ධ වූ අතර කේ 6 වලින් පහළ ශ්‍රේණි දක්වා ද වැටුප් ප්‍රතිශෝධනය පුළුල් කරන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. ඔවුන්ගේ ඉල්ලීම දිනා ගැනීම සඳහා ඔවුහු වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගණනාවක් දියත් කරනු ලැබූ අතර අවසානයේදී, එම අවධියේදී පවත්වමින් තිබූ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය පිළිබඳව ද නොසළකා හරිමින්, 2012 අගෝස්තු මාසයේ සිට, වැඩ මුර රාජකාරී ද ඇතුළුව, අඛණ්ඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකරණයට ද, රජයට ද තර්ජනය කරමින්, මෙදින 14,500 කට ආසන්න, මාණ්ඩලික නිලධාරීන් හැර, අනෙකුත් සියළුම සේවකයින් ඔවුන්ගේ වැඩ නවත්වනු ලැබීය.

ලංකා විදුලිබල මණ්ඩලයේ අවුරුදු 16 ක මෑත කාලීන ඉතිහාසයේ මෙපමණ සංඛ්‍යාවක් සේවයෙන් ඉවත්ව සිටීම මුල් වරට සිදුවූ නමුදු, බහුතරය ඉංජිනේරුවන් වන විධායක කාර්ය මණ්ඩලය, කළමනාකරණය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මගින් මෙම අභියෝගය ඉතා හොඳින් භාර ගනු ලැබීය. විධායක කාර්ය මණ්ඩලයේ විශේෂයෙන්, ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරුවන්ගේ වෘත්තීය සමිතිය මගින් මෙහෙයවන ලද ඉංජිනේරුවන්ගේ සහාය ඇතිව, මෙම කාලය තුළ දී මුළු රට පුරා, බිඳ වැටීමකින් තොරව විදුලිබලය පවත්වා ගෙන යාමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවීය. වැඩ වැරුම දින 6.5 කාලයක් පුරා පැවති අතර ඉන් අනතුරුව, වැඩ වර්ජනය කළ සේවකයින් කිසිදු ඉල්ලීමක් ජයග්‍රහණය නොකර, කම්කරු අමාත්‍යාශය ඉදිරියේ, ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹෙමින් සේවයට වාර්තා කරනු ලැබීය.

### මුදල් තත්ත්වය

2012 වර්ෂය, මූල්‍ය වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ඉතා දුශ්කර වර්ෂයක් වීය. අනපේක්ෂිත කාලගුණික රටාව වර්ෂයේ ජනන මිශ්‍රණයට අහිතකර ලෙස බලපානු ලැබීය. විදුලිබල ජලාශයන්හි ධාරිතාවයෙන් 63% පිරී පවතිනු ඇතැයි යන අපේක්ෂාවෙන් 2012 වර්ෂයේ මුල් අයවැය වාර්තාව පිළියෙල කරන ලද නමුදු, රටේ පැවති වියලි කාලගුණ තත්ත්වය මගින් ඇති කරන ලද ජනන මිශ්‍රණයේ අනපේක්ෂිත, පුරෝකථනය කළ නොහැකි අවිනිශ්චිත හැසිරීම් රටාව හේතුවෙන්, ලංකා විදුලිබල මණ්ඩලයට එහි මෙහෙයුම් අයවැය වාර්තාව සංශෝධනය කිරීමට සිදුවිය. අගෝස්තු මාසයේ මැද වන විට, සමස්ථ සංචිතයෙන් 18.8% ක් දක්වා ජල විදුලි උත්පාදනය පහළ වැටිණි. බිඳවැටීමකින් තොරව, 24/7 නිරතුරු විදුලිබලය පවත්වා ගෙන යාම සඳහා මිල අධික තාප විදුලිබලාගාර මගින් විදුලිය නිපදවීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවීය.

2011 වර්ෂයේ, ගල් අගුරු බලාගාරයන් ද ඇතුළුව, සමස්ථ තාප විදුලිබල ජනනය ගිවොපැ 6,758 ක් වීය. (සමස්ථ විදුලි ජනනයෙන් 58% ක්). 2012 වර්ෂයේදී, එකී නිෂ්පාදනය ගිවොපැ 8,338 දක්වා සීඝ්‍රයෙන් ඉහළ ගියේය. (සමස්ථ විදුලි ජනනයෙන් 71%ක්)

පසුගිය වර්ෂයේ පැවති රුපියල් බිලියන 151 ට සාපේක්ෂව විකුණුම් පිරිවැය රුපියල් බිලියන 222 දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනයට මූලික වශයෙන් දායකත්වය සැපයූවන් වනුයේ, ඉන්ධන මිල ගණන් ඉහළයාම සහ අඩු අගයක් ගත් ජල විදුලිබල ජනනයේ අඩුව පිරිමැසීමට ගල් අඟුරු නොවන තාප විදුලිබල ජනනය ඉහළ නැංවීමයි. ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලිබල (ගල්අඟුරු නොවන) ජනන පිරිවැය 2011 පැවති රුපියල් 20.39/ කිවොපැ සිට 2012 දී රුපියල් 23.92/ කිවොපැ දක්වා ඉහළ ගිය අතර ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගේ ජනන පිරිවැය 2011 දී පැවති රුපියල් 17.75/ කිවොපැ සිට 2012 දී රුපියල් 22.76/ කිවොපැ ඉහළ ගියේය.

ඉන්ධන ගැලපුම් ගාස්තුව 25% කට සීමා කරමින් 2012 පෙබරවාරි 16 දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, විදුලි අයක්‍රම සංශෝධනය හඳුන්වා දෙනු ලැබීය. අපේක්ෂා කළ තරමින් අයක්‍රමය ඉහළ නැංවූයේ නැති අතර ඉන්ධන ගැලපුම් ගාස්තු වැඩිවීමේ ප්‍රතිශතය, ආයතනයක මූල්‍ය ස්වශක්තතාව ඇති කිරීම සඳහා අයක්‍රම නියම කිරීමේ "වියදම් පියවුම් ප්‍රවේශය" ("cost pass through") සෑහීමට පත්කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. 2012 වර්ෂයේ මුහුණපාන ලද මූල්‍ය දුශ්කරතාවන් පහසු කර ගැනීම සඳහා රජයෙන් සහනාධාර සපයනු නොලැබීය. මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහයන් සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලයට, තමාගේම වූ ක්‍රියාමාර්ගයන් ගැනීමට සිදුවීය.

ලංකා විදුලිබල මණ්ඩලය, වර්ෂය අවසානයේදී, පසුගිය වර්ෂයේ පැවති අලාභය වූ රුපියල් බිලියන 19 මෙන් 310% වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 78 ක මූල්‍ය අලාභයක් වාර්තා කළ බැවින් මෙහෙයුම් ප්‍රතිඵල සෘණාත්මකවීය. මෙම තත්ත්වය මගින් 2012 වර්ෂයේදී විකුණන ලද එක් ඒකකයකින් (කිවොපැ) රුපියල් 7.41 නිෂේධාත්මක දායකත්වයක් ඇති කරන ලද අතර ලංකා විදුලිබල මණ්ඩලයේ පුරෝකථනය කළ නොහැකි, අවිනිශ්චිත මූල්‍ය හැසිරීම් රටාවට සහ ද්‍රවශීලතාවට අහිතකර ආකාරයෙන් බලපා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අතිරේක ජනන පිරිවැය දරා ගැනීම පිණිස ලබා ගත් රුපියල් බිලියන 40 ක බැංකු ණය ප්‍රමාණයට අමතරව ඉන්ධන සැපයුම්කරුවන්ට හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයනට ගෙවිය යුතු රුපියල් බිලියන 51.5 කෙටි කාලීන වගකීමක් ඇතිව, ලංකා විදුලිබල මණ්ඩලයේ වසරේ මූල්‍ය කටයුතු අවසන් කෙරිණි. අතිරේක ජනන වියදම් සඳහා 2011 වර්ෂයේ දී බැංකු වෙතින් ලබාගත් ණය මුදල රුපියල් බිලියන 12 ක් වීය.

ශේෂ පත්‍ර දිනයේදී පැවති පරිදි, මුළු ස්ථාවර වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 622 ක් වීය. ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ වත්කම්වලින් 84%ක් මෙයින් නියෝජනය කෙරෙයි. එමනිසා, සැලකිය යුතු ප්‍රමාණයක් වන රුපියල් බිලියන 21 වාර්ෂික ක්ෂයවීම් ද 2012 වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 78 ක ගිණුම්කරණ අලාභයට ඇතුළත් කර ඇත. පසුගිය වර්ෂයේ පැවති සංඛ්‍යාව වූ, ගිවොපැ 10,023 ට සාපේක්ෂව, 4.45%ක වර්ධනයක් පෙන්නුම් කරමින්, විදුලි විකුණුම් 2012 වර්ෂය තුළ දී, ගිවොපැ 10,474 දක්වා ඉහළ ගියේය. 2012 වර්ෂයේ දී, විකුණුම් සඳහා වූ අදාළ රුපියල් වටිනාකම රුපියල් බිලියන 163 ලෙසට වාර්තා වූ අතර එය 2011 වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලියන 31ක එනම් 24% ක වර්ධනයක් විය. 2012 පෙබරවාරි මාසයේ සිට 25 %ක් වූ ඉන්ධන ගැලපුම් ගාස්තුව ක්‍රියාත්මක කිරීම, විකුණුම් ආදායම ඉහළ යාමට ප්‍රධාන හේතුව වීය.



**බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය**

# ලංවිම සම්ප්‍රේෂණ ජාලය 2012





## ජල විදුලිබලය

**1,584 මෙගාවොට්**

මුළු ජලවිදුලි ධාරිතාවය

**3,292 ගිගාවොට්පැය**

ජලයෙන් ජනනය කරන ලද බලශක්තිය

## තාප විදුලිබලය

**1,638 මෙගාවොට්**

මුළු ජනන ධාරිතාවය

**8,339 ගිගාවොට්පැය**

තාපයෙන් ජනනය කරන ලද බලශක්තිය

## සූර්ය ශක්තිය, සුළඟ හා ජෛවස්කන්ධ විදුලිබලය

**90 මෙගාවොට්**

මුළු ජනන ධාරිතාවය

**171 ගිගාවොට්පැය**

ජනනය කරන ලද බලශක්තිය

# ජනන අංශය



# ජනන අංශය

ලංකා විදුලිබල මණ්ඩලයට අයත් තාප හා ජල විදුලි බලාගාර ක්‍රියා කරවීම හා නඩත්තු කිරීම පිළිබඳව ලංකා විදුලි බල මණ්ඩලයේ ජනන අංශය වගකිව යුතුය. මෙගා වොට් 1,357 ස්ථාපිත ධාරිතාවක් සහිත ජල විදුලි බලාගාර 17 කින් ද, මෙගා වොට් 554 ක ස්ථාපිත ධාරිතාවක් ඇති තෙල් දහනයෙන් ක්‍රියා කරන විශාල තාප විදුලි බලාගාර හයකින් ද, මෙගා වොට් 300 කින් යුත් ගල්අඟුරු දහනයෙන් ක්‍රියා කරන බලාගාරයකින් ද ජනන වත්කම් සමන්විතවේ. යාපනය අර්ධද්වීපයේ සහ අවට පිහිටි දූපත් ආශ්‍රිතව ඇති තනි ජාලවලින් සමන්විත විදුලි බලාගාර කිහිපයක් ද ලංකා විදුලිබල මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරයි. මේ අනුව 2012 වර්ෂයේ අවසානය වන විට, ලංකා විදුලිබල මණ්ඩලය සතු විදුලි බලාගාරවල සමස්ථ ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 2,214 ක් විය.

විවිධ කාර්යයන් සඳහා වගකිවයුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් එකොළොස් දෙනෙකුගේ සහාය ඇතිව අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් ජනන අංශය පාලනය කෙරේ. මහවැලි, ලක්ෂපාන, තාප විදුලි බලාගාර, වෙනත් ජල විදුලි බලාගාර සහ ගල්අඟුරු බලාගාර යන ජනන සංකීර්ණ පහක් ලෙසින් ජනන අංශය සංවිධානය වී ඇත. බොහෝ කාලයක් ප්‍රයෝජනයට ගැනීමෙන් පැරණිවීම සහ අඩු විශ්වාසනීයත්වය නිසා සේවයට යොදා ගත හැකි කාලය අවසන්ව ඇති බවට හඳුනා ගනු ලැබ ඇති පොදු වත්කම් පුනරුත්ථාපනය කිරීම, ජනන අංශය යටතේ ක්‍රියාත්මක, ජනන ව්‍යාපෘති අංශය මගින් සිදු කෙරේ.

විදුලි බලාගාරයන්හි ප්‍රධාන අළුත්වැඩියාවන් සඳහා අවශ්‍ය විශේෂඥ තාක්ෂණික සහාය, ජනන අංශයේ තාප බලශක්ති වත්කම් කළමනාකරණ අංශයන් මගින් සැපයෙයි. මෙම අංශ මගින් අඛණ්ඩව ජනන වත්කම්වල තත්වය අධීක්ෂණය කරනු ලබන අතර ජනන වත්කම්වල මෙහෙයුම් කාලය වැඩි කිරීම සඳහා දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනියි.

විදුලිබල උත්පාදනය සඳහා පහසුකම් සලසන වේලි, ජලාශ, විදුලි බලාගාර උමං, සහ අනෙකුත් ඒ හා සම්බන්ධිත ව්‍යුහයන් නඩත්තු කිරීම හා අඛණ්ඩ අධීක්ෂණය කිරීම, වේලි සුරක්ෂිතතා, පාරිසරික හා සිවිල් ව්‍යුහ නඩත්තු කිරීමේ ශාඛාවේ වගකීම වේ. තාප විදුලි බලාගාර මගින් පරිසරයට සිදු කෙරෙන විමෝචනයන් පිළිබඳව ජාතික ප්‍රමිතීන්ට අනුව අඛණ්ඩව අධීක්ෂණය සහ නඩත්තු කටයුතු සිදු කරේ.

ජනන අංශයේ වාර්ෂික මෙහෙයුම් හා නඩත්තු අයවැය මත පදනම්ව, ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි බලාගාරයන්හි විදුලිබල නිෂ්පාදන ධාරිතාව හා බලශක්ති පිරිවැය තීරණය කිරීම සහ එම තොරතුරු සම්ප්‍රේෂණ අංශය හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට වෙත මාසිකව යොමු කිරීම ද ජනන අංශයේ බලශක්ති විකුණුම් ශාඛාවේ වගකීම වේ. එසේම, විදුලිය බෙදාහැරීම සම්බන්ධයෙන් ලැබිය යුතු ගාස්තු අය කර ගැනීම සඳහා මාසික ගනුදෙනු සටහන් සම්ප්‍රේෂණ අංශය වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව ද බලශක්ති විකුණුම් අංශය වගකිව යුතුවේ.

ජනන අංශයේ මානව සම්පත් කළමනාකරණය ද සේවක ප්‍රවර්ග සැලසුම් කිරීම ද ජනන අංශයේ ආයතන කටයුතු පිළිබඳ ශාඛාවේ වගකීම වේ. කාර්ය මණ්ඩලයේ කුසලතාවන් සහ ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස අඛණ්ඩ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමද මෙයට ඇතුලත් වේ. සමාලෝචිත වර්ෂය තුළ, අංශයේ සේවකයන් 604 දෙනෙකුට කාර්ය විශේෂිත පුහුණු අවස්ථාවන් සැලසීමට මෙකී ශාඛාව මගින් කටයුතු පිළියෙල කර තිබිණි.

සම්ප්‍රේෂණ අංශය යටතේ ඇති පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් බලාගාර පිළිබඳ කටයුතු ක්‍රියාත්මක කරන අතර බලාගාරවල සියළුම නඩත්තු කටයුතු ජනන සංකීර්ණයන් පහ මගින් සිදුකෙරේ. ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ප්‍රධාන ජල සහ තාප විදුලි බලාගාර සියල්ලම මෙම වසර තුළදී, පහත දැක්වෙන පරිදි, ඉතා ඉහළ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීමට සිදුවිය.

### ලක්ෂපාන සංකීර්ණය

ලක්ෂපාන බලාගාර සංකීර්ණයේ ස්ථාපිත මුළු ධාරිතාව මෙගා වොට් 345 කි. දූරදර්ශී මහා ඉංජිනේරුවරයෙකු වූ නැසී ගිය ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මහතාගේ යෝජනාවක් අනුව ඉදි කරනු ලැබූ, පැරණි ලක්ෂපාන ජනන බලාගාරය ලෙස නම් කරනු ලැබූ මුල් හා ප්‍රධානතම ජල විදුලි බලාගාරය ඇතුලුව ස්ථාන හතරක පිහිටා ඇති ජල විදුලිබල ජනන ස්ථාන පහකින් එය සමන්විත වෙයි. මෙම බලාගර කැළණි ගංගේ අතු ගංගා දෙකක එක කඳු රැල්ලක පිහිටා තිබේ. විමලසුරේන්ද්‍ර හා පැරණි ලක්ෂපාන බලාගාර කෙහෙල්ගමුව ඔයෙන් පෝෂණය වන අතර කැනියොන් හා නව ලක්ෂපාන බලාගාර මස්කෙළිය ඔයෙන් පෝෂණය වේ. මෙම ගංගා දෙකෙහි ජලය අවසානයේ දී, සමනල බලාගාරය සඳහා භාවිතා කෙරේ.

මෙම සංකීර්ණයේ බලාගාර පහත වගුවේ දක්වා ඇති පරිදි ක්‍රියාත්මකවී ඇත. 2012 වර්ෂය තුළ, ලක්ෂපාන සංකීර්ණයේ මුළු බලශක්ති ජනනය, ගි.වොට්.පැ. 884.9 ක් වූ අතර එය මුළුබල ශක්ති ජනනයෙන් 7.5 % ක් විය.



නව ලක්ෂපාන බලාගාරය - විදුලි උත්පාදක යන්ත්‍රය (ජෙනරේටරය) එකලස් කිරීම.

| බලාගාරය | මුළු බලශක්ති ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතාව (%) |
|---|---|---|
| පැරණි ලක්ෂපාන | 177.3 | 88.6 |
| නව ලක්ෂපාන | 300.3 | 51.8 |
| කැනියොන් | 86.0 | 91.6 |
| සමනල | 247.0 | 92.5 |
| විමලසුරේන්ද්‍ර | 74.3 | 49.2 |
| **මුළු එකතුව** | **884.9** | |

## ජනන අංශය

### මහවැලි සංකීර්ණය

මහවැලි සංකීර්ණය, ඉහළ කොත්මලේ, කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, උකුවෙල, බෝවතැන්න සහ නිලඹේ යන බලාගාරවලින් සමන්විත වේ. මෙම සංකීර්ණයේ මුළු ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 815 කි. 2012 වර්ෂයේ මුළු බලශක්ති ජනනයෙන් 10.75 % ක් වන ගි.වො.පැ.1342.8 ක් මහවැලි සංකීර්ණය විසින් ජනනය කරනු ලැබීය. මෙම සංකීර්ණයේ බලාගාර පහත් දැක්වෙන පරිදි ක්‍රියාත්මකවී ඇත.

| බලාගාරය | මුළු බලශක්ති ජනනය (ගි.වො.පැ.) |
|---|---|
| කොත්මලේ | 270.0 |
| වික්ටෝරියා | 392.8 |
| රන්දෙනිගල | 188.0 |
| රන්ටැඹේ | 110.2 |
| උකුවෙල | 85.0 |
| බෝවතැන්න | 31.8 |
| නිලඹේ | 5.1 |
| ඉහළ කොත්මලේ | 259.0 |
| **මුළු එකතුව** | **1,342.8** |

### වෙනත් ජල විදුලි බලාගාර සංකීර්ණය

අනෙකුත් ජලවිදුලි බලාගාර සංකීර්ණය, සමනලවැව, කුකුලේ, ඉඟිනියාගල සහ උඩවලවේ යන බලාගාරයන්ගෙන් සමන්විතවේ. මේවාට අමතරව, හම්බන්තොට සුළං විදුලි බලාගාරය ක්‍රියාත්මක වේ. මෙම සංකීර්ණයේ ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 213ක් වේ. 2012 වර්ෂය තුළ, අනෙකුත් ජල විදුලි බලාගාර සංකීර්ණයන් මගින් සමස්ථ විදුලි ජනනයෙන් 4.2 % ක් වූ ගි.වො.පැ. 501.44ක් ජනනය කරනු ලැබීය. ඉඟිනියාගල සහ උඩවලවේ මෙහෙයුම් රටාවන් මුළුමණින්ම රඳා පවතිනුයේ, මුදාහරිණු ලබන වාරි ජලය මත බවත් එබැවින් බලාගාර සාධක පහත් මට්ටමක පවත්නා බවත් සඳහන් කළ යුතුව ඇත. කෙසේ වෙතත්, 2012 වර්ෂය තුළ, ඉඟිනියාගල බලාගාරය මගින් ගි.වො.පැ. 31.60 ක බල ශක්තියක් ජනනය කරනු ලැබීය.

| බලාගාරය | මුළු බලශක්ති ජනනය (ගි.වො.පැ.) |
|---|---|
| සමනලවැව | 195.2 |
| කුකුලේගඟ | 266.5 |
| ඉඟිනියාගල | 31.6 |
| උඩවලවේ | 5.8 |
| සුළං (හම්බන්තොට) | 2.3 |
| **මුළු එකතුව** | **501.4** |

### තාප බලාගාර සංකීර්ණය

කැළණිතිස්ස වායු ටර්බයිනය, කැළණිතිස්ස වායු ටර්බයිනය (CCGT), සපුගස්කන්ද-A සපුගස්කන්ද-B යන බලාගාරයන්ගෙන් තාප බලාගාර සංකීර්ණය සමන්විත වේ. මෙම සංකීර්ණයේ මුළු ස්ථාපිත ධාරිතාව මෙ.වො. 540 ක් වේ. 2012 වර්ෂය තුළ දී, සමස්ථ විදුලි ජනනයෙන් 17.1 % ක් වූ ගි. වො.පැ. 2023.6 ක් මෙම තාප බලාගාරය මගින් උත්පාදනය කරනු ලැබීය.

| | මුළු බලශක්ති ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතාව (%) |
|---|---|---|
| කැළණිතිස්ස වායු ටර්බයින 7 | 120.3 | 24.5 |
| කැළණිතිස්ස රාමු 5 වායු ටර්බයින | 97.9 | 68.0 |
| කැළණිතිස්ස සීසීජීපී වායු ටර්බයින | 588.9 | 85.0 |
| කැළණිතිස්ස සීසීජීපී වාෂ්ප ටර්බයින | 290.7 | 80.8 |
| සපුගස්කන්ද-A | 392.6 | 78.8 |
| සපුගස්කන්ද-B | 533.2 | 86.2 |
| **මුළු එකතුව** | **2,023.6** | |

ලංකා විදුලිබල මණ්ඩලය සතු සියළුම තාප බලාගාර අතුරින්, අඩුම ජනන පිරිවැය, සපුගස්කන්ද පිහිටි බලාගාරයන්හි පවත්නා බැවින් මෙම බලාගාර මුළු වර්ෂය පුරාම පාදම විබර මත ක්‍රියාත්මක කරවනු ලැබීය. යාබද පිහිටි ලංකා ඛණිජ තෙල් සංස්ථා පිරිපහදුවෙන් ලබා ගන්නා, අනෙකුත් ඛණිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් ශේෂ වන අඩු මිල තෙල් මෙම බලාගාර මගින් භාවිතා කෙරේ.



පුත්තලමේ පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය

ශ්‍රී ලංකාවේ ප්‍රථම ගල්අඟුරු බලාගාරය වන මෙගාවොට් 300 ක ධාරිතාවයකින් යුත් මෙමගින් 2012 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ගි.වො.පැ. 1,404 ක විදුලිබලයක් උත්පාදනය කරනු ලැබීය. මෙය මුළු පද්ධති ඉල්ලුමෙන් 12 % ක් විය. මෙම කාලය තුළ බලාගාරයේ ගල්අඟුරු පරිභෝජනය සහ ඩීසල් පරිභෝජනය පිළිවෙලින් ටොන් 584,761 ක් සහ ටොන් 1,767 ක් විය. ප්‍රථම වාර්ෂික නඩත්තු කටයුතු සඳහා මෙම බලාගාරය දින හතලිහක පමණ කාලයක් වසා තබනු ලැබීය. 2012 වර්ෂය තුළ දී බලාගාරයේ උපයෝජ්‍යතාව (availability) 78 % ක් පමණ විය. පුත්තලම ලක්විජය ගල්අඟුරු බලාගාරයෙන් වාර්ෂික උපයෝජ්‍යතාව 85 % කි.

| සංකීර්ණය | ඉන්ධන රුපියල් මිලියන | අමතර කොටස් හා අනෙකුත් නඩත්තු ද්‍රව්‍ය |
|---|---|---|
| තාප | 42,515 | 2,715 |
| ජලවිදුලි * | - | 495 |
| ගල්අඟුරු | 11,099 | 130 |
| **මුළු එකතුව** | **53,614** | **3,340** |

| උත්පාදන පිළිබඳ සාමාන්‍ය පිරිවැය ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර | |
|---|---|
| | ඒකක පිරිවැය (රු./කි.වො.පැ.) |
| ජලවිදුලි බලාගාර | 2.71 |
| තාප බලාගාර | 23.88 |
| ගල්අඟුරු බලාගාර | 11.30 |

### ජනන ව්‍යාපෘති

ජනන අංශයේ විෂය පථය යටතට ගැනෙන, බලාගාර පුනරුත්ථාපන ව්‍යාපෘති, කළමනාකරණය සහ පරිපාලනය භාරව ක්‍රියා කිරීමේ හා ජනන අංශය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන්ට අදාළ සියළුම විදේශ මිලදී ගැනීම් හැසිරවීමේ වගකීම ජනන අංශයේ, ජනන ව්‍යාපෘති ශාඛාවට පැවරී ඇත.

### නව ලක්ෂපාන සහ විමලසුරේන්ද්‍ර බලාගාර පුනරුත්ථාපනය



විමලසුරේන්ද්‍ර බලාගාරය - භ්‍රමකයක් එසැවීම

මෙම ව්‍යාපෘතිය යටතේ 2X50 මෙ.වො. ධාරිතාවකින් යුත් නව ලක්ෂපාන සහ 2X50 මෙ.වො. ධාරිතාවකින් යුත් විමලසුරේන්ද්‍ර බලාගාර යලි සකස් කොට නවීකරණය කරනු ලැබේ. මෙම ගිවිසුම යටතේ රුපියල් මිලියන 6660.0 පිරිවැයක් දරා ජෙනරේටරය, ටර්බයින් යන්ත්‍ර, පාලකය, සහ ආධාරක යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කර, යලි සකස් කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු Alstom Hydro, France වන අතර කොන්ත්‍රාත් වටිනාකමින් 85 % ක් Credit Agricole CIB" France (මුලින් CALYON Corporate Investment Bank) විසින් අපනයන ණය කොන්දේසි මත සපයනු ලබන අතර ඉතිරි 15% අරමුදල් හැටන් නැෂනල් බැංකුව මගින් සපයනු ලබයි. ව්‍යාපෘති කටයුතු 2008 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2014 ජූලි මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. 2012 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය 95 % ක් විය. විමලසුරේන්ද්‍ර බලාගාරයේ ඒකක 1 යන්ත්‍රය පුනරුත්ථාපනය කරනු ලැබ 2012 සැප්තැම්බර් මාසයේදී වාණිජ ක්‍රියාකාරිත්වය සඳහා යෙදවූ අතර නව ලක්ෂපාන බලාගාරයේ ඒකක 1 යන්ත්‍රය පුනරුත්ථාපනය කර 2012 දෙසැම්බර් 2 වන දින වාණිජ ක්‍රියාකාරිත්වය සඳහා යොදවනු ලැබීය. පුනරුත්ථාපන කටයුතුවලින් පසු, නව ලක්ෂපාන බලාගාරයේ සෑම ඒකකයකම ධාරිතාවය මෙගා වොට් 7 කින් ඉහළ නංවනු ලබන අතර නව ලක්ෂපාන බලාගාරයේ ටර්බයින යන්ත්‍රයේ කාර්යක්ෂමතාවය 89.3 % දක්වා ඉහළ නංවනු ලැබීය.

### පැරණි ලක්ෂපාන බලාගාරය පුනරුත්ථාපනය කිරීම

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ වනුයේ, පැරණි ලක්ෂපාන ව්‍යාපෘතියේ, 1 වන අදියරේ, ජෙනරේටරය, ටර්බයින් යන්ත්‍රය සහ ඒ ආශ්‍රිත උපකරණ වෙනුවට අළුත් යන්ත්‍ර යොදා මෙගාවොට් 3X8.33 බලාගාරයේ විශ්වාසනීයත්වය, කාර්යක්ෂමතාවය සහ ජීවය ඉහළ නැංවීමයි. රුපියල් මිලියන 4,200 මුළු පිරිවැයක් යටතේ මෙම කොන්ත්‍රාත්තුව ඔස්ට්‍රේලියාවේ, Voith Hydro ආයතනයට ප්‍රදානය කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ වියදමින් 85% සඳහා අරමුදල් Unicredit bank Austria AG මගින් සපයන ලද අතර ඉතිරි 15 % සඳහා හැටන් නැෂනල් බැංකුව මගින් අරමුදල් සපයනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ වැඩ 2010 මැයි මාසයේදී ආරම්භ කරන ලද අතර 2013 වසරේ ජූනි මාසය අවසානයේ දී නිම කිරීමට සැලසුම් කර තිබිණි. 2012 වර්ෂයේ අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය 92 % ක් ව පැවතිණි. පැරණි ලක්ෂපාන බලාගාරයේ ඒකක 1 සහ 3 යන්ත්‍ර පුනරුත්ථාපනය කර, 2012 වර්ෂය තුළදී, ලංකා විදුලිබල මණ්ඩලයට ආපසු භාර දෙනු ලැබීය. ඒකක 1 යන්ත්‍රය 2012 සැප්තැම්බර් මස 03 දින ද, ඒකක 3 යන්ත්‍රය 2012 දෙසැම්බර් මස 14 වන දින ද, වාණිජ මෙහෙයුම් සඳහා යොදවනු ලැබීය. එක් එක් ඒකකයක ධාරිතාවය මුලින් පැවති මෙගාවොට් 8.33 ධාරිතාවයේ සිට මෙගාවොට් 9.5 දක්වා ඉහළ නංවනු ලැබීය. ටර්බයිනයේ කාර්යක්ෂමතාවය පිළිබඳ පරීක්ෂනය නොවැම්බර මාසයේදී පවත්වනු ලැබීය. ටර්බයිනයේ කාර්යක්ෂමතාවය 90.18% කින් මුදුන් පමුණුවා ගන්නා ලදී. සහතික කරන ලද අගය එමගින් සපුරාලනු ලැබිණි.



පැරණි ලක්ෂපාන බලාගාරයේ ජෙනරේටරයේ සහ ටර්බයිනයේ කොටස් ගලවා ඉවත් කිරීම



පැරණි ලක්ෂපාන බලාගාරයේ භ්‍රමකය එසවීම



නෝර්ටන් වේල්ලෙහි පතුල් කඩුලු දණ්ඩේ අළුත් වැඩියාව

**සමනල බලාගාරය පුනරුත්ථාපනය කිරීම**

වසර 41 ක ක්‍රියාකාරීත්වයෙන් පසු එහි සේවා කාලයේ අවසානය දක්වා එළඹ ඇති මෙගාවොට් 2X37.5 බලාගරයේ ආයු කාලය දීර්ගකර ගැනීමේ අරමුණෙන්, ස්වාධීන උපදේශකයෙකු වූ ස්විස්ටර්ලන්තයේ Poyry Energy AG විසින් 2010 වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබීය.

මෙම අධ්‍යයනයෙන් පසු, ලංසු තැබීමේ ලේඛන සකස් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රවීණ නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුවක් පත්කරනු ලැබූ අතර මෙම කමිටුවේ කටයුතු දැනට කෙරී ගෙන යයි.



# සම්ප්‍රේෂණ අංශය

# සම්ප්‍රේෂණ අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ ඇතැම් කටයුතු සම්බන්ධයෙන් වෙනත් අංශයන්ට සේවා සපයන අතරතුර ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම සම්ප්‍රේෂණ වත්කම් සැලසුම් කිරීම, වැඩිදියුණු කිරීම, මෙහෙයවීම සහ පවත්වා ගෙන යාම සම්ප්‍රේෂණ අංශයෙන් සිදු කෙරෙයි.

### සම්ප්‍රේෂණ අංශයේ මෙහෙවර

ඵලදායි සහ කාර්යක්ෂම සැලසුම් භාවිතයෙන් විශ්වාසනීය, ගුණාත්මක විදුලිබලය තොග වශයෙන් සැපයීමත්, පිළිගත හැකි පාරිසරික ප්‍රමිතීන් ආරක්ෂා කරමින්ද, සතුටුදායක ලාභ අනුපාතයක් උපයා ගනිමින්ද, නිපුණ හා අභිප්‍රේරිත සේවකයන්ගේ ඵලදායි සහභාගිත්වයෙන්, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා සුදුසු ආකාරයෙන් යෝග්‍ය තාක්ෂණය භාවිතයෙන්, සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම හා මෙහෙයවීමත් සම්ප්‍රේෂණ අංශයේ මෙහෙවර වේ.

### සම්ප්‍රේෂණ අංශයේ අරමුණු

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වාසනීය හා අරපිරිමැස්මෙන් යුත් සම්ප්‍රේෂණ පද්ධතියක් වැඩිදියුණු කොට පවත්වා ගෙන යාම
- සුරක්ෂිත, විශ්වාසනීය හා අරපිරිමැස්මෙන් යුත් විදුලි සැපයුමක් විදුලි පාරිභෝගිකයන්ට සැපයීම සහතික කළ හැකි වන පරිදි බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට විදුලිය සැපයීම හා විකිණීම
- විදුලිය සඳහා ඇති විය හැකි බවට සාධාරණව පුරෝකථනය කළ ඉල්ලුම සපුරාලීමට හැකි වන සේ, උත්පාදන බලාගාරයන්හි ප්‍රමාණවත් ධාරිතාවක් පවත්වා ගෙන යන බවට සහතිකවීම
- කිලෝවෝල්ට් 132 සඳහා ±10 % කද, කිලෝවෝල්ට් 220 සඳහා ±5 % කද සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයක් සහ හර්ට්ස් 50 ක් සඳහා ±1 % සංඛ්‍යාතයක් පවත්වා ගෙන යාම

### මෙහෙයුම් ක්‍රියාකාරකම්

සියලුම බලාගාර එකට සම්බන්ධ කර ගනිමින් සම්ප්‍රේෂණ අංශය කිලෝවෝල්ට් 220 සහ කිලෝවෝල්ට් 132 ජාල මෙහෙයවන අතර ජාලයට සපයනු ලබන සමස්ථ විදුලිබලය එහි පද්ධති පාලන මධ්‍යස්ථානය මගින් බෙදාහරිනු ලබයි. විශ්වාසනීයත්වය, ගුණාත්මක බව සහ මෙහෙයුම් සකසුරුවම උපරිම මට්ටමෙන් ලැබෙන ආකාරයෙන්, උත්පාදන සහ සම්ප්‍රේෂණ පද්ධතිය ක්‍රියාකරවීමේ කාර්යය, පද්ධති පාලන ශාඛාව මගින් සැලසුම් කර ක්‍රියාත්මක කරයි. මෙම ශඛාව මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ බලශක්ති උත්පාදන හා සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ වාර්තා රැස් කොට, දත්ත ලේඛනාගාර ගත කරන අතර, නිත්‍ය පදනමින් කළමනාකරණයට තොරතුරු සපයයි.

### පද්ධති පාලන මෙහෙයුම්

සියලුම බලාගාර එකට සම්බන්ධ කර ගනිමින්, කි.වොට් 220 සහ කි.වො.132 ජාල සම්බන්ධීකරණය හා මෙහෙයවීම සම්බන්ධයෙන්, පද්ධති පාලන ශාඛාව වගකිව යුතුය. විශ්වස්‍යතාව, ගුණාත්මකබව සහ මෙහෙයුම් සකසුරුවම්කම ඉහළම මට්ටමින් පවත්වා ගැනීම සඳහා ජනන හා සම්ප්‍රේෂණ පද්ධතිය මෙහෙයවීම, පද්ධති පාලන ශාඛාව මගින් සැලසුම් කොට ක්‍රියාත්මක කරයි. මෙම ශාඛාව මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන හා සම්ප්‍රේෂණ පද්ධතියට අදාළ දත්ත රැස්කිරීම, සටහන් කරගැනීම හා ලේඛනාගාර ගත කිරීම සිදුකර, තොරතුරු නිත්‍ය පදනමකින් කළමනාකරණය වෙත සපයයි.

2012 වර්ෂයේ පැවති සමස්ථ ජල සංචිතයෙන් 88.1 % ට සාපේක්ෂව, සමස්ථ ජල සංචිතයෙන් 52.3 % ක් වූ, ගිවොපැය 658.4 ක ජල රැඳුමක් (storage) ඇතිව, 2012 වර්ෂය ආරම්භ විය. පසුගිය වර්ෂය සමඟ සසඳා බැලීමේදී, විදුලිබල ජලාශ තුළට මුල් මාස කිහිපය තුළට ගලා ආ, ජල ධාරිතාව අඩු මට්ටමක පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2012 මාර්තු 28 දින වන විට, ජල සංචිතය ගි.වො.පැ. 426 දක්වා පහත බැස තිබිණි. නිරිත දිග මෝසම් කාලය තුළ අඩු වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් ජල සංචිතය අඛණ්ඩව අඩු වෙමින් පැවතිණි. 2012 අගෝස්තු 16 දින වාර්තාගත වූ අඩුම ජල සංචිතය කි.වො.පැය 236.6 ක් (මුළු රැඳවුම් ධාරිතාවයෙන් 18.8 % ක්) විය. 2012 වර්ෂය තුළදී ජලාශයන් තුළට ගලා ආ ජල ප්‍රමාණය අඩුවීම, තාප විදුලිබල නිෂ්පාදනය ඉහළ යාමට හේතුවිය. ඊසාන දිග මෝසම් ආරම්භ වීමත් සමග, 2012 වසරේ අවසාන කාර්තුව තුළ, ජලාශයන්ට ගලා එන ජල ප්‍රමාණය ඉහළ ගියේය. ගිගාවොට් පැය 1072.7 (මුළු රැඳවුම් ධාරිතාවෙන් 85.1 %) ක් වූ, වාර්තා ගත ඉහළම ජල රැඳවුම, 2012 දෙසැම්බර් 29 දින වාර්තා විණි. අවුරුද්ද අවසාන වන විට පැවති ජල ධාරිතාවය ගිගාවොට් පැය 1067 ක් විය.

2012 වර්ෂයේ වාර්තා වූ උපරිම විදුලිබල ප්‍රමාණය මෙගාවොට් 2146.4 ක් 2012 මැයි 9 දින වාර්තා වූ අතර වර්ෂය තුළ ජනනය කරන ලද සමස්ථ බලශක්තිය ගිගාවොට් පැය 11800.8 ක් විය. එය 2011 වර්ෂයට සාපේක්ෂව 2.4 % ක ඉහළ යාමකි.




**දෛනික ජනන චක්‍රය 09.05.2012**

### පද්ධති පාලන මධ්‍යස්ථානය නවීකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ නව පද්ධති පාලන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා, 2006 දී සකස් කරන ලද සක්‍යතා වාර්තාවක් පදනම් කර ගෙන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය පැකේජයන් දෙකකින් සමන්විත විය. ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම සහ අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) හා සංනිවේදන පද්ධතිය සවිකිරීම පැකේජයට ඇතුළත් වූ අතර දැනට යොදා ඇති බිම් කම්බිය වෙනුවට දෘෂ්‍ය විදුලි භූ තන්තුව(Optical Fiber Ground Wire )OPGW) යෙදීම A පැකේජයට ඇතුළත් විය. පද්ධති පාලන නවීකරණ ව්‍යාපෘතිය සඳහා උපදේශක මණ්ඩල කොන්ත්‍රාත්තුවක්, 2010 මැයි මාසයේ දී ප්‍රදානය කරනු ලැබිණි.

ශ්‍රී ලංකාවේ විදුලිබල සම්ප්‍රේෂණ හා ජනන පද්ධතිය පාලනය කිරීම සඳහා, ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයක් ලබාදීම, A පැකේජයේ අරමුණ විය. නව පද්ධති පාලන මධ්‍යස්ථානයට ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ පද්ධතියේ කිලෝවෝල්ට් 132/220 කොටුමා උප

## සම්ප්‍රේෂණ අංශය

පොලවල වහරුපන්න (switchgear) අධීක්ෂණය කිරීමේ හා පාලනය කිරීමේ ශක්තිය ලැබෙනු ඇත. මෙහෙයුම් කාර්යය මණ්ඩලයට ක්‍රියාශීලී ලෙස බලශක්ති බෙදා හැරීමේ ලේඛනය සම්බන්ධයෙන් තීරණය ගැනීමට උපකාරී වන්නාවූ අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) පද්ධතිය සමග ඒකාබද්ධවූ, බලශක්ති කළමනාකරණ පද්ධතියක්, නව පද්ධති පාලන මධ්‍යස්ථානයේ ඉතා වැදගත් අංගය වනු ඇත.

මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන්ට, මෙම කොන්ත්‍රාත්තුව යටතේ සපයන්නාවූ ගොඩනැගිල්ලක් තුළ NSCC ස්ථාපනය කිරීම ද, දිවයින පුරා ඇති උපපොල වල සහ බලාගාරයන්හි බලාගාර සම්බන්ධකයේ (interface) කටයුතු සම්පූර්ණ කිරීම සහ සෑම උපපොලක් හා බලාගාරයක්ම පාලන මධ්‍යස්ථානය සමග සම්බන්ධ කරමින් රට පුරා විහිදුන සංනිවේදන ජාලයක් ස්ථාපනය කිරීම ද ඇතුළත් වේ.

දැනට යොදා ඇති භූ තන්තුව වෙනුවට ආසන්න වශයෙන් කි.මී. 1038 ක් දිග කිලෝවෝල්ට් 132 සහ කිලෝවෝල්ට් 220 ද්විත්ව පරිපථ තෙකලා සම්ප්‍රේෂණ මාර්ග සංයුත තන්තු දෘශ්‍ය උඩිස් භූ තන්තුවක් (OPGW) යෙදීම සහ සෑම විදුලි උපපොල වැඩ බිමකම අන්තවන දෘෂ්‍ය විදුලි භූ තන්තු සන්නායකය සඳහා approach fiber optic cable සවි කිරීම B පැකේජයේ කාර්ය විෂයපථයට ඇතුළත්වේ. ඉහත A සහ B පැකේජයන්හි සම්පූර්ණ පිරිවැය ආවරණය කර ගැනීම පිණිස රුපියල් මිලියන 25 ක් පමණ ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයයි. කිලෝමීටර් 200 ක් පමණ දිග දෘෂ්‍ය උඩිස් භූ තන්තුව සවිකිරීම ද B2 පැකේජය යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුව මගින් සපයන අරමුදල් භාවිතයෙන් ක්‍රියාවට නැංවෙමින් පවතී. B පැකේජය සඳහා වන කොන්ත්‍රාත්තුව, 2012 අප්‍රේල් මාසයේදී, Viscas Corporation නැමති ආයතනය වෙත පිරිනමනු ලැබීය. සවිකිරීම් කටයුතු වලින් 37 % ක පමණ ප්‍රමාණයක් 2013 ජූනි මාසය වන විට සම්පූර්ණ කරනු ලැබ ඇත. B2 පැකේජය සඳහා කොන්ත්‍රාත්තුව 2012 නොවැම්බර් මාසයේදී LTL Projects (Pvt) Ltd and LTB Leitungsbau GmbH යන මූල්‍යායතන සමූහයට ප්‍රදානය කරනු ලැබීය. B සහ B2 යන පැකේජයන් දෙක මගින්ම අදාළ සවිකිරීම් 2013 අවසාන වන විට අවසන් කිරීමට සැළසුම් කරනු ලැබ ඇත.

A පැකේජය සඳහා වන ප්‍රසම්පාදනයන් ආසියානු සංවර්ධන බැංකුවේ අදියර දෙකේ ලංසු තැබීමේ ක්‍රියාපරිපාටිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර දැනට මිල ගණන් අගැයීමේ අවසාන අදියරේ පවතී. අවුරුදු දෙකක කාලයකින් වැඩ අවසන් කිරීමට යටත්ව, A පැකේජයට අදාළ කොන්ත්‍රාත් දෙක, 2013 සැප්තැම්බර් මාසයේදී පිරිනැමීම අපේක්ෂා කරනු ලැබිණි.



කැළණිතිස්ස කොටුමා උපපොල කිලෝවෝල්ට් 132



220 දවෝ වහරු අංගනය - පන්නිපිටිය කොටුමා උපපොළ

බලාගාරයන්ගෙන් සහ සම්ප්‍රේෂණ ජාලයේ උපකරණවලින් උපරිම වාණිජ ප්‍රතිලාභ අත්කර ගැනීම සම්ප්‍රේෂණ අංශයේ, වත්කම් කළමනාකරණ ශාඛාවේ වගකීම වේ. මෙහෙයුම් සඵලතාව සුරක්ෂිත කිරීම සහ වත්කම්වල සකසුරුවමින් යුත් ආයු කාලය උපරිම මට්ටමින් පවත්වා ගෙන යාම, නඩත්තු පිළිවෙත් හා ක්‍රියාමාර්ග සකස් කිරීම, බලාගාර ක්‍රියාකාරිත්වය සහ නඩත්තු කටයුතු ඵලදායි ආකාරයෙන් අධීක්ෂණය කිරීම, එයට ඇතුළත් වේ. වත්කම්වල ප්‍රයෝජනවත් කාලය ඉකුත්වීමෙන් අනතුරුව ඒ වෙනුවට නව වත්කම් යෙදීමට සැළසුම් කිරීම, වැදගත් වත්කම් කළමනාකරණ කාර්යයක්වේ.

අධි වෝල්ටීයතා සම්ප්‍රේෂණ පද්ධතිය කිලෝවෝල්ට් 132 උඩිස් රැහැන් කිලෝමීටර 1787.1 ක්, කිලෝවෝල්ට් 132 භූගත රැහැන් කිලෝමීටර් 47.6 ක්, කිලෝවෝල්ට් 220 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් කිලෝමීටර් 502.5 ක් සහ කිලෝවෝල්ට් 220 භූගත රැහැන් කිලෝමීටර 2 කින් සමන්විත වේ. මීට අමතරව, 2012 වර්ෂයේ අවසානය වන විට, කොටුමා උප පොලවල් 57 ක් ක්‍රියාත්මකව පැවතිණි.

සම්ප්‍රේෂණ අංශය සඳහා අමතර කොටස්, උපකරණ සහ මෙවලම් ප්‍රසම්පාදනයත්, වැඩකට ගත නොහැකි සම්ප්‍රේෂණ වත්කම් බැහැර කිරීමත් සම්ප්‍රේෂණ වත්කම් කළමනාකරණ ශාඛාවේ වෙනත් වැදගත් කාර්යයන් වේ.

2012 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන්

- MITFIN මෘදුකාංග යොදා ගනිමින් කොටගල ගබඩාවන්හි ගබඩා කළමනාකරණ කාර්යයන් පරිගණක ගත කිරීමේ කටයුතු 50 % කින් සම්පූර්ණ කරනු ලැබීය.
- කොටගල ගබඩාවන්හි පහසුකම් සංවර්ධන කටයුතු 50 % කින් සම්පූර්ණ කරනු ලැබීය. නව ආරක්ෂක වැටක් ඉදිකිරීම සහ එළිමහන් ප්‍රදේශයේ බිම්තලය කොන්ක්‍රීට් යොදා සකස් කිරීම ද මෙම සංවර්ධන කාර්යයන්ට ඇතුළත් විණි.
- පරිගණක පාදක කරගත් වත්කම් ලේඛනයක් (වත්කම් දත්ත ගබඩාවක්) වැඩිදියුණු කරනු ලැබීය. මෙම කාර්යය, මුළුමනින්ම ආයතනයේ කාර්යය මණ්ඩලය විසින් ඉටු කරන ලදී. මෙම දත්ත ගබඩාව මගින් සෑම කොටුමා උපපොලකම ඇති සියලුම ප්‍රධාන උපකරණ පිළිබඳ වැදගත් දත්ත, අදාළ කොටුමා උපපොලේ

(Graphical User Interface of Single Line Diagrams of the relevant GSS) තුළින් තත්පර දහයත් ඇතුළත ලබා ගත හැකිය.

- කොටුමා උපපොලවල ඇති උපකරණයන්හි තත්ත්වය තක්සේරු කිරීමට, තත්ව අධීක්ෂණ ඒකකයක් පිහිටුවීමේ ආරම්භක කාර්යයන් ඉටු කරනු ලැබිණි.

**සම්ප්‍රේෂණ ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු**

සම්ප්‍රේෂණ අංශයේ, සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ ප්‍රධාන අරමුණ වනුයේ, පවත්නා කොටුමා උපපොල 48, කිලෝවෝල්ට් 220 ප්‍රමාණයේ කිලෝමීටර 650 ක් සහ කිලෝවෝල්ට් 132 ප්‍රමාණයේ කිලෝමීටර් 2,300 ක සම්ප්‍රේෂණ මාර්ග කාර්යක්ෂම, විශ්වාසනීය හා එලදායි ආකාරයෙන් ක්‍රියාකරවීම හා නඩත්තු කිරීමයි.

ඉහත අරමුණ ඉටුකර ගැනීම සඳහා, සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව යටතේ වෙනම ප්‍රාදේශීය කාර්යාල හතරක්, ආරක්ෂණ සහ මධ්‍යගත සේවා අංශයක් සහ ක්ෂණික ඇමතුම් නඩත්තු අංශයක් පිහිටුවනු ලැබ ඇත.

මෙම අංශයේ එක් එක් ශාඛාව මගින් 2012 වර්ෂය තුළ ක්‍රියාවේ යොදවන ලද විශේෂ කාර්යයන් සමහරක් පහත දක්වා ඇත.

**මෙහෙයුම් හා නඩත්තු කටයුතු - කොළඹ ඒකකය**

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු අංශයේ, කොළඹ කලාපය මගින්, කොටුමා උපපොල විසි එකක සාමාන්‍ය දෛනික කාර්යයන්/නිවාරක නඩත්තු කටයුතු සහ කිලෝවෝල්ට් 220 සහ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගයන්හි කිලෝමීටර් 380 ක් දුරට විහිදී තිබූ අතු ඉති කපා ඉවත් කිරීමේ කටයුතුවලට අමතරව, පහත දැක්වෙන විශේෂ නඩත්තු කටයුතු සාර්ථකව ඉටුකරනු ලැබ ඇත.

- මෙහෙයුම් සහ නඩත්තු අංශයට දැනට අනුයුක්ත කර සිටින කාර්ය මණ්ඩලය විසින් තරාපැවි කුළුනේ හතරැස් අඩිය ඉදිකිරීම ඇතුළුව, පන්නිපිටිය කොටුමා උපපොලෙහි 31.5MVA, කිලෝවෝල්ට් 132/33 නව විදුලි තරාපැවිය සවිකිරීම/ඉදිකිරීම, පරීක්ෂා කිරීම සහ සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ කිරීම
- කිලෝවොල්ට් 36, දෝෂ සහිත සැරිසිඳු අළුත්වැඩියා කර, කොලොන්නාවේ ස්ටැන්ලි කොටුමා උපපොලෙහි සවිකරනු ලැබිණි
- කැළණිතිස්ස, කිලෝවෝල්ට් 132 නව GIS පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම පරීක්ෂාවෙන් බලාසිටීම
- සීතාවක කොටුමා උපපොලෙහි දෝෂ සහිත ධාරා තරාපැවිය ප්‍රතිස්ථාපනය කිරීම
- කැළණිය කොටුමා උපපොලෙහි දෝෂ සහිත කිලෝවොල්ට් 132 සැරිසිඳු කණු ප්‍රතිස්ථාපනය කිරීම
- සපුගස්කන්දේ කිලෝවෝල්ට් 33 දෝෂ සහිත නියදඬු විභව තරාපැවි ප්‍රතිස්ථාපනය කිරීම
- බියගම කොටුමා උපපොලෙහි පරණ කිලෝවෝල්ට් 33 bays පාලන රැහැන් ඉවත්කර අළුත් රැහැන් සවිකිරීම
- කැළණිතිස්ස කිලෝවෝල්ට් 220 (220kV GIS) හි පරිපථ බිඳුම් යාන්ත්‍රණය අළුත්වැඩියා කිරීම සහ අවශ්‍ය කොටස් අළුතින් සවිකිරීම
- කොස්ගම කොටුමා උපපොලෙහි කිලෝවොල්ට් 33 සැරිසිඳු කණු ඉවත් කර ඒ වෙනුවට අළුත් සැරිසිඳු කණු සවි කිරීම
- හොරණ කොටුමා උපපොලෙහි ඉම්ඇඳනයේ බිඳුම් යාන්ත්‍රණය ප්‍රතිස්ථාපනය කිරීම
- එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීමේ ආරම්භක පියවරක් ලෙස, එවකට මෙහෙයුම් හා නඩත්තු අංශයට අනුයුක්ත ශ්‍රම බලකාය විසින් කොළඹ කලාපයේ කොටුමා උපපොලවල් වර්ණාලේප කිරීම

**මෙහෙයුම් හා නඩත්තු කටයුතු - මහනුවර ඒකකය**

කොටුමා උපපොලවල් හයක සියලු උපකරණයන් සම්බන්ධයෙන් වාර්ෂික නිවාරක නඩත්තු සහ 2012 වර්ෂය තුළ සිදු කිරීමට සැලසුම් කර තිබූ, කිලෝවෝල්ට් 220 සහ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගයන්හි, කිලෝ මීටර 670 ක් දුරට විහිදී තිබූ අතු ඉති කපා ඉවත් කිරීමේ කටයුතු ද සාර්ථකව සම්පූර්ණ කරනු ලැබීය. ඉහත දැක් වූ සාමාන්‍ය දෛනික කාර්යයන්ට අමතරව පහත සඳහන් විශේෂ කාර්යයන් ද, 2012 වර්ෂය තුළ සාර්ථකව ඉටු කරනු ලැබීය.

- බදුල්ල කොටුමා උපපොලෙහි අංක 1 සහ 2 දරණ ප්‍රධාන තරාපැවියේ කිලෝවෝල්ට් 33 පැති පරිපථ බිඳුම සවිකිරීම, පරීක්ෂා කිරීම හා සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ කිරීම. මෙහෙයුම් යාන්ත්‍රණයෙන් හා වාහේ ව්‍යුහයෙන් සකලාංග වූ කිලෝවෝල්ට් 36 ක Magrini Galileo SF6 පරිපථ බිඳුම යොදා ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. ඒ වන විට ක්‍රියාත්මකව තිබූ AGSAREP ව්‍යාපෘතිය මගින් මෙම බිඳුම් පරිපථ ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කොට තිබූ නමුත් තවත් දීර්ඝ කාලයක් සඳහා බදුල්ල කොටුමා උපපොලෙහි විශ්වාසනීයත්වය පිළිබඳ අපේක්ෂාවෙන් සිටීම යෝග්‍ය නොවන බැවින් සවිකොට තිබූ පරිපථ බිඳුම් කලින් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවීය.
- AGSAREP ව්‍යාපෘති කටයුතු සඳහා බදුල්ල කොටුමා උපපොලෙහි කිලෝවෝල්ට් 33 පැරණි වහරු අංගනය (switch yard) ඉවත් කිරීම පිණිස අවශ්‍ය වූ අතුරු බිඳුම් සඳහා පහසුකම් සැලසීමට පාලන රැහැන් ඇතුලු කිලෝවෝල්ට් 33 වෝල්ටීයතා (bus bar voltage) තාරාපැවිය විතැන් කිරීම ඇතුලුව අධි වෝල්ටීයතා උපකරණ ස්ථාපනය කිරීම සහ අඛණ්ඩ විදුලි සැපයුම තහවුරු කිරීම පිණිස තරාපැවි AVR පද්ධතිය ජාතික ජාලය හා සම්බන්ධ කිරීම සිදු කෙරිණි.
- සම්ප්‍රේෂණ මාර්ගයේ බරපතල දෝෂයක් නිසා බදුල්ල - අම්පාර විදුලි මාර්ගයේ කිලෝවෝල්ට් 132 පරිපථ බිඳුමේ y Phase කණුවේ තෙල් පීඩන සහන උපකරණය (pressure relief device) හරහා මුදාහරණු ලැබීය. 2012.08.14 දින සම්ප්‍රේෂණ මාර්ගයට කරන ලද කඩාකප්පල්කාරී ක්‍රියාවක් නිසා නැගෙණහිර පලාතේ විශාල කොටසක බරපතල විදුලිය ඇන හිටීමක් ඇති කරමින් මෙම දෝෂය සිදුවිය.මේ වන විට පැවති වෘත්තීය සමිති ක්‍රියාකාරකම් හේතුවෙන්, සම්පූර්ණ ශ්‍රම බලකාය සේවය සඳහා වාර්තා නොකළ නමුත් නිෂ්පාදකවරයාගේ නිර්දේශයන් අනුව අවශ්‍ය සියලුම පරීක්ෂා කිරීම් සහ නඩත්තු කටයුතු සිදුතිරීමෙන් පසු විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ඉංජිනේරුවන්ට හැකිවිය.



බදුල්ල - අම්පාර විදුලි සැපයුම් මාර්ගයේ කිලෝවෝල්ට්145 පරිපථ බිඳුමේ අලුත්වැඩියාවන්

## සම්ප්‍රේෂණ අංශය

- කලාපය තුළ, කිරිබත්කුඹුර, කුරුණෑගල සහ බදුල්ල යන කොටුමා උපපොලවල සවිකර තිබූ කිලෝවෝල්ට් 132 පැරණි ධාරා තරාපැවි 58 ක් ඒ වන විට වසර විසි හයකට වඩා පැරණි වීමත්, 2005 වාර්තා වූ සිද්ධීන් කිහිපයකදී පුපුරා යාහැකිව ඉඩ තිබූ නිසාත්, හැකි මුල්ම අවස්ථාවෙහි ප්‍රතිස්ථාපනය කළ යුතුව පැවතිණි. එසේ වුවත්, කලාපය තුළ පිහිටි කාර්යාලයන්හි දී, නිෂ්පාදකවරයාගේ නිර්දේශයන්ට තරමක් දුරට වෙනස් ආකාරයෙන්, වැඩි දියුණු කරනු ලැබූ විශේෂ නඩත්තු පිළිවෙත් ක්‍රියාත්මක කිරීම නිසා, කල්වේලා ඇතිව ප්‍රතිස්ථාපනය කළ යුතුව පැවති නමුත් ධාරා තරාපැවි තවදුරටත් සේවයේ පැවතිණි.
- කිරිබත්කුඹුර කොටුමා උපපොලෙහි තරාපැවි අංක 1 සහ තරාපැවි අංක 2 පරිවරණය අවක්‍රමණය වීමේ යටගියාවක් ඇති නිසා, ක්‍රියාකාරිත්වය ඇණහිටීමේ අවදානමක් පවතී. ගත වූ වසර කිහිපය තුළ ගන්නා ලද අධීක්ෂණ සහ පරිවරණ වර්ධනය කිරීමේ නඩත්තු කටයුතු කිහිපයකට අමතරව මෙම තරාපැවි දෙක භාවිතයට ගන්නා අතරතුරේම 2012 දී තෙල් පෙරීමේ චක්‍ර කිහිපයකයට භාජනය කරනු ලැබීය.
- බදුල්ල කොටුමා උපපොලෙහි තරාපැවි දෙකෙහි හානියට පත් තෙල් ආරක්ෂණයෙහි මයිනහම්වල තෙල් කාන්දුවක් සෑදී තිබිණි. තරාපැවි සවිකර ඇති ස්ථානයෙහි දී ඒවා අලුත්වැඩියා කිරීමට ගත් ප්‍රයත්නයන් සාර්ථක නොවූ බැවින් මුල් උපකරණ නිශ්පාදකයාගෙන් (OEM) වලින් ඇණවුම් කළ මයිනහම ලැබෙන තෙක් තෙතමනය ඇද ගැනීමේ හැකියාව අවම කිරීම පිණිස අතිරේක බ්‍රිදරයක් හඳුන්වා දෙමින් එහි සක්‍යතාව වැඩි කරමින් තරාපැවිය විබැරලීමට සලස්වනු ලැබිණි. මීට අමතරව, භාවිතා කරන අතරතුර මාර්ගගත පෙරුම් යන්ත්‍රාගාරය යොදා ගැනීමට ඇති හැකියාවට යටත්ව නැවත වරක් මෙම තරාපැවියේ තෙල් පෙරීමට ද කටයුතු කරනු ලැබීය.

බදුල්ල කොටුමා උපපොලෙහි තරාපැවි දෙකේ හානියට පත් තෙල් ආරක්ෂණයෙහි (conservator) අළුත්වැඩියා කටයුතු



බදුල්ල කොටුමා උපපොලෙහි තරාපැවි දෙකේ හානියට පත් තෙල් ආරක්ෂණයෙහි (conservator) අළුත්වැඩියා කටයුතු

- නුවරඑළිය කොටුමා උපපොලේ තරාපැවි අංක 1 සහ අංක 2 හි diverter switches of online tap changers අලුත්වැඩියා කරනු ලැබීය.
- තාවකාලිකව අධි වෝල්ටීයතා කිලෝවෝල්ට් 132 සහ කිලෝවෝල්ට්33 එළිමහන් සහ අභ්‍යන්තර (outdoor and indoor GIS) විදුලි බලය සම්බන්ධ කිරීමේ වැඩ පිළිවෙලවල්, විදුලි උපපොලෙහි විදුලි සම්ප්‍රේෂණ නවීකරණය සහ ස්වයංක්‍රීය වෝල්ටීයතා හසුරුවන පද්ධති නවීකරණය යනාදී විවිධ අන්තර් සම්බන්ධතා කටයුතු ක්‍රියාත්මක කරමින් බදුල්ල කොටුමා උපපොල, අම්පාර කොටුමා පොල සහ නුවරඑළිය කොටුමා උපපොල වර්ධනය කිරීමේ කටයුතුවලට බොහෝ සෙයින් මැදිහත් විය. ඉහත දැක්වූ කොටුමා උපපොලවල් සහ උකුවෙල කොටුමා උපපොල, විමලසුරේන්ද්‍ර කොටුමා උපපොල සහ මහියංගනයේ නව කොටුමා උපපොල හා ආශ්‍රිතව සිදු වූ මධ්‍යම විදුලි ජාලයට සම්බන්ධ කිරීමේ කටයුතු වලට අමතර වශයෙන් මෙම කටයුතු සිදු කෙරිණි.
- කිරිබත්කුඹුර සහ තුල්හිරිය කොටුමා උපපොලවල එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරිණි.

### ගාල්ල ඒකකයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු

- 2012 වර්ෂයේ දී, කොටුමා උපපොල දහයක සහ කිලෝමීටර 360 ක කිලෝවොල්ට් 132 සම්ප්‍රේෂණ රැහැනේ දිනපතා කෙරෙන/නිවාරක නඩත්තු කටයුතු වලට අමතරව, සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ, ගාලු කලාපයේ පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු ද සාර්ථකව නිම කර තිබිණි.
- ගාල්ල කොටුමා උපපොලෙහි අසමාන තලයේ වෝල්ටීයතාවන් පැවතීම නිසා පැවති තරාපැවි සමාන්තරකරණය කළ නොහැකි විය. නව ස්වයංක්‍රීය වෝල්ටීයතා හසුරුවන පිළියවනයක් අප විසින් සපයා ගනු ලැබූ අතර කිසිදු අතුරු බිඳීමකින් තොරව මෙම තරාපැවි තුන සමාන්තරකරණය කරනු ලැබීය. පැරණි තරාපැවි දෙක මත පැවති පීඩාවට මෙම කටයුත්ත මගින් සහනයක් සැළසිණි.
- 2011 වර්ෂයේ දී පුපුරා ගිය ගාල්ල-බලංගොඩ මාර්ගයේ පැරණි කිලෝවෝල්ට් 132 තෙල් සැරිසිඳු සවි කිරීම, පරීක්ෂා කිරීම සහ ජාතික ජාලයට සම්බන්ධ කිරීම .
- බලංගොඩ කොටුමා උපපොලෙහි තරාපැවි දෙකෙහි තෙල් ප්‍රතිචක්‍රීකරණය කිරීම
- බලංගොඩ කොටුමා උපපොලෙහි තරාපැවි අංක 2 හි රේඩියේටරයේ ඇසුරුමේ තෙල් කාන්දුව ප්‍රකෘතිමත් කිරීම
- හම්බන්තොට සහ ඇඹිලිපිටිය කොටුමා උපපොලවල දෝෂ සහිත එනවුන්සියේටර් පද්ධතිය ප්‍රකෘතිමත් කිරීම
- දෙනියාය කොටුමා උපපොලෙහි බොහෝ කාලයක් ප්‍රකෘතිමත් නොකර පැවති SAS දෝෂය නිවැරදි කිරීම
- ගාල්ල කොටුමා උප පොලෙහි ඉම කොටසේ දෝෂ සහිත කිලෝවොල්ට් 33 ධාරා තරාපැවි ප්‍රතිස්ථාපනය
- මතුගම කොටුමා උපපොලෙහි අංක 1 දරණ පෝෂකයේ දෝෂ සහිත කිලෝවොල්ට් 33 සැරිසිඳු යාන්ත්‍රණයන්ගෙන් එකක් ප්‍රතිස්ථාපනය කරනු ලැබීය.
- විදුලිය බිඳ වැටීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාණ්ඩායම්, මතුගම කොටුමා උපපොලෙහි සහ හම්බන්තොට කොටුමා උපපොලෙහි නිර්මාණය කිරීම.
- මතුගම කොටුමා උපපොලෙහි බිම් ගැන්නු තරාපැවියේ තෙල් කාන්දුව නිවැරදි කිරීම.

### අනුරාධපුර ඒකකය - මෙහෙයුම් සහ නඩත්තු කටයුතු

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ අනුරාධපුර කලාපය, 2012 වසර තුළ, කොටුමා උපපොලවල් 10 ක සාමාන්‍ය දිනපතා කෙරෙන/නිවාරන නඩත්තු කටයුතුවලට අමතරව, පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු සහ කිලෝ මීටර් 900 ක් දුර කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගයේ රැහැන් වෙත යොමුවූ කොළ අතු කපා ඉවත් කිරීම සාර්ථකව නිම කරනු ලැබ ඇත.

# සම්ප්‍රේෂණ අංශය

- බෝලවත්ත කොටුමා උපපොලෙහි කිලෝවෝල්ට් 132 සහ කිලෝවෝල්ට් 33 සියලුම පරිපථ බිඳිනයන් පරීක්ෂා කරනු ලැබිය.
- හබරණ කොටුමා උපපොලෙහි ධාරිත්‍රක බැංකුවේ සෑම ධාරිත්‍රකයකම ධාරණාව මිණුම් ගත කරනු ලැබීය.
- පන්නල කොටුමා උපපොල කාර්යාලයේ එස් 5 සංකල්පය ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර ඒ සඳහා කුසලතා සම්මානයක් හිමිකර ගනු ලැබ ඇත.
- වාලච්චේන කොටුමා උපපොලෙහි පාලන ගොඩනැගිල්ල නවීකරණය කරනු ලැබීය.
- මුළු කලාපයේම අමතර කොටස් ඇතුලත්ව, ද්‍රව්‍ය රැස් කර තැබීම සඳහා අනුරාධපුර නව කොටුමා උපපොලෙහි, ගබඩා ගොඩනැගිල්ල ගොඩනගනු ලැබ ඇත.

## සජීව මාර්ග නඩත්තු ඒකකය

2012 වර්ෂය තුළ, තිස්සමහාරාම සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තු ශාඛාවේ සජීව මාර්ග නඩත්තු අංශය මගින්, කිලෝමීටර් 650 දුර කිලෝවෝල්ට් 220 සහ කිලෝමීටර් 2,300 දුර කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගයන්හි සාමාන්‍ය දිනපතා කෙරෙන/නිවාරණ නඩත්තු කටයුතුවලට අමතරව, පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු සාර්ථකව සම්පූර්ණ කරනු ලැබ ඇත.

- බෝලවත්ත - පුත්තලම සම්ප්‍රේෂණ මාර්ගයේ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගයේ, කුළුණු අංක 2 හා කුළුණු අංක 6 සහ කුළුණු අංක 210 හා කුළුණු අංක 216 අතර පරතරයන්හි බිම් සංනායකය ප්‍රතිස්ථාපනය කරනු ලැබීය.
- අනුරාධපුර කොටුමා උපපොලෙහි මීටර් 70 ක් දිග බස්බාර් සහ මීටර් මීටර 18 ක් දිග බස්බාර් හතරක් ඔසවා සවිකරනු ලැබීය.
- පස්සර ප්‍රදේශයේ පැවති සුළි සුළඟක් හේතුවෙන් කිලෝවෝල්ට් 132 බදුල්ල - ඉඟිනියාගල සම්ප්‍රේෂණ මාර්ගයේ ඇද වැටුණු අංක 161 දරණ කුළුණ, එය පිහිටා තිබූ ස්ථානයේ සිට කොටසින් කොටස ඉවත් කරනු ලැබීය. එසේ ඉවත් කිරීමට පෙර තාවකාලිකව අම්පාර දක්වා විදුලිය සැපයුම යථා තත්ත්වයට පත් කරනු ලැබූ අතර අත්තිවාරම් වැඩ නිම කිරීමෙන් පසු කුළුණ නැවත ඉදිකරණු ලැබ පිරියවන අමුණනු ලැබීය. අංක 194 සිට අංක 196 දක්වා කලා පිරියවන ප්‍රකෘතිමත් කරනු ලැබිණි.
- වියලි සහ සුළං සහිත කාලයේ, කිලෝවෝල්ට් 220 නොරොච්චෝලේ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ගයේ, ලුනු තැන්පත්වීම නිසා කුළුණු අංක 1 සිට කුළුණු අංක 50 දක්වා පරිවාරකයේ පිටිසැණෙලීම වැළැක්වීම සඳහා සජීව මාර්ග නඩත්තු කාණ්ඩායම් 10 යේ සියලු සේවකයින් යොදවා නිතර සෝදනු ලැබීය.
- ව්‍යාපෘති කළමනාකරු (VKTP) ගේ ඉල්ලීම පරිදි HLM ඒකකය මගින් අලුතින් ඉදිකරනු ලැබූ, කිලෝවෝල්ට් 132 වව්නියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ මාර්ගය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරනු ලැබ දෝෂ ලැයිස්තු ගත කර ව්‍යාපෘතිය වෙත යවනු ලැබීය.
- 31.5MVA නව තරාපැවිය පන්නිපිටිය කොටුමා උපපොලෙහි බිම් තලයට ඇද ගෙන ගොස් තැබීම සඳහා HLM ඒකකයට ආධාරක සේවා සපයනු ලැබීය.
- බලාගාරයේ අභ්‍යාසලාභීන්ට සජීව රැහැන් මෙහෙයුම් පිළිබඳව පුහුණු සැසි පවත්වනු ලැබීය.

## 2012 වර්ෂය තුළ ආරක්ෂක නඩත්තු හා සේවා ඒකකය මගින් සිදු කරන ලද විශේෂ නඩත්තු කටයුතු

1. සංඛ්‍යාංක පිළියවනයන් යොදා ගනිමින්, නව ලක්ෂපාණ විදුලි බලාගාරයේ පැරණි විද්‍යුත් යාන්ත්‍ර දුරස්ථ ආරක්ෂන පිළියවනයන් (L3Wyas) ප්‍රතිස්ථාපනය කිරීම.

   අ. නව ලක්ෂපාණ - බලංගොඩ කිලෝවෝල්ට්132 මාර්ගය අංක 1 සහ අංක 2
   ආ. නව ලක්ෂපාණ - පොල්පිටිය කිලෝවෝල්ට්132 මාර්ගය අංක 1 සහ අංක 2
   ඇ. නව ලක්ෂපාණ - කැනියොන් කිලෝවෝල්ට්132 මාර්ගය



නව ලක්ෂපාණ කොටුමා උපපොලෙහි සම්ප්‍රේෂණ මාර්ග රැකවරණය සඳහා අලුතින් සවි කළ සංඛ්‍යාංක පිළියවනයන්

2 සපුගස්කන්ද තරාපැවිය අංක 2, දෝෂ සහිත තරාපැවිය වෙනුවට නව තරාපැවිය ප්‍රතිස්ථාපනය කරමින් ආරක්ෂණ උපක්‍රමය ජාතික ජාලයට සම්බන්ධ කිරීම

3 2012 ජුනි මාසයේදී ආරක්ෂණ සහ මධ්‍යගත සේවාවන් ස්ථාපනය කරණු ලැබූ අතර සම්ප්‍රේෂණ කොටුමා උපපොලවල ස්ථානගත කළ විදුලි තරාපැවි සහ මධ්‍යගත සේවාවක් ලෙස රට පුරා විවිධ ව්‍යාපෘති යටතේ ලැබෙන තරාපැවි වෙනුවෙන් විදුලි තරාපැවි තත්ව අධීක්ෂණ වැඩපිළිවෙල පවත්වා ගෙන යාම ආරම්භ කෙරිණි.
2012 වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ පහත දැක්වෙන තරාපැවි පරීක්ෂා කර දත්ත රැස්කරනු ලැබීය.

   අ. සීතාවක අංක 1 හා 3 (නව) විදුලි තරාපැවි
   ආ. නුවරඑළිය කොටුමා උපපොලෙහි අංක 3 තරාපැවිය
   ඇ. රත්මලාන කොටුමා උපපොලෙහි අංක 2 හා 3 පවත්නා තරාපැවි
   ඈ. පන්නිපිටිය කොටුමා උපපොලෙහි අංක 1 නව තරාපැවිය

4. 2012 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ප්‍රධාන ආරක්ෂන නඩත්තු කාර්යයන්

# සම්ප්‍රේෂණ අංශය

| කොටුමා උපපොළ | බලාගාරය පිහිටීම | කාර්යය |
|---|---|---|
| කොස්ගම-කොටුමා උපපොළ | කොලොන්නාව මාර්ගය | දෝෂ සහිත TOSHIBA වර්ගයේ දුරස්ථ රැකවරණ පිළියවනය ඉවත් කර සංඛ්‍යාත්මක IED (MiCOM P545) ප්‍රතිස්ථාපනය කළා |
| අ.පුර පැරණි කොටුමා උපපොළ | පුත්තලම 02 හබරන 02 | පැරණි (L3Wyas) වර්ගයේ දුරස්ථ රැකවරණ පිළියවනය ඉවත් කර සංඛ්‍යාත්මක IEDs (MiCOM P545, REL 316)ප්‍රතිස්ථාපනය කළා |
| බදුල්ල කොටුමා උපපොළ | අම්පාර මාර්ගය | පැරණි (RAZOA) වර්ගයේ දුරස්ථ රැකවරණ පිළියවනය ඉවත් කර සංඛ්‍යාත්මක IED (MiCOM P442) ප්‍රතිස්ථාපනය කළා |
| සපුගස්කන්ද කොටුමා උපපොළ | තරාපැවිය 02 | ප්‍රධාන රැකවරණ පිළියවනය ඉවත් කර 7UT 613 ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු තරාපැවිය ජාතික ජාලයට සම්බන්ධ කිරීම |
| බියගම කොටුමා උපපොළ | කොත්මලේ 01 | දෝෂ සහිත RAZFE වර්ගයේ දුරස්ථ රැතවරණ පිළියවනය ඉවත් කර සංඛ්‍යාත්මක IEDs (Siemens 7SA522) ප්‍රතිස්ථාපනය කළා |

### ජනන සැලසුම්කරණය

- ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන ප්‍රසාරණ සැලැස්ම යනු සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් ශාඛාව යටතේ ඇති ජනන සැලසුම් අංශය මගින් විදුලිබල සැලසුම් මෙවලම් හා ශිල්පක්‍රමයන්හි නව්‍ය සංවර්ධන තත්වය උපයෝගී කරමින්, වසර විසිපහක කාලයක් සඳහා සෑම දෙවසරකටම වරක් පිළියෙල කරනු ලබන තාවකාලික සැලැස්මකි.
- මෙම අංශය මගින් ජාතික ඉල්ලුම් පුරෝකථනය පිළියෙල කරයි. අපේක්ෂිත විශ්වසනීයතා මට්ටම සහ පාරිසරික සාධක ඇතුළත, අවම පිරිවැය විසඳුම් සහිත ආර්ථිකමය වශයෙන් ඉතාම යෝග්‍ය බලාගාර නවාංගයන්, තාප සහ ජල විදුලිබල උත්පාදන ප්‍රසාරණ ඉල්ලුම්කරුවන් වෙතින් ජනන සැලසුම් අධ්‍යයනයන් මගින් තෝරාගනු ලබයි. නවතම ජනන ප්‍රසාරණ සැලසුම් අධ්‍යයනයන්ට අනුව, 2013 - 2032 කාලය සඳහා ඉදිරි 15 වසරක කාලය තුළ, ගල්අඟුරු දහන විදුලි බලාගාර වලින් උත්පාදනය කෙරෙන මෙගාවොට් 4,700 විදුලිබලයක් ඇතුළුව ආසන්න වශයෙන් මෙගාවොට් 6,025 ක අතිරේක විදුලිබලයක්, පද්ධතියට එකතු විය යුතු බව අපේක්ෂා කරයි.
- යෝජිත ජනන ව්‍යාපෘතීන් සඳහා මූලික අධ්‍යයනයන්ගෙන් අරඹා විස්තරාත්මක සක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම දක්වා වන විවිධ අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීමේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිරූපය ලෙස, ජනන සැලසුම්කරණ අංශය කටයුතු කරයි.
- මේ සම්බන්ධයෙන්, අනාගත ජනන ප්‍රසාරණ විකල්පයන් ලෙස බොහෝ අධ්‍යයනයන් හා ක්‍රියාමාර්ගයන් ආරම්භ කරනු ලැබීය. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියේ තාක්ෂණික සහයෝගය ඇතිව, ජනන සැලසුම්කරණ අංශය මගින් ''න්‍යෂ්ටික බලය හා මානව සම්පත් සංවර්ධනය සඳහා උපස්ථම්භක බලශක්ති සැලසුම් හා පූර්ව-සක්‍යතා අධ්‍යයනය'' පිළිබඳව ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.
- ජපාන අන්තර් ජාතික සහයෝගිතා ආයතනයේ ආධාරය ඇතිව ''ඉහළම බලශක්ති ඉල්ලුම සඳහා ප්‍රශස්ත බලශක්ති උත්පාදනය කෙරෙහි සංවර්ධන සැලසුම්කරණය'' පිළිබඳව සක්‍යතා අධ්‍යයනයක් 2012 දී ආරම්භ කළ අතර 2014 දී එම අධ්‍යයනය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.
- දකුණු ප්‍රදේශයේ මෙගාවොට් 4×300 ගල්අඟුරු විදුලිබල සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති සංකල්පයක් ජපාන රජය වෙත ඉදිරිපත් කළ අතර ව්‍යාපෘතිය සඳහා පූර්ව සක්‍යතා අධ්‍යයනයන් 2013 දී ආරම්භ කෙරෙනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික ආධාර යටතේ, පුනර්ජනනීය බලශක්ති මහා සැලැස්ම සකස් කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.
- බලශක්ති විවිධාංගීකරණය වර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (LNG සඳහා සක්‍යතා අධ්‍යයනය) දෙවන අදියර සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්කරණ ශාඛාව යටතේ ආරම්භ කරනු ලැබීය.
- අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල මගින් අරමුදල් සපයන ලද, මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිය සඳහා පරිසර බලපෑම් තක්සේරුව සම්පූර්ණ කරන ලද අතර ව්‍යාපෘති අනුමත කිරීමේ ඒජන්සි ආයතනය මගින් 2013 දී එය අනුමත කරනු ලැබීය. තව ද, ආසියානු සංවර්ධන බැංකුව මගින් සපයන ලද අරමුදල් භාවිතයෙන් සිදුකෙරෙන, සක්‍යතා සමාලෝචනය සහ විස්තරාත්මක සැලැස්ම හා ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම, 2012 වර්ෂයේ දී ආරම්භ කෙරිණි.

### සම්ප්‍රේෂණ සැලසුම්කරණය

- සම්ප්‍රේෂණ පද්ධතියේ නව අවශ්‍යතා සහ ඉල්ලුම සපුරාලනු පිණිස දස අවුරුදු තාවකාලික සැලැස්මක් ලෙස, දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන අධ්‍යයනයන් සිදු කරමින් පවතී. සම්ප්‍රේෂණ සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණු වනුයේ, සැලකිලිමත් වන සැලසුම්කරණ කාලය සඳහා විශ්වාසනීය සහ ස්ථාවර විදුලි පද්ධතියක් පැවතීම සහතික කිරීම සහ මෙම සම්ප්‍රේෂණ විකාශනයන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන්නාවූ පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා අවශ්‍ය වන සම්ප්‍රේෂණ සංවර්ධන වැඩපිළිවෙලක් සකස් කිරීමයි.
- 2013 - 2022 දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම මගින් 2014 - 2022 කාලය සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති පනස් දෙකක් හඳුනාගෙන ඇත. ඉහළ ප්‍රමුඛත්වයක් සහිත ව්‍යාපෘති කිහිපයක් සඳහා අරමුදල් ලබා ගැනීමේ කටයුතු, ජපාන අන්තර් ජාතික සහයෝගිතා ඒජන්සිය සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි ණය දෙන ආයතන සමග පිළියෙල කරනු ලැබ ඇත.

## සම්ප්‍රේෂණ අංශය

- ජපාන අන්තර් ජාතික සහයෝගිතා ඒජන්සියේ අරමුදල් අපේක්ෂාවෙන් පෙළ ගැසී ඇති ව්‍යාපෘතීන්ට, කිරිඳිවැල කිලෝවෝල්ට් 220/132 වහරු අංගනය සහ කිලෝවෝල්ට් 220/132 කොටුමා උපපොළ, වේයන්ගොඩ-කිරිඳිවැල-පාදුක්ක කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය, පොල්පිටිය-කොත්මලේ කිලෝවෝල්ට් 220 නව සම්ප්‍රේෂණ මාර්ගය, වේයන්ගොඩ-තුල්හිරිය කි.වො.132 සම්ප්‍රේෂණ මාර්ගය, කෙරවලපිටිය කිලෝවෝල්ට් 220/33 කොටුමා උපපොළ, බත්තරමුල්ල කිලෝවෝල්ට් 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම සහ පොල්පිටිය-හබරන-කොලොන්නාව-පන්නිපිටිය සහ රත්මලාන-පන්නිපිටිය යන තවත් සම්ප්‍රේෂණ මාර්ග කිහිපයක් නැවත ඉදිකිරීම ඇතුලත්වේ.

- ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයීමට යෝජිතව ඇති ව්‍යාපෘති වනුයේ, අනුරාධපුර කිලෝවෝල්ට් 220/132 පැරණි කොටුමා උපපොළ වර්ධනය කිරීම, කටුනායක කිලෝවෝල්ට් 220/132 කොටුමා උපපොළ වර්ධනය කිරීම, කල්පල්තුරෙයි කිලෝවෝල්ට් 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම, මන්නාරම-නදුකුඩා කි.වො.132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සහ නදුකුඩා කොටුමා උපපොළ ඉදිකිරීම, කැස්බෑව කිලෝවෝල්ට් 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම හා හම්බන්තොට කිලෝවෝල්ට් 220 වහරු අංගනය ඉදිකිරීම සහ පොල්පිටිය-හම්බන්තොට කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමත්ය.

- තව ද, පුනර්ජනනීය බලශක්තිය වඩාත් අවශෝෂණය කර ගැනීම සඳහා, මාලිබොඩ, වේවැල්වත්ත, රාගල සහ නාවලපිටිය යන කොටුමා උපපොළවල් ඉදිකිරීම පිණිස මුදල් යෙදවීම සම්බන්ධයෙන් ප්‍රංශ සංවර්ධන ඒජන්සිය සමග සාකච්ඡා පැවැත්වෙමින් තිබිණි.

### සම්ප්‍රේෂණ සැලසුම් නිර්මානය කිරීම සහ පරිසරය

සැලසුම්ගත සම්ප්‍රේෂණ සංවර්ධනයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රාථමික කාර්යයන්, සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාන සහ පරිසර ශාඛාවේ සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාන ඒකකය මගින් ක්‍රියාවට නංවයි. සම්ප්‍රේෂණ රැහැන් ඇදීම සඳහා සුදුසු මං තීරු සහ උපපොළවල් ඉදිකිරීම සඳහා භූමිය හඳුනා ගැනීම, ඉංජිනේරු සැලසුම් සුදානම් කිරීම සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලේඛන කෙටුම්පත් කිරීම යන කටයුතුවලින් මෙය සමන්විතවේ. ක්‍රියාත්මක කිරීමේ අදියර තුළදී, ඉදිකිරීම් සැලසුම් විමර්ෂණය කිරීම, ද්‍රව්‍ය සහ උපකරණවල තාක්ෂණ අනුකූලතාව පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව, ඉල්ලා සිටි අවස්ථාවකදී, සැලසුම් නිර්මාන කටයුතු සම්බන්ධයෙන් සම්ප්‍රේෂණ අංශයේ අභ්‍යන්තර උපදේශකයන්ගේ කාර්යයභාරය, සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාණ ඒකකය මගින් ඉටු කරයි.

### සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාණ

සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාණ ශාඛාව මගින් පවරා ගනු ලැබූ වැඩකටයුතු පහත දැක්වෙන පරිදි වේ.

යට දැක්වෙන ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලේඛන පිලියෙල කිරීම.

CENEIP පැකේජය 1 කොටස A" CENEIP පැකේජය 1 කොටස B, CENEIP පැකේජය 2, කොටස C)1 CENEIP පැකේජය 2 කොටස C)2, CENEIP පැකේජය 3 - කොටස ඊ, CENEIP පැකේජය 2 කොටස B, CENEIP පැකේජය 2 Lot C" CENEIP පැකේජය 3 A කොටස, ECCFPP - කොටස B සහ ECCFPP - නැගෙණහිර වෙරළබඩ ගල් අඟුරු දහන විදුලිබල ව්‍යාපෘතිය කොටස A.

ඉදිකිරීම් නිර්මාණ මගින්, ඊසාන දිග විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, කොටස A, කොටස B සහ කොටස C, ගාල්ල නව සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය කොටස A කොටස B, ජාතික පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය - පැකේජය B, කිලිනොච්චි-චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, වව්නියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ කොටුමා උපපොළ ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීමේ නැගෙණහිර පලාත් ව්‍යාපෘතිය, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අවශෝෂණය කර ගැනීම සඳහා කොටුමා උපපොළවල් වර්ධනය කිරීම සහ නොරොච්චෝලේ උකහා ගැනීමේ මධ්‍යස්ථානය විමර්ෂණය කෙරෙයි.

මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අඩු කර ගැනීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ සූරියවැව කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා ඉංජිනේරු නිර්මාණ සැලසුම් වාර්තා සකස් කිරීම සිදු කරනු ලැබීය.

### ආරක්ෂන ප්‍රවර්ධනය

### විශ්වසනීයතාව

සම්ප්‍රේෂණ සැලසුම් නිර්මාණ සහ පරිසර ශාඛාවේ ආරක්ෂන ප්‍රවර්ධන අංශයේ ඉලක්කය වනුයේ, විදුලි බලාගාරවල සිට සම්ප්‍රේෂණ පද්ධතිය කරා ඉහළම ජාත්‍යන්තර සම්මතයන්ට අනුව, සමායෝජිත හා විශ්වාසනීය ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීමයි. ආරක්ෂන තත්ව විචාරය (Protection Philosophy) නියම කිරීම හා පවත්වා ගෙන යාම සහ පද්ධතියේ ආරක්ෂන පුනරුත්ථාපන හා සංවර්ධන අවශ්‍යතාවන් හඳුනාගැනීම, අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ. නව සම්ප්‍රේෂණ ව්‍යාපෘති යටතේ, රැකවරණ සංවර්ධන කටයුතු පාලනය කිරීම, මෙම අංශයට පවරනු ලැබ ඇත. නව ව්‍යාපෘති යටතේ, ජාලක පුළුල් කිරීමේ කටයුතුවල කොටසක් ලෙස, ආරක්ෂන වැඩසටහනේ නවීකරණයන් ද සිදු කරනු ලැබීය.

### බිඳවැටීම් විශ්ලේෂණය

සම්ප්‍රේෂණ පද්ධතියේ සම්පූර්ණ ලෙස හෝ අඩ වශයෙන් ඇතිවන බිඳවැටීම් පිළිබඳව ද, මෙම අංශය මගින් බිඳ වැටීම් විශ්ලේෂණයන් සිදු කරන අතර පද්ධතියේ විශ්වසනීයතා ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා, ප්‍රතිකාරක හෝ නිවාරක ක්‍රියා මාර්ගයන් ද ක්‍රියාවට නංවයි.

### ලංවිම භාරගත් ව්‍යාපෘති වැඩ

ලංකා විදුලිබල මණ්ඩල ව්‍යාපෘති සඳහා ආරම්භ කර ඇති වැඩ කටයුතු යාපනය කලාපීය සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතියේ විදුලි සැපයුම් පුනරුත්ථාපනය යටතේ, ලංකා විදුලිබල මණ්ඩලයේ කිවො 220 සම්ප්‍රේෂණ ජාලයේ, ආරක්ෂන වැඩසටහන පුනරුත්ථාපනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට, ජර්මනියේ KFW බැංකුවෙන් අරමුදල් ලැබී ඇත. ජර්මනියේ FitchnerGmbH ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවාවන් සපයයි.

මෙම ව්‍යාපෘතියේ විෂය පථය වනුයේ, බියගම කොටුමා උපපොළ, කොත්මලේ විදුලි බලාගාරය, වික්ටෝරියා විදුලි බලාගාරය, රන්ටැඹේ විදුලි බලාගාරය හා අනුරාධපුර නව කොටුමා උපපොළෙහි දැනට ඇති කිවො 220 සම්ප්‍රේෂණ රැහැන්වල ආරක්ෂන වැඩසටහන් හා තරාපැවි ප්‍රතිස්ථාපනය කිරීම සහ බියගම-කැළණිය, කොත්මලේ-වික්ටෝරියා, වික්ටෝරියා-රන්දෙනිගල සහ රන්දෙනිගල-රන්ටැඹේ කි.වො. 220 සම්ප්‍රේෂණ මාර්ගයන්හි දෘශ්‍ය විදුලි භූ තන්තු ස්ථාපනය කිරීමයි.

## සම්ප්‍රේෂණ අංශය

දෘශ්‍ය විදුලි භූ තන්තු ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2012 මැයි මාසයේදී ප්‍රදානය කරනු ලැබූ අතර එය 2013 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට නියමිතය. තව ද ආරක්ෂණ පනේල ප්‍රතිස්ථාපන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර එය 2014 මැයි මාසයේ දී සම්පූර්ණ කිරීමට නියමිතය.

අළුත් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා ආරක්ෂන විෂය පථය හඳුනා ගැනීම, තාක්ෂණික පිරිවිතර පිළියෙල කිරීම, ව්‍යාපෘති ආශ්‍රිත විදුලි සම්ප්‍රේෂණ ජාලගත කිරීමේ කටයුතු අධීක්ෂණය සහ පවත්නා විදුලි පද්ධතියට නව ව්‍යාපෘති ඒකාබද්ධ කිරීම ද 2012 වර්ෂය තුළ ආරක්ෂන ප්‍රවර්ධන අංශය මගින් ක්‍රියාවේ යොදවන ලද ව්‍යාපෘති කටයුතුවලට ඇතුළත්විණි. සම්පූර්ණ කර ඇති සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා සමහරක් පහත දැක්වේ.

1. ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය
2. බෙලිඅත්ත කොටුමා උපපොල ව්‍යාපෘතිය
3. පුනර්ජනනීය ව්‍යාපෘතියේ දෙවනි අදියර අවශෝෂණය කිරීම සඳහා කොටුමා උපපොල වර්ධනය කිරීම
4. ඊසාන දිග විදුලිබල සම්ප්‍රේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය
5. වවුනියා - කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

### වෙනත් ක්‍රියාකාරකම්

කිරිබත්ගොඩ කොටුමා උපපොල, අනුරාධපුර පැරණි කොටුමා උපපොල, අනුරාධපුර නව කොටුමා උපපොල, පොල්පිටිය කොටුමා උපපොල සහ කොටුගොඩ කොටුමා උපපොලෙහි දෝෂ සහිත රැහැන් ආරක්ෂණ පිළියවනයන් ප්‍රතිස්ථාපනය සඳහා සැළසුම්වල හරි වැරදි බැලීම්, සැළසුම් පිළියෙල කිරීම හා ගණනයන් සැකසීම සිදු කරනු ලැබූ අතර රත්නපුරය, නුවරඑළිය, මාතර සහ සීතාවක කොටුමා උපපොලවල දෝෂ මට්ටම ඉහළනැංවීම සඳහා (to increase the fault level) සම්බන්ධීකරණයන් ඇති කිරීම සිදු කරනු ලැබීය.

### බලශක්ති මිලදී ගැනීම්

පද්ධති ඉල්ලුම සපුරාලීම පිණිස, පෞද්ගලික විදුලිබල නිෂ්පාදකයන් වෙතින්. ප්‍රශස්ත මිල ගණන් යටතේ විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් බලශක්ති මිලදී ගැනීමේ ශාඛාව වගකිව යුතුය. මෙම ශාඛාව යටතේ පාලනය කරනු ලැබූ ප්‍රධාන විදුලි බලාගාර වර්ග දෙකක් වනුයේ,

- ස්වාධීන විදුලිබල නිෂ්පාදනයින්(IPP)
- සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනාගාර

ලංකා විදුලිබල මණ්ඩලයට මෙගාවොට් 775 ක මුළු තාප විදුලිබලයක් සපයන ස්වාධීන විදුලිබල නිෂ්පාදනයින් හත් දෙනෙක් ඇති අතර මෙගාවොට් 320 ක මුළු ධාරිතාවක් සහිත සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 123 ක් ශ්‍රී ලංකාවේ ඇත.

### ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්

| විදුලි බලාගාරය | ධාරිතාව (මෙවො) |
|---|---|
| AES කැළණිතිස්ස | 163.50 |
| හෙළදනව් | 100.00 |
| ACE පවර් (ඇඹිලිපිටිය) | 100.00 |
| සීස. කළම්බො පවර් (පුද්ගලික) | 60.00 |
| ඒසියා පවර් (Asia Power) | 51.00 |
| නොදර්න් පවර් (Nothern Power) | 30.00 |
| කෙරවලපිටිය | 270.00 |
| **එකතුව** | **774.50** |

විදුලිබල මිලදීගැනීම් ගිවිසුම්වලට ඇතුළත්වී සිටින සහ වාණිජ මෙහෙයුම්වල නියැලී සිටින පෞද්ගලික විදුලිබල නිෂ්පාදකයින් සඳහා වන සියලුම ගෙවීම්, බලශක්ති මිලදීගැනීම් ශාඛාවෙන් සිදු කරයි.

### සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර

මෙගාවොට් 10 ට අඩු ධාරිතාවක් ඇති, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා පහත දැක්වෙන ආකාරයේ අයකුම කාණ්ඩ දෙකක් යටතේ ගෙවීම් කරනු ලබයි.

- පිරිවැය පදනම් කරගත් තාක්ෂණ විශේෂී ස්ථර තුනේ අයකුමය (Cost Based Technology Specific Three Tier Tariff)
- අත්හළ පිරිවැය පදනම් කරගත් අයකුමය (Avoided Cost Based Tariff)

### කුඩා ජලවිදුලි බලාගාර සංවර්ධනය

2012 වර්ෂය තුළ, මුළු ධාරිතාවය මෙගාවොට් 30 ක් වන, කුඩා ජල විදුලිබල ව්‍යාපෘති දහ අටක් ජාතික විදුලි ජාලකයට සම්බන්ධ කරනු ලැබ ඇත. වර්ෂයේ අවසානය වන විට, කුඩා ජල විදුලි බලාගාර 107 ක ප්‍රධාන ජාලයට සම්බන්ධ කළ මුළු ස්ථාපිත ධාරිතාවය මෙගාවොට් 234 කට ආසන්න විය. සමස්ථ විදුලිබල උත්පාදනය ගිවොපැ 563 ක් විය. ලංකා විදුලිබල මණ්ඩලය වසර අවසාන වන විට, සමස්ථ ධාරිතාවය මෙගාවොට් 171 ක් වූ ප්‍රමිතිගත (Standardized) විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් 76 කට එළඹී තිබිණි.



දෙනවක ගඟ විදුලි බලාගාරය - කුඩා ජල විදුලිබල ව්‍යාපෘතිය

# සම්ප්‍රේෂණ අංශය

### ජෛව ස්කන්ධ විදුලිබල සංවර්ධනය

ජෛව ස්කන්ධ විදුලි බලාගාර ප්‍රධාන වර්ග තුනකින් යුක්තවේ. උදාහරණ Dendro, මහනගර සභා අපද්‍රව්‍ය සහ කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය ජෛව ස්කන්ධ විදුලිබල ව්‍යාපෘතීන්ට අදාළව, මෙගා වොට් 11.5 ක මුළු ධාරිතාවයකින් යුත් කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය විදුලි බලාගාර දෙකක් සහ එක් ඩෙන්ඩ්‍රෝ විදුලි බලාගාරයක් ජාතික විදුලි ජාලයට සම්බන්ධ කරනු ලැබ ඇත. මුළු විදුලිබල උත්පාදනය ගිවොපැ 22ක් විය. වසර අවසන් වන විට, මුළු ධාරිතාව මෙගාවොට් 75 ක් වන ප්‍රමිතිගත (Standardized) විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් 14 කට ලංකා විදුලිබල මණ්ඩලය එළඹී තිබිණි.



ටොකියෝ ජෛව ස්කන්ධ (වී පොතු) විදුලිබල ව්‍යාපෘතිය

### සුළං විදුලිබල සංවර්ධනය

2012 වසර තුළ දී, සම්පූර්ණ ධාරිතාවය මෙගාවොට් 30 කින් සමන්විත සුළං විදුලිබල ව්‍යාපෘති තුනක් ජාතික විදුලිබල ජාලයට සම්බන්ධ කරනු ලැබ තිබිණි. සමස්ථ විදුලිබල උත්පාදනය ගිවොපැ 143 ක් විය. වසර අවසානය වන විට, සම්පූර්ණ ධාරිතාවය මෙගාවොට් 72 ක් වූ සුළං විදුලි බලාගාර නවයක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරනු ලැබ තිබිණි. මුළු ධාරිතාවය මෙගාවොට් 21 ක් වන, ප්‍රමිතිගත (Standardized) විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් 4 කට ලංකා විදුලිබල මණ්ඩලය අත්සන් තබා තිබිණි. ඉහත දැක්වූ සුළං බලාගාර දැනට ඉදි කෙරෙමින් පවතී.




**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2012.12.31 දිනට**




**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලින් වූ බලශක්ති දායකත්වය**

### බලශක්ති අලෙවිය

සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර පවත්නා විදුලිබල සම්ප්‍රේෂණ පද්ධතියට අනුකූලව බලශක්ති අලෙවි ශාඛාව, 2010 දී නැවත ක්‍රියාත්මක කරනු ලැබීය. අයක්‍රම සකස් කිරීමේ දී, ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශය වෙනුවෙන්, බලශක්ති අලෙවි ශාඛාව, ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග ක්‍රියාකාරීව සහයෝගය දක්වනු ලැබුවාය.

2011 වර්ෂයේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තොග සැපයුම් නව අයක්‍රම හඳුන්වා දීමත් සමග බෙදාහැරීමේ බලපත්‍ර හතරකට (Distribution Licensees) හා සීමා සහිත ලංකා විදුලි පෞද්ගලික සමාගමට විදුලිබලය විකිණීම සඳහා තොග සැපයුම් සම්ප්‍රේෂණ ගිණුම් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ බලපත්‍ර හතරකට (Distribution Licensees) සම්ප්‍රේෂණ සටහන් පිළියෙල කිරීමටත් බලශක්ති අලෙවි ශාඛාවට පවරනු ලැබීය. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් බෙදාහැරීමේ බලපත්‍ර වෙත සම්ප්‍රේෂණය කළ විදුලිබල ප්‍රමාණය වාර්තා කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ මායිම් සහ බෙදාහැරීම් බලපත්‍රලාභියාගේ මායිම් හරහා සවිකිරීම පිණිස, 0.2 නිරවද්‍යතා පංතියේ නව බලශක්ති මීටර ලබා දෙනු ලැබූ අතර සවිකිරීම් කටයුතු බොහෝ දුරට නිම කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මග පෙන්වීම් අනුව, සම්ප්‍රේෂණ අංශය තුළ, මනු පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබ ඇත.

## සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ අංශයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත සෑම මාසයකම සම්ප්‍රේෂණය කරන ලද විදුලිබලය පදනම් කර ගනිමින්, බලශක්ති අලෙවි ශාඛාව මගින් 2012 වර්ෂය සඳහා සම්ප්‍රේෂණ ගිණුම්/සටහන්, මාසික පදනමින් පිළියෙල කර ඇත. බෙදාහැරීම් බලපත්‍රලාභියා - සීමාසහිත ලංකා විදුලිබල පෞද්ගලික සමාගම වෙත විදුලිබල තොග විකිණීම් සඳහා මාසික ඉන්වොයිස් පත්‍ර පිළියෙල කිරීම සඳහා 2012 වර්ෂයේදී, තොරතුරු තාක්ෂණ ශාඛාවේ සහාය ඇතිව, නව මෘදුකාංග වැඩසටහනක් වැඩි දියුණු කරනු ලැබීය.

### සන්නිවේදනය

සංනිවේදන ශාඛාවේ වගකීම වනුයේ, ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළත, ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සහ අනෙකුත් අංශ අතර දත්ත සංනිවේදන අවශ්‍යතාවන් සහ පද්ධති පාලන මධ්‍යස්ථානයට අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) අවශ්‍යතාවන් සපයා දීමයි. මෙම පහසුකම් සැපයීමේදී, පහත සඳහන් සංනිවේදන තාක්ෂණයන් භාවිතයට ගැනෙයි.

- විදුලි රැහැන් මත පදනම් වූ සංනිවේදන ජාලයන් - විදුලි රැහැන් වාහකය(PLC) සහ දෘෂ්‍ය තන්තුව/දෘෂ්‍ය විදුලි භූ තන්තුව (Optical Fiber/OPGW)
- සූක්ෂම තරංග - සංඛ්‍යාංක සංනිවේදන ජාලය(DCN)
- VHF/UHF - ජංගම සහ ස්ථාපිත(ජංගම නොවන) ගුවන් විදුලි සංනිවේදන පද්ධතිය

රට පුරා විසිරී ඇති, විදුලි රැහැන් වාහක PLC හා PLTS, දුරකථන පද්ධති, දුරකථන හුවමාරු පොලවල් සහ විදුලි බලාගාර හා කොටුමා උපපොලවල ඇති ශාඛා පද්ධති යන කෙළවර උපකරණ ඇතුළුව විදුලි රැහැන්, විදුලි රැහැන් වාහක ජාලය (PLC), දෘෂ්‍ය තන්තු ජාලය, PLTS හා දත්ත සංනිවේදන ජාලය සම්බන්ධයෙන් සංනිවේදන පද්ධති ඒකකය වගකිව යුතුය. කොළඹ, මහනුවර, ගාල්ල, අනුරාධපුරය, සමනලවැව සහ ලක්ෂපාන සිට ක්‍රියාත්මක වන උප-ඒකක හයක් මෙම ඒකකය සතුය.

අධීක්ෂක පාලනය සහ දත්ත ලබා ගැනීමේ (SCADA) පද්ධතිය, පද්ධති පාලන මධ්‍යස්ථානයේ SCADA පරිගණක සහ එහි දෘඩාංග හා මෘදුකාංග ඇතුළු RTUs හා Gateways ඇතුළත්ව ශාඛා සහ දුරස්ථ බලාගාරයන්හි SCADA උපකරණ සම්බන්ධයෙන් සංනිවේදන සේවා ඒකකය වගකිව යුතුය.

### සංඛ්‍යාංක ධාරක ඒකකය (Digital Bearer Unit)

ලංකා විදුලිබල මණ්ඩලයේ උත්පාදන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ සහ අනෙකුත් ශාඛා ඒකකයන්හි මෙහෙයුම් හා පරිපාලන සංනිවේදන සේවාවන් සඳහා සේවය සපයන සංඛ්‍යාංක සංනිවේදන ජාලය සම්බන්ධයෙන් සංඛ්‍යාංක ධාරක ඒකකය වගකිව යුතුය. ලංකා විදුලිබල මණ්ඩලයේ ජනක, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ සහ අනෙකුත් ශාඛා ඒකකයන්හි මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ආරක්ෂක සේවා සම්බන්ධයෙන්, ගුවන් විදුලි (VHF UHF) සංනිවේදන පහසුකම් සැපයීම පිළිබඳව ද, සංඛ්‍යාංක ධාරක ඒකකය වගකිව යුතුය.

### වසර 2012

**වර්ෂය තුළ, විදුලි රැහැන් වාහක (PLC) පද්ධතින්හි ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන්ට පහත සඳහන් කටයුතු ද ඇතුළත්වේ.**

- උකුවෙල විදුලි බලාගාරයේ බැම්මෙහි දත්ත අධීක්ෂණය කිරීම සඳහා නව ගුවන් විදුලි දත්ත සම්බන්ධය සැලසුම් කිරීම, සකස් කිරීම, සවි කිරීම සහ උකුවෙල විදුලි බලාගාරය සහ පොල්ගොල්ල වේල්ල අතර ජාතික සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ කිරීම
- පද්ධති පාලන මධ්‍යස්ථානය සඳහා නව PLTS පද්ධතියක් නිර්මාණය කිරීම, සකස් කිරීම හා සවිකිරීම සහ PLTS පද්ධතිය සඳහා අමතර පහසුකම් සැපයීමට, SOPHO PABX දුරකථන පද්ධතිය හැඩගැස්සීම.
- පොල්පිටිය සහ කිරිබත්කුඹුර කොටුමා උපපොලවල් අතර පැවති සංනිවේදන බාධාවන් ඉවත් කිරීම සඳහා පොල්පිටිය සහ කිරිබත්කුඹුර අතර නව ETL 540 PLC සම්බන්ධකයක් සවිකර ජාතික සම්ප්‍රේෂණ ජාලකයට සම්බන්ධ කිරීම
- FOX 515 fiber optic multiplexer ලංකා විදුලිබල මණ්ඩලයේ සවි කොට ප්‍රධාන ජාලකයට සම්බන්ධ කර fiber optic ජාලය හරහා, ව්‍යාප්ති කාර්යාල හා විදුලි බලාගාර කිහිපයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩල LAN පුළුල් කිරීම
- හබරන කොටුමා උපපොල සහ වාලච්චේන කොටුමා උපපොල අතර විදුලි රැහැන් වාහක (PLC) සම්බන්ධකය (කෙළවර උපකරණය) ප්‍රතිස්ථාපනය කිරීම වාලච්චේන කොටුමා උපපොල සඳහා නව විදුලි රැහැන් වාහක (PLC) දුරස්ථ ග්‍රාහකයක් සැපයීම
- අනුරාධපුරය-ත්‍රිකුණාමලය විදුලි රැහැන් වාහක (PLC) සන්නිවේදන සම්බන්ධකයේ පැරණි coax කේබලය ත්‍රිකුණාමලය කොටුමා උපපොලේදී ප්‍රතිස්ථාපනය කිරීම
- කිරිබත්කුඹුර කොටුමා උපපොල, කුරුණෑගල කොටුමා උපපොල, කොත්මලේ කොටුමා උපපොල ආරක්ෂක කාර්යාල සඳහා නව විදුලි රැහැන් වාහක (PLC) ග්‍රාහකයන් සැපයීම

**වසර තුළ අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) පද්ධතිවල ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන්ට පහත සඳහන් කටයුතු ද ඇතුළත්වේ.**

- බෙලිඅත්ත කොටුමා උපපොලෙහි ද්වාරය පරීක්ෂා කිරීම
- දැනට ඇති අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) උපකරණයන්, වැඩිදියුණු කිරීම්/නවීකරණයන් සිදු කිරීම්, ව්‍යාපෘති යටතේ ඇති සම්බන්ධක කටයුතු වශයෙන් සිදු කරනු ලැබීය. (උදා. වව්නියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය)
- අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) පරිගණක ප්‍රදර්ශන පද්ධතිය සහ පද්ධති පාලන අවශ්‍යතාවන් ලෙස MIMIC ප්‍රදර්ශන පද්ධතිය තත්වයෙන් උසස් කිරීම
- ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයේ පද්ධති පාලන මධ්‍යස්ථානයට අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) ක්‍රමය ඒකාබද්ධ කිරීම
- කොත්මලේ විදුලි බලාගාරයේ සියලු අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA) සංඥාවන් ඉහළ කොත්මලේ ද්වාරය ඔස්සේ අත් කර ගැනීමට පිළියෙල කිරීම
- නව ලක්ෂපාන අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ (SCADA), නව ද්වාරය හරහා පද්ධති පාලන මධ්‍යස්ථානයට ඒකාබද්ධ කිරීමට සක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම
- නොරොච්චෝල සුළං විදුලි බලාගාරයේ අධීක්ෂක පාලන සහ දත්ත ලබා ගැනීමේ උපකරණ පද්ධති, පාලන මධ්‍යස්ථානයට ඒකාබද්ධ කිරීමට මූලික පරීක්ෂණ ඇරඹීය.

# සම්ප්‍රේෂණ අංශය

### වසර තුළදී VHF ගුවන් විදුලි අංශය මගින් ඉටු කරන ලද විශේෂ කටයුතු

- මොනරාගල දිස්ත්‍රික්කයට සංනිවේදන පහසුකම් සැලසීම පිණිස බොහෝ වැඩබිම් පරීක්ෂා කරනු ලැබූ අතර ක්ෂේත්‍ර සමීක්ෂණ ප්‍රතිඵල අනුව, මොනරාගල ප්‍රදේශයට සංනිවේදන පහසුකම් සැපයීමට VHF පහළ තරංග පථ පරාවර්ථකයක් සවි කිරීමට, මැදගම, තිඹිරිය මොබිටෙල් සමාගමේ වැඩබිම තෝරා ගනු ලැබිණි.
- ආවරණ කලාපය උසස් තත්ත්වයට ගෙන ඒම, බාධා කිරීම් වැළැක්වීම හා අනෙකුත් අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීම පිණිස ඇතැම් පරාවර්තකයන් නැවත ස්ථානගත කරනු ලැබිණි. ඒවා පහත දැක්වෙන පරිදිවේ.

අ මහවැලි සංකීර්ණය මගින් කරන ලද ඉල්ලීමක් අනුව මහවැලි සංකීර්ණයේ සියලු විදුලි බලාගාර ආවරණය වන පරිදි, ගලෙහිකන්ද වැඩබිමේ ඉහළ තරංග පථ පරාවර්ථකයන් හන්තානට ගෙන යනු ලැබිණි.

ආ ආවරණය ඉහළ නැංවීම පිණිස ගොන්ගල වැඩබිමේ මධ්‍යම තරංග පථ පරාවර්තකය හක්මන, මුලටියන ඩයලොග් වැඩබිම වෙත ගෙන යනු ලැබිණි.

ඇ වඩා හොඳින් ශ්‍රවනය කිරීමට හැකි වන පරිදි දෝතලු ඔය වැඩබිමේ මධ්‍යම තරංග පථ පරාවර්ථකය, කිරිමැටියානකන්ද වෙත විතැන් කරනු ලැබීය.

- මඩකලපුව ප්‍රදේශයේ ඉල්ලුම සපුරාලීම පිණිස නව පහළ තරංග පථ පරාවර්ථකයන්, පහළ තරංග පථ ස්ථාවර/ජංගම Transceivers සහ ඉහළ තරංග පථ hand held Transceivers මිලදී ගනු ලැබිණි.

### ආයතනික සහ නියාමන සබඳතා

සම්ප්‍රේෂණ අංශයේ කාර්යය මණ්ඩලය සඳහා, වාර්ෂික සේවක මණ්ඩල සැලසුම් සකස් කිරීම මගින් සම්ප්‍රේෂණ අංශය යෝග්‍ය පරිදි ක්‍රියා කරන බවට සහතික කිරීම සහ පුහුණු ශාඛාවේ සහාය ඇතිව මාණ්ඩලික හා මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ වෘත්තීය සංවර්ධනය ඉහළ නැංවීම උදෙසා, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම හා පැවැත්වීම, ආයතනික සහ නියාමන සබඳතා ශාඛාවේ වගකීම වේ. ආයතනික හා නියාමන සබඳතා ශාඛාවේ ඉංජිනේරු විගණන අංශය මගින් මෙහෙයුම් පද්ධති වෝල්ටීයතා උච්චාවචනයන් සංඛ්‍යාත විචලනය, කොටුමා උපපොලවල/සුළං විදුලි බලාගාරවල ප්‍රසංවාද ආකලනයන් අධීක්ෂණය කිරීම සිදු කරයි. එම දත්ත නියාමන අවශ්‍යතාවන් සහ සැලසුම් අරමුණු සඳහා යොදා ගනී.

### ඉංජිනේරු විගණනය

වැඩබිම් අගැයීම මගින් සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රමිතිය හා ගුණාත්මකබව අධීක්ෂණය කිරීම හා පවත්වා ගෙන යාම, ආයතනික සහ නියාමන සබඳතා ශාඛාවේ ඉංජිනේරු ඒකකයේ වගකීම වේ. විදුලි පද්ධතියේ පරාමිතියන් විපරම් කිරීම සඳහා දත්ත ලසුරු (loggers) සහ විදුලි සැපයුමේ ගුණත්ව විශ්ලේෂක උපකරණ යොදා ගැනේ.

සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ කොට ඇති පෞද්ගලික සුළං විදුලි බලාගාර මගින් සපයන විදුලිබලය, ලංකා විදුලිබල මණ්ඩලය මගින් අපේක්ෂිත ප්‍රමිති මට්ටම්වලින් යුක්ත වන්නේ ද යන්න පිළිබඳව ඉංජිනේරු විගණන ඒකකය මගින් අධීක්ෂණය කරනු ලැබීය.

දත්ත ලසුරු යොදා ගනිමින්, විදුලියේ ගුණත්වය පිළිබඳ ක්ෂණික දත්ත හා ජනන ආකෘතික දත්ත අසුකර ගනු ලැබිණි.

සුළං විදුලි බලාගාර මගින් විදුලිබල පද්ධතියට සිදු කෙරෙන අනුවර්ති සංකලනයන් පිළිබඳව පරීක්ෂා කර බැලීමට විදුලිබල ගුණත්ව දත්ත භාවිතා කෙරිණි.

සුළං විදුලි බලාගාරයන්හි ජනන රටාවන් හා සුළං විදුලි ජනනය ලංකා විදුලිබල පද්ධතිය තුළට එක්කර ගැනීම සඳහා ඉදිරියේදී කිනම් මට්ටමක් දක්වා එය ප්‍රසාරණය විය යුතු ද යන්න විශ්ලේෂණය කිරීමට විදුලි ජනන ආකෘතික දත්ත යොදා ගැනිණි. මෙගාවොට් 10 ක් ජනනය කෙරෙන සේගුවන්තිව් සුළං විදුලි බලාගාරයේ (2012 ජනවාරි 21 දින සිට 2012 ජනවාරි 23 වන දින දක්වා) විදුලි ජනන ආකෘතිය පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කෙරේ.



### මානව සම්පත්

සම්ප්‍රේෂණ අංශයේ මානව සම්පත් කළමනාකරණ කටයුතු, නි.සා. ආයතනික හානියාමන සබඳතා ශාඛාව මගින් ඉටු කරයි. විධායක නිලධාරීන් 127 දෙනෙකු ගෙන් ද විධායක නොවන නිලධාරීන් 961 දෙනෙකු ගෙන් ද වශයෙන් 1088 ක මුළු සේවක සංඛ්‍යාවක්, සම්ප්‍රේෂණ අංශයට අනුයුක්තව සිටී. මෙම වසර තුළ දී බඳවාගත් සේවකයන් 180 දෙනෙක් මණ්ඩලය විසින් මෙම අංශයට පත්කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පිළිවෙත් වලට අනුකූලව, සේවකයන් 203 දෙනෙකු ඉහළ ශ්‍රේණි වලට උසස් කරනු ලැබුහ නැතහොත් ඔවුහු, ඔවුන්ගේ ඊළඟ ඉහළ වැටුප් පියවරේ තබනු ලැබූහ.

කුසලතා සංවර්ධන අවශ්‍යතාවන් මත, දේශීයව හෝ විදේශීය වශයෙන් කාර්යය මණ්ඩලයට පුහුණු අවස්ථාවන් සළසනු ලැබීය. සැලසුම්කරණය, සංනිවේදනය, උපපොලවල් හා සම්ප්‍රේෂණ මාර්ග මෙහෙයුම් හා නඩත්තු යන විෂයයන් විදේශ පුහුණුවේදී ආවරණය කරන ලදී. දේශීය බාහිර පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා පුද්ගලයන් 222 දෙනෙක් ද, විදේශ පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු ආදිය සඳහා පුද්ගලයන් 27 දෙනෙකු ද සහභාගී කරවනු ලැබිණි. අනෙකුත් කාර්ය මණ්ඩලයට තමන් ලද දැණුම පැවරීමට කටයුතු කරන ලෙස එවැනි පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටින ලදී. සම්ප්‍රේෂණ රැහැන් සහ කොටුමා උපපොල විවිධ උපකරණ පිළිබඳ කර්මාන්ත ශාලාව තුළ භාණ්ඩ භාරගැනීම සඳහා වූ පරීක්ෂණ නිරීක්ෂණය කිරීම සඳහා සහභාගී වීමට පුද්ගලයන් 27 දෙනෙකුට සම්ප්‍රේෂණ අංශය මගින් පහසුකම් සළසනු ලැබීය. ආයතනික සහ නියාමන සබඳතා ශාඛාව මගින් පුහුණු ශාඛාවේ සහාය ඇතිව, සම්ප්‍රේෂණ අංශයේ කාර්ය මණ්ඩලයට දේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගීවීමට අවස්ථාව සළසා දෙනු ලැබීය.

# බෙදාහැරීම් අංශය



# බෙදාහැරීම් අංශය 1

බෙදාහැරීම් අංශය 1, වයඹ, උතුරුමැද, උතුරු සහ කොළඹ නගරයේ මහනගර සභා බල ප්‍රදේශය යන පරිපාලන පලාත් හතරකින් සමන්විත වේ. දැනට, විදුලිබල මණ්ඩල ප්‍රදේශ 16 ක් ඇති අතර, 2014 වර්ෂය අවසානයේදී නව කිලිනොච්චි ප්‍රදේශය එකතුවීමක් සමග එම ප්‍රදේශ සංඛ්‍යාව 17 ක් වනු ඇත.බෙදාහැරීම් අංශය 1 තුළ ජීවත්වන ජනගහනය මිලියන 7 ක් පමණ වේ. බෙදාහැරීමේ අංශය 1 තුළ, ඉහළම විදුලිබල සැපයුම් මට්ටම වන 99% කොළඹ නගරය තුළ පවත්නා අතර අඩුම විදුලිබල යෙදවුම් මට්ටම වන 65% උතුරු පලාතේ පවතියි. බෙදාහැරීම් අංශය 1 තුළ, එක් පාරිභෝගිකයෙක් සඳහා වන වාර්ෂික විදුලිබල පරිභෝජනය කිලෝවොට් පැය 2, 136 කි. එක් පාරිභෝජිකයෙක් සඳහා ඉහළම වාර්ෂික විදුලිබල පරිභෝජනය වන ඒකක 7745 කොළඹ නගරයෙන් වාර්තා වන අතර එක් පාරිභෝජිකයෙක් සඳහා අඩුම වාර්ෂික විදුලිබල පරිභෝජනය වන ඒකක 1580 වයඹ පලාතෙන් වාර්තාවේ. මෙම අංශයේ වඩාත් ලාභදායි කොටස කොළම නගරය වන අතර යාපනය හා කිලිනොච්චි යන ප්‍රදේශ ද ලාභ ලබන ප්‍රදේශ බවට පත් වනු ඇත.

**මෙහෙයුම් ව්‍යුහය**

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් අංශය 1, සාමාන්‍යාධිකාරී වරයාට කෙළින්ම වගකිව යුතු, අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් පාලනය කරයි. මෙහෙයුම් අරමුණු උදෙසා, මෙම අංශය කොළම නගරය, වයඹ පලාත, උතුරුමැද පලාත, උතුරු පලාත යනුවෙන් පලාත් හතරකට බෙදා ඇති අතර නැවතත් එම පලාත්, ප්‍රධාන ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන් හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන් විසින් පාලනය කරනු ලබන ප්‍රදේශ වශයෙන් බෙදා දක්වනු ලබයි. පරිපාලනය ඵලදායි ආකාරයෙන් පවත්වා ගෙන යාම සඳහා බෙදා හැරීමේ අංශය 1, ප්‍රදේශ 16 කට හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 51 කට බෙදා දක්වා ඇත.

පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්ට අමතරව, බෙදාහැරීමේ අංශය 1හි, ව්‍යාපෘති හා අධි සැර නඩත්තු කටයුතු, සැලසුම් සහ සංවර්ධන කටයුතු සහ වාණිජ හා ආයතනික කටයුතු පිළිබඳ සොයා බැලීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් තිදෙනෙක් සේවයේ යොදවා ඇත. මෙම අංශයේ සහ අනෙකුත් අංශවල ද ග්‍රාමීය විදුලිබල සැපයුම් කටයුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී( ග්‍රාමීය විදුලිබල සැපයුම් හා ප්‍රසම්පාදන) විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

පලාතේ මූල්‍ය හා ආදායම් රැස්කිරීමට අදාළ කාර්‍යයන් ගණකාධිකාරීන් විසින් සිදු කරන අතර අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් පාලන හා අධීක්ෂණ කටයුතු සිදු කරයි. මානව සම්පත් කටයුතු සඳහා සෑම පලාතකටම එක් මානව සම්පත් නිලධාරියෙකු බැගින් ලබා දී ඇත.මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ සියළුම විධායක නිලධාරීන්ගේ හා ආයතනික කාර්යාලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කාර්යයන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) යටතේ ඇති ඒකකයෙන් ඉටු කරනු ලැබේ.

| අංකය | විස්තරය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| 1 | වසර තුළ බෙදාහැරීම් 1 ට සම්ප්‍රේෂණය කර විකුණන ලද ඒකක ගණන | ගි.වොට් පැය | 3024 |
| 2 | වසර තුළ අංශය ඇතුළත විකුණන ලද ඒකක ගණන | ගි.වොට් පැය | 2892 |
| 3 | විකුණන ලද ඒකක ගණනින් උපයන ලද ආදායම | රුපි. මිලියන | 52,642 |
| 4 | සාමාන්‍ය විකුණුම් මිල | රුපි. | 18.20 |
| 5 | බෙදාහැරීමේ ශක්ති හානිය | % | 9.32 |
| 6 | අයවීමට ඇති මුදල් තත්ත්වය | මාස | 1.93 |
| 7 | වර්ෂය අවසාන වනවිට අංශය තුළ තොග පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 3,216 |
| 8 | වර්ෂය අවසාන වනවිට අංශය තුළ සිල්ලර පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 1,348,551 |
| 9 | වසර තුළ සපයන ලද නව සම්බන්ධතා ගණන | සංඛ්‍යාව | 86,304 |
| 10 | වසර අවසාන වන විට සිටි සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,831 |
| 11 | මාසයක් තුළ එක් පාරිභෝගිකයෙකුගෙන් සාමාන්‍ය ආදායම (තොග) | රුපි. | 947,546.00 |
| 12 | මාසයක් තුළ එක් පාරිභෝගිකයෙකුගෙන් සාමාන්‍ය ආදායම (සාමාන්‍ය) | රුපි. | 1625.00 |
| 13 | වසර අවසාන වනවිට එක් සේවකයෙකු සඳහා සිටින සාමාන්‍ය පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 477 |
| 14 | එක් සේවකයෙකු සඳහා අඩු වෝල්ටීයතාවයෙන් මාර්ගවල සාමාන්‍ය දිග | කි.මී. | 10.28 |
| 15 | එක් පාරිභෝගිකයෙකු සඳහා අඩු වෝල්ටීයතා මාර්ගවල සාමාන්‍ය දිග | කි.මී. | 0.02 |
| 16 | එක් බෙදාහැරීමේ උප පොලකට මධ්‍යම වෝල්ටීයතා මාර්ගවල සාමාන්‍ය දිග | කි.මී. | 1.14 |



# බෙදාහැරීම් අංශය 1

## අරමුණු

- අංශය තුළ සිටින පාරිභෝගිකයන්ට, ව්‍යවස්ථානුකූල වෝල්ටීයතා මට්ටම්වලින් විශ්වාසනීය විදුලි සැපයුමක් ලබාදීම
- විදුලි බලය විකිණීම සහ මුළු වියදමට සාපේක්ෂව සැලසුම් ගත අතිරික්ත ආදායම් උපයා ගැනීම
- විදුලිය සැපයුම ලබා ගැනීමට අපේක්ෂිත පාරභෝගිකයනට නව සම්බන්ධතා සැපයීම
- බෙදාහැරීමේ අංශය 1 තුළ විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියේ තර්කාන්විත සංවර්ධනයක් ඇති කිරීම

## බෙදාහැරීමේ යටිතල ව්‍යුහය

| විස්තරය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| කිලෝවෝල්ට් 33 බෙදාහැරීමේ මාර්ග | කි.මී. | 7,302 |
| කිලෝවෝල්ට් 11 බෙදාහැරීමේ මාර්ග | කි.මී. | 619 |
| කිලෝවෝල්ට් 11 යටි බිහන් විදුලි රැහැන් | කි.මී. | 601 |
| කිලෝවෝල්ට් 33/11 මූලික උප පොල | සංඛ්‍යාව | 41 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීම් මාර්ග | කි.මී. | 29,104 |
| අඩු වෝල්ටීයතා යටි බිහන් විදුලි රැහැන් | කි.මී. | 544 |
| අඩුවෝල්ටීයතා බෙදාහැරීමේ උපපොල සංඛ්‍යාව | සංඛ්‍යාව | 7,465 |
| සේවා සම්බන්ධතා මුළු ගණන | සංඛ්‍යාව | 1,351,767 |

## පාරිභෝගික සත්කාරය

2012 වසර තුළ දී, පාරිභෝගිකයන් හා නිලධාරීන් සම්මුඛ වන අවස්ථාවන්හිදී, විදුලිබල සේවා සංවර්ධනය කිරීමට විශේෂ උත්සාහයන් දරණු ලැබිණි. ප්‍රාදේශීය කාර්යාල 16 කට, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 51 කට, විකුණුම් කවුළු 12 කට, බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන 4 කට අනුයුක්ත කරනු ලැබූ කාර්යය මණ්ඩලය පාරිභෝගිකයන්ට වඩාත් හොඳින් සේවය සැපයීමට විශේෂ උත්සාහයන් දරනු ලැබීය. මුදල් ගෙවීම සඳහා පෝලිම්වල රැඳෙමින් පාරිභෝගිකයන් මුහුණ පෑ දුෂ්කරතා, නව විකුණුම් කවුළු නවයත් විවෘත කිරීමත් සමග අවම කිරීමට හැකිවිණි.

පාරිභෝගිකයන්ට හා මහජනතාවට විශේෂ සේවාවන් සැපයීමට, විදුලිබල මණ්ඩලය මුල් වරට 2010 දී ''විදුලි පුරවර'' සංකල්පය හඳුන්වා දෙනු ලැබීය. 2012 වර්ෂය තුළ, බෙදාහැරීමේ අංශය 1 තුළ, මෙම සේවාවන් තවදුරටත් වැඩි දියුණු කර පුළුල් කරනු ලැබීය. විදුලි පුරවර යනු පාරිභෝගිකයන්ට හා මහජනයාට සියළුම සේවා (බැර සැපයුම් සේවා හැර) ලබා දෙන, ''එකම සේවා ස්ථානයෙන් සියළුම සේවා ලබා ගත හැකි'' යන සංකල්පය අනුව බිහිවූවකි.

| පලාත | ප්‍රදේශය | සංඛ්‍යාව |
|---|---|---|
| කොළම නගරය | කොළඹ බටහිර | 1 |
| | කොළඹ දකුණ | 1 |
| | කොළඹ නැගෙණහිර | 1 |
| | කොළඹ උතුර | 1 |
| වයඹ පලාත | කුලියාපිටිය | 1 |
| | කුරුණෑගල | 1 |
| | හලාවත | 1 |

| පලාත | ප්‍රදේශය | සංඛ්‍යාව |
|---|---|---|
| උතුරු මැද පලාත | මින්නේරිය | 1 |
| | අනුරාධපුරය | 1 |
| උතුරු පලාත | වව්නියාව | 1 |

වර්ෂය අවසානයේදී, මෙම අංශය තුළ, ''විදුලි පුරවර'' මධ්‍යස්ථාන දහයක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. සම්ප්‍රදායානුකූල විසන්ධිකිරීමේ නියෝගය වෙනුවට, කෙටි පණිවිඩ සේවය ඔස්සේ පාරිභෝගිකයන්ට අනතුරු හැඟවීමක් යැවීම වැනි දියුණු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම මෙහිදී සිදු කෙරේ. තව ද, පාරිභෝගික අධ්‍යාපන සේවාවන්, බලශක්තිය ඉතිරිකර ගැනීම පිළිබඳ තොරතුරු හා ප්‍රචාරාත්මක වැඩසටහන් සහ කාර්යක්ෂමතා සංවර්ධන කාර්‍යයන් ඇතුළත් වන සේ විදුලි පුරවර වැඩසටහන් පුළුල් කරනු ලැබිණි.

අපගේ අගනා පාරිභෝගිකයන්ට සපයන සේවාවන් වැඩිදියුණු කිරීම පිණිස, මෙම බෙදාහැරීමේ අංශය තුළ, නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන දෙකක් විවෘත කරනු ලැබීය.



පුත්තලමේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය විවෘත කිරීම

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා සැලසීමේදී පැන නගින, ඕනෑම ගැටළුවක් විසඳා ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස, පාරිභෝගික සමිති තුනක් ද, උතුරු මැද පලාතේ පිහිටවනු ලැබීය. විදුලි පාරිභෝගිකයන්ගේ සහයෝගය තුළින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවාවන් වැඩි දියුණු කිරීමට ද මෙමගින් පහසුකම් සැලසේ.

## විකුණුම්

2012 වර්ෂයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබල විකුණුම් අතරින් 27.6 % ක් බෙදාහැරීමේ අංශය 1 මගින් සිදු කෙරිණි. මෙම වසර තුළ, ඉකුත් වසරට සාපේක්ෂව 3.4 % ක වර්ධනයක් සමග, බෙදාහැරීමේ අංශය 1 මගින් විකුණනු ලැබූ විදුලිබල ප්‍රමාණය ගිගාවොට් පැය 2,892 ක් වීය.

## බෙදාහැරීම් අංශය 1




**බලශක්ති විකුණුම් අංශ අනුව බෙදී ඇති ආකාරය**

සමස්ථ විකුණුම්වලින් 43% ක් කොළඹ නගර ප්‍රදේශය තුළ වන අතර ඊළඟට වැඩිම විකුණුම් පිළිවෙලින් වයඹ, උතුරු මැද හා උතුර යන පලාත් මගින් සිදු කරනු ලැබ ඇත.




**පලාත් අනුව විදුලිය විකිණීමෙන් ලද ආදායම**

අදාළ වර්ෂය තුළ විදුලිබල විකුණුම්වලින් ලද ආදායම් රුපියල් මිලියන 52,642 ක් වූ අතර එය එකුත් වසරට වඩා 23% කින් වැඩිය.




**බෙදාහැරීම් අංශය 1 හි ආදායම් කොටස**




**බොදාහැරීම් අංශය 1 හි පලාත් තුළ සාමාන්‍ය විකුණුම් මිල ගණන්**

### විදුලිබල පාරිභෝගික ගිණුම් සහ නව සේවා සම්බන්ධතා

2012 වර්ෂයේ අවසානය වන විට, බෙදාහැරීම් අංශය 1 තුළ වාර්තා වූ පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව 1, 351, 767 ක් වීය. පාරිභෝගික ගිණුම් අතරින් බහුතරය ගෘහස්ත කාණ්ඩයට අයත් වූ අතර, අනතුරුව වඩාත් වැඩි කාණ්ඩය වූයේ, වාණිජ පාරිභෝගිකයන් ය. වර්ෂය අවසානය වන විට මෙම අංශය තුළ සිටි තොග සැපයුම් ලැබූ පාරිභෝගිකයන් සංඛ්‍යාව 3,216ක් වීය. තොග සැපයුම් ලබන පාරිභෝගිකයන් අතරින් වැඩිම සංඛ්‍යාව වාර්තා වූයේ, කොළඹ නගරයෙනි.




**අයක්‍රමය අනුව පාරිභෝගික ගිණුම්**

බෙදාහැරීම් අංශය 1 හි සමස්ථ පාරිභෝගික ගිණුම් අතරින් වැඩිම ගිණුම් සංඛ්‍යාව (663,514) වයඹ පලාතෙන් වාර්තා වූ අතර අඩුම ගිණුම් සංඛ්‍යාව( 161,018) කොළඹ නගරයෙන් වාර්තා විණි.




**පලාත් අනුව පාරිභෝගික ගිණුම්**

### ප්‍රාදේශීය මනු පරීක්ෂණාගාරය

2012 වසර, මනු පරීක්ෂණාගාරය සඳහා තවත් අභියෝගාත්මක වසරක් විය. වසර ආරම්භයේ සිටම, මනු පරීක්ෂන විද්‍යාගාර කාර්යය මණ්ඩලයේ දක්ෂතා නැවත වරක් පරීක්ෂණයට භාජනය කරනු ලැබීය. සමස්ථ දිවයිනේ තොග සැපයුම්කරුවන් අතරින් ආසන්න වශයෙන් 3,216ක් මෙම අංශයේ විදුලි පාරිභෝගිකයන් වීම නිසා, එය මෙම අංශයට සැබෑ අභියෝගයක්විය. මෙම සියලු තොග සැපයුම් වැඩපිළිවෙල සකස් කිරීම, වර්තමාන අවශ්‍යතාවයට ගැළපෙන ආකාරයෙන් නිම කිරීම, දෙන ලද අභියෝගය විය. අවශ්‍ය සියලුම යටිතල පහසුකම් (මානව සම්පත්, වාහන, වැඩසටහන් සම්පාදනය සඳහා අවශ්‍ය උපකරණ) අත්කර ගැනීම, මනු විද්‍යාගාර කාර්යය මණ්ඩලයට පරිබාහිරව අනෙකුත් ඒකකයන්ගෙන් ලබා ගන්නා ලද පුද්ගලයන් සඳහා වැඩසටහන් සම්පාදනය පිළිබඳ පුහුණුවක් ලබා දීම පැවති අභියෝගයන් විය. බෙදාහැරීමේ අංශය 1 මගින් මෙම කාර්යය භාර ගන්නා ලද අතර දෙන ලද කාල පරිච්ඡේදය තුළ, කටයුතු සාර්ථකව නිම කරනු ලැබීය. මෙම කාර්යයේ අවසාන ප්‍රතිඵලය පහත දැක්වෙන පරිදි විය.

- පරීක්ෂා කර නිකුත් කරන ලද එකලා මණු සංඛ්‍යාව 117,660
- පරීක්ෂා කර නිකුත් කරන ලද තෙකලා මණු සංඛ්‍යාව 4,244
- සොයා ගන්නා ලද දෝෂ සහිත මීටර සංඛ්‍යාව 37
- සැළසුම් කර තිබූ සහ නිකුත් කළ තොග සැපයුම් මීටර සංඛ්‍යාව 325

මනු යලි සකස් කිරීම සඳහා මාස තුනක කාලයක් ගත කළ නමුදු, තවමත් මනු පරීක්ෂණාගාර කාර්යය මණ්ඩලයට සිරිත් පරිදි කෙරෙන පරීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීමට හැකි වුයේ, වයඹ, උතුරු මැද සහ උතුරු යන පළාත්වල පමණි. ප්‍රදේශ 16 න්ම ලද පාරිභෝගික පැමිණිලි ද ඉතිරිව පැවති මාස දොළහක කාලය තුළ විමසා අවසන් කරනු ලැබීය. මෙම පළාත් වල පවත්නා ප්‍රදේශ දහයක ඇති තොග සැපයුම් මීටර ආසන්න වශයෙන් 1,452 ක් පරීක්ෂා කරනු ලැබීය.

### සැපයුම් විශ්වසනීයතාවය

විදුලි පාරිභෝගිකයින් සඳහා සපයන විදුලි සැපයුමෙහි විශ්වාසනීයත්වය ඉහළ නැංවීම පිණිස බෙදාහැරීමේ අංශය 1 යටතේ පවත්නා, සැලසුම් සහ සංවර්ධන ශාඛාව මගින්, අඛණ්ඩව ප්‍රයත්න දරනු ලැබීය. බලශක්ති ජාලය පිළිබඳ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමේ අදහසින්, සැපයුම කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීම අරමුණු කරගෙන, බිඳවැටීම් සංඛ්‍යාව පහත හෙළීමටත් කුමන අංශයක දෝෂ පවතී ද යන්න නිශ්චය කර ගැනීම/ඒකලනය කිරීම සඳහා ගත වන කාලය අඩු කිරීමටත් පියවර කිහිපයක් අනුගමනය කරනු ලැබ ඇත.

ගස්කොළන් ආදිය නිසා ඇති වන දෝෂ, අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ඇති වන දෝෂ වැනි නොයෙකුත් ආකාරයේ බාධාවන්, බෙදා හැරීමේ පද්ධතියට බලපෑම් ඇති කරයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ, (මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ ජාලය යටි බිහන් පද්ධතියක් වන කොළඹ නගරයේ හැර) බෙදාහැරීමේ ජාලය, මූලික වශයෙන් උඩිස් ජාලයක් වීමයි. සැපයුම බිඳ වැටීම සඳහා ප්‍රධාන හේතූන් වනුයේ, ස්වයංක්‍රීය පරිපත බිඳුම් පැනීම "ACB tripping" ගස් කොළන් ආදිය, විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා කාර්යාල දුර බැහැරව පිහිටා තිබීම, ජිනුව දැවීයාම (burning of jumpers) සහ සවිකිරීම් කොටස් කල් ගත වීමත් සමග දිරාපත්වීම ආදියයි. අදාළ වසර තුළ, බෙදාහැරීමේ අංශය 1 හි, මධ්‍යම වෝල්ටීයතා බලශක්ති ජාලයේ සාමාන්‍ය බිඳවැටුම් අනුපාතිකය මසකට, රැහැන් දුර කිලෝ මීටර 100 කට 7.5 ක් විය.




පළාත්බද මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම්




පළාත් අඩුවෝල්ටීයතා ජාලයේ බිඳවැටීම්

බෙදාහැරීම් පාලන මධ්‍යස්ථාන සහ බෙදාහැරීම සඳහා යන්ත්‍ර භාවිතය

මූලික වශයෙන් වැදගත් වනුයේ, සේවාව සම්බන්ධයෙන් ඇති විශ්වාසනීයත්වයයි. සැපයුම් විශ්වාසනීයත්වය ඉහළ නැංවීම යන්නෙන් අදහස් කරනුයේ, විදුලිය ක්‍රියා විරහිතව පවත්නා කාලය අඩු කිරීම, බිඳවැටීම් ප්‍රමාණය අඩු කිරීම සහ පිළිසකර කිරීම සඳහා වැය වන කාලය අඩු කිරීමයි. ශ්‍රී ලංකාව වැනි කර්ම කලාපීය රටක, උඩින් සවි කළ නිරාවරණය වූ සංනායක සහිත මධ්‍යම වෝල්ටීයතා ජාලයක බිඳ වැටීම් යම් මට්ටමක් ඉක්මවා පහත හෙළීමට ප්‍රායෝගිකව අපහසු වන්නේ නම්, එය ලාභදායක නොවනු ඇත. දෝෂ ඇති ස්ථාන හඳුනා ගැනීම/යථා තත්වයට පත් කිරීම සඳහා ගත වන කාලය අඩු කිරීම මේ සඳහා ඇති විකල්ප විසඳුමයි. දුරස්ථ ස්ථානයක සිට ආදාන දත්ත එසැණින් සැකසීමෙන් ක්‍රියාකරණ පද්ධති ආකාරයෙන්, බෙදාහැරීමේ අංගෝපාංගයන් දුර සිට අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාකරවීම යන කාර්යයන් කළ හැකි පරිදි බෙදාහැරීම් ජාල මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය මගින් මෙම අරමුණ මුදුන් පමුණුවා ගත හැකිය.

නැගෙනහිර පළාත සඳහා වන බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය එහි කටයුතු 2012 වර්ෂයේ දී ආරම්භ කළ අතර උතුරු පළාතේ, සමස්ථ මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා බලශක්ති ජාලයන් එමගින් අධීක්ෂණය කෙරේණි. පාලන මධ්‍යස්ථානයේ ඉංජිනේරුවන් හා අනෙකුත් කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සකස් කරනු ලැබ ඇත.

# බෙදාහැරීම් අංශය 1

## පලාත් මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම් කෙරේ බලපෑ හේතු




වයඹ පලාතේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම් කෙරේ බලපෑ හේතු




උතුරු මැද පලාතේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම් කෙරේ බලපෑ හේතු




උතුරු පලාතේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම් කෙරේ බලපෑ හේතු




කොළඹ නගරයේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ බිඳවැටීම් කෙරේ බලපෑ හේතු

සැපයුම් විශ්වාසනීයත්වය පිළිබිඹු කරන්නාවූ මෙම වසර තුළදී, වයඹ පලාත, උතුරු මැද පලාත හා කොළඹ නගරයේ බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානයන් මගින් අධීක්ෂණය හා ගණනය කරන ලද, වයඹ පලාත, උතුරු මැද පලාත සහ කොළඹ නගරයේ පාරිභෝගික මට්ටමේ විශ්වසනීයතා මට්ටම පහත දැක්වේ.

| | වයඹ පලාත | | උතුරු මැද පලාත | | කොළඹ නගරය | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 |
| IFI | 38 | 66 | 18 | 20 | - | - |
| SAIDI (hrs) | 73 | 124 | 64 | 75 | 0.3 | 0.34 |

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 1 හි තවත් බෙදා හැරීමේ පාලන මධ්‍යස්ථාන දෙකක් කොළඹ නගරයේ සහ උතුරු මැද පලාතේ ක්‍රියාත්මක කර ඇත. කොළඹ නගර පාලන මධ්‍යස්ථානය, බෙදාහැරීමේ SCADA සහ බෙදාහැරීමේ සවයංක්‍රීයකරණය ද සමග තාක්ෂණික විෂයක නව්‍ය සංවර්ධන තත්වයක (a state-of-the-art facility) පවතින අතර සංනිවේදන පද්ධති සම්පූර්ණයෙන්ම සම්පාදනය කර ඇත. SCADA මගින් උපකරණ දුර සිට මෙහෙයවීම සඳහා මෙහෙයුම් හා සුරක්ෂිතතා පිළිවෙත් සහ මාර්ගෝපදේශ වැඩි දියුණු කරණු ලැබීය.

කොළඹ නගරයේ බෙදාහැරීම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කරන ලද SCADA පද්ධතියක් මගින් මධ්‍යම වෝල්ටීයතා ජාලයක් ක්‍රියා කරවීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් යොදවනු ලැබීය. කොළඹ 5, ක්ලේසන් පෙදෙසේ පිහිටි, කොළඹ නගර පාලන මධ්‍යස්ථානයේ සිට ක්‍රියා කරවනු ලබන, උප පොලවල් 212 ක් ආරම්භක වශයෙන්, ස්වයංක්‍රීයකරණය කරනු ලැබ ඇත. ස්වයංක්‍රීයකරණය කරණ ලද උප පොලවල් හා කොළඹ නගර පාලන මධ්‍යස්ථානය අතර සංනිවේදන කටයුතු සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් සපයන ලද දෘෂ්‍ය විදුලි තන්තූන් හා සමර්පිත සම්බන්ධතා, භාවිතා කරනු ලබයි.

## විදුලිබලය බෙදා හැරීමේදී සිදුවන හානි අඩු කිරීම

2002 වසරේදී 17 % ක් වැනි ඉහළ අගයක පැවති බෙදාහැරීමේ අංශ 1 හි බෙදාහැරීමේ හානිය 2012 වසරේ අවසානය වන විට 9.32% දක්වා අනුක්‍රමයෙන් අඩු කරනු ලැබ ඇත. ගතවූ කාලය තුළ, බෙදාහැරීමේ අංශය 1 මගින් දියත් කරනු ලැබූ, බෙදාහැරීමේ හානි අඩු කර ගැනීමේ වැඩසටහන් (කාර්මික හා කාර්මික නොවන) ප්‍රබල ලෙස අධීක්ෂණය

# බෙදාහැරීම් අංශය 1

කිරීම හා ක්‍රියාත්මක කිරීම, මෙම බෙදා හැරීම් හානි අඩු වීමට හේතුවිය. 2012 වර්ෂය තුළ, බෙදාහැරීමේ අංශය 1 හි පලාත් මට්ටමේ හානි පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පලාත | බලශක්ති යෙදවුම ගි.වොට් පැය/වසර | හානි % |
|---|---|---|
| කොළඹ නගරය | 1323.2 | 5.88 |
| වයඹ පලාත | 1147.4 | 9.15 |
| උතුරු මැද පලාත | 423.2 | 12.3 |
| උතුරු පලාත | 272.5 | 23.53 |
| සමස්ථ බෙදාහැරීමේ අංශය 1 | 3166.3 | 9.4 |

**බෙදාහැරීමේ අංශය 1 හි බෙදාහැරීමේ හානි**

තාක්ෂණික හානි 8.32% ක් පමණ වන බවත් ඉතිරි 1% ප්‍රමාණය, සොරකම්, නීති විරෝධී ලෙස විදුලිය ලබා ගැනීම සහ මනුගත නොකළ වීදි ලාම්පු ආදී තාක්ෂණික නොවන හානි ලෙස ද ඇස්තමේන්තු කෙරේ. තාක්ෂණික නොවන හානි අඩු කර ගැනීමේ වැඩසටහන යටතේ දුර්ස්ථ මනු කියවීමේ ක්‍රියාවලී අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබූ අතර ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට අවශ්‍ය පරිදි සහයෝගය දෙනු ලැබීය.

මනු කියවීම් වාර්ෂිකව පරීක්ෂා කිරීම, විධිමත් පරීක්ෂණයන් සිදු කිරීම සහ ස්වයංක්‍රීය මනු කියවීම් මගින් බැර සැපයුම් හා සම්බන්ධ වාණිජ හානි ආසන්න වශයෙන් ශුන්‍ය මට්ටම දක්වා අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## ඵලදායිතා සංවර්ධනය සහ තත්ව කළමනාකරණය

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් ඉතිහාස ක්ෂේත්‍රයෙහි මුල් වරට, වයඹ පලාත, පහත සඳහන් කාර්යාල සඳහා, අයිඑස්ඕ 9001 - 2008 තත්ව කලමනාකරණ සහතිකය ලබා ගන්නා ලදී.

- ප්‍රධාන ඉංජිනේරු (තැනීම්), ප්‍රධාන ඉංජිනේරු බෙදාහැරීම් නඩත්තු) සහ ගිණුම් කාර්යාල දෙකක් ඇතුළුව, වයඹ පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාල සංකීර්ණය
- ප්‍රධාන ඉංජිනේරු (කුරුණෑගල) ප්‍රාදේශීය කාර්යාලය, ප්‍රධාන ඉංජිනේරු (හලාවත) ප්‍රාදේශීය කාර්යාලය, (කුලියාපිටිය)ප්‍රාදේශීය කාර්යාලය සහ පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය
- කුරුණෑගල නගර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, පොතුහැර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, නාරම්මල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය
- ප්‍රධාන ඉංජිනේරු බෙදාහැරීම් නඩත්තු ශාඛාවේ සියලු වැඩබිම් කාර්යාලයන් ඉහත සඳහන් සහතිකයන්ට අමතරව, වයඹ පලාත, TAIKI Akimoto එස් 5 ත්‍යාග ප්‍රදානෝත්සවයේදී, විශිෂ්ඨතා සම්මානය ලබාගෙන ඇත.

## විශිෂ්ඨතා සම්මානලාභීන්

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය - කුරුණෑගල
- ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - වාරියපොල
- ගණකාධිකාරී ආදායම් කාර්යාලය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වයඹ පලාත,
- පාරිභෝගික සේවා මධ්‍යස්ථානය - පොතුහැර

## සමර්පණ සම්මානලාභීන්

- පාරිභෝගික සේවා මධ්‍යස්ථානය - මහව

ලංකා විදුලිබල මණ්ඩලය මගින් පවත්වනු ලැබූ ,එස් 5 තරඟයේදී, කොළඹ දකුණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී.

ලංකා විදුලබල මණ්ඩලයේ ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ඉදිරිපත් කරන ලද අනර්ඝ උපායමාර්ගික සැලසුම් සඳහා , ජපාන සහ ශ්‍රී ලංකා තාක්ෂණික හා සංස්කෘතික සංගමය මගින් පිළිගන්වන ලද, ''Taiki Akimoto" කුසලතා සම්මානය ද, කොළඹ දකුණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් දිනා ගන්නා ලදී.

උතුරු මැද පලාතේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ, ආදායම් ශාඛාව ද 2012 වසරේ, එස් 5 සම්මානය දිනා ගන්නා ලදී.

## පද්ධති සංවර්ධනය

විදුලිබල පද්ධතිය සංවර්ධනය කිරීම යටතේ යාපනය අර්ධද්වීපයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමට, කිලිනොච්චි කොටුමා උපපොලේ සිට පුතුක්කාඩු දක්වා රුපියල් මිලියන 200 ක වියදමින් (DCV එල්ම් රැහැන්) විදුලි සැපයුම් මාර්ගයක් ඉදි කළ අතර මුලු පේදුරුතුඩුව සහ චාවකච්චේරි ප්‍රදේශයන්ට කිලිනොච්චි කොටුමා උපපොලෙන් විදුලිබලය සපයනු ලැබීය. මෙම කාර්යය නිම කිරීමෙන් පසු යාපනය අර්ධද්වීපයේ විදුලි සැපයුම කපා හැරීමේ ගැටළු ප්‍රමාණවත් ලෙසින් පහත වැටිණි.

ඉතා උසස් මට්ටමින් යාපනය නගරයේ විදුලි සැපයුමේ විශ්වාසනීයත්වය පවත්වා ගෙන යාම සඳහා කිලෝ වොට් 11 ක (ඒ සඳහාම වූ රැකෝන් රැහැන් මාර්ගයක්) විදුලි සැපයුම් මාර්ගයක් පරමේස්වර කොටුමා උපපොලේ සිට යාපනය දක්වා ඉදි කරනු ලැබීය.

මීට අමතරව, මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා ජාල වැඩි දියුණු කිරීමට සමස්ථ උතුරු පලාත සඳහා රුපියල් මිලියන 342 ක් වෙන් කරනු ලැබීය.

කිලිනොච්චි සහ යාපනය ප්‍රදේශයන්හි සියළුම තොග සැපයුම් පාරිභෝගිකයන් සඳහා ස්වයංක්‍රීය මනු කියවීම් ස්ථාපනය කරනු ලැබූ අතර 2012 පෙබරවාරි මස සිට මාසික මනු කියවීම් දුරස්ථව ක්‍රියාත්මක කරනු ලැබීය.

ඉංජිනේරුවන්ට බලශක්ති ජාලයන් වඩාත් සුමට සහ නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට හා ක්‍රියාකරවීමට හැකි වන ආකාරයෙන් ඔවුනට ජාල මෙහෙයුම් හා සැලසුම් දත්ත කරා පිවිසීමට හැකි වන පරිදි, කොළඹ නගර පාලන මධ්‍යස්ථානට සම්පූර්ණ පහසුකම් සපයනු ලැබේ.

එමනිසා, මෙම මධ්‍යස්ථානයේ ඇති පහසුකම් භාවිතයෙන් SAIDI" SAIFI වැනි කළමනාකරණ තොරතුරු සහ හානි වඩාත් නිවැරදිව ගණනය කරනු ලැබේ. මෙලෙස, වැදගත් මානව සම්පත් සියල්ල ලංකා විදුලිබල මණ්ඩලය සඳහා වෙන් කරමින්, දවස පුරා උපපොලවල් ක්‍රියාත්මක කිරීම සඳහා දැරීමට සිදුවූ පිරිවැය එමගින් පහත හෙළනු ලැබ ඇත.

2012 වර්ෂය තුළදී, කාර්යය මණ්ඩලය නව තාක්ෂණය හා කුසලතා අත්කර ගනු ලැබූ අතර වක්‍ර/කේන්ද්‍රගාමී # 1097 හා # 1428 උපපොලවල් ස්වයංක්‍රියකරණය කර, SCADA සමග සම්බන්ධ කිරීමේ කටයුතු මුළුමණින්ම කොළඹ නගර ප්‍රදේශයේ ඉංජිනේරුවන් හා කාර්යය මණ්ඩලය විසින් සිදු කරනු ලැබීය.



කොළඹ නගර පාලන මධ්‍යස්ථානයේ සිට කාර්ය මණ්ඩලය කටයුතු මෙහෙයවීම

### තොග සැපයුම් පාරිභෝගිකයන්

පුත්තලම සිමෙන්ති කර්මාන්ත ශාලාව, නෙස්ලේ කිරි සැකසුම් කර්මාන්ත ශාලාව, ශ්‍රී ලංකා වානේ කර්මාන්ත ශාලාව  මාදම්පේ බුවල්කා වානේ කර්මාන්ත ශාලාව වැනි  විශාල කර්මාන්ත ශාලා ආදිය, අපගේ ප්‍රාදේශීය ආදායමට සෑහෙන ප්‍රමාණයකින් දායක වන්නා වූ පලාත් තුළ පිහිටා ඇත.

අනාගත සංවර්ධනය සඳහා ඉතා ඉහළ අවකාශයක් මෙම පලාත තුළ ඇත. කාර්මික උයන් දැනටමත් මාකඳුරේ ආරම්භ කරනු ලැබ ඇත. හෙරලියවල, මාවතගම හා පොල්ගහවෙල ප්‍රදේශයන්ට දැනටමත් ආයෝජන මණ්ඩලයේ ආශීර්වාදය ලැබී ඇත. පුත්තලම සහ කල්ලාඩි වල වැඩබිම් කිහිපයක්, කාර්මික උද්‍යාන ලෙස නුදුරු අනාගතයේදී සංවර්ධනය කිරීමට ආයෝජන මණ්ඩලය සැලසුම් කර ඇත.

මාදම්පේ සිට කල්පිටිය දක්වා වෙරළ තීරය දිගේ ඉස්සන් වගාකිරීමේ කර්මාන්තයන් සීග්‍රයෙන් වැඩි දියුණු වෙමින් පවතී. තන්තු (Fiber) පදනම් කරගත් කර්මාන්ත මාදම්පේ, කුලියාපිටිය සහ හලාවත ප්‍රදේශයන්හි සංවර්ධනය වනු ඇත. පන්නල ප්‍රදේශයේ මාකඳුර කර්මාන්ත ජනපදයේ ඇති අනෙකුත් මධ්‍යම පරිමානයේ කර්මාන්තයන්ට අමතරව, විශාල වානේ කම්හලක් නුදුරු අනාගතයේදීම ස්ථාපිත කරනු ඇත. දන්කොටුව සිට මාරවිල දක්වා වෙරළ තීරයේ සහ කල්පිටිය අර්ධද්වීපයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සංචාරක මණ්ඩලය මේ වනවිටත් සැලසුම් සකස් කරනු ලැබ ඇත.

### ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලිබලය සැපයීම

| ව්‍යාපෘතියේ නම | කාර්යයේ ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | අධි සැර (කිමී) | උප පොල ගණන | අඩු සැර (කිමි) | රැහැන් පරිවර්තන (කිමි) |
| උතුරුමැද පලාත ආලෝකමත් කිරීම සහ විදුලමු ලංකා | 164 | 134 | 832 | 88 |
| ගැ. වි: 8 (ඉරානය) | 320 | 320 | 1961 | 38 |

100%ක් විදුලි බලය සැපයීමේ ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, බෙදාහැරීමේ අංශය 1 හි සියලූම ගෘහ ඒකකයන් සඳහා විදුලිය සැපයීම සහ ගුණාත්මක බව, විශ්වසනීයතාව හා අංශයේ සියලූම දෙනාට විදුලිය සැපයීමේ සේවාව වැඩි දියුණු කිරීමයි.

### උතුරු වසන්තය ව්‍යාපෘතිය

තිස් වසරක කාලයක් පුරා උතුරු පලාතේ පැවති යුද්ධය 2009 මැයි මාසය අවසානයේදී නිමාවිය. මෙම කාලය තුළ යාපනය අර්ධද්වීපය හැර අනෙකුත් ප්‍රදේශ රජයේ පාලනය යටතේ නොවීය. එසේ වුවත්, ඉහත ව්‍යාපෘතිය සමග අර්බුද බලපෑ සියලූ ප්‍රදේශයන්ට විදුලි බලය ලබා දෙමින් තිබිණි.



උතුරු පලාතේ ග්‍රාමීය විදුලිය සැපයීමේ යෝජනා ක්‍රමයක් විවෘත කිරීම



උතුරු පලාතේ ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලි සැපයීමේ යෝජනා ක්‍රමය විවෘත කිරීම

### ගැමි විදුලියන ව්‍යාපෘතිය - 8 (ඉරාණය)

අනෙකුත් ව්‍යාපෘතී යටතේ ආවරණය නොවූ, වයඹ පලාතේ දුර බැහැර පිහිටි ගම් වලින් වැඩි ප්‍රමාණයකට විදුලිබලය සැපයීම, ගැමි විදුලියන ව්‍යාපෘතිය - 8 මගින්  අපේක්ෂා කෙරේ.

# බෙදාහැරීම් අංශය 1

### ගැමි විදුලියන ව්‍යාපෘතිය - 4 (දිගුව)

ගැමි විදුලියන ව්‍යාපෘතිය - 4 (දිගුව) ව්‍යාපෘති යෝජනාවේ ප්‍රධාන අරමුණ වනුයේ, Nordea බැංකුවේ සහායෙන් උතුරු මැද පළාතේ 100% ක් විදුලිය සැපයීමේ මට්ටම සාක්ෂාත් කර ගැනීමයි.

### දැයට කිරුළ

2012 වසරේ දැයට කිරුළ ජාතික උත්සවය අනුරාධපුරයේ ඔයාමඩුවේදී පවත්වනු ලැබීය. ප්‍රදර්ශන භූමියට විදුලි බලය සැපයීමේ පිරිවැය රුපියල් මිලියන 425 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබිණි. ඉහත සඳහන් සියල්ලට අමතරව, අනෙකුත් ව්‍යාපෘතීන් යටතේ එන යෝජනා ක්‍රම සහ පුළුල් කිරීම් සියල්ලම දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

| | කාර්යයන් ගණන | නිම කළ කාර්යයන් සඳහා පිරිවැය |
|---|---|---|
| ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලිබලය සැපයීමේ යෝජනා ක්‍රම | 48 | රුපි. මි. 463.4 |
| ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලිබලය පුළුල්කිරීමේ යෝජනාක්‍රම | 130 | රුපි.මි. 236.6 |

### ව්‍යාපෘති හා අධිසැර නඩත්තු කටයුතු

ව්‍යාපෘති හා අධිසැර නඩත්තු අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ, පහත



දැයට කිරුළ ප්‍රදර්ශන ප්‍රදේශය සඳහා සමර්පිත පෝෂකය (Dedicated feeder) (කි.වෝ 33) ඉදිකිරීම

දැක්වෙන ආකාරයේ, මධ්‍යම වෝල්ටීයතා බෙදා හැරීමේ පහසුකම් ඉදිකිරීම හා නඩත්තු කිරීමයි.

- කිලෝ වෝල්ට 33 කුළුණු රැහැන්
- කිලෝ වෝල්ට 33/11 ප්‍රාථමික උපපොළවල්
- අටළු අංගනය
- සියසල පිළිවසු
- බැර කඩන වහරු
- බෙදාහැරීමේ අංශය 1 පුරා පැතිර පවත්නා අධි සැර මිනුම් තරාපැවි (High Voltage Measuring Transformers)

මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීම් ජාලයේ බැර නඩත්තු කටයුතු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික වශයෙන් විශේෂ පුහුණුව ලද කාර්ය මණ්ඩලයක් හා විශේෂ යන්ත්‍ර සූත්‍ර මෙම අංශය සතුය. 2012 වසර වන විට, මෙම ශාඛාවේ පුද්ගලයන් 140 දෙනෙකු සේවයේ නියුක්තව සිටි අතර එයින් 18 දෙනෙකු මිනිස්බල ආයතනයන්ගෙන් ලබාගත් සේවකයන් විය.

2012 වසරේදී, අංශය තුළ විදුලි පාරිභෝගිකයන් සඳහා ඉහළ ගුණාත්මක බවකින් යුත් හා වඩාත් විශ්වාසනීය විදුලි සැපයුමක් සැපයීම තහවුරු කිරීමට, පහත වගුවේ දැක්වෙන බෙදාහැරීමේ පහසුකම්වලට අදාළව දිනපතා කෙරෙන නඩත්තු කටයුතු සිදුකරනු ලැබ ඇත.

| උපකරණය | සංඛ්‍යාව |
|---|---|
| කිවො 33/11 ප්‍රාථමික උපපොළ | 32 |
| අටළු අංගන | 18 |
| සියසල පිළිවසු (Auto Reclosers) | 77 |
| බැර කඩන වහරු | 41 |
| මිනුම් තරාපැවි | 48 |
| කිවො 33 කුළුණු රැහැන් (කිමි) | 1166 |

පද්ධති විශ්වාසනීයත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන, විදුලි සැපයුමට බාධා නොවන පරිදි මධ්‍යම වෝල්ටීයතා කුළුණු රැහැන් වල එදිනෙදා නඩත්තු සඳහා සජීවී රැහැන් නඩත්තු (Live Line Maintenance) ක්‍රියාමාර්ගයන් 2011 සිට හඳුන්වා දෙනු ලැබීය. ඉංජිනේරුවරයෙක්, විදුලි අධිකාරීවරයෙක්, සජීවී රැහැන් මාර්ග නඩත්තු කටයුතු පිළිබඳව ඉන්දියාවේ පුහුණුව ලත් සේවකයින් පස් දෙනෙක් ජීව මාර්ග නඩත්තු අංශයට ඇතුලත් වේ. මෙම කණ්ඩායමට අවශ්‍ය සියළුම මෙවලම් සපයනු ලැබීය. එදිනෙදා නඩත්තු කටයුතු සඳහා සිදු විය හැකි බවට උපලේඛන ගත කර තිබූ, අධිවේගී මාර්ගවල විදුලි සැපයුමට වන බාධා කිරීම් සංඛ්‍යාව, 2012 වසර අවසාන වන විට, සැළකිය යුතු මට්ටමකින් පහත වැටී තිබූ බව නිරීක්ෂණය කරනු තිබිණි. එනිසා, සජීවී රැහැන් නඩත්තු කටයුතු ඉහළ නංවමින් ද, තෝරා ගන්නා ලද කිලෝ වොල්ට් 33 කණු රැහැන් දක්වා එම කටයුතු ව්‍යාප්ත කරමින් ද පද්ධති විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් තිබේ. මෙම අරමුණ ඉටුකර ගැනීම ඉලක්ක කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් කිහිප දෙනෙක් සජීවී රැහැන් නඩත්තු අංශයට බඳවා ගනු ලැබූ අතර ඔවුනට සජීවී රැහැන් නඩත්තු ශිල්පක්‍රම පිළිබඳව සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබීය. කිලෝවෝල්ට් 33 කණු රැහැන්වල සජීවී රැහැන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ, 2012 වර්ෂයේ දී මිලදී ගෙන ඇත. සජීවී රැහැන් නඩත්තු ශිල්පක්‍රම පිළිබඳව උනන්දුවක් දක්වන ලංකා විදුලිබල මණ්ඩල තාක්ෂණ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට සහ ජීව මාර්ග නඩත්තු වැඩ කණ්ඩායම් සජීවී රැහැන් මාර්ග නඩත්තු වැඩ කාණ්ඩායම්වල සේවය කිරීමට අවශ්‍ය සුදුසකම් ලබා ගැනීමට ඔවුනට අවස්ථාවක් සලසාලීමට 2014 වසරේ අවසානය වන විට පුහුණු මධ්‍යස්ථානයක් හබරන පිහිටුවීමට අවශ්‍ය මූලික පියවර ගනු ලැබ ඇත. මීට අමතරව, ප්‍රාථමික උප පොලවල, මධ්‍යම වෝල්ටීයතා කුළුණු රැහැන් සහ වහරු අටළු අංගනවල නව ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීම්වලට අදාළව මධ්‍යම වෝල්ටීයතා සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව මෙම අංශය වගකිව යුතු ය. බෙදාහැරීම් අංශ 1 හි 2010-2012 මධ්‍යම වෝල්ටීයතා සංවර්ධන සැලස්මෙහි යෝජනා කර ඇති පරිදි, බෙදාහැරීම් 1 අංශයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ව්‍යාපෘති හා අධිසැර නඩත්තු කුළුණු රැහැන් සහ අටළු අංගන කිහිපයක් 2012 දී නිම කරනු ලැබ ඇත.

## බෙදාහැරීම් අංශය 1



කිලෝවොල්ට් 33 කුළුණු රැහැන්වල සජීවී රැහැන් නඩත්තු කටයුතු

යාපනය අර්ධද්වීපයේ බෙදාහැරීමේ ජාලය, ප්‍රධාන බලශක්ති ජාලකය සමග සම්බන්ධ කිරීමට එලිෆන්ට්පාස් කලපුව හරහා කිලෝවෝල්ට් 33 ක කිලෝ මීටර 4 ක් දිග ද්විත්ව පරිපථ කණු රැහැන් මෙම අංශය මගින් ඉදිකරනු ලැබ ඇත. ලුනු බැඳීම නිසා පරිවාරකයන් නිතර සේදීම හා කොන්ක්‍රීට් කණු, සන්නායකයන්, රැඳවුම් කම්බි, හරස් ඇඳි ආදියේ වානේ වේගයෙන් දිරාපත්වීම වැනි මෙහි පරිසරයට විශේෂවූ ගැටළු වැළැක්වීම සඳහා මෙම විදුලි මාර්ගය ඉදි කිරීමට විශේෂ සැලසුම් යොදා ගැනීමට සිදුවිය. මෙම කණු මාර්ගය ඉදිකිරීමේදී, මඩ සහිත භූමි භාගයෙහි පැන නැගුනාවූ දුෂ්කරතාවන් මැඩ පැවැත්වීමට, ආයතනය තුළ සංවර්ධනය කළ විශේෂ ඉදිකිරීම් ශිල්පක්‍රම අනුගමනය කිරීමට සිදුවිය.

යාපනය තුළ, මධ්‍යම වෝල්ටීයතා ජාලයට අවශ්‍ය මෙහෙයුම් පහසුකම් සැපයීම අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව) ගේ වගකීමක් වේ. අළුතින් ඉදිකළ මෙගාවොට් 24 ක උතුරු ජනනී ඩීසල් බලාගාරයේ විදුලිබල උත්පාදනය බෙදාහැරීමට 33කිවෝ නව පෝෂක රාක්ක තුනක් සහ කිවෝ 33 වෙළුම් රැහැනක් චුන්නාකම් වහරු අංගනයේ දී 2012 වර්ෂයේදී නිම කරනු ලැබීය. උතුරු පලාතේ, අච්චුවේලිහි දී ද්විත්ව බස්බාර් අටළු අංගනය ඉදිකිරීමට ආසන්න වශයෙන් රුපියල් මිලියන 25 ක පිරිවැයක් දරා CAARP අරමුදල් භාවිතයෙන් 2012 වසරේ දී උතුරු පළාතේ ප්‍රධාන කර්මාන්ත උද්‍යානය සඳහා විදුලිය සැපයීම නිම කරනු කරනු ලැබීය.

තුල්හිරිය කොටුමා උපපොලේ සිට නාරම්මල අටළු අංගනය දක්වා කිලෝ මීටර 20 ක් දිග ද්විත්ව පරිපථ කුළුණු රැහැන් ඉදිකිරීම් රුපියල් මිලියන 250 ක පිරිවැයකින් නිම කරනු ලැබීය. දැයට කිරුළ ප්‍රදර්ශනයට විදුලිය සැපයීමේ ඔවුන්ගේ කඩිනම් වැඩසටහනේ කොටසක් ලෙස බෙදාහැරීම් 2 අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව) ඉල්ලීමක් මත වාලච්චේන කොටුමා උපපොලේ සිට කිලෝ මීටර 5 ක් දිග කිලෝවෝල්ට් 33 ද්විත්ව පරිපථ කුළුණු රැහැන් ඉදිකිරීම මෙම අංශය මගින් සම්පූර්ණ කරනු ලැබ ඇත. ප්‍රධාන වශයෙන් කුළුණු රැහැන් නිර්මාණ කාර්‍යයන් කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව) බෙදාහැරීම් 1 අංශයේ පිරිසැලසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කරනු ලැබ ඇත. පිරිසැලසුම් කාර්‍යාලයක් ස්ථාපනය කිරීමේ අරමුණ වනුයේ, කුළුණු රැහැන් නිර්මාණ ක්ෂේත්‍රයෙහි කාර්ය මණ්ඩල කුසලතාවන් වැඩිදියුණු කිරීමයි. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා PLSCAD නමැති විශේෂ කුළුණු රැහැන් නිර්මාණ මෘදුකාංගය මිලදී ගනු ලැබ ඇත. මාදම්පේ-බිංගිරිය සිට අනුරාධපුර-කණ්ඩුවැව සහ පොලොන්නරුව, ජයන්තිපුර දක්වා කිලෝවෝල්ට් 33 නව සීග්‍රගාමී කුළුණු රැහැන් සඳහා නිර්මාණ සැලසුම් කටයුතු 2012 දී නිමකරනු ලැබ ඇත. අනාගතයේ ඉදිවන සියලු මධ්‍යම වොල්ටීයතා කුළුණු රැහැන් පිළිබඳ නිර්මාණ කටයුතු මෙම පිරිසැලසුම් කේන්ද්‍රය මගින් හසුරුවනු ඇත. සිවිල් ඉංජිනේරුවන්ගේ සහාය ඇතිව, සිවිල් පරිපාලකයන් යටතේ, පෙදරේරු වැඩ සහ වඩු වැඩ ආශ්‍රිත සිවිල් ක්ෂේත්‍රය හා සම්බන්ධිත කාර්‍යයන් ඉටු කිරීම සඳහා පිටතින් ලබාගත් පුහුණු තාක්ෂණිකයන්ගේ වැඩ කාණ්ඩායමක් පිහිටුවනු ලැබ ඇත. 2012 වර්ෂය අවසාන වන විට, සිවිල් කාණ්ඩායමට, නූතන මිණුම් උපකරණ සපයා දෙනු ලැබූ අතර පාංශු පරීක්ෂණ කාර්‍යයන් ද පවරනු ලැබීය.

පොලොන්නරුව-මනම්පිටිය සහ පොලොන්නරුව-කදුරුවෙල යන යෝජිත කිලෝවෝල්ට් 33 අධිවේගී ද්විත්ව පරිපථ කුළුණු රැහැන් සඳහා පැතිකඩ සමීක්ෂණයන් නිම කරනු ලැබ ඇත. මූලික වශයෙන්, අනුරාධපුරය සිට කහටගස්දිගිලිය සහ වව්නියා සිට කැබිතිගොල්ලෑව දක්වා කිලෝවෝල්ට් 33 ද්විත්ව පරිපථ කුළුණු රැහැන් මිණුම් කටයුතු සම්පූර්ණ කර ඇති අතර මෙම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු අරමුදල් ලබා ගැනීමට අවශ්‍ය විධිවිධානයන් පිළියෙල කරනු ලැබ ඇත.

කඩුවැව, කදුරුවෙල සහ කහටගස්දිගිලිය යන ස්ථානයන්හි, අනාගතයේ දී ඉදිකිරීමට නියමිත අටළු අංගන තුනක් සඳහා අවශ්‍ය භූමි වෙන් කිරීම් සම්පූර්ණ කරනු ලැබ ඇති අතර මනම්පිටිය, ගනේවල්පොල සහ බිංගිරිය යන ස්ථානයන්හි අටළු අංගන ඉදිකිරීම සඳහා ඉඩම් මිලදී ගැනීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. නාරම්මල නව අටළු අංගනයේ ඉඩම් සංවර්ධන කටයුතු 2012 දී ආරම්භ කරනු ලැබීය. අනාගතයේදී, දිගින් කිලෝ මීටර පහට අඩු කුළුණු රැහැන් ඉදිකිරීම්, මිනිසුන් සේවයේ නොයෙදෙන මූලික ඉදිකිරීම් සහ අටළු අංගන ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය නොකර, අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ ප්‍රවීණතාව සහ කුසලතාවන් භාවිතයට ගනිමින් ගොඩනැගීමට මෙම අංශය තීරණය කර ඇත.

## බෙදාහැරීම් අංශය 1


යාපනයේ, උතුරු ජනනී බලාගාරයේ විදුලි උත්පාදනය බෙදාහැරීම සඳහා කිලෝවොල්ට් 33 පෝෂක මාර්ග සැපයීම


එලිෆන්ට් පාස් කලපුව හරහා කිලෝවොල්ට් 33 කණු රැහැන් ඉදිකිරීම

### සමාජමය කාර්යයන්

බෙදාහැරීමේ අංශය 1 හි සේවකයන් විදුලි රැහැන් ඉදිකිරීමේ පමණක් නොව වෙනත් සමාජීය උත්සව අවස්ථාවන් සංවිධානය කිරීම සම්බන්ධයෙන් ද ඔවුනගේ දක්ෂතාවන් පෙන්නුම් කර ඇත. එවැනි අවස්ථාවන් පිළිබඳ එක් උද්දීපනයක් පහත දැක්වේ.


අනුරාධපුර පොසොන් බැතී සරණිය

# බෙදාහැරීම් අංශය 2

**මෙහෙයුම් ව්‍යුහය**

සාමාන්‍යාධිකාරීවරයාට සෘජුවම වග කියන අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් මෙම බෙදාහැරීමේ අංශය පාලනය කෙරේ. මෙහෙයුම් අරමුණු සඳහා, මෙම අංශය නැගෙණහිර, මධ්‍යම හා බස්නාහිර පලාත උතුර ලෙස නැවත පලාත් තුනකට බෙදා ඇත. එක් එක් පලාතක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ පාලනය වේ. එක් එක් පලාත ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු විසින් පාලනය කරනු ලබන එම පලාත් ප්‍රදේශ කිහිපයකට නැවතත් බෙදා තිබේ. සෑම ප්‍රදේශයක්ම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන යනුවෙන් නැවතත් වෙනම ප්‍රදේශවලට වෙන් කර ඇත. මෙහෙයුම් පහසුව උදෙසා, බෙදාහැරීමේ අංශය 2 තුළ, ප්‍රාදේශීය කාර්යාල 20 ක් ද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 58 ක් ද ඇත.

පලාත් නියෝජ්‍ය සාමානයාධිකාරීවරුන් හැර, අංශයේ, ව්‍යාපෘති හා අධිසැර නඩත්තු කටයුතු, සැලසුම් හා සංවර්ධන සහ වානිජ හා ආයතනික කටයුතු සොයා බැලීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් තිදෙනෙක් වෙති. වාණිජ හා ආයතනික ශාඛාව, ආදායම් අධීක්ෂණය, තාක්ෂණික නොවන හානි අඩු කිරීම, බලශක්ති කළමනාකරණය, ඉංජිනේරු විගණනය හා මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් වගකිව යුතුවේ. බෙදාහැරීම් අංශ 2 හි මනු පරීක්ෂණාගාරය සහ ප්‍රධාන කාර්යාලීය ඇමතුම් මධ්‍යස්ථානය, එහි වාණිජ හා ආයතනික ශාඛාව මගින් පාලනය කෙරෙයි. සැලසුම් සහ සංවර්ධන ශාඛාව මගින් විශ්වසනීයතාව, මධ්‍යම වෝල්ටීයතා ජාල සංවර්ධනය, අංශයට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, එබ්බූ විදුලිබල උත්පාදන ආශ්‍රිත ගැටළු, තාක්ෂණික හානි අඩු කිරීම සහ ග්‍රාමීය විදුලිබල සැපයුමට අදාළ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරයි. ඉදිකිරීම් කටයුතු, කිලෝවෝල්ට් 33 වානේ කුළුණු රැහැන් නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු, ලින්ක්ස් සංනායකයන් භාවිතයෙන් කොන්ක්‍රීට් පෙරැදි කණු රැහැන්, කිලෝවෝල්ට් 33/කිලෝවෝල්ට් 11 ප්‍රාථමික උප පොලවල්, කිලෝවෝල්ට් 33 වහරු පොලවල් ඉදිකිරීම සහ ස්වයං පිළිමසු සහ අධි සැර මානන ට්‍රාන්ස්ෆෝමර ස්ථාපනය කිරීම ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු කටයුතු අංශය මගින් සිදු කරයි. කිලෝවෝල්ට් 33 වානේ කුළුණු රැහැන්වල හදිසි නඩත්තු කටයුතු ද ව්‍යාපෘති සහ අධිසැර නඩත්තු කටයුතු අංශය මගින් සිදු කරයි.

**මෙහෙයුම් ප්‍රදේශය**

බෙදාහැරීමේ අංශය 2 හි මෙහෙයුම් ප්‍රදේශය මගින්, සමස්ථ නැගෙණහිර හා මධ්‍යම පලාත්, බස්නාහිර සහ සබරගමුව පලාත්වල ඇතැම් කොටස් ආවරණය කෙරෙයි. නැගෙණහිර පලාත, අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ කල්මුනෙයි යනුවෙන් කොටස් හතරකට නැවත බෙදා වෙන් කෙරේ. කෑගල්ල, මාවනැල්ල, මහනුවර නගරය, පේරාදෙනිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, ගලගෙදර, මාතලේ, දඹුල්ල සහ නාවලපිටිය යනුවෙන් මධ්‍යම පලාත ප්‍රදේශ 12 කට නැවත බෙදා වෙන් කෙරේ. බස්නාහිර පලාත උතුර, ගම්පහ, කැළණිය, මීගමුව, ජා*ඇල, දිවුලපිටිය සහ වේයන්ගොඩ යන ප්‍රදේශ 6 කට නැවත බෙදා දක්වයි. ශ්‍රී ලංකාවේ මිලියන 4.98 ක් වන සමස්ථ විදුලි පාරිභෝගිකයන් අතරින් පාරිභෝගිකයන් 1,563,349 කින් බෙදාහැරීමේ අංශය 2 සමන්විතවේ.

| විස්තරය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| 2012 දී බෙදාහැරීමේ අංශය 2 තුළ විකුණනු ලැබූ ඒකක ගණන | ගි.වො.පැය | 2,948 |
| විකුණන ලද විදුලිබලයෙන් ඉපැයූ ආදායම | රුපි. මිලියන | 43,283 |
| වසර අවසානයේ අංශයේ මුළු පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 1,563,349 |
| වසර අවසානයේ අංශයේ මුළු සිල්ලර පාරභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 1,561,054 |
| වසර තුළ සැපයූ මුළු නව සම්බන්ධතා ගණන | සංඛ්‍යාව | 74,604 |
| වසර අවසානයේ සිටි සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 3,826 |
| වසර අවසානයේ අංශයේ මුළු තොග පාරභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 2,295 |
| සාමාන්‍ය ආදායම | රු/මාසය/පාරි | 2,307.17 |
| වසර අවසානයේ අංශයේ එක් සේවකයෙකුට සිටි මුළු සිල්ලර පාරභෝගිකයන් ගණන | පාරි./සේවක | 408 |
| ප්‍රදේශ ගණන | සංඛ්‍යාව | 20 |
| විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ගණන | සංඛ්‍යාව | 58 |
| කිලෝවෝල්ට් 33 රැහැන් දුර | කි.මීටර | 7,112.2 |
| කිලෝවෝල්ට් 11 රැහැන් දුර | කි.මීටර | 672.9 |
| අඩු වෝල්ටීයතා බෙදාහරීමේ රැහැන් | කි.මීටර | 29,611 |
| බෙදාහැරීමේ හානි | % | 10 |
| අංශය තුළ ඇති කොටුමා උපපොල ගණන | සංඛ්‍යාව | 19 |
| කිලෝවෝල්ට් 33/11 ප්‍රාථමික උපපොල | සංඛ්‍යාව | 39 |
| අඩු වෝල්ටීයතා උපපොලවල් | සංඛ්‍යාව | 5,230 |
| පුනර්ජනනීය බලාගාර සංඛ්‍යාව | සංඛ්‍යාව | 24 |
| පුනර්ජනනීය බලාගාර වල ස්ථාපිත ධාරිතාවය | මෙගා වොට් | 51.34 |
| විදුලිබලය සපයා ඇති නිවාස ප්‍රතිශතය | % | 83 |

## බෙදාහැරීම් අංශය 2




**බෙදාහැරීමේ අංශය 2, මායිම්**




**බෙදාහැරීමේ අංශය 2 හි විකුණුම්**




**බෙදාහැරීමේ අංශය 2 හි එකතු කළ ආදායම**




**විවිධ අයකුම ප්‍රභේදයන් යටතේ විකුණුම්(ගි.වො.පැය) 2012 - බෙදාහැරීමේ අංශය 2**




**පලාත් අනුව විදුලිබල විකුණුමෙන් ලද ආදායම බෙදාහැරීමේ අංශය 2**




**අයකුමය අනුව විදුලිබල විකුණුමෙන් ලද ආදායම - බෙදාහැරීමේ අංශය 2**

### 2012 වර්ෂයේ මෙහෙයුම් දත්ත
### බෙදාහැරීමේ අංශය 2 හි වාණිජ හා ආයතන ශාඛාව

අංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී වෙත වගකීමට බැඳී සිටින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) විසින් වාණිජ හා ආයතනික ශාඛාවේ ප්‍රධානත්වය දරයි.

වාණිජ හා ආයතනික ශාඛාවේ ප්‍රධාන කාර්‍යයන් වනුයේ,

1 . අංශයේ තුළ ඇති වාණිජ කටයුතු
2 . අංශයේ බලශක්ති කළමනාකරණ කටයුතු
3 . අංශයේ මානව සම්පත් කළමනාකරණ කටයුතු
4 . මනු පරීක්ෂණාගාරයේ කටයුතු

# බෙදාහැරීම් අංශය 2

### 2012 වර්ෂයේ විශේෂ වාණිජ කටයුතු

| | |
|---|---|
| නව බැර සැපයුම් මෙගාවොට් 1 ට වැඩි | මෙ.වොට් 22 (සංඛ්‍යාව 05) |
| නීති විරෝධීව විදුලිබලය පරිහරණය කරන්නන්ගෙන් අය කරගත් මුදල් | රුපි. 35,152,270/* |
| අවසන් කරන ලද ගිණුම්වලින් අයකරගත් හිඟ මුදල් | රුපි. 18,597,095/* |

### බෙදාහැරීම් හානි අඩුකර ගැනීමේ වැඩසටහන

බෙදාහැරීම් හානි අඩුකර ගැනීමේ වැඩසටහන යටතේ, තාක්ෂණික නොවන හානි අඩු කර ගැනීම සඳහා දැඩි ප්‍රයත්නයක් දරනු ලැබීය. ප්‍රධාන තාක්ෂණික නොවන හානි හඳුනා ගනු ලැබූ අතර ඒවා අවම කිරීම පිණිස නව ක්‍රම හඳුන්වා දෙනු ලැබීය.

අවසන් කරනු ලැබූ විදුලි ගිණුම්වල හිඟ මුදල් අයකර ගැනීම, පාඩු අඩු කර ගැනීමේ වැඩසටහන යටතේ, වාණිජ හා ආයතන ශාඛාව මගින් හඳුන්වා දුන් තවත් කටයුත්තක් විය. මෑතකාලීන ගිණුම් අවසාන කරනු ලබන අවස්ථාවේ සම්පූර්ණ හිඟ මුදල් අයකර ගන්නා අතර සම්පූර්ණයෙන්ම අවසන් කරනු ලැබූ පැරණි ගිණුම්වල හිඟ මුදල් අයකර ගැනීම මෙ වැඩසටහනේ ඉලක්කය විය.

### ලංකා විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානය

ලංකා විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානය 2012 දී බෙදාහැරීම් අංශය 2 හි, වාණිජ හා ආයතන ශාඛාවට භාර දෙනු ලැබූ අතර සියළුම පරිපාලන සහ ක්‍රියාකාරී කටයුතු බෙදාහැරීමේ අංශය 2 හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වාණිජ හා ආයතන) විසින් පාලනය කරනු ලබයි.

### මනු පරීක්ෂණ විද්‍යාගාරය

බෙදාහැරීම් අංශය 2 හි මනු පරීක්ෂණ විද්‍යාගාරය, අංකද 209, නුවර පාර, කිරිබත්ගොඩ යන ලිපිනයේ පිහිටා ඇත.
මනු පරීක්ෂණ විද්‍යාගාරයේ ප්‍රධාන කාර්‍යයන් වනුයේ,

1. එකලා හා තෙකලා මනු පරීක්ෂා කිරීම, ක්‍රමාංකනය කිරීම සහ අළුත්වැඩියා කිරීම
2. තොග සැපයුම් මනු ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක්කිරීම
3. නව තොග සැපයුම් පාරිභෝගිකයන්ට නව තොග සැපයුම් මීටර සවි කිරීම
4. තොග සැපයුම් පාරිභෝගිකයන්ගේ දෝෂ සහිත මනු වෙනුවට අලුත් මනු සවිකිරීම
5. තොග සැපයුම් පාරිභෝගිකයන්ගේ දුරස්ථ මනු කියවීමේ ගැටළු නිරාකරණය කිරීම

### විශේෂ මනු පරීක්ෂණාගාර කටයුතු - 2012

| අනු අංකය. | නිම කරනු ලැබූ කාර්යයන් | | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | මනු පරීක්ෂා කිරීම | ගෘහ සේවා මනු | 72,079 |
| | | සෘජු සම්බන්ධතා තෙකලා මනු | 2,619 |
| | | තොග සැපයුම් මනු | 577 |
| | | ගිල්වූ ජනන ස්ථානයන්හි සවිකර ඇති මනු | 16 |
| 2. | අලුත් මනු සවිකිරීම | තොග සැපයුම් මනු | 124 |
| | | ගිල්වූ ජනන ස්ථානයන්හි සවිකර ඇති මනු | 03 |
| 3. | පරණ මීටර ඉවත් කර අළුතින් සවිකිරීම | තොග සැපයුම් මනු | 88 |
| | | ගිල්වූ ජනන ස්ථානයන්හි සවිකර ඇති මනු | 01 |
| 4. | මනු අළුත්වැඩියාව | ගෘහ සේවා මනු | 1,191 |
| | | තෙකලා සෘජු සම්බන්ධතා මනු | 215 |
| 5. | දුරස්ථ මනු කියවීමේ පහසුකම් | ලබාදීම තොග සැපයුම් මීටර ගණන | 2,541 |
| | | තෙකලා සෘජු සම්බන්ධතා මනු | 23 |
| | | මනු කියවීම් ස්ථාන ගණන | 25 |

මනු පරීක්ෂණ විද්‍යාගාරයේ කටයුතු දියුණු කිරීමට එකලා සහ තෙකලා නව ස්වයංක්‍රීය මනු පරීක්ෂණ උපකරණ මෑතදී මිලදී ගනු ලැබීය. මෙකී මනු පරීක්ෂණ උපකරණ භාවිතයෙන්, IEC සම්මතයන් අනුව බල ශක්ති මනු පරීක්ෂා කිරීමට මනු පරීක්ෂණාගාරයට හැකියාව ලැබෙනු ඇත. පාරිභෝගික පරිශ්‍රයන්හි සවිකරනු ලැබ ඇති මනුවල නිරවද්‍යතාවය මෙගින් සහතික කෙරෙනු ඇත.

# බෙදාහැරීම් අංශය 2



කිරිබත්ගොඩ මනු පරීක්ෂණ විද්‍යාගාරයේ තෙකලා මනු පිරික්සුම් ඵලකය (bench)

### මානව සම්පත් * බෙදාහැරීමේ අංශය 2

2012 වසරේ අවසානය වන විට මෙම අංශයට අනුයුක්ත කරනු ලැබ සිටි සේවක සංඛ්‍යාව 3,826 ක් විය. ශ්‍රේණි අනුව සේවක ව්‍යාප්තිය පහත රූප සටහනෙහි දක්වා ඇත.




**කාර්ය මණ්ඩල ව්‍යාප්තිය - බෙදාහැරීමේ අංශය 2**

### කාර්යමණ්ඩල පුහුණුව - 2012

| අනු අංකය | ශ්‍රේණි | පුහුණුව |
|---|---|---|
| 1 | මැද මට්ටම | 100% |
| 2 | ලිපිකරු/යතුරු/ගබඩා | 60% |
| 3 | පුහුණු ශ්‍රේණි | 33% |
| 4 | රියැදුරන් | 56% |

### මානව සම්පත් තොරතුරු පද්ධතිය

මානව සම්පත් කළමනකරණය සඳහා බෙදාහැරීමේ 2 අංශයට මානව සම්පත් තොරතුරු පද්ධති මෘදුකාංගය හඳුන්වා දෙනු ලැබීය. ප්‍රයෝජනයට ගන්නන් පුහුණු කිරීම හා මානව සම්පත් තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස්කිරීමේ කටයුතුත් සියළුම අංශයන්හි සාර්ථකව සම්පූර්ණ කර ඇත.

### ව්‍යාපෘති සහ බැර නඩත්තු ශාඛාව

ව්‍යාපෘති සහ බැර නඩත්තු ශාඛාව, පිළිවෙලින් ගම්පහ සහ මහනුවර පිහිටි, බටහිර කලාපය සහ මධ්‍යම කලාපය යන කාර්‍යාල දෙකකින් සමන්විතවේ. කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන්, ප්‍රාථමික උප පොලවල් හා අටළු අංගන ඉදිකිරීම සහ නඩත්තු කිරීම, ස්වයං පිළිමසු හා CT/PT ඒකක සවි කිරීම මෙම ශාඛාව මගින් සුදු කෙරේ. 2012 වර්ෂය තුළ මෙම අංශ දෙක මගින් ඉටු කළ සේවාවන් පහත දැක්වෙන පරිදි වේ.

### බටහිර කළාපය

#### නිම කරන ලද ප්‍රධාන ඉදිකිරීම් කටයුතු

1. කිලෝවොල්ට් 33 හා කිලෝවොල්ට් 11 ප්‍රමාණයේ LBS සවිකිරීම - සංඛ්‍යාව 06
2. කිලෝවෝල්ට් 33 A/R - සවිකිරීම සංඛ්‍යාව 01
3. මීරිගම පල්ලියේ අටළු අංගනය ඉදිකිරීම
4. කටුනායක අධි වේගී මාර්ගය හරහා කිලෝවෝල්ට් 33 යටි බහන් (UG Cable) ඇතිරීම සහ නැවත සැකසීම

#### නඩත්තු කටයුතු

1. බෙදාහැරීමේ අංශය 2 හි ප්‍රාථමික තරාපැවි වල තෙල් පෙරීම ඇතුළු විදිනෙදා නඩත්තු කටයුතු 2012 වසර සඳහා, සාර්ථකව නිම කිරීම
2. බස්නාහිර පලාත උතුර, මධ්‍යම පලාත සහ නැගෙණහිර පලාත යන පලාත්වල AR ඇතුළුව අටළු අංගන නඩත්තු කටයුතු නිම කිරීම

### කිලෝවෝල්ත 33 කුළුණු රැහැන් ඉදිකිරීමේ කාර්යයන්

| කාර්යය | පලාත | දිග(කි.මී.) | පිරිවැය රුපියල් |
|---|---|---|---|
| ගිනිගත්හේන - ඉඹුල්පිටිය | මධ්‍යම පලාත | 8.1 | 13,626,600 |
| ඉඹුල්පිටිය - උලපනේ/සිංහපිටිය | මධ්‍යම පලාත | 7.7 | 27,721,700 |
| මඩකළපුව - වාලච්චේන අදියර III (17-35) | නැගෙණහිර පලාත | 5 | 2,915,000 |
| ගාල හන්දිය - මංකඩ පාර | බස්නාහිර පලාත උතුර | 2.5 | 19,672,000.00 |
| මඩකළපුව - වාලච්චේන අදියර II | නැගෙණහිර පලාත | 10 | 4,131,000 |
| එකතුව | | | **88,066,300** |

## බෙදාහැරීම් අංශය 2

| COLD රැහැන් නඩත්තු - 2012 | | | | |
|---|---|---|---|---|
| **ප්‍රදේශය** | **කුළුණු රැහැන්** | **කුළුණු ගණන** | **ආසන්න රැහැන් දුර/කි.මී** | **ආසන්න පිරිවැය (රු.පි.)** |
| මීගමුව | කොටුගොඩ - කටුනායක කුළුණු රැහැන් | 36 | 7 | 1,862,695 |
| මාවනැල්ල | ඈදුරුපොත - මාවනැල්ල කුළුණු රැහැන් | 61 | 14 | 1,330,509 |
| කෑගල්ල | තුල්හිරිය - ඈදුරුපොත රැහැන් | 61 | 18 | 1,787,608 |
| ගම්පහ | පූගොඩ - කොස්ගම කුළුණු රැහැන් | 28 | 6 | 386,244 |
| කැලණිය | බියගම කොටුමා උප පොල - බියයගම ආයෝ. මණ්ඩල කුළුණු රැහැන් | 37 | 5.5 | 6,839,789 |
| කෑගල්ල | තුල්හිරිය - ඈදුරුපොත රැහැන් | 27 | 5 | 357,902 |
| ගම්පහ | ඉඹුල්ගොඩ - බැණ්ඩියමුල්ල කුළුණු රැහැන් | | 4.8 | 485,000 |
| ගම්පහ | කොටුගොඩ කොටුමා උප පොල - බැණ්ඩියමුල්ල කුළුණු රැහැන් | 58 | 12 | 829,691 |
| වේයන්ගොඩ | වේයන්ගොඩ කොටුමා උප පොල - මල්වත්ත අටළු අංගනය | 25 | 7 | 921,967 |
| මාවනැල්ල | ඈදුරපොත - මොලගොඩ කුළුණු රැහැන් | | 8 | 742,111 |
| කෑගල්ල | ඈදුරපොත - බුලතුකොහුපිටිය | 100 | 20 | 1,045,475 |
| මාවනැල්ල | මාවනැල්ල - කඩුගන්නාව | 26 | 4 | 1,505,996 |
| **මුළු පිරිවැය** | | | | **18,094,987** |

| කි.වොට් 33 කුළුණු රැහැන් පුණරුත්ථාපනය - 2012 | | | | |
|---|---|---|---|---|
| **ප්‍රදේශය** | **කුළුණු රැහැන්** | **කුළුණු ගණන** | **ආසන්න රැහැන් දුර/කි.මී** | **පිරිවැය රු.පි.** |
| ජා-ඇල | දළුපිටිය - මාබෝලේ කුළුණු රැහැන් | 16 | 3 | 12,467,928 |

### මධ්‍යම පළාත

### කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන් ඉදිකිරීම් කාර්යයන්

### නිම කරණ ලද ප්‍රධාන කාර්යයන්

| කාර්යය | පළාත | විස්තර | දුර/කි.මී | පිරිවැය/රු.පි. මිළි |
|---|---|---|---|---|
| මඩකලපුව - වාලච්චේන අදියර 3 | නැගෙණහිර පළාත | 33kV Lynx ද්විත්ව මාර්ග | 7.2 | 80.4 |
| මඩකලපුව - වාලච්චේන අදියර 4 | නැගෙණහිර පළාත | 33kV Lynx ද්විත්ව මාර්ග | 5 | 90 |

### රැහැන් නඩත්තු කටයුතු

මහනුවර, මාතලේ, පේරාදෙනිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, නාවලපිටිය, ගලගෙදර, මහනුවර නගරය, දඹුල්ල, අම්පාර, මඩකළපුව, කල්මුනෙයි සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයන්හි කිලෝවෝල්ට් 33 සියළුම කුළුණු රැහැන් නඩත්තු කටයුතු පිළිබඳව, ව්‍යාපෘති හා බැර නඩත්තු ශාඛාවේ, මධ්‍යම කලාපීය කාර්යාලයේ, රැහැන් නඩත්තු ඒකකය වගකිව යුතුය. 2012 වර්ෂය තුළ ක්‍රියාවෙහි යොදන ලද කාර්යයන් පහත වගුවේ දැක්වේ.

| COLD රැහැන් නඩත්තු | | | | |
|---|---|---|---|---|
| **ප්‍රදේශය** | **කුළුණු රැහැන්** | **කුළුණු ගණන** | **ආසන්න රැහැන් දුර/කි.මී** | **පිරිවැය රු.පි.** |
| පේරාදෙණිය | ඊරියගම - ගලහ | 93 | 15.30 | 1,242,849 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය - කිතුල්උතුව | 100 | 28.00 | 1,326,968 |
| | ත්‍රිකුණාමලය - මොරවැව | 83 | 20.75 | 783,455 |
| කුණ්ඩසාලේ | කරල්ලියැද්ද - මහියංගනය - රන්දෙනිගල | 149 | 27.00 | 1,525,028 |
| **එකතුව** | | | | **4,878,300** |

බෙදාහැරීම් අංශය 2

| සජීවී රැහැන් නඩත්තු කටයුතු | | | | |
|---|---|---|---|---|
| ප්‍රදේශය | කුළුණු රැහැන් | කුළුණු ගණන | ආසන්න රැහැන් දුර/කි.මී | පිරිවැය රු.පි. |
| කෑගල්ල | කෑගල්ල ප්‍රදේශය | 64 | 21.00 | 576,085 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය - කිතුල්උතුව | | | |
| | ත්‍රිකුණාමලය - මොරවැව | 382 | 104.20 | 259,787 |
| නාවලපිටිය | නාවලපිටිය ප්‍රදේශය | 188 | 59.00 | 1,538,596 |
| **එකතුව** | | | | **2,374,468** |

| වියදම් පියවාගත් කාර්යයන් - 2012 | | |
|---|---|---|
| ප්‍රදේශය/කුළුණ | කාර්යය | පිරිවැය |
| නාවලපිටිය | කිලෝවෝල්ට් 66 රැහැන් (දැනට කිලෝවෝල්ට් 33) නඩත්තු කටයුතු | 1,718,456 |
| | උලපනේ කුළුණු රැහැන් නඩත්තු කටයුතු | 53,675 |
| | දොළොස්බාගේ කුළුණු රැහැන් නඩත්තු කටයුතු | 109,289 |
| | වටප්පොල කුළුණු රැහැන් නඩත්තු කටයුතු | 89,662 |
| | ගම්පොල | 53,410 |
| | දොළොස්බාගේ කුළුණු රැහැන් බිඳ වැටීම් | 807,820 |
| කටුගස්තොට | කටුගස්තොට කුළුණු රැහැන් බිඳ වැටීම් | 214,882 |
| | වලල උකුවෙල රැහැන් පහතින් ඇදීමේ කටයුතු | 565,860 |
| මාතලේ | උකුවෙල කොටුමා උපපොල | 41,494 |
| **එකතුව** | | **3,654,549** |

කුළුණු රැහැන් ඉදිකිරීමේ කටයුතු





## බෙදාහැරීම් අංශය 2

### රැහැන් නඩත්තු කටයුතු





### සැලසුම් හා සංවර්ධන ශාඛාව

සැලසුම් හා සංවර්ධන ශාඛාවේ ප්‍රධානියා වනුයේ සැලසුම් හා සංවර්ධන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා යටතේ, ප්‍රධාන විදුලි ඉංජිනේරුවරුන් දෙදෙනෙක් සහ විදුලි ඉංජිනේරුවරුන් හය දෙනෙක් සේවයේ යෙදී සිටිති.

විශ්වසනීයතාව, අංශයට අවශ්‍යය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, ගිල්වූ විදුලිබල උත්පාදනය, ගිල්වූ ජනන යන්ත්‍ර ආශ්‍රිත ගැටළු, තාක්ෂණික හානි අඩුකිරීම සහ ග්‍රාමීය විදුලිබල සැපයුම සම්බන්ධිත ගැටළුවලට විසඳුම් ලබාදීමට කටයුතු කරයි. එය ප්‍රධාන වශයෙන්, මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීම් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ මධ්‍යම වෝල්ටීයතා ජාලය සංවර්ධනය කිරීමේ යෙදී සිටියි.

### සැලසුම් සකස් කිරීම

වාර්ෂිකව මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා ජාලයන් වැඩිදියුණු කිරීමට යොජනා ඉදිරිපත් කරන හා දිගු කාලීන මධ්‍යම වෝල්ටීයතා ජාල සංවර්ධන සැලසුම් සකස් කරන්නාවූ පලාත් සැලසුම් ඒකක සමග සම්බන්ධවෙමින් මෙම ඒකකය කටයුතු කරයි.

වාහන, උපකරණ, කොන්ත්‍රාත්කරුවන් ආදියේ හිඟකම නිසා, 2012 වර්ෂයට අදාළ මධ්‍යම වෝල්ටීයතා යෝජනාවන් ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රමාදයන් ඇතිවීය. මධ්‍යම වෝල්ටීයතා යෝජනාවන් කල්වේලා ඇතිව ක්‍රියාත්මක නොකිරීම නිසා, සැලසුම් කළ පරිදි, බලශක්ති හානිය අපේක්ෂිත ආකාරයෙන් අඩුකර ගැනීමට සහ සැපයුමේ ගුණාත්මක බව මුදුන් පමුණුවා ගැනීමට නොහැකිවී ඇත.

එක් එක් ශාඛාවට පවරනු ලැබූ කාර්යයන්හි ප්‍රගතිය මෙම ශාඛාව මගින් නිරතුරුව අධීක්ෂණය කරයි. අනෙකුත් කාර්යයන් පලාත්වලට පවරනු ලබන අතර කුළුණු රැහැන්, අටළු අංගන වැනි බැර ඉදිකිරීම් කාර්‍යයන් සහ ප්‍රාථමික උපපොල වර්ධනය කිරීම හා ඉදිකිරීම, ව්‍යාපෘති හා බැර නඩත්තු ඒකකයට පවරනු ලබයි.

### ද්‍රව්‍ය කළමනාකරණය

ද්‍රව්‍ය කළමනාකරණය සැලසුම් හා සංවර්ධන ශාඛාවේ වගකීම් වලින් එකකි. ප්‍රධාන විදුලි ඉන්ජිනේරු (ද්‍රව්‍ය කළමනාකරණ) විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ ද්‍රව්‍ය සැලැස්ම පිළියෙල කරයි.

2012 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තු ගත පිරිවැය සහ මිලදී ගත් ද්‍රව්‍යයන්හි සැබෑ මිල ගණන් පහත රූප සටහනෙහි දක්වා ඇත.



## බෙදාහැරීම් අංශය 2

### ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලි බලය සැපයීම

බෙදාහැරීමේ අංශය 2 හි පිහිටි පලාත් තුන බෙදාහැරීමේ අංශය 2 හි ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මෙම ව්‍යාපෘති සඳහා, විමධ්‍යගත අයවැය හෝ අදාළ පලාත් සභා අයවැය හරහා විදේශීය ඒජන්සි ආයතන මගින් අරමුදල් සපයයි. 2012 වසර තුළ එක් එක් පලාත් සභාව මගින් නිමකරන ලද කාර්යයන් ගණන පහත වගුවෙහි දැක්වේ.

| පලාත | කාර්යයන් ගණන |
|---|---|
| නැගෙණහිර පලාත | 411 |
| මධ්‍යම පලාත | 794 |
| බස්නාහිර පලාත උතුර | 332 |

### ව්‍යාපෘති සාමායෝජනය කිරීම

2012 වර්ෂය තුළදී, සැලසුම් හා බෙදාහැරීමේ ශාඛාව මගින් හසුරුවන ලද එක් එක් ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

- "මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ හානි අඩුකර ගැනීම" පිළිබඳව දත්ත රැස්කිරීමේ සමීක්ෂණය, ආසියානු සංවර්ධන බැංකු උපදේශකයන්ගේ තාක්ෂණික සහාය ඇතිව සිදු කරනු ලැබීය. දුර බැහැර ප්‍රදේශයන්හි විදුලිබල සැපයුම වැඩි දියුණු කිරීම සඳහා කිලෝවෝල්ට් 33 කිලෝමීටර් 130 ක් දිග DC කුළුණු රැහැන් සහ කිලෝවෝල්ට් 33 අටළු අංගන පහක් ඉදිකිරීම, සඳහා වූ කාර්යය විෂය පථය, පිරිසිදු බලශක්තිය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ පැකේජය 4 යටතේ, ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයීම සඳහා අනුමත කරනු ලැබීය.
- "කිරිබත්ගොඩ, කටුනායක, නාවල සහ කොටිකාවත්ත යන නගරවල ඉදිකිරීමට යෝජිත ප්‍රාථමික උප පොලවල් කරා කිලෝවෝල්ට් 33 විදුලි රැහැන් ඉදිකිරීම" සඳහා වූ කාර්ය විෂයපථය, පිරිසිදු බලශක්තිය සහ ඒකරා පිවිසුම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කොටස 3, පංගුව බී යටතේ, ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයීම සඳහා අනුමත කරනු ලැබීය.
- "ශ්‍රී ලංකාව ආලෝකනය කිරීමේ නැගෙණහිර පලාත් ව්‍යාපෘතිය" සඳහා වූ ණය ගිවිසුමේ ණය සඵලතාව චීනයේ එක්සිම් බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2012 මැයි මාසයේදී, ප්‍රකාශයට පත් කරනු ලැබීය.
- ත්‍රිකුණාමල ඒකාබද්ධ යටිතල සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රංශ අරමුදල් භාවිතයෙන් 2012 වසර තුළ දී නිම කරනු ලැබීය.
- පවිත්‍ර හා පුනර්ජනනීය බලශක්තිය සඳහා ලිංග භේදය නොසළකා පිවිසුම ඉහළ නැංවීමට, ජපානය විසින් අරමුදල් සපයූ, දිළිඳුබව පහත හෙළීමේ, අංක 9158 දරන ප්‍රදානයේ කාර්ය විෂයපථය, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව, අවසන් කරනු ලැබීය.
- "විදුලිබල සැපයුම් පද්ධති කාර්යක්ෂමතාවය" පිළිබඳ දත්ත රැස්කිරීමේ සමීක්ෂණය, ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ සමීක්ෂණ කාණ්ඩායමේ තාක්ෂණික සහයෝගය ඇතිව සිදු කරනු ලැබීය.
- ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයූ, තිරසාර බලශක්ති අංශ සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ ද්‍රව්‍ය බෙදාහැරීම 2012 ජනවාරි මාසයේදී ආරම්භ කරනු ලැබීය.

### ඉදිකරීම් ප්‍රගතිය - 2012

#### නැගෙණහිර පලාත

| අරමුදල් වර්ගය | කාර්යයන් ගණන | කාර්යයයේ ප්‍රමාණය | | | | | පිරිවැය රු. මිලි |
|---|---|---|---|---|---|---|---|
| | | HT | LT | S/S | 1 – 3 Ph | 2–3 Ph | |
| විම. අයවැය | 74 | | 7.87 | | | | 9.49 |
| පලාත්සභා අයවැය | 21 | | 2.89 | | | | 3.34 |
| AREP | 5 | 11.7 | 38.1 | 6 | | | 80.34 |
| BS | 45 | 11.55 | - | 44 | | | 114.13 |
| විගෙවනලදෂ | 88 | 0.66 | 2.19 | 6 | | | 74.66 |
| RE-08 | 27 | 7.56 | 46.93 | 3 | | | 78.99 |
| LSE | 58 | 3.872 | 41.41 | 3 | | | 63.62 |
| SYA | 44 | 13.1 | 3.63 | 8 | 8.15 | | 32.73 |
| ආ.ස.බැ | 94 | 21.31 | 147.1 | 10 | 6.042 | 0.04 | 242.92 |
| NN | 216 | 58.42 | 438.95 | 49 | 26.310 | 1.03 | 775.68 |
| UU | 4 | 4.89 | 32.66 | 4 | | | 54.72 |
| BSF | 4 | 9.71 | - | 1 | | | 28.83 |
| **එකතුව** | **680** | **142.8** | **822.81** | **134** | | | **1,559.45** |

AREP - කඩිනම් ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය, LSE - ශ්‍රී ලංකාවේ නැගෙණහිර ආලෝකනය කිරීම,
UU - ඌව උදානය, ADB - ආසියානු සංවර්ධන බැංකුව, NN - නැගෙණහිර නවෝදය,
BSF - මණ්ඩලයේ විශේෂ අරමුදල, DCB - විමධ්‍යගත අයවැය, PCB - පලාත් සභා

# බෙදාහැරීම් අංශය 2

### බස්නාහිර පලාත උතුර

| අරමුදල් වර්ගය | කාර්යයන් ගණන | කාර්යයේ ප්‍රමාණය | | | පිරිවැය රු. මිලියන |
|---|---|---|---|---|---|
| | | HT (කිමී) | LT (කිමී) | S/S | |
| විමධ්‍යගත අයවැය | 3 | - | 0.274 | - | 0.18 |
| පලාත් සභා අයවැය | 22 | - | 2.087 | - | 2.47 |
| පද්ධති වර්ධනය කිරීම | 69 | 2.898 | 30.142 | 22 | 115.48 |
| රන් අරුණ | 332 | - | 51 | 1 | 93.00 |
| රැහැන් නඩත්තු කිරීම | 108 | 75.216 | 2.1 | 30 | 59.82 |

### මධ්‍යම පලාත

| අරමුදල් වර්ගය | | කාර්යයන් ගණන | කාර්යයේ ප්‍රමාණය | | | පිරිවැය රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| | | | අධිසැර (කිමී) | අඩුසැර (කිමී) | අඩුසැර | |
| විමධ්‍යගත අයවැය | | 139 | 0 | 24.15 | | 27.70 |
| පලාත් සභා අයවැය | | 396 | 2 | 70.68 | 2 | 102.03 |
| ආපසු අයකරගත් ගාස්තුව | තොග සැපයුම් | 83 | 17.98 | 0.65 | 65 | 179.44 |
| | බෙදාහැරීම් | 72 | 48.49 | 30.01 | 16 | 166.38 |
| පද්ධති වර්ධනය කිරීම | | 185 | 14.81 | 98.32 | 7 | 72.48 |
| කඩිනම් ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය | | 30 | 26.05 | 60.62 | 11 | 150.83 |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම - මධ්‍යම පලාත | | 111 | 1.56 | 49.78 | 3 | 76.81 |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම - කෑගල්ල දිස්ත්‍රික්කය | | 27 | 1.65 | 9.3 | 2 | 17.07 |
| ගැමි විදුලියන ව්‍යාපෘතිය - 8 | | 850 | 38.82 | 421.98 | 48 | 759.58 |
| රන් අරුණ | | | | | | |
| සිඩා (SIDA) | | 9 | 16.45 | 26.68 | 9 | 84.01 |

### නිමවූ මධ්‍යම වෝල්ටීයතා/ අඩු වෝල්ටීයතා ජාල සංවර්ධන කටයුතු - 2012

| පලාත | නව බෙදාහැරීමේ උපපොල සංඛ්‍යාව | සංවර්ධනය කල උපපොල සංඛ්‍යාව | නව මධ්‍යම වෝල්ටීයතා කි.මී. | නව අඩු වෝල්ටීයතාන් කි.මී. | අඩු සැර රැහැන් පරිවර්තන |
|---|---|---|---|---|---|
| **බ.පලාත උතුර** | 22 | 9 | 2.898 | 6.679 | 23.463 |
| **මධ්‍යම පලාත** | 90 | 3 | 121.5 | 822.8 | 41.5 |

### බලශක්ති කළමනාකරණ ඒකකය

1) සාමාන්‍ය සැපයුම් මනු පරීක්ෂා කිරීම

අ) එකලා පරීක්ෂාකිරීම

| අයිතමය | බ.පලාත උතුර | මධ්‍යම පලාත |
|---|---|---|
| පරීක්ෂා කරන ලද මනු ගණන | 7494 | 1573 |
| ප්‍රතිස්ථාපනය කළ මනු ගණන | 726 | 95 |
| සැපයුම් ස්ථාන සැකසීම | | |
| මනු සිඳනළු | 913 | |
| නව සිඳනළු සැකසීම | 122 | |
| සැකැසීම ගලපා නිවැරදි කිරීම | 62 | |
| සවි කළ මනු පෙට්ටි ගණන | 1283 | |
| මනු අපවේශනය සොයා ගැනීම් | 130 | 75 |

ආ) තෙකලා පරීක්ෂා කිරීම

| අයිතමය | බ.පලාත උතුර | මධ්‍යම පලාත |
|---|---|---|
| පරීක්ෂා කරන ලද මනු ගණන | 3544 | 869 |
| ප්‍රතිස්ථාපනය කළ මනු ගණන | 174 | |
| සැපයුම් ස්ථාන සැකසීම | 98 | 211 |
| පාරිභෝගික බැර පරීක්ෂණය | 22 | 21 |
| සදෘෂ්‍ය මනු ප්‍රතිස්ථාපනය සඳහා සවිකළ මනු ගණන | 57 | 170 |

2) තොග සැපයුම් මනු පරීක්ෂාව

| අයිතමය | බ.පලාත උතුර | මධ්‍යම පලාත |
|---|---|---|
| සිරිත් පරිදි පරීක්ෂා කළ මනු ගණන | 951 | 591 |
| වි.ඉ. ඉල්ලීම් අනුව පරීක්ෂා කළ මනු ගණන | 48 | |
| දෝෂ හේතුවෙන් ප්‍රතිස්ථාපිත මනු ගණන | 93 | |
| ප්‍රතිස්ථාපිත මනු ගණන - වර්ධනය කිරීම | 15 | |
| අළුත් සම්බන්ධතා සඳහා සවි කළ මනු ගණන | 63 | |
| දුරස්ථ මනු කියවීම් සෝදිසි කරන්නා | 106 | |
| අධිසැර මනු නැවත තබැදුම් කිරීම, තරාපැවි නිබන්ධන සත්‍යෝක්ෂනය | 09 | |
| ස්වයං ජනනය සඳහා සවි කළ මනු ගණන | 20 | |
| මනු විතැන් කිරීම සඳහා සවි කළ මනු ගණන | 01 | |

### 2012 වසරේ විශේෂ අවස්ථා

### බස්නාහිර පලාත උතුර

›› **බස්නාහිර පලාත උතුර ඇමතුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ විදුලි පාරිභෝගියන්ට කාර්යක්ෂම සහ සුහද සේවයක් සැපයීමේ අරමුණ ඇතිව බස්නාහිර පලාත උතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ඇත. දවසේ පැය විසි හතර පුරා මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන අතර එකවර පාරිභෝගිකයන් විසි දෙනෙකුට සේවය සැළසිය හැකිය.

011 5 988 988 ඇමතීමෙන් විදුලි පාරිභෝගිකයන්ට පහත සඳහන් සේවාවන් ලබා ගත හැකිය.

1. විදුලි සැපයුමේ බිඳවැටීම් වාර්තා කිරීම
2. නීති විරෝධී විදුලි පරිභෝජනයන් පිළිබඳව වාර්තා කිරීම
3. කාලීන විදුලි ඇනහිටීම් පිළිබඳව අසා දැන ගැනීම
4. ලංකා විදුලිබල මණ්ඩලයේ බස්නාහිර පලාත උතුරට අදාළ වෙනත් ඕනෑම තොරතුරක් දැන ගැනීමට



### නැගෙණහිර පලාත

›› **බලශක්ති සංරක්ෂණයපිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන**

නැගෙණහිර පලාත තුළ, බලශක්ති සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය.





ත්‍රිකුණාමලයේ රාජකීය විද්‍යාලයේදී පවත්වන ලද වැඩසටහන

›› **දුරස්ථ ප්‍රදේශයන්හි පවත්වන ලද ජංගම සේවාවන්**

2012 වසර තුළ නැගෙණහිර පලාතේ ජංගම සේවාවන් තුනක් පවත්වන ලදී. දුරස්ථ ප්‍රදේශයන්හි සිටින පාරිභෝගිකයන්ට මෙමගින් ප්‍රතිලාභ ගෙන දෙයි. ජංගම සේවාවන් පවත්වන ලද ස්ථානයන් වූයේ, දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව සහ කන්තලේය. මෙම වැඩසටහන යටතේ, දුරස්ථ ප්‍රදේශයන්හි පාරිභෝගිකයන්ට, සියළුම ප්‍රාදේශීය කාර්යාල සේවාවන් ලබා දෙන ලදී.

## බෙදාහැරීම් අංශය 2

ජංගම සේවාවන්හිදී ලබා දෙන ලද සේවාවන්

- පාරිභෝගිකයාට එක් දිනක් තුළ සේවා සම්බන්ධතා ලබාදීම
- පාරිභෝගියා වෙතින් එක් දිනක් තුළ අයදුම්පත් ලබාගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ගෙවීම් ලබා ගැනීම සහ සම්බන්ධතාවන් ලබා දීම
- බිල්පත් ආරවුල් සමතයකට පත්කිරීම
- හිඟගාස්තු ඇතුළුව බිල්පත් නිරවුල් කිරීමට අවස්ථාව සලසාලීම
- විදුලිබල යෝජනාක්‍රම සහ සේවා දිගු සඳහා පාරභෝගිකයන් වෙතින් ලද ඉල්ලීම් විමර්ශනය සඳහා ලබා ගැනීම



කන්තලේ පවත්වන ලද ජංගම සේවය

### තොග සහ සාමාන්‍ය පාරිභෝගික සේවා ප්‍රදේශ අනුව පාරිභෝගික සමිති පිහිටුවීම

තොග සහ සාමාන්‍ය පාරිභෝගිකයන් සඳහා පාරිභෝගික සමිති පිහිටුවනු ලැබීය. ප්‍රාදේශීය සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මට්ටමින් රැස්වීම් පවත්වනු ලැබූ අතර හඳුනාගත් ගැටළු සාකච්ඡා කොට විසඳා ලනු ලැබීය. තවද, බලශක්ති සංරක්ෂණය සහ විදුලිය සඳහා ඉහළම ඉල්ලූමක් ඇති කාලය තුළ විදුලිය පරිභරණය අඩු කරන ලෙසත් පාරිභෝගිකයන් දැනුවත් කරනු ලැබීය.

### මධ්‍යම පලාත

චිත්‍ර හා රචනා තරඟයක් ද පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබීය.

### බෙදාහැරීමේ අංශය 2 තුළ එස් 5 සංකල්පය යොදා ගැනීම

ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය තුළ එස් 5 සංකල්පය පුළුල් පදනමින් භාවිතා කිරීම ස්ථාපිත කර දිරිගැන්වීමෙන්, පාරිභෝගිකයනට එමගින් විශාල වශයෙන් ප්‍රතිලාභ අත්කර දෙමින් පවත්වන ලද එස් 5 සහ නව්‍යකරණය පිළිබඳ තරඟයෙන් පහත සඳහන් ත්‍යාගයන් පිරිනමනු ලැබීය.

- ප්‍රථම ස්ථානය - ප්‍රාදේශීය කාර්යාලය, කැළනිය
- දෙවන ස්ථානය - ප්‍රාදේශීය කාර්යාලය, දිවුලපිටිය
- තුන්වන ස්ථානය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වානිජ හා ආයතනික) කාර්යාලය
- කුසලතා සම්මානය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(නැගෙණහිර) කාර්යාලය
- කුසලතා සම්මානය - ප්‍රාදේශීය කාර්යාලය, පේරාදෙනිය

### කුණ්ඩසාලේ ප්‍රදේශය

- ISO 9001, 2008 තත්ත්ව කළමනාකරණ සහතිකය දිනා ගන්නා ලදී
- ප්‍රදේශයේ මධ්‍යම වෝල්ටීයතා පද්ධතියෙහි දෝෂ ස්වයංක්‍රීයව හඳුනා ගැනීම සහ දෝෂ සහිත කොටස වෙන්කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය
- JASTICA ආයතනය මගින් පවත්වන ලද TAIKI AKIMOTO එස් 5 තරඟයේදී පහත සඳහන් ත්‍යාගයන් ලබා ඇත.
    - විශිෂ්ටත්වය පිළිබඳව, තරඟයේ දෙවැන්නාට හිමිවන ත්‍යාගය
    - Kaizen ත්‍යාගය
    - අංශ ත්‍යාගය (කුඩා පරිමානයේ සේවා)
- ජාතික ඵලදායිතා ලේකම් කාරය්‍යාලය මගින් පවත්වන ලද ජාතික ඵලදායිතා තරඟයෙන් තරඟයේ දෙවැන්නාට හිමිවන ත්‍යාගය (සේවා අංශය, මධ්‍යම)
- දුම්බර පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ පවත්වන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ එස් 5 තරඟයේ දී තරඟයේ දෙවැන්නාට හිමිවන ත්‍යාගය

# බෙදාහැරීම් අංශය 3

## 2012 වසරේ උද්දීපනයන්

| විස්තරය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| වර්ෂය තුළ දී බෙදාහැරීමේ අංශය 3 කලාපය තුළ විකුණන ලද ඒකක ගණන | ගි.වෝ.පැ | 1,938 |
| විකුණන ලද ඒකක ප්‍රමාණයෙන් උපයා ගන්නා ලද ආදායම | රු. මිලියන | 27,934 |
| සාමාන්‍ය විකුණුම් මිල | රු./කි.වෝ.පැ | 14.41 |
| බෙදාහැරීමේ හානි | % | 10.3 |
| අයවීමට ඇති මුදල් තත්ත්වය | මාස | 0.96 |
| වර්ෂය අවසානයේදී කලාපය තුළ ඇති සිල්ලර පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 1,208,772 |
| වර්ෂය තුළ ලබා දෙන ලද නව සම්බන්ධතා ගණන | සංඛ්‍යාව | 56,831 |
| වර්ෂය අවසානය වන විට සේවයේ නියුතු සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,867 |
| වර්ෂය අවසානයේදී තොග සැපයුම් පාරිභෝගිකයන් ගණන | සංඛ්‍යාව | 1,814 |
| පාරිභෝගිකයෙකුගෙන් මාසයකට ලැබෙන සාමාන්‍ය ආදායම | රු./මාස | 1,923 |
| වර්ෂය අවසානයේදී එක් සේවකයෙකු සඳහා ඇති සාමාන්‍ය සිල්ලර පාරිභෝගිකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 422 |
| එක් බෙදාහැරීමේ උප පොලකට ඇති සිල්ලර පාරිභෝගිකයන් | සංඛ්‍යාව | 263 |
| එක් සේවකයෙකු සඳහා අඩු වෝල්ටීයතා රැහැන් සාමාන්‍ය දිග | කි.මී./සේවක) | 9.4 |
| එක් පාරිභෝගිකයෙකු සඳහා අඩු වෝල්ටීයතා රැහැන් සාමාන්‍ය දිග සංඛ්‍යාව(මී/පාරිභෝගික) | මී./පාරිභෝගික | 22.36 |
| බෙදාහැරීමේ උප පොලක් සඳහා ඇති මධ්‍යම වෝල්ටීයතා රැහැන් සාමාන්‍ය දුර | කිමී/ උප පොල | 1.5 |
| විදුලිය සැපයීමේ මට්ටම | % | 90.0 |
| කිවෝ 33/11උපපොළ සංඛ්‍යාව | සංඛ්‍යාව | 39 |
| අඩුසැර බෙදාහැරීම් උපපොල සංඛ්‍යාව | සංඛ්‍යාව | 5,230 |
| පුනර්ජීවන බලශක්ති බලාගාර සංඛ්‍යාව | සංඛ්‍යාව | 24 |
| එම මුළු ධාරිතාවය | මෙගවොට් | 51.34 |
| විදුලිය සඳහා ඇති නිවාස ප්‍රතිශතය | % | 83 |

රූප සටහන මගින් දක්වා ඇති පරිදි, සබරගමුව පලාත, ඌව පලාත, බස්නාහිර පලාත දකුණ 2 නමින් දැක්වෙන, බස්නාහිර පලාතේ කොටස මගින් බෙදාහැරීමේ අංශය 3 හි මෙහෙයුම් ප්‍රදේශය ආවරණයවේ. බස්නාහිර පලාත දකුණ 2, හෝමාගම, ශ්‍රී ජයවර්ධන පුර, අවිස්සාවේල්ල සහ හොරණ යන ප්‍රදේශයන්ගෙන් ආවරණය වන අතර රත්නපුර දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කය යන ප්‍රදේශයන්ගෙන් සබරගමුව පලාත සමන්විතවේ. බදුල්ල දිස්ත්‍රික්කය, මොණරාගල දිස්ත්‍රික්කය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටසකින් ඌව පලාත සමන්විතවේ. කලාපය 3 නමින් ද හැඳින්වෙන බෙදාහැරීමේ අංශය 3, දිවයිනේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 23% ක් පමණ ආවරණය කරයි. 2012 නවර්ෂයේ, මෙම කලාපයේ සමස්ථ ජනගහනය මිලියන 5.7 ක් පමණ විය. කලාපයේ ඉහළම විදුලි සැපයුම් මට්ටම වන 99% බස්නාහිර පලාත දකුණ 2 න් වාර්තා වූ අතර අඩුම ප්‍රමාණය වන 84% ඌව පලාතෙන් වාර්තාවීය. සබරගමුව පලාතේ විදුලි සැපයුම් මට්ටම 92% ක් විය.

2012 වර්ෂය තුළ දී, මෙම කලාපය තුළ වාර්ෂික ඒක පුද්ගල විදුලි පරිභෝජනය ඒකක 1,601 ක් විය. ඒකක 2,979 ක් වූ ඉහළම වාර්ෂික ඒක පුද්ගල විදුලි පාරිභෝජනය බස්නාහිර පලාත දකුණ 2 වාර්තා වූ අතර ඒකක 948 ක් වූ අඩුම වාර්ෂික ඒක පුද්ගල විදුලි පාරිභෝජනය ඌව පලාතේ පැවතිණි. කලාපය 3 හි වඩත් ලාභදායක කොටස බස්නාහිර පලාත දකුණ 2 වූ අතර සබරගමුව සහ ඌව පලාත්වල ඇතැම් ප්‍රදේශයන්හි ව්‍යාපාර කටයුතු සතුටුදායක මට්ටමට පහතින් පැවතිණි.




**කලාපය 3 හි භූගෝලීය මායිම්**

### මෙහෙයුම් ව්‍යුහය

සෘජුවම සාමාන්‍යාධිකාරීවරයාට වගකිව යුතු වූ අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු, ලංකා විදුලිබල මණ්ඩලයේ කලාප 3 හි ප්‍රධානියා විය. මොහයුම් අරමුණු උදෙසා, මෙම කලාපය සබරගමුව, ඌව සහ බස්නාහිර පලාත දකුණ 2 යන පලාත් තුනකට බෙදා තිබිණි. එක් එක් පලාතක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුගේ පාලනය යටතේ පැවතිණි. සෑම පලාතක්ම නැවත ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු විසින් පාලනය කරනු ලබන ප්‍රදේශවලට බෙදා තිබිණි. එලදායි පරිපාලනයක් පවත්වා ගෙන යාම උදෙසා, කලාපය තුළ ප්‍රාදේශීය කාර්යාල 15 ක් ද පාරභෝගික සේවා මධ්‍යස්ථාන 46 ක් ද ක්‍රියාත්මක විය.

පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාට අමතරව, කලාපයේ ව්‍යාපෘති හා බැර නඩත්තු කටයුතු, සැලසුම් හා සංවර්ධන කටයුතු සහ වාණිජ හා ආයතන කටයුතු පිළිබඳව සොයා බැලීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

## බෙදාහැරීම් අංශය 3

තිදෙනෙකු වූහ. වාණිජ හා ආයතනික ශාඛාව මගින් ආදායම් අධීක්ෂණය, කාර්මික නොවන හානි අඩු කිරීම, බලශක්ති කළමනාකරණය, ඉංජිනේරු විගණනය සහ මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධන කටයුතු යන කාර්යයන් ඉටු කරයි. සැලසුම් හා සංවර්ධන ශාඛාව මගින් විශ්වසනීයතාව, මධ්‍යම වෝල්ටීයතා ජාල සංවර්ධනය, බෙදාහැරීම් අංශය 3 සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, විදුලි උත්පාදනය ආශ්‍රිත කටයුතු, තාක්ෂණික හානි අඩුකරගැනීම සහ විදුලි බලය සැපයීම පිළිබඳ ගැටළු සඳහා විසඳුම් සෙවීමට කටයුතු කරයි. ව්‍යාපෘති සහ බැර නඩත්තු ශාඛාව කිලෝවෝල්ට් 33 වානේ කුළුණු රැහැන්, කිලෝවෝල්ට්33/ කිලෝවෝල්ට් 11 ප්‍රාථමික උප පොලවල්, කිලෝවෝල්ට් 33, අටළු අංගන, ස්වයං පිළිමසු සහ අධි සැර මානනය ට්‍රාන්ස්ෆෝමර ඉදිකිරීම, නඩත්තුව හා පුනරුත්ථාපනය සිදු කරයි. කිලෝවෝල්ට් 33 වානේ කුළුණු රැහැන්වල හදිසි නඩත්තු කටයුතු ද මෙම ශාඛාව මගින් ඉටු කරයි. පලාත් කාර්යාල මගින් සිදු කරනු ලබන මූල්‍ය සහ ආදායම් කටයුතු අංශයේ අතිරේක මූල්‍ය කළමනාකරු විසින් අධීක්ෂණය කරයි. මානව සම්පත් කටයුතු සිදු කිරීම සඳහා සෑම පලාතකම මානව සම්පත් නිලධාරියෙකු බැගින් සිටී. මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ආයතන කාර්යාලයට සම්බන්ධිත සියළුම විධායක නිලධාරීන්ගේ හා කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කටයුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ ආයතනික) යටතේ ඇති ඒකකයක් මගින් ක්‍රියාත්මක කරයි.

### පලාතේ අන්තර්ගත විදුලි ජනක ස්ථාන

කුඩා පරිමාණයේ විදුලි බලාගාර අතරින් 90%ක් පමණ බෙදාහැරීම් අංශය 3 තුළ පිහිටා ඇත. දැනට, අන්තර්ගත (embdded) ජනක ස්ථාන 337 ක් පමණ බෙදාහැරීම් අංශය 3 තුළ පිහිටා ඇති අතර, මේවා බොහෝ දුරට කුඩා ජල විදුලි බලාගාරයන්වේ. මේවා අතරින් 65%ක් සබරගමුව පලාතේ පිහිටා ඇති අතර 34%ක් ඌව පලාතේ පිහිටා ඇත. බලාගාර 75 ක් නිෂ්පාදනය ආරම්භ කර, මෙගාවොට් 157 විදුලි බලය ජාතික ජාලයට එක්කරමින්, අංශයේ බෙදාහැරීමේ ජාලයට සම්බන්ධ කර ඇත. එසේ වුවත් ඇතුළට ගිල්වූ ජනක යන්ත්‍ර පිළිබඳ නව යෝජනාවන් ඉදිරියට කරගෙන යාම නැවතීමට මඟ පෙන්වූ ගැටළු කිහිපයක් විය. ඒවා අතරින් සමහරක් වූයේ, දැනට පවත්නා ජාලයේ ප්‍රමාණවත් රැහැන් ධාරිතාවක් නොවීමයි. මේ හේතුව නිසා, කුඩා බලාගාර සඳහා පවා සමර්පණ පෝෂකයන් (dedicated feeders) ඉදිකිරීමට සිදු වන අතර නව පෝෂකයන් සඳහා නව රැහැන් මාර්ග සොයා ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවන් මතුවීමයි. තව ද අංශය තුළ ඇති කොටුමා උපපොලවල් වැඩි ප්‍රමාණයක් ඉඩ ලබා දිය හැකි බෙදා හැරීමේ සීමාවන් ඉක්මවා ගොස් ඇත. මෙලෙස, ඇතැම් අංශය තුළ ඇති සමහර කොටුමා උපපොලවල් සඳහා නව යෝජනාවන් ක්‍රියාත්මක කරනු නොලැබීය. දැනට ඇති බෙදාහැරීමේ විෂය පථය ඉක්මවූ නව බෙදාහැරීමේ යෝජනාවන්ගෙන් පමනක් මෙම ගැටළුව විසඳිය හැකිව තිබිණි.

### බෙදාහැරීම් අංශය 3 හි ප්‍රධාන අරමුණු

- පවත්නා පාරිභෝගික ජාලයට වැඩි පාරිභෝගිකයන් සංඛ්‍යාවක් සම්බන්ධ කර ගැනීම
- සැපයුම් විශ්වසනීයතාව සතුටුදායක මට්ටමක පවත්වා ගෙන යාම
- සැපයුම් ගුණාත්මක බව විශේෂිත මට්ටමක පවත්වා ගෙන යාම
- තාක්ෂණික හානි, තාක්ෂණික නොවන හානි ආදී සියළු අලාභයන් අවම කිරීමට පූර්වෝපායයන් යෙදීම
- පාරිභෝගිකයන්ට අදාළ සියළු කරුණු පිළිබඳව සොයා බැලීම සහ අවම කාලයක් තුළ විසඳුම් ලබාදීම
- පාර්ශවකරුවන්ගේ උපරිම සන්තෘප්තිය උදෙසා සියළු සේවාවන් සැපයීම

| බෙදාහැරීමේ ව්‍යුහය | | |
|---|---|---|
| බෙදාහැරීමේ රැහැන් | කි.මී. | 6,836.65 |
| කිලෝවෝල්ට් 11 ඉහළින් ඇද ඇති රැහැන් | කි.මී. | 49.68 |
| කිලෝවෝල්ට් 11 භූගත රැහැන් | කි.මී. | 3.90 |
| කිලෝවෝල්ට් 33/11 ප්‍රාථමික උපපොල | සංඛ්‍යාව | 11.00 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන් | කි.මී. | 27,067.78 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොල | සංඛ්‍යාව | 4,597 |
| සේවා සම්බන්ධතා | සංඛ්‍යාව | 431,917 |

### 2012 වර්ෂය තුළ විකුණුම්

සමස්ථ දිවයිනෙහි (ලංකා විදුලි සමාගම මගින් කළ විකුණුම් හැර) විදුලිබල විකුණුම් අතරින් 21%ක් බෙදාහැරීම් අංශය 3 න් වාර්තාවීය. 2012 වර්ෂය තුළ ලංකා විදුලි සමාගම මගින් විකුණන ලද විදුලිබලය හැර, ලංකා විදුලිබල මණ්ඩලය මගින් විකුණන ලද ගිගාවොට්පැය 1938 ක විදුලිබලය පසුගිය 2011 වර්ෂය සමග සසඳා බැලීමේදී 5% ක වර්ධනයක් විය. බෙදාහැරීම් අංශය 3 හි විදුලි අලෙවියෙන් වැඩි කොටස කාර්මික අය කිරීම් කාණ්ඩයෙන් ලැබී ඇති අතර එය අංශයේ මුළු විකුණුම්වලින් ආසන්න වශයෙන් 44% ක් විය. ඉන් අනතුරුව, පැවති වැඩිම විකුණුම් ප්‍රමාණයන් ගෘහස්ථ හා පොදු අරමුණු අය කිරීම් කාණ්ඩයන්ගෙන් ලැබිණි. අංශයේ මුළු විකුණුම් අතරින් 55% ක් බස්නාහිර පලාත දකුණ 2 න් වාර්තා වන අතර ඊළඟට වැඩිම විකුණුම් පිළිවෙලින් සබරගමුව හා ඌව පලාත්වලිනි.




අංශ අනුව විකුණුම්




අයකිරීම් වර්ගය අනුව විදුලිය විකුණුම්




**පලාත් අනුව විදුලි විකුණුම්**




**පලාත් අනුව විදුලිය විකුණුම් මගින් ලද ආදායම**

## විදුලිය විකුණුම් මගින් ලද ආදායම

අදාළ වර්ෂය තුළ විදුලිය විකුණුම් මගින් ලද ආදායම රුපියල් මිලියන 27,934 ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා 22% ක වැඩිවීමකි (ලංකා විදුලි පුද්ගලික සමාගමේ විකුණුම් හැර). ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු ආදායමෙන් 17% ක් (ලංකා විදුලි පුද්ගලික සමාගම හැර), බෙදාහැරීම් අංශය 3 න් ලැබේ. බෙදාහැරීම් අංශය 3 හි විකුණුම්වලින් වැඩි කොටස, අංශයේ මුළු විකුණුම්වලින් ආසන්න වශයෙන් 42% වූ කාර්මික අයකිරීම් වර්ගයෙන් ලැබිණි. ඊළඟ වැඩිම විකුණුම් ගෘහස්ථ හා පොදු අරමුණු අයකිරීම් වර්ගයෙනි. අංශයේ විකුණුම් වලින් 59%ක් බස්නාහිර පලාත දකුණ 2 න් වාර්තා වූ අතර ඊළඟ වැඩිම විකුණුම් පිළිවෙලින් සබරගමුව හා ඌව පලාත් වලිනි. අංශයේ විදුලි ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 14.41 ක් වූ අතර එය, ජාතික සාමාන්‍යය වූ රුපියල් 15.56 ට වඩා අඩු අගයක් ගැනිණි. අංශයේ මිල ගණන් සංසන්දනය කිරීමේදී, ඉහළම ඒකක මිල අංශය 1න් වාර්තා වූ අතර එම ප්‍රමාණය ජාතික සාමාන්‍යයට වඩා ඉහළ අගයක් ගන්නා ලදී.




**පලාත් අනුව විදුලි ඒකකයක මිල**




**අංශ අනුව විදුලි ඒකකයක මිල**




**බෙදාහැරීම් අංශය 3 ලැබූ ආදායම් කොටස**




**ගාස්තු අයකිරීම් වර්ගය අනුව විදුලි ආදායම**

2012 වසර තුළ, විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස එකතුව 98% විය. පසුගිය වසරේ අදාළ සංඛ්‍යාව 101.9 ක්විය. 2012 වර්ෂය සඳහා, අංශයේ ණයකරුවන්ගේ ස්ථානය මිලියන 2332 ක් විය. 2012 දෙසැම්බර් වන විට අංශය තුළ සමස්ථ අයවිය යුතු ස්ථානය 2012 වන විට මාස 0.96 වූ අතර 2011 වර්ෂයේ එය 0.95 ක් විය.

## විදුලි පාරිභෝගික ගිණුම් සහ නව සේවා සම්බන්ධතාවන්

2012 වසර අවසාන වන විට, පාරිභෝගික ගිණුම් 1,210,586 ක් අංශය 3 සතුව පැවතිණි. පාරිභෝගික ගිණුම් අතරින් බහුතරය ගෘහස්ථ කාණ්ඩයට අයත් වූ අතර ඊළඟට වැඩිම ගිණුම් සංඛ්‍යාව වාණිජ අංශයේ විය. වර්ෂය අවසානය වන විට අංශය තුළ සිටි තොග සැපයුම් පාරිභෝගික සංඛ්‍යාව 1,814 ක් විය. විශාලම තොග සැපයුම් පාරිභෝගිකයන් සංඛ්‍යාව වූ 867 බස්නාහිර පලාත දකුණ 2 න් වාර්තාවිය. 2012 වර්ෂය තුළ දී නව සම්බන්ධතා 56,831 ක් සපයනු ලැබීය.

## බෙදාහැරීම් අංශය 3




**එක් එක් පලාතෙහි සිටින විදුලි පාරභෝගිකයන සංඛ්‍යාව**

### විශ්වසනීයතාව

අංශයේ පෝෂක බිඳවැටීම් පිළිබඳව, 2012 වර්ෂය තුළදී, විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ලැබ ඇත. මේ අනුව මාර්ගයන් වෙත ඇදී ඇති කොළ අතු කපා ඉවත් කිරීමේ වැඩපිළිවෙල පලාත් මට්ටමින් සංවිධානය කරනු ලැබීය. තවද, ස්වයං පිළිමසු වලින් වැඩි කොටස දුර සිට මෙහෙයවිය හැකි පරිදි සකස් කරමින් පවතින අතර ස්වයං පිළිමසු සමග සම්බන්ධීකරණයෙන් ස්ථාපිත කරනු ලැබීය.බිඳවැටීම් ප්‍රතිෂ්ඨාපනය සඳහා ගත වන කාලය මෙමගින් නිශ්චිතවම අඩු කරනු ඇත.

අධිසැර සහ අඩුසැර රැහැන් දුර පෙර වර්ෂයේ පැවතියාට වඩා 1% කින් හා 10% කින් පිළිවෙලින් ඉහළ නංවා ඇති නමුදු සැපයුම් විශ්වසනීයතාව පෙර වර්ෂයේ පැවතියාට වඩා සමාලෝචනය කෙරෙන වර්ෂය තුළ ඉහළ නංවා ඇත. රැහැන් කිලෝමීටර 100 දුර ප්‍රමාණයේ මාසයක් තුළ සිදුවන බිඳ වැටීම් සංඛ්‍යාව, අධි වෝල්ටීයතා රැහැන්වල 13ක් පමන වන අතර අඩු වෝල්ටීයතා රැහැන්වල 22 ක මට්ටමකින් පවත්වා ගෙන යනු ලැබ ඇත.




**අංශයේ ජාලකය තුළ 2012 වර්ෂය තුළ සිදුවූ අතුරු බිඳීම් සංඛ්‍යාව**

### විදුලිබල බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම

2012 වර්ෂය තුළ, අංශය තුළ ක්‍රියාවේ යොදවන ලද හා නිම කරන ලද ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම, ග්‍රාමීය විදුලිබල සැපයුම් කටයුතු හා වෙනත් පද්ධති සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර පහත දක්වා ඇත. 2012 වර්ෂය තුළ දී, කිලෝ මීටර 1398.9 ක නව අඩුසැර විදුලි මාර්ග ද කිලෝ මීටර 656.0 ක නව අධිසැර විදුලි මාර්ග ද නව විදුලි උප පොලවල්/අටළු අංගන 126 ක්ද ඉදිකරනු ලැබීය. 2012 වර්ෂය තුළ ඉටුකරන ලද සමස්ථ විෂය පථය වටිනාකම රුපියල් මිලියන 2,515ක් විය.

| ව්‍යාපෘතිය/යෝජනා ක්‍රමය | අඩු සැර (කිමී) | අධි සැර (කිමී) | නව අටළු අංගන | වර්ධනය කළ උප පොලවල් | නඩත්තු කළ උප පොලවල අටළු අංගන | මුළු පිරිවැය රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| විමධ්‍යගත අයවැය | 5.7 | | | | | 8.3 |
| පලාත් සභා ප්‍රතිපාදන | 19.7 | | | | | 22.0 |
| පද්ධති වැඩි දියුණු කිරීමේ ප්‍රතිපාදන | 43.5 | 86.4 | 19 | 11 | | 321.3 |
| LKDD | 34.4 | | | | | 46.2 |
| ඌව උදානය | 607.7 | 108.9 | 64 | | | 1061.2 |
| රත්නපුරය ආලෝකමත් කිරීම | 349.7 | 14.4 | 9 | | | 431.0 |
| ගම නැගුම | 0.3 | | | | | 0.3 |
| නඩත්තු කටයුතු | 3.0 | 393.9 | | | 241 | 64.5 |
| මිල අයකරගත් කාර්යයන් (මාර්ග පළල් කිරීම) | 3.0 | 10.0 | | | | 16.0 |
| වෙනත් - ග්‍රාමීය විදුලි සැපයුම් යෝජනා ක්‍රම (RE8 ඇතුළුව) | 179.2 | 42.4 | 34 | | | 342.1 |
| වෙනත් - ග්‍රාමීය විදුලි සැපයුම් යෝජනා ක්‍රම දීර්ඝ කිරීම් (RE8 ඇතුළුව) | 152.8 | | | | | 202.4 |
| **එකතුව** | **1398.9** | **656.0** | **126** | **11** | **241** | **2515.2** |

# බෙදාහැරීම් අංශය 3

### කුළුණු රැහැන් ඉදිකිරීම සහ වෙනත් උපකරණ ස්ථාපනය කිරීම

| අයිතමය | විෂය පථය | සම්පූර්ණ රු. මිලියන |
|---|---|---|
| **නව රැහැන්** | | |
| ද්විත්ව පරිපථ Raccoon රැහැන් | | |
| තනි පරිපථ Raccoon රැහැන්(කිමී) | 2.8 | 20 |
| ද්විත්ව පරිපථ Lynx කුළුණු(කිමී) | 12.4 | 173 |
| තනි පරිපථ Lynx කුළුණු(කිමී) | 9.5 | 85.5 |
| **රැහැන් නඩත්තු කිරීම** | | |
| ද්විත්ව පරිපථ Raccoon කුළුණු (කිමී) | | |
| තනි පරිපථ Raccoon කුළුණු (කිමී) | 30.25 | 17.86 |
| තනි පරිපථ Lynx කුළුණු (කිමී) | 34 | |
| තනි පරිපථ Lynx කුළුණු (කිමී) | 42 | |
| **ප්‍රාථමික උපපොල නඩත්තු කිරීම** | | |
| උපපොල සංඛ්‍යාව | | 20.1 |
| **අටළු අංගන** | | |
| අළුත් අටළු අංගන | 1 | 20 |
| **උපකරණ සවිකිරීම** | | |
| ස්වයං පිළිවසු (සංඛ්‍යාව) | 7 | 14.9 |
| බැර කඩන වහරු (සංඛ්‍යාව) | 2 | 3.8 |
| මායිම් මනු (සංඛ්‍යාව) | 3 | 5.79 |
| තොග සැපයුම් මනු (සංඛ්‍යාව) | 13 | 27.02 |
| **එකතුව** | | **387.97** |

### ඌව උදානය

ග්‍රාමීය අංශයේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත ස්ථාපනය කරමින්, 2012 වන විට සියල්ලන්ට විදුලිබලය සැපයීමට ශ්‍රී ලංකා රජය සැබෑ උත්සාහයක් දරමින් සිටියේය. ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාප්තිය සහ සැපයුම ලබා ගැනීමේ අවිස්ථාව වැඩි දියුණු කරන්නාවූ, යෝජිත ඌව උදානය විදුලිබල සැපයීමේ ව්‍යාපෘතිය මගින් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක වියදමින්, දුර බැහැර ගම්මානයන්ට 800 කට විදුලිබලය සැපයීමට අපේක්ෂා කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය මගින් කිලෝමීටර් 2250 ක අඩු වෝල්ටීයතා ජාලකයක් හරහා නව නිවාස ඒකකයන් 80,000 කට විදුලිබලය සපයන බෙදාහැරීම් උප පොලවල් 250 ක් සමගින් කුඩා හා මධ්‍යම ප්‍රමාණ සහ විශාල පරිමාණයේ කර්මාන්තයන්ගේ අවශ්‍යතාවන් සපුරාලමින්, මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන් කිලෝ මීටර 625කින් දීර්ඝ කිරීමට අපේක්ෂා කෙරිණි. වසර අවසානය වන විට මෙම කාර්යයන් අතරින් 35% ක් නිම කරනු ලැබ තිබිණි.

### ඉරාන (ගැමි විදුලියන - 8) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ආණ්ඩුවේ ග්‍රාමීය විදුලි සැපයුම් යෝජනා ක්‍රමය යටතේ, බටහිර, මධ්‍යම, බටහිර උතුර, නැගෙණහිර, බටහිර දකුණ 1, බටහිර දකුණ 2, සබරගමුව සහ දකුණු පලාත යන ලංකා විදුලිබල මණ්ඩල පලාත් එකොලහක දහසක් ගම්වලට විදුලිය සැපයීමට ගැමි විදුලියන යෝජනා ක්‍රමය - 8 මගින් සැලසුම් කරනු ලැබීය.

ගැමි විදුලියන යෝජනා ක්‍රමය - 8 ඉරාන රජය මගින් අරමුදල් සැපයූ අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තු ගත වියදම ඇමරිකා එක්සත් ජනපද ඩොලර මිලියන 106.5 ක් වීය. ව්‍යාපෘතියේ යෝජිත කොන්ත්‍රාත්කරු වූයේ, ඉරානයේ Sunir Co' නම් සමාගමයි. ලංකා විදුලිබල මණ්ඩලය මගින් නිෂ්පාදනය කරනු ලබන, වැරකැවූ කොන්ක්‍රීට් කණු හැර අනෙකුත් සියළුම ද්‍රව්‍යයන් එකී සමාගම මගින් සපයනු ලැබීය. මෙම ව්‍යාපෘතිය මගින් යෝජිත කාර්ය විෂය පථය වූයේ,

- 100kVA, 33kV/LV බෙදාහැරීමේ උපපොලවල් 1000 ක් ඉදිකිරීම
- කිලෝවෝල්ට් 33 මධ්‍යම වෝල්ටීයතා විදුලි රැහැන් කිලෝමීටර 1000 ක් ඉදිකිරීම
- පොදි බහන්/තෙකලා, අඩු සැර බෙදාහැරීම් රැහැන් කි.මීටර 4000 ක් ඉදිකිරීම
- තෙකලා, අඩු සැර බෙදාහැරීම් රැහැන් කි.මීටර 2000 ක් ඉදිකිරීම

කි.මීටර් 50 දිග එකලා රැහැන් තෙකලා රැහැන් බවට පරිවර්තනය කිරීමේ යෝජනාක්‍රම සමහරක් නිම කරනු ලැබ ඇති අතර පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා බලශක්තිය සපයනු ලැබ ඇත.

### රත්නපුරය ආලෝකමත් කිරීම

මෙම ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, රත්නපුර දිස්ත්‍රික්කය 100%ක් විදුලිබලය සැපයීමයි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු විසින් ව්‍යාපෘති කටයුතු පාලනය කෙරෙන අතර එය 2008 වර්ෂයේදී ආරම්භ කරනු ලැබීය. ව්‍යාපෘතියේ විෂයපථය පහත දැක්වේ.

1. රත්නපුර කොටුමා උපපොල වර්ධනය කිරීම
2. කිලෝවෝල්ට් 33 කිලෝ මීටර් 71 ක් දිග, අධිවේගී විදුලි රැහඅන් සහ අටළු අංගන තුනක් ඉදි කිරීම
3. කිලෝමීටර් 1000 ක් දිග මධ්‍යම වෝල්ටීයතා විදුලි රැහැන්, කිලෝමීටර්2100 ක් දිග අඩු වෝල්ටීයතා විදුලි රැහැන් සහ බෙදාහැරීමේ උප පොල 550 ක් ඉදිකිරීම

### බෙදාහැරීම් පද්ධති හානිය අඩු කිරීම

ලංකා විදුලිබල මණ්ඩලයේ දළ නිෂ්පාදනයෙන් 21 %ක් පමණ වන ඉහළ මට්ටමක පැවති විදුලිබල පද්ධති හානි ද, දළ නිෂ්පාදනයෙන් 17 % ක් පමණ වූ බෙදාහැරීමේ මට්ටමේ හානි ද 2012 වර්ෂය අවසානයේ දී 10.67% දක්වා ක්‍රමාණුකූලව පහත හෙළනු ලැබීය. පසු ගිය වසර කිහිපය තුළ, බෙදාහැරීමේ අංශ මගින් දියත් කරන ලද බෙදාහැරීමේ හානි පහත හෙළීමේ වැඩසටහන් (තාක්ෂණික හා වාණිජ) ශක්තිමත් ආකාරයෙන් අධීක්ෂණය කිරීමත් ක්‍රියාවට නැංවීමත් නිසා මෙම බෙදාහැරීමේ පද්ධතියේ හානි පහත වැටීම සිදුවීය.

අංශය 3 හි බෙදාහැරීමේ හානි, එම අංශයට 2012 වර්ෂය තුළ ලබා දුන් විදුලිබල යෙදවුමෙන් 10.3% ක් වීය. 2012 වර්ෂය තුළ පලාත් මට්ටමෙන් සිදුවූ හානි පහත දක්වා ඇත.

## බෙදාහැරීම් අංශය 3

| පලාත | බලශක්තිය (මෙවොපැ) | හානි% |
|---|---|---|
| බපද 2 | 1,456 | 6.0 |
| ඌව | 449 | 15.2 |
| සබරගමුව | 572 | 15.1 |
| බෙදාහැරීම් අංශය 3 | 2477 | 10.3 |

10.3% ක් වූ මෙම හානි අතරින්, 8.4 % පමණ තාක්ෂණික හානි වූ අතර ඉතිරි 1.9%, සොරකම්, හිතානුකූල නොවන සැපයුම්, බිල්පත් දෝෂ, මනු දෝෂ, මනු නොයෙදූ වීදි ලාම්පු ආදිය නිසා ඇති වූ තාක්ෂණික නොවන හානි වීය. තවදුරටත්, බස්නාහිර පලාත දකුණ 2 සමග සසඳා බැලීමේදී, සබරගමුව සහ ඌව පලාත්වල විදුලිබල හානිය අධික වීමට හේතු වූයේ, පෝෂකයන්ගේ සිට ඇති රැහැන් දිග අධික වීමයි. මෙම හානි අඩු කර ගැනීමට නව කොටුමා උපපොළ, ප්‍රාණ නාලිය වූ රැහැන් සහ අටළු අංගන ස්ථාපිත කිරීමට යෝජනා කරනු ලැබීය. තාක්ෂණික නොවන හානි අඩු කර ගැනීම සඳහා බෙදාහැරීම් 3 බලශක්ති කළමනාකරණ ඒකකය මගින් තොග සැපයුම් වල මනු සබදතා වැඩි දියුණු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. බස්නාහිර පලාත දකුණ 2 හි බලශක්ති කළමනාකරණ ඒකකය මගින් සොරකම් හා නීතිවිරෝධී ඉන්ධන සැපයීම් ගැන නිතර සොයා බැලූ අතර නිරන්තර මනු පරීක්ෂාවන්ද සිදු කරනු ලැබීය.

### ඵලදායිතා සංවර්ධනය සහ තත්ත්ව කළමනාකරණය

එස් 5 සංකල්පය මනාව ක්‍රියාවට නංවනු ලැබ ඇති අතර අංශය 3 හි කැපී පෙනෙන දියුණුවක් දක්නට ලැබිණි. අංශය 3 හි නිලධාරීන්ගෙන් වැඩි කොටසක් 2012 - එස් 5 තරඟයට සහභාගී වූ අතර ත්‍යාගයන් දිනාගනු ලැබීය. (වානිජ හා ආයතනික) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය, බස්නාහිර පලාත දකුණ 2, කහවත්ත ප්‍රාදේශීය කාර්යාලය, කලවාන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සහ ඌව පලාතේ බෙදාහැරීම් නඩත්තු කටයුතු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය මෙම තරගයේ ත්‍යාගයන් දිනා ගන්නා ලදී.

9001: 2008 තත්ව සහතික ප්‍රදානයන් අත්කර ගැනීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සැලසුම් හා සංවර්ධන ශාඛාව නිර්දේශ කරනු ලැබීය. ජාත්‍යන්තර ප්‍රමිති ආයතන විගණනයේ අවසාන අදියර 2013 වර්ෂයේ දී පැවැත් වූ අතර මෙම ශාඛාව 2013 දී ISO 9001: 2008 සහතිකය ලබා ගන්නා ලදී. 2010-2011 ජාතික ඵලදායිතා තිළිණයන් වෙනුවෙන්, "D1 ශ්‍රේණියේ" තිළිණයක්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් සැලසුම් හා සංවර්ධන ශාඛාවට ප්‍රදානය කරනු ලැබීය.

### ද්‍රව්‍ය ප්‍රසම්පාදනය

සමස්ථ ඇස්තමේන්තු ගත මිලදී ගැනීමේ පිරිවැය රුපියල් මිලියන 1539 ක් සඳහා වූ ටෙන්ඩර් 58 ක්(at MPC" BPC and RPC මට්ටම් වලින්) 2012 වසරේ දී ආරම්භක වශයෙන් ලද අතර වර්ෂය තුළ දී ටෙන්ඩර් 43 ක් ප්‍රදානය කරනු ලැබීය. මධ්‍යගත වශයෙන් මිලදී ගත් ඉතා වැදගත් ද්‍රව්‍යයන් සියල්ලම පාහේ අංශය තුළින් ලබා ගත හැකි බව සහතික කරමින් අංශය 3 හි ද්‍රව්‍ය තත්ත්වය ඉතා සතුටුදායක මට්ටමක පැවතිණි.

අංශය 3 හි තොරතුරු තාක්ෂණ ශාඛාව මගින් සංවර්ධනය කරනු ලැබූ, .ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය. නම් වූ මෘදුකාංගය, සැලසුම් හා සංවර්ධන ශාඛාවේ ප්‍රසම්පාදන ආශ්‍රිත සියලු කටයුතු ඉටුකිරීම පිණිස යොදා ගන්නා ලදී. මෙම මෘදුකාංගය මගින් අනුගමනය කළ ටෙන්ඩර විවෘත කිරීමේ මාර්ගගත (on line) ක්‍රමය නිසා, ටෙන්ඩර් විවෘත කිරීම හා සම්බන්ධිත කටයුතු සඳහා වැයවූ කාලයෙන් විශාල කොටසක් ඉතිරි කර ගැනීමට හැකිවී ඇත. සෑම ටෙන්ඩරයක්ම අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබූ අතර තාක්ෂණ අගැයුම් කමිටුවේ ප්‍රමාදයන් සිදුවීම අවම කර ගැනීම සඳහා ප්‍රගතිය සොයා බැලීමට ක්‍රියාශීලී කටයුතු කරනු ලැබීය. ප්‍රයෝජනයට ගන්නවුන්ට මිතුරු ආකාරයෙන් නව අංගයන් එක් කරමින්, මෙම මෘදුකාංගය තවදුරටත් වැඩිදියුණු කරනු ලැබීය.

### මානව සම්පත් කළමනාකරණය

ප්‍රසන්න සහ කාර්යක්ෂම ක්‍රියාකාරී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා උපස්ථම්භක සේවාවක්, මානව සම්පත් කළමනාකරණ ඒකකය මගින් සපයයි. 2012 වර්ෂය අවසාන වන විට අංශය තුළ සිටි සම්පූර්ණ සේවක සංඛ්‍යාව 2,867 ක් වීය. අප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් යම් අංශයක වූයේ නම් මිනිස් බල ආයතනයන්ගෙන් ලබා ගත් පුද්ගලයන් සේවයේ යොදවමින් අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගන්නා ලදී. අංශය තුළවිවිධ සේවා කාණ්ඩයන්හි සේවකවන් බෙදී ගොස් සිටි ආකාරය පහත දක්වා ඇත.

සේවක සංඛ්‍යාව වර්ගීකරණය




2012 වසර අවසානය වන විට බෙදාහැරීම් අංශය 3 තුළ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

### සුබ සාධනය

අංශය 3 තුළ, සාමුහික ප්‍රයත්නයන් දිරිගැන්වීමට වඩාත් හොඳ කාර්ය වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා සේවකයින්ගේ සුබ සිද්ධිය පිණිස බොහෝ අවස්ථාවන් සංවිධානය කරනු ලැබීය.

බස්නාහිර පලාත දකුණ 2 සුබසාධක සමිතිය මගින් අංශය 3 ප්‍රධාන කාර්යාලයේදී රුධිරය අවශ්‍යතාවයෙන් පෙළෙන රෝගීන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා ලේ දන්දීමේ ව්‍යාපාරයක් සංවිධානය කරනු ලැබීය. මීට අමතරව, 2012 වෙසක් උත්සවය නිමිත්තෙන් ධර්ම දේශනයක් ද ඔවුන් විසින් සංවිධානය කරන ලදී. අංශය 3 වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ සුහද හමුව 2012 බදුල්ලේ වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගණයේදී පවත්වනු ලැබූ අතර මෙහි උත්සව සත්කාරකත්වය ඌව පලාත විසින් දරන ලදී. මීට අමතරව, සංඝයා වහන්සේ පණස් නමක් විෂයයෙහි පිරි නැමූ දානමය පිංකමක ද ඌව පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යාලයේදී පවත්වනු ලැබීය.

තවදුරටත්, සැලසුම් හා සංවර්ධන ශාඛාවේ සුබ සාධක සමිතිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ සංගීත පිපාසය සංසිඳවීම සඳහා "මියැසිවිලා" සංගීත ප්‍රසංගය සංවිධානය කරනු ලැබීය. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ විදුපියස ශ්‍රවණාගාරයේදී 2013 ජනවාරි මාසයේ දිනක පවත්වනු ලැබීය.

## බෙදාහැරීම් අංශය 3



බස්නාහිර පලාත දකුණ 2 මගින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහන




බෙදාහැරීම් අංශය 3 හි වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ සුහද හමුව-2012

# බෙදාහැරීම් අංශය 4

බස්නාහිර පලාතේ කොටසක් ද (බස්නාහිර පලාක දකුණ 1) සමස්ථ දකුණු පලාත ද, සබරගමුව පලාතේ කොටස් කිහිපයක් ද ඌව පලාත ද, බෙදාහැරීමේ අංශය 4 හි මෙහෙයුම් ප්‍රදේශයෙන් ආවරණයවේ. බස්නාහිර පලාක දකුණ 1 ප්‍රදේශය මගින් රත්මලාන, කළුතර හා දෙහිවල යන ප්‍රදේශ ආවරණය කෙරේ. බෙදාහැරීමේ අංශය 4 හි බෙදාහැරීම් ජාලකය දෙහිවල සිට කතරගම දක්වා පැතිරේ.

### 2012 වසරේ උද්දීපනයන්

| විස්තරය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| වසර තුළ මෙම අංශය මගින් විකුනූ ඒකක ගණන | ගිවොපැ | 1,338 |
| විකුණන ලද විදුලිය මගින් ඉපැයූ ආදායම | රුපි. මිලියන | 20,159 |
| සාමාන්‍ය විකුණුම් මිල | රුපි./කිවොපැ | 15.07 |
| බෙදාහැරීමේ පාඩුව | % | 12.6% |
| අයවීමට ඇති මුදල් තත්වය (අවසාන කළ ගිණුම් හා වීදි පහන් හැර) | මාසය | 0.94 |
| වර්ෂය අවසානයේදී අංශය තුළ සිටි සිල්ලර පාරිභෝගිකයන් | සංඛ්‍යාව | 875,322 |
| වර්ෂය අවසානයේදී අංශය තුළ සිටි තොග පාරිභෝගිකයන් | සංඛ්‍යාව | 1,266 |
| වර්ෂය තුළ සපයන ලද නව සම්බන්ධතා | සංඛ්‍යාව | 29,389 |
| වර්ෂය අවසානයේදී සේවා නියුක්ත සේවකයින් | සංඛ්‍යාව | 2,015 |
| සාමාන්‍ය ආදායම | රුපි./මාස/පාරිභෝ. | 1,916 |
| වර්ෂය අවසානයේදී එක් සේවකයකු සඳහා වූ සිල්ලර පාරිභෝගිකයන් | සංඛ්‍යා/සේවකයන් | 434 |
| එක් බෙදාහැරීම් උපපොලක් සඳහා සිටි සිල්ලර පාරිභෝගිකයන් සාමාන්‍ය ගණන | සංඛ්‍යාව/උප පොල | 214 |
| එක් සේවකයෙකු සඳහා වූ අඩු වෝල්ටීයතා රැහැන්වල සාමාන්‍ය දිග | කිමී/සේවකයන් | 10.90 |
| එක් පාරිභෝගිකයෙකු සඳහා වූ අඩු වෝල්ටීයතා රැහැන්වල සාමාන්‍ය දිග | කිමී/පාරිභෝගික | 0.025 |
| එක් බෙදාහැරීම් උපපොලක් සඳහා මධ්‍යම වෝල්ටීයතා රැහැන් සාමාන්‍ය දුර ප්‍රමාණය | කිමී/උප පොල | 1.14 |

බෙදාහැරීමේ අංශය 4 තුළ පදිංචි ජනගහනය මිලියන 3.93 ක් පමණවිය. අංශය තුළ පැවති විදුලිබලය සැපයීමේ ඉහළම මට්ටම වූ 99.5 %, බස්නාහිර පලාත දකුණ 1හි දක්නට තිබූ අතර අඩුම ප්‍රමාණය වූ 99% මට්ටම දකුණු පලාතෙහි පැවතිණි. රත්මලාන ගුවන් තොටුපල, රත්මලාන කාර්මික කලාපය, කොග්ගල කාර්මික කලාපය, හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපල සහ ප්‍රසිද්ධ වෙරළබඩ හෝටලවලින් බොහොමයක් භූගෝලීය වශයෙන් මෙම අංශය තුළ පිහිටා ඇත.

මෙම බෙදාහැරීමේ අංශය තුළ එක් පාරිභෝගිකයෙකුගේ සාමාන්‍ය වාර්ෂික විදුලිබල පරිභෝජනය ඒකක 1,527 ක් විය. එක් පාරිභෝගිකයෙකු සඳහා වන ඉහළම වාර්ෂික විදුලිබල පරිභෝජනය වූ ඒකක 2,236 බස්නාහිර පලාත දකුණ 1 න් වාර්තා විය. එක් පාරිභෝගිකයෙකු සඳහා වන අඩුම වාර්ෂික විදුලිබල පරිභෝජනය වූ ඒකක 1,258 ඒකක ප්‍රමාණය දකුණු පලාතෙන් වාර්තා විණි.




බෙදාහැරීම් අංශය 4 භූගෝලීය මායිම්




බෙදාහැරීම් අංශය 4 හි බලශක්ති විකුණුම් කොටස




අයක්‍රම අනුව විකුණුම් - බෙදාහැරීම් අංශය 4




බෙදාහැරීමේ අංශය 4 හි පළාත අනුව ආදායම




බෙදාහැරීමේ අංශය 4 හි පළාත අනුව ආදායම




බෙදාහැරීමේ අංශය 4 හි සාමාන්‍ය විකුණුම් මිල




බෙදාහැරීමේ අංශය 4 හි ආදායම් කොටස




බෙදාහැරීමේ අංශය 4 හි අයක්‍රම අනුව පාරිභෝගික ගිණුම්




බෙදාහැරීමේ අංශය 4 හි අයක්‍රම අනුව ආදායම




බෙදාහැරීමේ අංශය 4 හි පළාත් අනුව පාරිභෝගික ගිණුම්

# බෙදාහැරීම් අංශය 4

## මෙහෙයුම් ව්‍යුහය

සාමාන්‍යාධිකාරීවරයාට සෘජුවම වග කියන අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අංශය 4 පාලනය කරනු ලබයි. මෙහෙයුම් අරමුණු උදෙසා, මෙම අංශය, දකුණු පලාත සහ බස්නාහිර පලාත දකුණ 1 යනුවෙන් පලාත් දෙකකට බෙදා ඇති අතර පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු විසින් එක් එක් පලාතක් පාලනය කරයි. සෑම පලාතක්ම ප්‍රධාන ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරයෙකු විසින් පාලනය කරනු ලබන ප්‍රදේශ කිහිපයකට බෙදනු ලැබ ඇත. මෙහෙයුම් කටයුතු ඵලදායි ලෙස සිදුකිරීම සඳහා අංශය තුළ ප්‍රාදේශීය කාර්යාල නවයක් ද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 36 ක් ද මෙම අංශය තුළ ක්‍රියාත්මකව පවතී.

බස්නාහිර පලාත දකුණ 1, දෙහිවල, රත්මලාන සහ කළුතර යන ප්‍රාදේශීය කාර්යාල වලින් සමන්විත වන අතර අම්බලන්ගොඩ, ගාල්ල, හම්බන්තොට, මාතර, තංගල්ල සහ වැලිගම යන ප්‍රාදේශීය කාර්යාලයන්ගෙන් දකුණු පලාත සමන්විතවේ.

| | බස්නාහිර පලාත දකුණ 1 | දකුණු පලාත |
|---|---|---|
| භූමි ප්‍රමාණය ව.කි.මී. | 1,230 | 5,640 |
| ජනගහනය මිලියන | 1.47 | 2.46 |
| නිවාස ඒකක සංඛ්‍යාව | 436,061 | 627,657 |
| විදුලි සැපයුම් මට්ටම | 99.5% | 99% |

පලාත් සාමාන්‍යාධිකාරීවරයාට අමතරව, මෙම අංශයේ, ව්‍යාපෘති හා බැර නඩත්තු කටයුතු, සැලසුම් හා සංවර්ධන සහ වාණිජ හා ආයතනික යන ශාඛාවන් තුන භාරව තවත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් තිදෙනෙක් සිටිති.

මෙම අංශයේ, ප්‍රාථමික උප පොලවල්, කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන්, අටළු අංගන සහ කිලෝවෝල්ට් 33 බෙදාහැරීම් ජාලකය සමග සම්බන්ධිත අනෙකුත් උපකරණ, ඉදිකිරීම, සවිකිරීම හා නඩත්තු කිරීමේ කටයුතු ව්‍යාපෘති සහ බැර නඩත්තු අංශයට පවරනු ලැබ තිබිණි. අංශයේ ප්‍රධාන මිලදී ගැනීම් සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් කෙරෙන ලංසු තැබීම්, ව්‍යාපෘති හා බැර නඩත්තු අංශය මගින් සිදු කෙරිණි.

අංශයේ ඒකලා හා තෙකලා මනු අභ්‍යන්තර පිරික්සුම් සහ අංශ හතරෙහිම අලුත්ම තරාපැව් පිරික්සුම් කටයුතු මනු පරීක්ෂණාගාරයේ සිදු කරනු ලැබිණි.

විශ්වසනීයතාව, මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ ජාලකය සහ අන්තර්ගත ජනක යන්ත්‍රයන් හා සම්බන්ධිත වැඩ කටයුතු පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම, සැලසුම් හා සංවර්ධන ශාඛාවෙන් සිදු කරනු ලැබිණි.

අංශයේ වාණිජ ප්‍රතිපත්ති, බැර සැපයුම් හා තොරතුරු කළමනාකරණය පිළිබඳව වාණිජ හා ආයතනික ශාඛාව මගින් සැලකිල්ල යොමු කරනු ලැබීය. මානව සම්පත් කාර්යයන් සම්බන්ධ කටයුතු සඳහා සෑම පලාතකටම මානව සම්පත් නිධාරියෙකු ලබා දෙනු ලැබිණි. පලාත් කාර්යාලයන්හි මානව සම්පත් කටයුතු සම්බන්ධීකරණය හා අංශය 4 හි විධායක නිලධාරීන්ගේ මානව සම්පත් කටයුතු පාලනය කිරීම, වාණිජ හා ආයතනික ශාඛාව මගින් ඉටු කරනු ලැබීය.

පලාත් මගින් ඉටුකරන ලද මූල්‍ය හා ආදායම් කටයුතු, අංශය 4 හි මූල්‍ය ශාඛාව මගින් සිදු තරනු ලැබීය.

## ප්‍රධාන අරමුණු

අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ,

- වෝල්ටීයතාවයේ ගුණාත්මක බව පවත්වා ගනිමින්, අංශය තුළ සිටින පාරිභෝගිකයින්ට විශ්වාසනීය විදුලි සැපයුමක් ලබාදීම
- මුළු වියදම් සඳහා සැලසුම්ගත ආදායම් අතිරික්තයන් උපයා ගැනීම
- අනාගත පාරිභොගිකයන් සඳහා නව සම්බන්ධතා ලබාදීම
- බෙදාහැරීමේ අංශය 4 තුළ විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියේ තර්කාන්විත සංවර්ධනයක් ඇති කිරීම

| බෙදාහැරීමේ යටිතල ව්‍යුහය | | |
|---|---|---|
| කිලෝවෝල්ට් 33 බෙදා හැරීමේ රැහැන් | කිමී | 4,333 |
| කිලෝවෝල්ට් 11 බෙදා හැරීමේ රැහැන් | කිමී | 310 |
| කිලෝවෝල්ට් 33 /11 ප්‍රාථමික උප පොලවල් | සංඛ්‍යාව | 34 |
| අඩු වෝල්ටීයතා බෙදා හැරීමේ රැහැන් | කිමී | 21,973 |
| අඩු වෝල්ටීයතා බෙදා හැරීමේ උප පොලවල් | සංඛ්‍යාව | 4083 |
| සේවා සම්බන්ධතා (තොග සැපයුම් ඇතුළුව) | සංඛ්‍යාව | 876,588 |

## පාරිභෝගික සත්කාර්ය

පාරිභෝගිකයා සම්බන්ධ වන ස්ථානයන්හි (consumer interface points) සේවා වැඩි දියුණු කිරීම සඳහා විශේෂ උත්සාහයන් ගනු ලැබීය. 2012 වසර තුළ දී, පාරිභෝගිකයනට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා, ප්‍රාදේශීය කාර්යාල නවයක්, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 36 ක්, ලංකා විදුලිබල මණ්ඩලය මගින් පාලනය කරනු ලැබූ අලෙවි කවුළු 9 ක්, මහජන බැංකු ශාඛාවන්හි පිහිටි අලෙවි කවුළු 41 ක් සහ බෙදාහැරීමේ ඇමතුම් මධ්‍යස්ථාන 2 ක් මගින් විශේෂ ප්‍රයත්නයන් දරණු ලැබීය. ඇමතුම් මධ්‍යස්ථානය මගින් විදුලිය බිඳවැටීම් පිළිබඳව ලැබුණාවූ ඇමතුම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර පාරිභෝගික තෘප්තිය සහ සංහිවේදනය වර්ධනය කරමින් වසර පුරා හැම මොහොතකම ක්‍රියාත්මකව පැවතිණි.

2010 නොවැම්බර් මස බස්නාහිර පලාත දකුණ 1 හි ස්ථාපනය කරනු ලැබූ ඇමතුම් මධ්‍යස්ථානය, පාරිභෝගිකයන්ට වඩාත් හොඳ සේවාවක් ලබාදීමේ අරමුණෙන් වඩාත් නවීන උපකරණ සහ මෘදුකාංග භාවිතයෙන් උසස් තත්ත්වයට පත් කරනු ලැබීය.

## බලශක්ති විකුණුම්

දිවයිනේ සමස්ථ විදුලිය විකුණුමෙන් 13% කට අදාළව ගිණුම් බස්නාහිර පලාත දකුණ 1 මගින් පවත්වා ගෙන යනු ලබයි. 2012 වර්ෂයේ දී, මෙම අංශය තුළ විදුලිබලය ගිගාවොට් පැය 1,338 ක් විකුණනු ලැබීය. අංශය

## බෙදාහැරීම් අංශය 4

4 හි විකුණුම් අතරින් විශාලම කොටස ගෘහස්ථ අය කිරීම් කාණ්ඩය යටතේ අලෙවි කරනු ලැබූ අතර එම ප්‍රමාණය අංශය 4 තුළ විකුණූ විදුලිබලයෙන් ආසන්න වශයෙන් 48%ක් විය.අංශය 4 තුළ බෙදාහරිණ ලද මුළු බලශක්ති ප්‍රමාණයෙන් 60%ක් පමණ බස්නාහිර පලාත මගින් පරිභෝජනය කරනු ලැබීය.

### ආදායම

විදුලිය විකුණුම් මගින් 2012 වර්ෂයේ ලද අදායම රුපියල් මිලියන 20,159 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ ලද ආදායමට වඩා 24%ක වැඩිවීමක් විය. ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ථ ආදායමෙන් 12% ක් අංශය 4 මගින් උපයයි. අංශය 4 මගින් උපයන ආදායමෙන් වැඩිම කොටස ගෘහස්ථ අයකිරීම් කාණ්ඩයෙන් ලැබෙයි. අංශයේ සමස්ථ ආදායමෙන් 54%ක් දකුණු පලාතෙන් ලැබෙයි. අංශයේ එක් කිලෝවොට් පැයක විකුණුම් මිල රුපියල් 15.07 ක් වූ අතර එය කිලෝවොට් පැයක් සඳහා වූ රුපියල් 15.56 ක ජාතික සාමාන්‍යයට වඩා අඩු විය. 2012 වර්ෂයේ අවසානය වන විට, අංශය තුළ (අවසාන කළ ගිණුම් හා විදි පහන් හැර) තොග සැපයුම් පාරිභෝගිකයන් හා සිල්ලර සැපයුම් පාරිභෝගිකයන් සඳහා receivable position වූයේ පිළිවෙලින් මාස 1.11 සහ මාස 0.83 කි. 2012 වර්ෂය තුළ විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස රැස්කළ ප්‍රමාණය 98.7 %ක් විය.

### විදුලිබල පාරිභෝගික ගිණුම් සහ නව සේවා සම්බන්ධතාවන්

2012 වර්ෂය අවසාන වනවිට අංශය 4 හි පැවති පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව 876,588 ක් විය. පාරිභෝගික ගිණුම්වලින් වැඩි කොටස, ගෘහස්ථ කාණ්ඩයට අයත්විය. විමර්ෂණයට භාජනය වන වර්ෂය තුළ නව සම්බන්ධතා 29,389 ක් සපයා තිබිණි.

### විශ්වසනීයතාව

2012 වර්ෂය තුළදී, කිලෝමීටර් 100 ක රැහැන් දුරකට මාසයක දී සිදුවන බිඳවැටීම් සංඛ්‍යාව මධ්‍යම වෝල්ටීයතා රැහැන්වලදී 14 මට්ටමක පවත්වා ගෙන ඇති අතර අඩු වෝල්ටීයතා රැහැන්වලදී එය 17 ක් විය.

### විදුලිබලය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම

2012 වර්ෂය වන විට සියල්ලටම විදුලිබලය සැපයීමේ රජයේ දැක්ම ඉටුකර ගැනීමට ග්‍රාමීය විදුබල යෝජනා කඩිනම් කරනු ලැබිය. ග්‍රාමීය විදුලිබල සැපයුම් යෝජනා ක්‍රමයන් සහ ඉටුකරන ලද හා නිමවන ලද අනෙකුත් ඉදිකිරීම් කටයුතු පිළිබඳ විස්තර පහත දක්වා ඇත. ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම(ගාල්ල මාතර)ව්‍යාපෘතිය 2012 දී සාර්ථකව නිම කරනු ලැබීය.

ඉහත සඳහන් ජාලක සංවර්ධන ව්‍යාපෘතීන්ට අමතරව, මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතීන්හි රැහැන් ගලවා සවිකිරීමේ වැඩ, විශේෂයෙන් හම්බන්තොට ප්‍රදේශයේ සහ දක්ෂිණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ වැඩ, දකුණු පලාත භාර ගෙන ඇත.

2012 වසර තුළදී පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබීය

- රුපියල් මිලියන 175 ක මුළු වියදමකින් හම්බන්තොට කොටුමා උප පොලේ සිට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල දක්වා කිලෝවෝල්ට් 33 ද්විත්ව පරිපථ ද්විත්ව රැහැන් ඉදිකිරීම.

| කාර්යය ප්‍රභේදය | වැඩ ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | අධි සැර (කිමී) | අඩු සැර (කිමී) | (ගණන) (කිමී) | රැහැන් පරිවර්තන '(කිමී) |
| විමධ්‍යගත අයවැය + පලාත් සභාඅයවැය | 0.0 | 0.0 | 6.4 | 3.4 |
| ගෙවූ පිරි වැය හා සැපයුම් තොගය | 43.9 | 72.0 | 22.5 | - |
| ගම නැගුම | - | - | 1.5 | 0.5 |
| දේපල සංවර්ධනය | 3.3 | 13.0 | 35.3 | 0.6 |
| පද්ධති සංවර්ධනය | 64.3 | 37.0 | 30.3 | 162.9 |
| ඉරානය | 72.8 | 55.0 | 254.6 | 29.2 |
| ස්විඩන් අන්තර්ජාතික සංවර්ධන ආයතනය | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම ගාල්ල, මාතර | - | - | 211.9 | 58.9 |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම හම්බන්තොට | 0.0 | 0.0 | 0.0 | - |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම කළුතර | 0.0 | 0.0 | 24.6 | 2.1 |
| වෙනත් | - | - | 0.0 | - |
| **එකතුව** | **186.7** | **179.0** | **587.0** | **257.8** |

- රුපියල් මිලියන 28 ක මුළු වියදමක් දරා, මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපලෙහි කිලෝවෝල්ට් 33 අටළු අංගන ඉදිකිරීම.
- රුපියල් මිලියන 70 ක මුළු වියදමක් දරා දකුණ හා බස්නාහිර පලාත්වල පැවති කිලෝ මීටර් 175 ක තෝරාගත් කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන් පුනරුත්ථාපනය කිරීම.
- කිලෝ මීටර් 237 ක් දිග කිලෝවෝල්ට් 33 කුළුණු ජීව රැහැන් නඩත්තු කිරීම.
- ෆුලර්ටන් සහ බොරලැස්ගමුව ප්‍රාථමික උප පොලවල් රුපියල් මිලියන 180 ක වියදමින් යලි සැකසීමේ කටයුතු නිම කිරීම.
- රුපියල් මිලියන 8 ක මුළු වියදමකින් කළුවාමෝදර ප්‍රාථමික උප පොල සඳහා කිලෝවෝල්ට් 33 එළිමහන් වහරු පොල ඉදිකිරීම
- රුපියල් මිලියන 70 මුළු වියදමකින් සියසලු පිළිවසු, බැර කඩන වහරු සහ මැනිරීම් තරාපැව් සවිකිරීම.
- 20 සේවකයන් සිටින 15ක් සේවකයින් නොසිටි ප්‍රාථමික උප පොලවල එදිනෙදා නඩත්තු කටයුතු.
- 29 වහරු අටළු අංගන, 83 සියසලු පිළිවසු, 132 බැර කඩන වහරු සහ 51 මැනිරීම් තරාපැව් හා සම්බන්ධ සාමාන්‍ය නඩත්තු කටයුතු

### මධ්‍යම වෝල්ටීයතා පද්ධති සංවර්ධනය

2013 - 2022 කාලය සඳහා වන මධ්‍යම වෝල්ටීයතා බෙදාහැරීමේ ජාලක සංවර්ධන සැලැස්ම නිම කරනු ලැබ ඇත.

දෙහිවල බෙදාහැරීම් ප්‍රදේශයේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ එවකට පැවති තත්ත්වය හඳුනාගැනීමට හා ඉදිරි පස් වසර තුළ මෙම පද්ධතිය සතුටුදායක ආකාරයෙන් ක්‍රියාත්මක කරවීම සඳහා ක්‍රියාවට නැංවීමට වෘද්ධි සැලසුම් යෝජනා කිරීමට අධ්‍යයනයන් ක්‍රියාවට නගන ලදී.

## බෙදාහැරීම් අංශය 4

ලංකා විදුලි පුද්ගලික සමාගම මුහුණ පා ඇති විදුලිබල සැපයුම් හිඟය පිළිබඳ ගැටළුව විසඳීමේ යෝජනාවන් සමග ඒවා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් ද ලංකා විදුලි පුද්ගලික සමාගම සමග එක්ව පිළියෙල කරනු ලැබීය. විස්තරාත්මක සැලැස්ම සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. හම්බන්තොට, සූරියවැව සහ අවට උප නගරයන්හි ඇතිවී තිබෙන වේගවත් කාර්මික සංවර්ධනය හේතුවෙන් මෙම ජාතික ප්‍රයත්නයන්හිදී, විදුලිබලය සඳහා පෙර නොවූ විරූ ඉල්ලුමක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ඉදිරිපත්වී ඇත.එමනිසා, හම්බන්තොට සහ සූරියවැව ප්‍රදේශයන්හි මධ්‍යම වෝල්ටීයතා සංවර්ධනය සඳහා මහා සැලැස්මක් පිළියෙල කිරීමට අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

### මධ්‍යම වෝල්ටීයතා පද්ධතියෙහි විශ්වසනීයතාව

බෙදාහැරීමේ අංශය 4 හි, අවදානම් සහිත විබරෙහි සැපයුම් විශ්වසනීයතාව නිරීක්ෂණය කළ අතර වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

මධ්‍යම වෝල්ටීයතා ජාලකයෙහි විශ්වසනීයතාව සහ නම්‍යතාවය විමර්ශණයට ලක් කෙරුණ අතර පද්ධති කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පෝෂකයන්ගේ අනතුරට භාජනය විය හැකි කොටස් එකලනය කිරීමට නව වහරු සහ ස්වයං පිළිමසු සවිකිරීමට යෝජනා කර ඇත.

කොටුමා උපපොලවල පිළියවනයන් සහිත බෙදා හැරීමේ පෝෂකයන් ඔස්සේ ස්වයං පිළිමසුවල රැකවරණ සමායෝජකය විමර්ශණය කළ අතර ඒ අනුව ස්වයං පිළිමසුවල සැකසුම් සංශෝධනය කරනු ලැබිණි.

### අන්තර්ගත ජනන ස්ථාන

15MVA පූර්ණ ධාරිතාවකින් සමන්විත අන්තර්ගත ජනන ස්ථාන හතක් සඳහා ජාලක අන්තර් සම්බන්ධතා යෝජනාවන් ඉදිරිපත් කරනු ලැබීය.

### බෙදාහැරීමේ හානි අඩුකිරීම

කඩඉම් මනු සඳහා සුදුසු ස්ථානයන් හඳුනා ගනු ලැබ ඇති අතර සවිකිරීම් සඳහා අදාළ ශාඛාවන්ට දැනුම් දී ඇත. පලාත තුළ බෙදාහැරීමේ පද්ධති හානි (තාක්ෂණික මෙන්ම තාක්ෂණික නොවන) හඳුනාගැනීමට සහ හානි අඩු කිරීමට බලශක්ති කළමනාකරණ ඒකකය, බස්නාහිර දකුණ 1 හි ස්ථාපනය කර ඇත. මනු පරීක්ෂා කිරීම, සවිකර ඇති මනු වෙනුවට අළුත් මනු සවිකිරීම, තොග සැපයුම් මනු දුරස්ථව කියවීම සහ බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමරවල බලශක්ති විගණනය යන කටයුතු පලාතේ බලශක්ති කළමනාකරණ ඒකකය මගින් සිදුකරනු ලැබීය.

### මානනය

බෙදාහරීම් අංශය 4 හි මනු පරීක්ෂණ විද්‍යාගාරය මගින් 2012 වසර තුළදී පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

- ANTELECO සමාගම මගින් බෙදාහැරීමේ අංශය 4 සඳහා නිකුත් කරන ලද සම්පූර්ණ මනු සමූහය වෙනුවෙන් මනු පරීක්ෂණාගාරයේදී එකලා මනු පරීක්ෂා කිරීම
- බෙදාහැරීමේ අංශය 4 සඳහා නිකුත් කළ, ධාරා තරාපැවි ක්‍රියාත්මක වන සහ සෘජුව සම්බන්ධිත තෙකලා මනු, පරීක්ෂණාගාරයේදී පරීක්ෂා කිරීම
- ප්‍රාථමික උප පොලවල්, කොටුමා උපපොල සහ කුඩා ජල විදුලි බලාගාරවලදී අධි වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා බලශක්ති මනුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බැලීම
- ලංකා විදුලිබල මණ්ඩලයේ අංශ හතරෙහිම අඩුවෝල්ටීය ධාරා තරාපැවි පරීක්ෂා කිරීම
- බස්නාහිර පලාත දකුණ 1 ප්‍රදේශයේ ඇති තොග සැපයුම් බලශක්ති මනු සඳහා ලබා දී ඇති දුරස්ථ මනු කියවීම් පහසුකම්වලට අදාළ දෝෂ සොයා නිවැරදි කිරීම
- මනු හා සම්බන්ධ කටයුතු පිළිබඳව පුහුණු වැඩසටහන්

### ද්‍රව්‍ය ප්‍රසම්පාදනය

ඒ ඒ අංශයන්ට අයත් ප්‍රසම්පාදන ඒකකයන් මගින් 2012 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබීය.

- කිලෝවෝල්ට් 33 බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ දකුණු පලාත හා බස්නාහිර පලාත දකුණ 1හි ග්‍රාමීය විදුලිබල සැපයුම 95% කින් මුදුන්පත් කර ගැනීමට හැකිවූ, ග්‍රාමීය විදුලිබල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරීම සඳහා හිඟයකින් තොරව අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට ජාතික හා අන්තර්ජාතික ලංසු තැබීම මගින් රුපියල් මිලියන 950 ක් වටිනා අයිතම සපයනු ලැබිණි.
- ලබා ගන්නා ලද අයිතමයන් පිළිබඳව දැනුවත් කිරීම සහ දැණුම හා පළපුරුද්ද ඇති කිරීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීම
- ප්‍රසම්පාදන කටයුතු පහසු කිරීම සඳහා ප්‍රසම්පාදන කළමනාකරණ මෘදුකාංගයක් භාවිතයට ගනු ලැබිණි.

### කාර්යාලීය කටයුතු පරිගණක ගත කිරීම

2011 වසරේදී, අංශය 4 ට මානව සම්පත් තොරතුරු පද්ධතිය හඳුන්වා දෙනු ලැබීය. මෙම පද්ධතියට මොඩියුලයන් 13 ක් අයත් වන අතර නිවාඩු, කාර්යසාධන අගැයීම් සහ වෛද්‍ය පහසුකම් යන මුල් මොඩියුල තුන ආරම්භ කර තිබූ අතර කායිකව ක්‍රියාවට නංවන ක්‍රමයට සමගාමීව භාවිතයට ගනී.

පරිගණක ගත කළ ගිණුම්කරණ අරමුණු සඳහා (MITFIN) පද්ධතිය මුළුමණින්ම අංශය තුළ ක්‍රියාවට නංවා ඇත. ඒ අතරතුර, මුදල් පොත, සාමාන්‍ය ලෙජරය, ලේඛනගත භාණ්ඩ ලේඛනය සහ කාර්ය පිරිවැය ඇස්තමේන්තු ගත කිරීම මාර්ග ගතව ක්‍රියාවට නංවයි.

ව්‍යාපෘති හා අධිසැර නඩත්තු සහ ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීම, හම්බන්තොට ව්‍යාපෘති කාර්යාලය ඇතුළුව බස්නාහිර පලාත දකුණ 1, දකුණු පලාත යන පලාත්වල සියළුම ප්‍රාදේශීය කාර්යාල සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මාර්ගගතව සම්බන්ධ කරනු ලැබ ඇත. පාරිභෝගික සේවා පිරිවැය මධ්‍යස්ථාන මට්ටමින් ගිණුම් කටයුතු අවසන් කරනු ලැබ ඇත.

### ඵලදායිතා සංවර්ධනය

2012 වසර දී බෙදාහැරීමේ අංශය 4 තුළ එස් 5 සංකල්පය ක්‍රියාත්මක කරනු ලැබූ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ජාතික මට්ටමේ එස් 5 තිළිණයන් දිනා ගනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලය මගින් පවත්වන ලද එස් 5 තරඟයේදී, බෙදාහැරීමේ අංශය 4 හි අතිරේක සාමාන්‍යාධිකාරීගේ කාර්යාලය මගින් ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබීය. බෙදාහැරීමේ අංශය 4 හි ව්‍යාපෘති හා අධිසැර නඩත්තු කාර්යාලය සහ දික්වැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් දෙවන ස්ථානයන් දිනාගනු ලැබිණි. එම අංශයේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය සහ මාතර

## බෙදාහැරීම් අංශය 4

ප්‍රාදේශීය කාර්යාලය තෙවන ස්ථානය දිනා ගන්නා ලදී. සේවා සැපයීමට ගතවන කාලය අඩු කිරීමටත් පාරිභෝගිකයන්ට ලබා දෙන සේවයේ ගුණාත්මකබව ඉහළ නැංවීමටත් මේවා හේතුවීය.

### ISO 9001 : 2008 පිළිගැනීම

අඛණ්ඩ සංවර්ධනය සහ සේවයට කැපවීම හරහා ISO 9001-2008 තත්ව කළමනාකරණ සහතිකය, බෙදාහැරීම් අංශය 4 හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති අධීසැර නව) කාර්යාලය සහ මනු පරීක්ෂණ විද්‍යාගාරයට පවරණු ලැබීය.

### ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීමේ හම්බන්තොට ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ එක් දිස්ත්‍රික්කයකට 100% කින් විදුලිබලය ලබාදීම මුදුන් පමුණුවා ගැනීම ඉලක්ක කර ගත් මුල්ම ග්‍රාමීය විදුලිබල සැපයුම් යෝජනා ක්‍රමය වූයේ, ශ්‍රී ලංකාව ආලෝකමත් කිරීමේ හම්බන්තොට ව්‍යාපෘතිය යි. මෙම ව්‍යාපෘතිය මගින් නිවාස 30,000 කට විදුලිය සපයමින් ද ගුණාත්මකබව හා විශ්වසනීයතාව වැඩි දියුණු කරමින් ද 2012 දී එහි ඉලක්කයන් සපුරා ගනු ලැබීය. හම්බන්තොට දිසුත්‍රික්කයේ සියල්ලන්ට විදුලිය සැපයීමට මෙම ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ලැබීය. මේ සඳහා අවශ්‍ය වූ රුපියල් මිලියන 4,000 ක මුදල ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලැබීය.

බෙදාහැරීමේ උපපොලවල් 230 ක්, මධ්‍යම වෝල්ටීයතා රැහැන් කිලෝ මීටර් 350ක්, අඩු වොල්ටීයතා රැහැන් කිලෝ මීටර් 1,250 ක්, කිලෝවෝල්ට් 33 සීඝ්‍රගාමී ද්විත්ව පරිපථ කුළුණු රැහැන් කිලෝ මීටර් 108 ක් සහ කිලෝවෝල්ට් 33 වහරු අටළු අංගන (Switching Gantries) 6 ක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ විෂය පථයට අයත්විණි.

ව්‍යාපෘතියේ ඉහත දැක්වූ විෂය පථයට අමතරව, එහි විදුලිබලය බෙදාහැරීමේ ජාලකය ඉදිකිරීමේ කටයුතු ද ව්‍යාපෘතිය මගින් භාරගනු ලැබ ඇත. 2012 වසර අවසානය වන විට, ග්‍රාමීය විදුලිබල සැපයීමේ ව්‍යාපෘතිය යටතේ, උපපොලවල්, මධ්‍යම වෝල්ටීයතා රැහැන් හා අඩු වෝල්ටීයතා රැහැන් ඉදිකිරීම නිමකර තිබිණි. දිස්ත්‍රික්කයේ වටිනා ගස් රැක ගැනීම සඳහා, අඩු වෝල්ටීයතා රැහැන්වලින් 75% කට වැඩි ප්‍රමාණයක් ඇහැසි පොදිබහන් (ABC) භාවිතයෙන් ඉදිකරනු ලැබ ඇත. වන රක්ෂිතයන්හි වෘක්ෂලතාදීය රැක ගැනීමට, ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට, මෙම බෙදාහැරීමේ පරිපථයෙහි, අර්ධ වශයෙන් පරිවරණය කළ, පරිසර හිතකාමී මධ්‍යම වෝල්ටීයතා රැහැන් කිලෝ මීටර් 5 ක් පමණ ඇද ඇත. දැනට ලංකා විදුලිබල මණ්ඩලයට අයත් අනෙක් අංශයන් ද අතු ඉති කපා දැමීම සීමාකරනු ලැබ ඇති ප්‍රදේශයන්හි, ඉහත තාක්ෂණය යොදා ගනිමින් ග්‍රාමීය විදුලිබල සැපයුම් කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන් ඉදිකිරීමේ කටයුතුවලින් 65% ක් ද අටළු අංගනය ඉදිකිරීමේ කටයුතුවලින් 55%ක් ද 2012 වර්ෂය අවසාන වනවිට නිම කරනු ලැබ තිබූ අතර ඉතිරි වැඩ කොටස් 2013 වසර අවසාන වනවිට නිම කිරීමට සැලසුම් කර තිබිණි. මීට අමතරව, අවශ්‍ය පුහුණුව ලබාදී PLCCAD නමැති නව මෘදුකාංගය යොදාගනිමින් කිලෝවෝල්ට් 33 නව කුළුණු රැහැන් නිර්මාණය කරනු ලැබූ අතර එහිදී කුළුණු රැහැන් පිරිවැය වඩාත් යහපත් මට්ටමක පවත්වා ගැනීමට හැකිවී ඇත.

ඉඩම් පරිහරණය අවම කිරීමටත් කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන් ඉදිකිරීමේ පිරිවැය පහත හෙළීමටත් යොදාගනු ලැබූ තවත් විශිෂ්ට නව තාක්ෂණයක් වූයේ, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කිලෝ මීටර 4.5 ක පරිපත හතරේ කුළුණු රැහැන් ඉදිකිරීමයි.හම්බන්තොට වරායට විදුලිය සැපයීමට මෙම මෙය ඉදිකරනු ලැබීය.

ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක අතරින් වැඩි කොටසක් නිමකරනු ලැබ ඇති අතර කිලෝවෝල්ට් 33 කුළුණු රැහැන් සහ කිලෝවෝල්ට් 33 වහරු අටළු අංගනය ඉදිකිරීම 2013 වසරේදී නිම කිරීමට සැලසුම් කරනු ලැබ ඇත.

විදුලිබලය බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය, දෙහිවල - ගල්කිස්ස පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කරනු ලැබ ඇතද

- යටි බහන් රැහැන් ජාලකයේ අදියර 1 කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තරාත්මක ක්ෂේත්‍ර සමීක්ෂණ
- පරිපූර්ණ වැඩ ඇස්තමේන්තුවක් සකස් කිරීම සඳහා දත්ත රැස්කිරීම සම්පූර්ණ කරනු ලැබීය. තවද නැදිමාල, රැහැන් ඇතිරීමේ පාලම් සැලසුම (මීටර් 10.5 ක් දිග) සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අනුමැතිය ලබා ගැනිණි.
- අඩු වෝල්ටීයතා විවෘත විදුලි රැහැන් ඇහැසි පොදිබහන් රැහැන් (ABC) බවට පරිවර්තනය කිරීම සඳහා බෙදාහැරීමේ උපපොල යෝජනාක්‍රම 50 කට අදාළව ක්ෂේත්‍ර සමීක්ෂණ හා ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු සහ අදියර - 1 හි, අරිය උපපොල ගොඩනැගිලි ඉදිකරමින් පැවති වැඩබිම්වල මධ්‍යම වෝල්ටීයතා හා අඩු වෝල්ටීයතා උපකරණ විතැන් කිරීම ඇතුළුව වැඩබිම් ඉවත් කිරීමේ කටයුතු
- මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීම පිණිස, ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි ආයතනය වෙත යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත.

### මානව සම්පත්ද බෙදාහැරීමේ අංශය 4

වර්ෂය අවසානයේදී, මෙම අංශයේ සම්පූර්ණ කාර්යමණ්ඩල සේවක සංඛ්‍යාව 2,015 ක් වීය.




**සේවක කාණ්ඩ බෙදාහැරීමේ අංශය 4**

# ව්‍යාපෘති අංශය



# ව්‍යාපෘති අංශය

## ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය

**ධාරිතාවය**

ස්ථාපිත ධාරිතාව  මෙගාවොට් 150 ( මෙ.වොට් 75x ඒකක 2)
වාර්ෂික බලශක්ති ප්‍රමාණය  ගි.වො.පැය 409
බලාගාර සාධකය (Plant Factor)  31%

**පිරිවැය**

විදේශ පිරිවැය(JICA ණය)  ජපන් යෙන් මිලියන 37,817(ඇ.එ.ඩො. මි.346)
දේශීය පිරිවැය  ලංකා රුපි. මිලියන 8,548 (ඇ.එ.ඩො. මි.100)

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය යනු ගංගාශ්‍රිත ජල විදුලිබල යෝජනා ක්‍රමයකි. එහි ප්‍රධාන විෂය පථය වනුයේ, ජල විදුලි බලාගාරයක් ඉදිකරමින් ශ්‍රී ලංකාවේ ප්‍රක්ෂේපිත විදුලිබල ඉල්ලුමේ වැඩිවීම සපුරාලීමයි. පාරිසරික සහ සමාජීය බලපෑම් ප්‍රමාණවත් පරිදි ලිහිල් කරමින්, ක්‍රියාත්මක කෙරෙන මෙම යෝජනා ක්‍රමයේ ස්ථාපිත ධාරිතාවය මෙගාවොට් 150 ක් වන අතර අපේක්ෂිත වාර්ෂික බලශක්ති උත්පාදනය ගිගාවොට් පැය 409 කි.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ,

- තලවාකැලේ නගරයට ආසන්නව, මීටර 35.5 ක උසකින් සහ මීටර 180 ක මුදුන් දුරකින් යුත් වේල්ල. ඝන මීටර 0.8 ක සක්‍රීය ධාරිතාවයක් සමග මෙ.ඝ.මීටර 2.5 ක දළ ධාරිතාවක් ද ඝන කිලෝ මීටර් 0.25 (අක්කර 60 ක) මතුපිට ක්ෂේත්‍රඵලයක් ද එයට ඇත. ජලාශයේ පූර්ණ සැපයුම් මට්ටම, මධ්‍යම මුදු මට්ටමේ සිට මීටර1,194 ක් වනු ඇත. අවම ක්‍රියාකාරී මට්ටම, මධ්‍යම මුදු මට්ටමෙන් මීටර් 1,190 ක් ද සාමාන්‍ය අවර දිය මට්ටම මධ්‍යම මුදු මට්ටමෙන් මීටර් 703 ක් ද වනු ඇත.
- විශ්කම්භය මීටර් 4.5/මීටර් 5.8 ක් වන පෙරාර උමග, පෝරු දමා ඇති කොටසකින් ද පෝරු නොදැමූ කොටසකින් ද යුක්ත වන අතර දිග කිලෝමීටර් 12.89 ක්වේ. දැනට පවත්නා කොත්මලේ වේල්ල හා ජලාශය දෙසට එනම් ඊසාන දෙසට හැරීමට පෙර වේල්ලේ සිට උතුරුට පුන්දල් ඔය ඇල්ල දෙසට ගලායයි. (ජලාශය හා බලාගාරය අතර උපරිම දළ හිස මීටර 491 ක් වේ.)
- බලාගාරයේ මුදුනේ පිහිටි සීමිත විවරයකින් ද සමන්විත ප්‍රතිප්‍රහාර රළ ඉපිලුම් ටැංකිය මීටර් 12 ක විශ්කම්භයකින් ද මීටර් 98 ක උසකින් ද යුක්තවේ.
- ආරම්භක විශ්කම්භය මීටර් 4.5ක සිට මීටර් 1.45 දක්වා අඩු වන ලෙසට පිහිටි ආනත භූගත දණ්ඩකින් කොටු දොර නිර්මාණය කර ඇත. එය දිගින් මීටර් 793 ක් වන අතර මීටර් 745 ක් වන එක් මං තීරුවකින් ද මීටර් 48 වන මංතීරු දෙකකින් ද සමන්විත වේ.
- කි.වොට් 77,000 ටර්බයින් ඒකක දෙකක්, සිරස් අක්ෂ තෙකලා 88000 KVA ජනක යන්ත්‍ර දෙකක්, තෙකලා තරාපැවි(ට්‍රාන්ස්ෆෝමර) දෙකක් සහ කි.වොට් 220 වායු පරිවාරක ස්විච්පන්න(පරිවාරක වහරු උපපොළ) උපපොළක් සහිතව, මීටර් 66.3 ක දිගකින්, මීටර් 18.8 පළලකින් මීටර 36.5 උසකින් යුක්තව නියම්ගම්දොර පිහිටි භූගත විදුලි බලාගාරයක්. (පුනා ඔය සහ කොත්මලේ ඔය දෙමෝදර සිට කිලෝමීටර් 2 ක් ගඟෙ ඉහළ කොටසේ)
- කිලෝවෝල්ට් 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය බලාගාරය සමඟ සම්බන්ධ කිරීම සඳහා මීටර් 36.5 ක් පළල, මීටර් 130 ක් දිග එළිමහන් වහරු අංගනයක් ද නියම්ගම්දොර ප්‍රදේශයේ පිහිටා ඇත.
- ජනනය කරනු ලබන විදුලි බලය දැනට පිහිටුවා ඇති කොත්මලේ උපපොලට හා ආශ්‍රිත වහරු අංගන දිගු වෙතට බෙදාහැරීම සඳහා කිලෝමීටර් 18 ක් දිග කිලෝවෝල්ට් 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන්

## වර්තමාන තත්ත්වය

කළමනාකරණ පහසුව තකා ව්‍යාපෘතිය කොටස් පහකට බෙදා ඇති අතර පහත දක්වා ඇති පරිදි කොන්ත්‍රාත්කරුවන් පස් දෙනෙකු වෙත ටෙන්ඩර් පිරිනමා ඇත.

කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර

| කොටස | කොන්ත්‍රාත්කරුගේ නම | ප්‍රදානයකල දිනය | කොන්ත්‍රාත් කාලය | කොන්ත්‍රාත් වටිනාකම | | ගෙවූ මුදල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලංකා රු. මිලියන | ජපන් යෙන් මිලියන | ලංකා රු. මිලියන | % | ජපන් යෙන් මිලියන | % |
| උපදේශන සේවා | J - පවර් | 2003.11.15 | 76 මාස | 734 | 2,358 | 616 | 84 | 2,184 | 93 |
| කොටස 1<br>සුදානම් කිරීමේ කටයුතු | මයිඩා සංස්ථාව | 2005.07.27 | 33 මාස | 6,830 | 661 | 5,770 | 84 | 630 | 95 |
| කොටස 2<br>ප්‍රධාන සිවිල් වැඩ | මයිඩා නිෂිමට්සු JV | 2006.12.06 | 54 මාස | 5,609 | 7,726 | 5,523 | 98 | 7,389 | 96 |
| කොටස 3<br>ජල තාක්ෂණික උපකරණ | සි.ස.කුරිමොටෝ. | 2007.11.29 | 42 මාස | 788 | 2,060 | 788 | 100 | 2,060 | 100 |
| කොටස 4<br>විදුලි කාර්මික උපකරණ | මිට්සුබිෂි කෝපරේෂන් | 2008.06.20 | 36 මාස | 585 | 7,973 | 531 | 91 | 7,235 | 91 |
| කොටස 5<br>සම්ප්‍රේෂණ මාර්ගය | කින්ඩන් කෝපරේෂන් | 2009.10.06 | 22 මාස | 723 | 738 | 706 | 98 | 720 | 98 |
| | | | | 15,271 | 21,517 | 13,934 | 91 | 20,218 | 94 |

## ව්‍යාපෘති අංශය

**2012 දෙසැම්බර් අවසානය වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය**

| අයිතමය | විස්තරය | නිම කළ ප්‍රතිශතය |
|---|---|---|
| කොටස 1 | සුදුනම් කිරීමේ කටයුතු | 94 |
| කොටස 2 | ප්‍රධාන සිවිල් වැඩ | 99 |
| කොටස 3 | ජල කාර්මික උපකරණ | 100 |
| කොටස 4 | විදුලි කාර්මික උපකරණ | 99 |
| කොටස 5 | සම්ප්‍රේෂණ මාර්ගය | 100 |
| | **ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය:** | **98** |

**ප්‍රධාන ජාලයට සම්බන්ධ කළ දිනය** ඒකකය 1: 2012 ජූනි 21
ඒකකය 2: 2012 මාර්තු 28

**අරමුදල් යොදා ඇති ආකාරය**

ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි ආයතනය ණය (SLP 74-JPY 33,265 M & SLP 100-JPY 4,552 M) ජපන් යෙන් මිලියන 37,817 හා ලංකා විදුලිබල මණ්ඩලය (ශ්‍රී ලංකා කොටස්කරු) ලංකා රුපියල් මිලියන 8,548




කොටස 1 - නැවත පදිංචි කිරීම



කොටස 2 - වේල්ල



කොටස 3 - වාන්මග දොරටු



කොටස 3 - යතිපෝරු සවිකිරීම



කොටස 4 - බලාගාරය ඇතුළත සවිකිරීම්



කොටස 4 - ප්‍රධාන පාලන මැදිරිය



කොටස - 5 රැහැන් ඇමිණීම



කොටස - 5 ඉදි කළ කුළුණ

වේයන්ගොඩ - හබරණ - සාම්පූර් ඇතුළුව කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ත්‍රිකුණාමලය ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය

### ත්‍රිකුණාමලයේ මෙගාවොට් 2 × 250 ගල්අඟුරු විදුලි බලාගරය

ඉන්දියාවේ NTPC සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹ ඇති අතර පසුව මෙම හවුල් ව්‍යාපාර සමාගම, 2011 වසරේ දී, සීමා සහිත ත්‍රිකුණාමලය බලශක්ති සමාගම නමින් සංස්ථාගත කරනු ලැබ ඇත. මෙගාවොට් 2 × 250 ගල් අඟුරු විදුලි බලාගාරය ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සම්බන්ධයෙන් සීමාසහිත ත්‍රිකුණාමලය බලශක්ති සමාගම වගකීම දරයි.

සක්‍යතා අධ්‍යයනය සම්බන්ධ උපදේශකවරුන් වන සීමාසහිත NTPC ආයතනය 2012 ජූනි මාසයේ දී සක්‍යතා අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර ඇත. කෙටුම්පත් සක්‍යතා අධ්‍යයන වාර්තාව පිළිබඳ නිරීක්ෂණය කිරීමෙන් පසු, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එය පිළිගනු ලැබූ අතර විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම සහ අනෙකුත් ව්‍යාපෘති ගිවිසුම් ක්‍රියාත්මක කරනු ලැබීය.

සම්ප්‍රේෂණ හානි අඩු කිලෝවෝල්ට් 220 ක කිලෝ මීටර් 150 සම්ප්‍රේෂණ රැහැන් හබරණ සිට වේයන්ගොඩ දක්වා ඉදි කළ යුතුව තිබූ අතර හබරණ නව කොටුමා උප පොල ගොඩනැගීම හා වේයන්ගොඩ කොටුමා උප පොල වර්ධනය කිරීම කළ යුතුය. මෙම සම්ප්‍රේෂණ මාර්ගය සඳහා අවශ්‍ය අරමුදල් ජපාන අන්තර් ජාතික සහයෝගිතා ඒජන්සි ආයතනය මගින් සපයනු ලැබීය (ජපන් යෙන් මිලියන 9,573). රැහැන් මාර්ගය සමීක්ෂණය කරනු ලැබූ අතර ඉඩම් හිමියන්ට නෛතික දැනුම්දීම් සිදු කරනු ලැබීය. පරීක්ෂණයන් පවත්වනු ලැබීය. මූලික පාරිසරික පරීක්ෂණයන් සඳහා අවශ්‍ය අනුමැතිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබා ගෙන ඇත. හබරණ නව කොටුමා උපපොල සඳහා ඉඩමක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ඇති අතර වේයන්ගොඩ කොටුමා උප පොල වර්ධනය කිරීමේ කටයුතු අවශ්‍ය පර්චස් 225 කුඹුරු ඉඩම එහි පුද්ගලික හිමිකරුගෙන් මිලදී ගන්නා ලදී. ශාක ගනනය කිරීම හා වන්දි ගෙවීම පිණිස තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඉදිකිරීම් කටයුතු 2013 නොවැම්බර් මාසයේ දී ඇරඹේ. උපදේශකවරයෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

හබරණ සිට සාම්පූර් දක්වා දිවෙන කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය කිලෝමීටර් 98 ක් දිග කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය හබරණ සිට සාම්පූර් දක්වා ඉදිකළ යුතුව ඇති අතර සාම්පූර් කොටුමා උපපොල ද ගොඩනැගිය යුතුය. මෙම බෙදාහැරීමේ මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් (එ.ජ.ඩො. මිලියන 60) ඉන්දියානු ණය මාර්ගයෙන් අපේක්ෂා කෙරිණි. ඉන්දියාව සමඟ සාකච්ඡා ආරම්භ කරන ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා මහ භාණ්ඩාග ාරයෙන් ඉල්ලීමක් කර ඇත.සාම්පූර් සිට හබරණ දක්වා ඉදි කෙරෙන කිලෝමීටර් 90 ක් දිග කිලෝවෝල්ට් 220 නව සම්ප්‍රේෂණ මාර්ගය පිළිබඳ සමීක්ෂණ කටයුතු සිදු කරනු ලැබ ඇත. මෙමගින් බලපෑමට ලක්වූ පාර්ශවයන්ට දැනුම්දීම් සිදු කරනු ලැබ ඇති අතර පරීක්ෂණයන් සිදු කරනු ලැබීය. අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුමැතිය සඳහා ඔවුන්ගේ නිර්දේශයන් මහජන උපයෝගිතා කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ආරම්භක පාරිසරික පරීක්ෂණයන් සිදු කරනු ලැබ වාර්තාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. අනුමැතිය අපේක්ෂාවෙන් සිටි අතර සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2013 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරිණි. යෝජිත සම්ප්‍රේෂණ මාර්ගයේ ගස් අතු ඉති ඉවත් කිරීම හා අත්පත් කර ගනු ලබන ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. සම්ප්‍රේෂණ සැලසුම් ශාඛාවේ සබඳකම් ඇතිව වේයන්ගොඩ-හබරණ-සාම්පූර් සම්ප්‍රේෂණ මාර්ගයට අදාළ ටෙන්ඩර් ලියකියවිලි සකස් කරමින් තිබිණි.

### මෙගාවොට් 900 පුත්තලම ගල්අඟුරු විදුලිබල ව්‍යාපෘතිය

පුත්තලම ගල්අඟුරු විදුලිබල ව්‍යාපෘතියේ 1 වන අදියර යටතේ, මෙගාවොට් 300 ක ප්‍රථම බලාගාර ඉදිකිරීම 2007 ජූලි මාසයේ ඇරඹිණි. අදියර 1 සඳහා සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 445 ක් විය. මෙම ව්‍යාපෘතියේ ක්‍රියාවට නැංවීමේ නියෝජිත ආයතනය වනුයේ, ලංකා විදුලිබල මණ්ඩලයයි.

මෙම ව්‍යාපෘතිය නොරොච්චෝලේ එනම් කල්පිටිය අර්ධද්වීපයේ දකුණු කෙළවරේ පිහිටා ඇත. එය කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශය යටතට ගැනේ. මෙය හෙක්ටයාර 93 ක භූමි ප්‍රදේශයක් වසා පැතිර පවතී. සහනදායි ණයක් ලෙස මෙම ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් සියල්ල සපයන ලද්දේ චීනයේ EXIM බැංකුව මගින්ය. දෛනිකව ගිගාවොට්පැය 5 ට ආසන්න විදුලිබලයක් නිපදවන මෙම ව්‍යාපෘතිය 2011 ජූලි මාසයේදී වාණිජ මෙහෙයුම් ආරම්භ කරනු ලැබීය. කොන්ත්‍රාත්තුවට අනුකූලව, 2012 ජනවාරි මාසයේදී මෙම ව්‍යපෘතිය නිම කර අවසන් කරනු ලැබිණි.

ව්‍යාපෘතියේ 1 වන අදියරේ විෂය පථය පහත දැක්වෙන පරිදි ප්‍රධාන අංශ හතරකින් සමන්විත විය.

### මෙම විදුලි බලාගාරය

මෙම විදුලි බලාගාරය වායු තලබමරයකින් බලගැන්වෙන මෙගාවොට් 300 ක උත්පාදන යන්ත්‍රයකින් බොයිලේරුව, අඟුරු අවගමනය කෙරෙන පටි, අඟුරු කෑලිබලට කඩන යන්ත්‍ර, කුඩු කරණ යන්ත්‍රය, ජලයෙහි ඇති ඛනිජ ඉවත් කරන යන්ත්‍ර වැනි යන්ත්‍රාගාරයකින් සහ උපකරණ ආදියෙන් සමන්විතවේ.

### ගල්අඟුරු මෙහෙයුම් උපකරණ

මෙට්‍රික් ටොන් 5000 කින් යුත්, ගල්අඟුරු ගෙන යන බත්තල් දෙකක් එකවර නැංගුරම් ලෑමට ඉඩකඩ සැලසිය හැකි මීටර් 500 ක් දිග ජැටියකින්/ආධාරක තට්ටුවකින් ද පැයකට ගල්අඟුරු මෙට්‍රික් ටොන් 650 ක් ගොඩබෑමට හැකි දොඹකර යන්ත්‍ර දෙකකින් ද, පැයකට ගල්අඟුරු මෙට්‍රික් ටොන් 1,500 ක් ගබඩා අංගනය කරා ගල්අඟුරු ගෙනයා හැකි වාහන පද්ධතියකින් ද, සාම්පල උපකරණයකින් ද මෙට්‍රික් ටොන් 900 විදුලි බලාගාරයට තෙමසක කාලයක් සඳහා අවශ්‍ය වන ගල්අඟුරු මෙට්‍රික් ටොන් 750,000 ක් ගබඩා කර තැබිය හැකි ගල්අඟුරු ගබඩා අංගනයකින් ද ගල් අඟුරු මෙහෙයුම් උපකරණ සමන්විත වේ.

### සම්ප්‍රේෂණ රැහැන් සහ උප පොල

කිලෝමීටර් 117 ක් දිග කිලෝවෝල්ට් 220 ක් බලපවත්වන පළමු අදියරේ සම්ප්‍රේෂණ රැහැන නොරොච්චෝලේ සිට වේයන්ගොඩ දක්වා වේ. මෙය ද්විත්ව සංනායක ද්විත්ව පරපථ සම්ප්‍රේෂණ රැහැනකි.

### සේවක නිවාස සංකීර්ණය

ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා නිදන කාමර, පෞද්ගලික නිවාස ඒකක, සමාජ ශාලාවක්, ඇතුළු අනෙකුත් සියලු පහසුකම් වලින් මෙය සමන්විත වේ.

### පුත්තලම ගල්අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතිය - අදියර II

පුත්තලම ගල්අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතියේ පළමු අදියරේ දිගුවක් ලෙස මෙගාවොට් 2 x 300 දෙවන අදියර ක්‍රියාත්මකවේ. මෙම දෙවන අදියර පහත සඳහන් ඉදිකිරීම් කටයුතුවලින් සමන්විත වේ.

1 . පළමු අදියරේ බලාගාරය හා ඒ ආශ්‍රිත කාර්යයන්ට සමාන ආකාරයෙන් මෙගාවොට් 300 දෙවන බලාගාරය ඉදිකිරීම
2. පළමු අදියරේ බලාගාරය හා ඒ ආශ්‍රිත කාර්යයන්ට සමාන ආකාරයෙන් හා ඉතිරි වැඩ සමග මෙගාවොට් 300 තෙවන බලාගාරය ඉදිකිරීම
3. ගල්අඟුරු ගොඩබෑමේ දොඹකර කෙක් ඉදිකිරීම
4. හලාවත නව උපපොල ඉදිකිරීම
5. කිලෝවෝල්ට් 220 ක සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සහ අනුරාධපුර උපපොල ඉදිකිරීම

දෙවන අදියරේ ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත්තුව 2009 ජූනි මාසයේදී අත්සන් තබනු ලැබීය. දෙවන අදියරේ මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 891 ක් වීය. 2010 වසරේ මැයි මාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර අදියර දෙකේ පළමු ඒකකය 2013 වසරේ අවසානයේදී ද දෙවන ඒකකය 2014 අප්‍රේල් මාසයේ ද ක්‍රියාත්මක වීම ආරම්භ කෙරෙයි. මෙම අදියර දෙක සඳහාම සහනදායි ණය කොන්දේසි යටතේ මහජන චීන සමූහාන්ඩුව මගින් අරමුදල් සපයනු ලැබෙයි.

### බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය ගලායන ගංගාශ්‍රිත ව්‍යාපෘතියක් වන අතර දැනට ක්‍රියාත්මකව පවත්නා පොල්පිටිය බලාගාරයේ පහළට ගලා යන ජලධාරාවේ ජල ශක්ති විභවය යොදා ගැනීමේ අරමුණෙන් කැළණි ගඟ ආශ්‍රිතව ඉදිකිරීමට සැලසුම් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය සතුව මෙගාවොට් 35 ක ස්ථාපිත ධාරිතාවක් ගොඩනැගෙන අතර වාර්ෂිකව ගිගාවොට් 126 ක විදුලිබල ශක්තියක් උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ප්‍රධාන වැඩබිම් කොළඹ සිට කිලෝ මීටර් 90 පමණ ඊසාණ දෙසින් කිතුල්ගල නගරය ආසන්නයේ පිහිටා ඇත. ව්‍යාපෘතියට ඇතුළත් ප්‍රධාන අංගයන් වනුයේ, ප්‍රධාන වේල්ල, හැරවීම් වේල්ල, පෙරාර උමග, හැරවුම් උමග, පෘෂ්ඨීක විදුලි බලාගාරය, වහරු අංගනය සහ සම්ප්‍රේෂණ මාර්ගයයි.

ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කරන ලද අරමුදල් සුරක්ෂිත වන පරිදි, සැලසුම් කර ඉදිකිරීමේ පදනමින් (Design Build Basis ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, 2006 දී කැබිනට් අනුමැතිය ප්‍රදානය කරනු ලැබීය. මිල ගණන් සාර්ථක ලෙස අගැයීමෙන් පසු, සාර්ථක ලංසු තබන්නා ලෙස, සීමා සහිත චීන ජාතික විදුලි ඉංජිනේරු සමාගම (CNEEC) තෝරාගනු ලැබිණි. 2010 වර්ෂය අවසානයේදී, ඔවුන් සමග කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලැබීය.

ව්‍යාපෘති වියදම එක්සත් ජනපද ඩොලර් මිලියන 82 ක් වන අතර චීනයේ කර්මාන්ත හා වාණිජ බැංකුවෙන් ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් PLC බැංකුවෙන් ලබාගත් ණය මුදලින් මෙම වියදම් පියවා ගනු ලැබේ. ඉතා ඉක්මණින් මූල්‍ය ගිවිසුම් අත්සන් කිරීමට නියමිතව තිබිණි. 2013 වර්ෂයේ මුල් කාර්තුව අවසානයේදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිත වූ අතර වසර හතරක් තුළ ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කර ඇත. ටෙන්ඩර් විධි නියමයන් අනුව ව්‍යාපෘති උපදේශකයෙකු පත්කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලිබල ව්‍යාපෘතිය සඳහා CDM ලියාපදිංචි කිරීම/ CER ආදායම් ලබාගැනීම සඳහා උපදේශක ලෙස කොරියාවේ සීමාසහිත Ecoeye සමාගම තෝරා ගනු ලැබිණි. දේශගුණික විපර්යාසයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සැකිලි සම්මුතිය යටතේ CDM ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දෙසැම්බර් 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සාර්ථකව ලියාපදිංචි කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත විමෝචන ඌණනය වර්ෂයකයට $CO_2$ මෙට්‍රික් ටොන් 83,075 සමානය.

ව්‍යාපෘතිය සඳහා පරිසර වාර්තාව ලබා ගැනීම, 2015 නොවැම්බර් 8 වෙනි දින දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. ව්‍යාපෘති වැඩ සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු වෙමින් පවතී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර එයට අනුමැතිය ලැබී ඇත.

### යාපනය විදුලිබල ව්‍යාපෘතිය

යාපනය අර්ධද්වීපයේ විදුලිබල අවශ්‍යතාවය

උතුරු ප්‍රදේශයේ, දැනට කෙරීගෙන යන සංවර්ධන වැඩ කටයුතු සහ ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමග යාපනය අර්ධද්වීපයේ විශ්වාසනීය විදුලිබල සැපයුම යථා තත්ත්වයට පත්කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් තිබිණි. යාපනය විදුලිබල ජාලය, ජාතික විදුලිබල ජාලයෙන් වෙන්වී ඇති බැවින්, කෙටි කාලීන විසඳුමක් ලෙස අඩු වියදම්, විශ්වාසනීය විදුලිබල උත්පාදන ක්‍රමයක් යාපනය අර්ධද්වීපයට සැපයීම වැදගත්වේ. තවදුරටත්, ජාතික ජාලයේ බලශක්ති ජනන මූලයන්ගේ සිට ඇති දුර සැලකිල්ලට ගෙන වෝල්ටීය ස්ථායිතාවය සහ විදුලිබල පද්ධතියේ විශ්වසනීයතාව පවත්වා ගෙන යාම සඳහා, දිගු කාලීන වශයෙන් යාපනයේ විදුලි බලාගාරයක් ස්ථාපිත කිරීම අවශ්‍යවේ.

### ව්‍යාපෘතියේ විෂයපථය

ව්‍යාපෘතියේ විෂයපථය වූයේ, ඩීසල් දහනයෙන් ක්‍රියා කරණ, මෙගාවොට් 24 විදුලි බලාගාරයක් සැලසුම් කොට, නිෂ්පාදනය කර, ස්ථාපනය කිරීම සහ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ කිරීමයි. මෙම ඩීසල් විදුලි බලාගාරය යාපනය අර්ධද්වීපයේ චුන්නාකම්හි ස්ථාපනය කිරීමට සැලසුම් කෙරිණි. EPC turnkey කොන්ත්‍රාත්තුවක් ලෙස දෝෂ සම්බන්ධයෙන් මාස දොළහක වගකීම් කාලයක් සඳහා ප්‍රතිඥාවන් ලැබිණි. මෙම බලාගාරය, 3X8 මෙගාවොට් DG කට්ටල සහ ආශ්‍රිත උපයෝගී පද්ධති, ගොඩ බෑමේ පහසුකම් සහිත tank farm, විකිරක තීරයක් (radiator bank), කිලෝ වොට් 33 gantry" fuel treatment house" incinerator, වැඩපල ගොඩනැගිල්ලක්, පරිපාලන ගොඩනැගිල්ලක් සහ තනිකඩ නිල නිවාස සඳහා ගොඩනැගිලි යනාදියෙන් සමන්විත වේ. තව ද, එංජිම නිෂ්පාදනය කරන ස්ථානයේදී, ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා, මෙහෙයුම් හා නඩත්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතුවේ.

### ව්‍යාපෘති නිර්මාණශිල්පය

ව්‍යාපෘතියේ නම : මෙගාවොට් 24 යාපනය විදුලිබල ව්‍යාපෘතිය

කොන්ත්‍රාත් අංකය : CEB / JPP /01-2012

සේවා යෝජක : ලංකා විදුලිබල මණ්ඩලය

ඉංජිනේරුවන් : ලංකා විදුලිබල මණ්ඩලය

EPC කොන්ත්‍රාත්කරු : සීමා සහිත ලක්දනව්

### කොන්ත්‍රාත් කාලය

| කාර්යය | සැලසුම්ගත කාලය | ගතවූ කාලය |
|---|---|---|
| ව්‍යාපෘති කාලය | දින 261 | දින 259 |
| ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | 2012 අප්‍රේල් මස 30 දින | 2012 අප්‍රේල් 30 |
| ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට දිනය | 2013.ජනවාරි | |

### කොන්ත්‍රාත් මිලගණන් (වෙනස්වීම් කොන්ත්‍රාත් වලට පසුව)

**විදේශ මුදල් කොටස -** එ.ජ.ඩො. 9,195,659.17 සමග යුරෝ 12,850,430.49

**දේශීය මුදල් කොටස -** ලංකා රුපියල් 686,156,781.49

### මුදල් යෙදවීම

කොන්ත්‍රාත් අගයෙන් 10% ක අත්තිකාරම් මුදලක්, 2012 මැයි 16 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් වලින් කොන්ත්‍රාත් කරුට ගෙවනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ මුදල් යෙදවීම සඳහා අවශ්‍ය මුදල් සැපයීම පිණිස ලංකා විදුලි පුද්ගලික සමාගම රුපියල් බිලියන 3.0 ක ණය මුදලක් ලබා ගැනීමට පිළියෙල කරනු ලැබීය.

### ව්‍යාපෘතියේ ප්‍රධාන සිදුවීම්

ලංසු කැඳවීම : 2011.12.22
ලංසු කැඳවීමේ අවසන් දිනය : 2012.02.02
SCAPC සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා
ටෙන්ඩර් අගැයුම් කමිටුවේ වාර්තාව ඉදිරිපත් කිරීම : 2012.02.08
ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම : 2012.04.09
ටෙන්ඩරය පිරිනැමීමේ ලිපිය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කිරීම : 2012.04.11
කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම : 2012.04.27
කොන්ත්‍රාත් ආරම්භවීම : 2012.04.30
10 % අත්තිකාරම් ගෙවීම : 2012.05.16
ප්‍රථම ඒකකය ඇරඹීම : 2012.12.20
විශ්වසනීයතා ධාවනය සහ වාණිජ නිෂ්පාදන කටයුතු ඇරඹීම : 2013 මුල් කාර්තුව තුළ අපේක්ෂා කරනු ලැබීය

### උමා ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය

වැලිමඩ, පුහුල්පොල දී, උමා ඔය හරහා කොන්ක්‍රීට් වේල්ලක් සහ දියරබඳී මහතොටිල්ල ඔය හරහා තවත් කොන්ක්‍රීට් වේල්ලක් ද, වතුර ගෙනයාමේ ව්‍යුහයන්, පොළොව යට පිහිටි විදුලි බලාගාරය, වහරු අංගනය සහ බදුල්ල කොටුමා උපපොල හා සමග සම්බන්ධ කෙරෙන සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත්වේ. ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග වියලි කලාපයේ ඉඩම් වලට ජල සම්පාදනය කිරීම පිණිස ඝණ මීටර මිලියන 145 ක දිගුකාලීන වාර්ෂික සාමාන්‍ය ජල ප්‍රමාණයක් trans-basin conveyance සැපයීමට මෙම ව්‍යාපෘතියට හැකිවේ. එමගින් මෙගාවොට් 120 ක ජල විදුලිබල ප්‍රමාණයක් ජාතික පද්ධතියට එකතු කරනු ඇත.

ව්‍යාපෘතිය කොන්ක්‍රීට් වේලි දෙකකින් සමන්විතවේ. පළමුවන වේල්ල, උමාඔය ගංගාවේ පුහුල්පොල ඉදි කරනු ලැබේ. පුහුල්පොල වේල්ල මගින් නියාමනය කරනු ලබන ජලය යා කිරීමේ උමගක් දිගේ, දියරබ දී මහතොටිල්ල ඔය හරහා බඳින ලද වේල්ලෙන් ඇතිවූ ජලාශය කරා ගෙන යයි. මෙහි සිට දීර්ඝ පෙරාර උමගක් සහ සිරස් උමගක් දිගේ ජලය භූගත විදුලි බලාගාරය කරා ගෙන යයි. විදුලි බලාගාරයෙන් පිට වන ජලය අවරාර උමඟක් දිගේ, කිරිඳිඔයේ අතු ගංගාවක් වන, අලිකොට ඔයට යොමු කෙරේ.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස, වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ව්‍යාපෘතිය ක්‍රියාවට නන්වයි. EPC/turnkey පදනමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, 2008 පෙබරවාරි 28 වන දින, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ඉස්ලාමි ජනරජයේ Farab බලශක්ති හා ජල ව්‍යාපෘතිය අතර ගිවිසුම අත්සන් කරනු ලැබිණි. කොන්ත්‍රාත් වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 529 ක් වන අතර කොන්ත්‍රාත් වටිනාකමින් 85 % ක් ඉරාන විදේශ සංවර්ධන බැංකුව මගින් සපයනු ලබයි. ඉතිරි 15 % ශ්‍රී ලංකා ආණ්ඩුව මගින් දරණු ලැබේ. කොන්ත්‍රාත්තුවට අනුව, EPC කොන්ත්‍රාත්කරු 2010 මාර්තු 15 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලැබීය. සේවයෙහි යෙදවීමේ සහ උමග විදීමේ කටයුතු ව්‍යාපෘති වැඩබිමෙහි දැනට සිදු කෙරෙමින් පවතී. 2015 දෙසැම්බර් මාසයේදී බලාගාර ජාතික පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. සම්ප්‍රේෂණ මාර්ගය (EM and HM works) ඇතුලු විදුලි ජනන උපකරණ එක්සත් ජනපද ඩොලර් මිලියන 189 ක් මිලවේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ මෙම කොටස, ලංකා විදුලිබල මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

### සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

2012 වර්ෂයේදී, සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක දහයක් කටයුතු කරනු ලැබ තිබිණි. බෙලිඅත්ත සහ කිලිනොච්චිය කොටුමා උප පොලවල් ඉදිකිරීම 2012 වර්ෂය තුළදී නිම කරනු ලැබ තිබූ අතර චුන්නාකම්, මහියංගනය, නාවුල, මාහෝ හා පල්ලේකැලේ කොටුමා උප පොල ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතිණි. රත්මලාන, රත්නපුර, විමලසුරේන්ද්‍ර, සීතාවක, බලංගොඩ, බදුල්ල, නුවරඑළිය, උකුවෙල, හබරන, පානදුර, මාතර, පුත්තලම, අම්පාර සහ වාලච්චේන යන කොටුමා උපපොලවල් වර්ධනය කිරීමේ කටයුතු මෙම කාලය තුළ ක්‍රියාවට නැන්විණි. ජාතික විදුලි ජාලය ශක්තිමත් කිරීම පිණිස, ගාල්ල සිට මාතර දක්වා, පුත්තලම සිට මාහෝ දක්වා, උකුවෙල සිට පල්ලේකැලේ දක්වා, හබරන සිට වාලච්චේන දක්වා, රන්ටැඹේ සිට

මහියංගනය දක්වා, වව්නියා සිට කිලිනොච්චි දක්වා සහ කිලිනොච්චි සිට චුන්නාකම් දක්වා සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමේ කටයුතු ද සිදු කෙරෙමින් පැවතිණි. සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව යටතේ හසුරුවනු ලැබූ ව්‍යාපෘති පිළිබඳ කෙටි විස්තරයක් මෙහි පහත එක් කෙරේ.

### බෙලිඅත්ත කොටුමා උප පොල ව්‍යාපෘතිය

බෙලිඅත්තේ, MVA 63, කිවො 132/33 කොටුමා උප පොල සහ හම්බන්තොට ආලෝකමත් කිරීම ව්‍යාපෘතිය යටතේ බාරගෙන ඇති හක්මන සිට බෙලිඅත්ත දක්වා කිලෝමීටර් 8 ක් දිග කිවො 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම. කොටුමා උපපොල සඳහා (යුරෝ මිලියන 4,731 සහ ලංකා රුපියල් මිලියන 89,332) සහ සම්ප්‍රේෂණ මාර්ගය සඳහා (ලංකා රුපියල් මිලියන 427) අවශ්‍ය මුල්‍ය පහසුකම් ලංකාණ්ඩුව මගින් සපයනු ලැබීය. සම්ප්‍රේෂණ මාර්ගය 2011 ඔක්තෝබර් මාසයේදී නිම කරනු ලැබූ අතර කොටුමා උපපොලේ වැඩ නිමකර 2012 පෙබරවාරි 13 දින බල ගැන්වනු ලැබීය.

### වව්නියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

උතුරු පලාතේ යටිතල ව්‍යුහ පහසුකම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා, රජය, වඩක්කින් වසන්තම් (උතුරු වසන්තය) වැඩ සටහන දියත් කර තිබිණි. මෙම වැඩසටහනේ කොටසක් ලෙස, අවශ්‍ය සම්ප්‍රේෂණ මාර්ග සහ කොටුමා උපපොලවල් ඉදිකිරීම ඇතුලත් කරනු ලැබීය.

වඩක්කින් වසන්තම් වැඩසටහන යටතේ, මෙම ව්‍යාපෘතිය සඳහා ජපන් අන්තර් ජාතික සහයෝගිත්ව ආයතනය විසින් ජපන් යෙන් මිලියන 2,700 ක් සපයනු ලැබ තිබිණි. වව්නියා කොටුමා උප පොලෙහි අවශ්‍ය වර්ධනය කිරීමේ වැඩ ද ඇතුළුව, කිවො 132/33, 63 MVA කොටුමා උප පොල සහ වව්නියා කොටුමා උප පොලේ සිට කිලිනොච්චි කොටුමා උප පොල දක්වා, කිලෝ මීටර් 67 ක් දිග, කිවො.132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම් කාර්යය විෂය ක්ෂේත්‍රයට අයත්විය. කොන්ත්‍රාත් ලියවිලි අත්සන් කරනු ලැබූ අතර 2010 ජූලි මාසයේ දී වැඩ ආරම්භ කරනු ලැබීය. නියමිත පරිදි වැඩ නිම කිරීමට හා අතිගරු ජනාධිපති තුමා විසින් 2012 සැප්තැම්බර් 25 දින කොටුමා උපපොල උත්සවාකාරයෙන් විවෘත කිරීමට ද හැකිවීය. මෙම කොටුමා උපපොල හා සම්ප්‍රේෂණ මාර්ගයේ වැඩ නිම කිරීමත් සමග, ජාතික ජාලය කිවො 132 මට්ටමෙන් කිලිනොච්චිය දක්වා ද දීර්ඝ කිරීමට ද, ලංකා විදුලිබල මණ්ඩලය ජයග්‍රාහී හැකි විය.



2012 සැප්තැම්බර් 25 දින කිලිනොච්චිය කොටුමා උප පොල විවෘත කිරීම

### කිලිනොච්චි - චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ද, උතුරු පලාත සංවර්ධනය කිරීම සඳහා රජය විසින් දියත් කරන ලද, වඩක්කින් වසන්තම් (උතුරු වසන්තය) වැඩසටහනේම කොටසකි.

එක්සත් ජනපද ඩොලර් මිලියන 28.72 කින් සමන්විත වන මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව මුදල් සපයයි.මෙම ව්‍යාපෘතියේ කාර්ය විෂය පථය සමන්විත වනුයේ, චුන්නාකම් කිවො 132/33, 63 MVA කොටුමා උපපොල ද, කිලිනොච්චි කොටුමා උපපොලේ සිට චුන්නාකම් කොටුමා උපපොල දක්වා කිලෝමීටර් 73 ක් දිග, කිවො 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමයි.

කිලිනොච්චි සිට චුන්නාකම් දක්වා කිවො 132 සම්ප්‍රේෂණ රැහැන් ඇදීම සඳහා එලිෆන්ට්පාස් කළපුව, වදරවත්ත කලපුව, යුද්ධ කාලය තිළ පවත්වා ගෙනගිය, මුහමාලේ ඉදිරි ආරක්ෂක තීරය යන වඩාත් දුෂ්කර භූමිභාගය හරහා සම්ප්‍රේෂණ විදුලි අටලු 215 ක් ඉදිකරනු ලැබීය. චුන්නාකම්හි, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් භූමියක, අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය ප්‍රදේශය තුළ ලබා ගැනීමට නොතිබූ බැවින්, මහත් අපහසුතාවන් මැද කොටුමා උපපොල ඉදිකරනු ලැබීය.

වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර 2013 අගෝස්තු මාසය වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබීය. වැඩ අවසන් කොට, මුළු රටම එකම ජාලකයකට සම්බන්ධ කළ විට, වෙන්ව පැවති අවුරුදු 23 ක කාලයට පසු, යාපනය දිස්ත්‍රික්කයේ මෙන්ම අවට පිහිටි දිස්ත්‍රික්කයන්හි ද, විදුලි සැපයුම අතිශයින් වැඩි දියුණු වනු ඇත.



චුන්කානම් වැඩ බිමේ ප්‍රගතිය

### පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය අවශෝෂණය කිරීම සඳහා කොටුමා උපපොලවල් වර්ධනය කිරීම

ආසියානු සංවර්ධන බැංකුවේ ණය අංක 2518-SRI/2519-SRI (SF) පිරිසිදු බලශක්තිය සහ පිවිසුම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, යටතේ මෙම ව්‍යාපෘතියේ කොටසක් සඳහා එම බැංකුව මගින් රුපියල් මිලියන 2,998 ක් සපයයි. මෙම අරමුදල් භාවිතයෙන්, කිවො 132/33, 63 MVA නව කොටුමා උපපොලක් මහියංගනයේ ඉදිකරමින් පවතින අතර

සීතාවක, බලංගොඩ, බදුල්ල, නුවරඑළිය සහ උකුවෙල ඇති කොටුමා උප පොලවල් වර්ධනය කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ, ලංකා රුපියල් මිලියන 1,361 ක් වටිනා සෙසු වැඩ කොටස් සඳහා ලංකා ආණ්ඩුව මුදල් යොදවයි. මෙම අදියර යටතේ දැනට පවත්නා රත්නපුර, විමලසුරේන්ද්‍ර සහ රන්ටැඹේ කොටුමා උප පොලවල්, ඒවායෙහි විදුලි තරාපැවි වල ධාරිතාව වැඩි කරමින්, වර්ධනය කරමින් පවතී. තව ද, රන්ටැඹේ සහ මහියංගනය කොටුමා උප පොලවල් එකට සම්බන්ධ කිරීම සඳහා කිලෝවෝල්ට් 132, කිලෝ මීටර් 21 ක් දිග සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකරමින් පවතී.

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සැපයූ කොටස හා ශ්‍රී ලංකා රජය අරමුදල් සැපයූ කොටුමා උපපොල කොටස සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් පිළිවෙලින් 2010 අගෝස්තු සහ 2010 නොවැම්බර් යන මාස වලදී අත්සන් කරනු ලැබීය. රන්ටැඹේ සිට මහියංගනය දක්වා සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් භාර ගෙන ඇත. ව්‍යාපෘතියේ සියළුම කොටස් වල වැඩ කරගෙන යමින් පවතින අතර 2012 වන විට වැඩ නිම කිරීමට අපේක්ෂා කෙරේ. දැනට ඇති කොටුමා උප පොලවල්, කුඩා ප්‍රමාණයේ විදුලි බලාගාර හා එකට සම්බන්ධ කිරීම සඳහා බොහෝ කාලයක් අපේක්ෂාවෙන් සිටි විදුලිබල ධාරිතාව ඉහල නැන්වීමේ අවශ්‍යතාවය, මෙම ව්‍යාපෘති ඉදිකර අවසන් කිරීමෙන් පසු, බොහෝ දුරට ඉෂ්ට කර ගත හැකි වනු ඇත.

### සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව, ඔවුන්ගේ ණය 2518-SRI/2519-SRI (SF) පිරිසිදු බලශක්තිය සහ පිවිසුම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ, සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 20.4 ක මූල්‍ය පහසුකම් සම්පාදනය කරයි. 132 කිවො ගාල්ල සිට මාතර දක්වා සම්ප්‍රේෂණ මාර්ග යන්, පුත්තලම සිට මාහෝ දක්වා සහ උකුවෙල සිට පල්ලෙකැලේ දක්වා, 132 සම්ප්‍රේෂණ මාර්ගයන් ඉදිකරමින් ඇත.



සම්ප්‍රේෂණ රැහැන් ඇදීම

### සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ කොටුමා උපපොල ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන සංවර්ධන බැංකුව එහි ණය අංක 2518-SRI/2519-SRI (SF) පිරිසිදු බලශක්තිය සහ පිවිසුම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ සපයන එක්සත් ජනපද ඩොලර් මිලියන 33.1 කින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයයි.

තාක්ෂණික අවශ්‍යතාවන් මත මෙම ව්‍යාපෘතිය කොටස් තුනකට බෙදා ඇත. කොටස 1 මගින් දැනට ඇති කුරුණෑගල කොටුමා උපපොලවල් සහ කොටස 3 (පැකේජ A සහ B) මගින් වේයන්ගොඩ සහ හොරණ කොටුමා උපපොලවල් වර්ධනය කරනු ලැබෙයි. මෙම කොටස් දෙක සඳහා කොන්ත්‍රාත් මෙතෙක් අත්සන් කර නැත. නාවුල, මාහෝ සහ පල්ලේකැලේ නව කොටුමා උප පොලවල් තුනක් ඉදිකිරීම සඳහා කොටස A2 ට අදාළ ගිවිසුම්, 2010 නොවැම්බර් මාසයේදී අත්සන් කරනු ලැබීය. දැනට පවත්නා කොටුමා උප පොලවල් හබරන, පානදුර, මාතර, පුත්තලම සහ ගාල්ල වර්ධනය කිරීම ද, A2 ට යා කරනු ලැබීය. කොටස A2 කොන්ත්‍රාත්තුව, 2013 මැයි භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

### සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ නැගෙණහිර පලාත් ව්‍යාපෘතිය

ණය අංක 2518-SRI/2519-SRI (SF) පිරිසිදු බලශක්තිය සහ පිවිසුම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ, ආසියානු සංවර්ධන බැංකුව, මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 25.2 ක අරමුදල් සපයයි. මෙම ව්‍යාපාතියේ, කොටස B, යටතේ, හබරන කොටුමා උප පොලේ සිට වාලච්චේන කොටුමා උපපොල දක්වා, කිවො 132, කිලෝ මීටර් 100 දිග සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකරනු ලැබේ. වාලච්චේන සහ අම්පාර කොටුමා උපපොලවල් වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ, ලොට් A, මගින් ආවරණය කෙරේ.

කොන්ත්‍රාත් කොටස A සහ කොටස B සඳහා ගිවිසුම් පිළිවෙලින්, 2011 මාර්තු මාසයේ සහ 2011 නොවැම්බර් මාසයේ අත්සන් කරනු ලැබීය. කොටස් දෙකෙහිම වැඩ කෙරෙමින් පවතින අතර 2013 මැද භාගයේ දී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

### ඊසානදිග විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

නැගෙණහිර සහ උතුරු මැද පලාත්වල විදුලි සැපයුම තවදුරටත් දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනු ලැබූ අතර මෙම අරමුණ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මූල්‍යාධාර අපේක්ෂා කරනු ලැබීය. ඊසාන දිග විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ හඳුනාගත් විෂය ක්ෂේත්‍රයන් සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 55 ක මූල්‍ය පහසුකම් සැලසීමට ආසියානු සංවර්ධන බැංකුව දැන් එකඟවී ඇති අතර ගිවිසුම් සකස් කිරීමේ කටයුතු අවසන් කෙරෙමින් පවතී.

මෙම ව්‍යාපෘතිය කොටස් තුනකට බෙදා තිබේ. එනම්

I. A: කොටස මොනරාගල, පොලොන්නරුව හා වව්නතිව් යන ස්ථානයන්හි නව කොටුමා උපපොල තුනක් ඉදිකිරීම සහ අම්පාර හා රන්ටැඹේ දැනට ඇති කොටුමා උපපොල මධ්‍යස්ථාන වර්ධනය කිරීම (ව්‍යාපෘතියේ)

II. B: කොටස මහියංගනය සිට නයනතිව් දක්වා, උහන සිට අම්පාර දක්වා සහ මැදගම සිට මොනරාගල දක්වා, කිවො132 සම්ප්‍රේෂණ මාර්ග

III. C: කොටස නව අනුරාධපුර - කොත්මලේ සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවැනි කිවො 220 පරිපතය ඉදිකිරීම

A කොටස, B කොටස, සහ C කොටස සඳහා පිළිවෙලින්, 2012 අගෝස්තු, 2012 අප්‍රේල් සහ 2012 පෙබරවාරි යන මාසවලදී කොන්ත්‍රාත් අත්සන්

කරනු ලැබීය. වැඩ කෙරී ගෙන යන අතර 2013 වසර අවසානයේදී වැඩ සම්පූර්ණ කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ගාල්ල නව විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

ගාල්ල නව විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගත් විෂය ක්ෂේත්‍රයන් සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 21.6 ක් සපයනු ලැබීය. ව්‍යාපෘතියේ A කොටසේ කොන්ත්‍රාත්තුව යටතේ, ගාල්ල නව කොටුමා උපපොල ඉදිකරනු ඇත. අම්බලන්ගොඩ කොටුමා උපපොලේ සිට ගාල්ල කොටුමා උපපොල දක්වා කිවො 132 සම්ප්‍රේෂණ මාර්ගය B කොටසේ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකරනු ඇත. තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් සමග, A කොටස හා B සඳහා, 2012 අගෝස්තු මාසයේ ගිවිසුම් අත්සන් කරනු ලැබූ අතර සැලසුම් කළ පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී. 2014 වර්ෂයේ අවසානයේදී ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.



# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

# ආයතනික ක්‍රමෝපාය අංශය

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

**වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය පහත සඳහන් ශාඛාවන්ගෙන් සමන්විතවේ.**

- **වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව**
- **පුහුණු ශාඛාව**
- **වැඩපල සහ උපකාරක සේවා ශාඛාව**
- **සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව**
- **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (විදුලක්පාය)**
- **ආරක්ෂක**

## වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව

වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව, ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් කළමනාකරණය ආශ්‍රිත කටයුතු භාර ගෙන ඇත. වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම්, ගොඩනැගිලි වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලය සතු සම්පත් හා වත්කම් උපයෝගීකර ගනිමින් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ට වෙනස් වූ අරමුණු සඳහා අතිරේක ආදායමක් ජනනය කිරීමයි. කෙසේ වෙතත්, එම ව්‍යවස්ථාපිත කාර්යයන්ට බල නොපාන ආකාරයෙන් මෙලෙස අතිරේක ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය.

වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාවේ ප්‍රධාන කාර්යයයන්.

- ලංකා විදුලිබල මණ්ඩලයට අයත් කිසිදු හිමිකම් ලේඛනයක් නොමැති ඉඩම් බිම් මැනීම හා අයිතිය තහවුරු කරගැනීම සඳහා ක්‍රියා කිරීම
- ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම
- මුහුදු ගුවන් යානා සහ විනෝදාත්මක බෝට්ටු සේවාවන් වැනි සංචාරක හා විනෝදාත්මක කටයුතු සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ජල සම්පත් බදු දීම
- ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලි සහ වාහන සඳහා දත්ත බැංකු ඇති කිරීම සහ යාවත්කාලීන කිරීම
- ආදායම් උපයන අරමුණු සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් උපයෝගීකර ගැනීම
- අංශයේ මානව සම්පත් කළමනාකරණය

## පුහුණු ශාඛාව

කාලානුරූප අධ්‍යාපනය, පුහුණුව, කුසලතා සංවර්ධනය සහ පළපුරුද්ද මගින් නූතන ඒකාබද්ධ කර්මාන්තයක කටයුතු ඵලදායි ලෙස ඉටු කිරීමට කාර්යක්ෂම ශ්‍රම හමුදාවක් ගොඩනැගීම සඳහා, පුහුණු ශාඛාව, වසර ගණනාවක කාලයක් පුරා, පියවර ගෙන ඇත. සියලුම කාර්යය මණ්ඩලයට ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම සම්මත පිළිවෙතයි. සමාලෝචනයට ලක් වන වසර තුළ, විවිධ ක්ෂේත්‍රයන්හි නියැලි සේවකයන්ගේ යහපත උදෙසා, සම්මත පුහුණු අධ්‍යාපන පරිපාටියට අමතරව, දැණුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වනු ලැබීය. පුහුණු ශාඛාව පහත සඳහන් ප්‍රධාන ශාඛාවන්ගෙන් සමන්විතවේ.

- ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය, පිළියන්දල
- ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය, කාසල්රී
- කොළඹ ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ බාහිර පුහුණු ඒකකය
- විභාග ඒකකය
- වෘත්තීය සෞඛ්‍යය සහ නිරාපද ඒකකය (Occupational Health & Safety Unit)
- තත්ත්ව හා පද්ධති ඒකකය

### ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය, පිළියන්දල

මෙම මධ්‍යස්ථානය මගින් ක්‍රියාවෙහි යොදවන ගුණාත්මක කළමනාකරණ පද්ධතිය උදෙසා ISO 9001 : 2008/SLS ISO 9001 සහතිකය තිළිණ කරනු ලැබ ඇත. දැනට, ගුණාත්ව කළමනාකරන පද්ධතිය පුහුණු මධ්‍යස්ථානයේ සාර්ථකව ක්‍රියාත්මක කෙරේ.

### දැක්ම

ශ්‍රී ලංකාවේ උපයෝගිතා ක්ෂේත්‍රයේ හොඳම පුහුණු ආයතනය බවට පත්වීම

### මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයේ උන්නතිය උදෙසා, දැනුම, කුසලතා සහ ආකල්ප වඩාත් සඵල කිරීමට වෘත්තීය මාර්ගෝපදේශණ ලබාදීම

පුහුණු ශාඛාවේ විවිධ අංශයන්හි යුතුකම් හා වගකීම්

| | ඒකකය | වගකීම් |
|---|---|---|
| 1 | ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය | |
| | පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල | තාක්ෂණික පුහුණුව, ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමය - 2002, අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ, ක්ෂේත්‍ර සේවයේ සහ පුහුණු ශ්‍රේණි සේවකයන්ගේ උසස්වීමේ අවශ්‍යතාවයන් සඳහා පුහුණුව |
| | අභ්‍යන්තර පුහුණු ඒකකය | පරිගණක පුහුණුව, තාක්ෂණික නොවන කාර්යය මණ්ඩලය සඳහා පුහුණුව, ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය - 2002 අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ තාක්ෂණික නොවන සේවකයින්ගේ උසස්වීම් ලැබීමේ අවශ්‍යතාවන් සඳහා පුහුණුව, උපාධි අපේක්ෂකයින් සහ ඉංජිනේරු විද්‍යාව හා තාක්ෂණය ඩිප්ලෝමා සඳහා<br>බලාගාර තුළ සේවය කරන අතරතුර පුහුණුව. |
| | තාක්ෂණික පුහුණු ඒකකය | ඉංජිනේරුවන් හා අධිකාරීන් සඳහා තාක්ෂණික පුහුණුව මෙහිදී ලබා දෙනු ලැබේ. |

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

| | ඒකකය | වගකීම් |
|---|---|---|
| 2 | කාසල්රී පුහුණු මධ්‍යස්ථානය | ජනන අංශයේ සේවකයින් සඳහා තාක්ෂණික පුහුණුව, ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය-2002 අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ, ජනන අංශයේ ක්ෂේත්‍ර සේවා සේවකයින්ගේ උසස්වීමේ අවශ්‍යතාවන් සඳහා පුහුණුව |
| 3 | බාහිර පුහුණු ඒකකය | සියලුම ලංකා විදුලිබල මණ්ඩල සේවකයින්ගේ විදේශ පුහුණු |
| 4 | විභාග ඒකකය | සියලු අභ්‍යන්තර විභාග සහ බඳවා ගැනීමේ පරීක්ෂණ. ලංකා විදුලිබල මණ්ඩල සේවකයින් සඳහා වෘත්තීය අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම. |
| 5 | වෘත්තීය සෞඛ්‍යය හා නිරාපද ඒකකය | ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් සඳහා සුරක්ෂිතතාව පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ හදිසි අනතුරු පිළිබඳ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය සඳහා සකස් කිරීම |
| 6 | තත්ත්ව හා පද්ධති ඒකකය | ගුණාත්මකබව වැඩිකිරීම, ඵලදායිතාවය සහ එස් 5 සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව |

## 2012 වසර තුළ කාර්යයසාධනය
## බාහිර පුහුණු ඒකකය

බාහිර පුහුණු ඒකකය මගින්, 2012 වර්ෂය තුළ දී විවිධ ප්‍රභේදයන්ට අයත් නිලධාරීන් 370 දෙනෙකුට පහත දැක්වෙන විවිධ පැවරුම් සඳහා විදේශ ගතවීම සඳහා පහසුකම් සලසා ඇත.

| වැඩසටහන | කාර්යයන් ගණන | සහභාගිවූවන් ගණන |
|---|---|---|
| සැපයීමට ඇති භාණ්ඩ නැව්ගත කිරීමට පෙර පිරික්සීම | 167 | 228 |
| පුහුණු | 35 | 103 |
| සම්මන්ත්‍රණ | 09 | 09 |
| වැඩමුළු | 10 | 11 |
| රැස්වීම් | 23 | 56 |
| සමුළු/ සම්මේලන | 05 | 04 |
| ශිෂ්‍යත්ව | 01 | 01 |
| අධ්‍යයන චාරිකා | 07 | 08 |
| ක්‍රීඩා චාරිකා | 03 | 06 |

## අභ්‍යන්තර පුහුණු ඒකකය

2012 වසර තුළ, බාහිර පුහුණුවන්නන්ට මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට වැඩිපුර පුහුණුවීමේ අවස්ථා සලසාලමින්, අභ්‍යන්තර පුහුණු ඒකකය එහි පුහුණු පහසුකම් වර්ධනය කරනු ලැබ ඇත. විශ්ව විද්‍යාල සහ කාර්මික විද්‍යාල වැනි විවිධ බාහිර ආයතනයන්ගෙන් පැමිණි 441 කට ආසන්න පුහුණුවන්නන් පිරිසක් බලාගාර තුල පුහුණු පහසුකම්වලින් ප්‍රතිලාභ අත්කර ගනු ලැබ ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් 461 දෙනෙකුට ඔවුන්ගේ උසස්වීම් අවශ්‍යතා සඳහා පුහුණුව සැළසූ අතර තවත් විදුලිබල මණ්ඩලයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන ප්‍රභේදවල 1,062 ක් වූ සේවකයන්ට, පරිඝණක පුහුණුව, පද්ධති පුහුණුව හා ප්‍රේරණ පුහුණුව සපයනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයේ, විවිධ ක්ෂේත්‍රයන්ට හා ප්‍රභේදයන්ට අයත් සේවකයන් 128 දෙනෙකුට 2012 වසර තුළදී දේශීය ආයතන තුළ පුහුණුව ලබා දී ඇත.





# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

## වෘත්තීය සෞඛ්‍යය හා නිරාපද ඒකකය (Occupational Health and Safety Unit)

ලංකා විදුලිබල මණ්ඩලයේ වඩාත් අගනා හරය සුරක්ෂිතතාව බවට පත්ව ඇත. සුරක්ෂිතතාව පිළිබඳ ආයතනික, ජාතික හා අන්තර් ජාතික අවශ්‍යතාවන් අනුව කටයුතු කිරීමට, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ සුහසිද්ධිය හා සුරක්ෂිතතාව උදෙසා, අධ්‍යාපන හා පුහුණු අංශය යටතේ නව ශාඛාවක් ස්ථාපනය කරනු ලැබීය.

දැනුවත් කිරීමේ වැඩසටහන්, සේවාස්ථ පුහුණුවීම් හා හදිසි අනතුරු පිළිබඳව කලින් කල දත්ත රැස් කිරීම හා හදිසි අනතුරු ප්‍රමාණය ශූන්‍ය දක්වා අඩු කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට පියවර ගැනීම පිණිස දත්ත විශ්ලේෂණය කිරීම මගින් මෙම අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කෙරෙයි. 2012 වර්ෂය තුළ දී මෙම ඒකකය මගින් පහත සඳහන් වැඩසටහන් හා වැඩමුළු පවත්වනු ලැබීය.

| | වැඩසටහන් | වැඩසටහන් ගණන | සහභාගීවන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | විධායක හා අධීක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා සුරක්ෂිතතාව පිළිබඳ වැඩමුළුව | 12 | 379 |
| 02. | විදුලි බලාගාර හා වැඩබිම් සඳහා සුරක්ෂිතබව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් | 08 | 326 |
| 03. | ප්‍රථමාධාර සහ ගින්නෙන් ආරක්ෂාවීම | 60 | 2629 |
| 04. | ගිනි නිවීමේ පුහුණුව හා ඉවත්වීම | 05 | 212 |
| 05. | ඉංජිනේරුවන් සඳහා වෘත්තීය සෞඛ්‍යය සහ සුරක්ෂිතතා වැඩසටහන් | 03 | 108 |

## විභාග ඒකකය

ලංකා විදුලිබල මණ්ඩලීය කාර්යය මණ්ඩලයට සේවකයින් බඳවා ගැනීම සහ සේවකයන්ට තනතුරු උසස්වීම් ලබාදීම සඳහා, විභාග ඒකකය මගින් බඳවා ගැනීමේ, උසස් කිරීමේ හා යෝග්‍යතා පරීක්ෂණ 4411 ක් සංවිධානය කර පවත්වනු ලැබීය.

## තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය පිළියන්දල

සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ, පිළියන්දල පිහිටි තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය මගින් ඉංජිනේරුවන්, අධිකාරීන් සහ පුහුණු හා නුපුහුණු ක්ෂේත්‍ර සේවා සේවකයින් ඇතුලු ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් 2,082 දෙදෙනෙකුට තාක්ෂණ පුහුණුව සපයනු ලැබීය. රජයේ වෙනත් ආයතන හා පෞද්ගලික සංවිධාන මගින් කරන ලද ඉල්ලීම් අනුව, එම ආයතනයන්හි සේවකයන් සඳහා වියදම් අයකර ගැනීමේ පදනමින්, තාක්ෂණ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වනු ලැබීය.

| වැඩසටහන් | වැඩසටහන් ගණන | සහභාගීවන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය | 16 | 196 |
| වැඩමුළු | 06 | 236 |
| තනතුරු උසස් වීම් අවශ්‍යතාවයන් සඳහා පුහුණුව | 46 | 1650 |
| වෙනත් සංවිධාන සඳහා පුහුණුව | 02 | 76 |

## ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානයේ සම්පත් කුලියට ලබාදීම - පිළියන්දල

ශ්‍රවණාගාර, පුහුණු ආධාරක සහිත දේශණ ශාලා, ආහාර සමග නේවාසිකාගාර පහසුකම් වැනි පුහුණු පහසුකම් බාහිර සංවිධානයන් සඳහා කුලියට දෙනු ලැබීය. පුහුණු පහසුකම් කුලියට දීමෙන්, 2012 වර්ෂය තුළ රුපියල් 182,464.00 ලාභයක් උපයා ගනු ලැබීය.



කාසල්රි පිහිටි තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය

## තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය - කාසල්රි

ලංකා විදුලිබල මණ්ඩලයේ පුරෝගාමී පුහුණු මධ්‍යස්ථානය වන කාසල්රි තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය, එහි පූර්ණ ධාරිතාවය උපයෝගී කරගනිමින්, 2012 වර්ෂය තුළදී, සේවකයන් 1,466 දෙනෙකුට පුහුණුව සපයනු ලැබීය. මෙම පුහුණු වැඩසටහන් මගින් පද්ධති පුහුණුව, තාක්ෂණ පුහුණුව, වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතාව, ප්‍රථමාධාර හා ඵලදායිතාවය යන ක්ෂේත්‍රයන් ආවරණය කරණු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලයට සේවා සපයන්නන් හා සාමාන්‍ය ජනතාව සඳහා ද, ගාස්තු අයකර ගැනීමේ පදනමින්, පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය.

## තත්ව හා පද්ධති ඒකකය

එස් 5, තත්ව සංවර්ධන කටයුතු යටතේ, ලංකා විදුලිබල මණ්ඩලයේ පිළියන්දල පුහුණු මධ්‍යස්ථානයේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශණයන් පනවනු ලැබීමත් අතර ලිපිගොණු සැකසීමේ ක්‍රමය, අපද්‍රව්‍ය

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

කළමනාකරණය, පහසුවෙන් තෝරා ගත හැකි පරිදි උපකරණ හඳුනා ගැනීම ආදිය වැඩි දියුණු කිරීමක් සිදු කළ අතර හරිත යාමේ සංකල්පය අනුව පරිසරය සංවර්ධනය කරනු ලැබීය.

පිළියන්දල, ලංකා විදුබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය 2011 දී තත්ත්ව ප්‍රමිති සම්බන්ධයෙන් ISO 9001:2008 තත්ව කළමනාකරණ සහතිකය ලැබූ අතර තත්ව කළමනාකරණ ක්‍රමය පුහුණු මධ්‍යස්ථානයේ සාර්ථකව ක්‍රියාත්මකවේ.

### 1. පරිසර සංවර්ධනය

ලීටර් 5,000 ධාරිතාවයකින් යුත් ජීව වායු බලාගාරයක් ලංකා විදුලිබල මණ්ඩලයේ පිළියන්දල පුහුණු මධ්‍යස්ථානයේ පිහිටුවනු ලැබීය. ආපන ශාලාවේ ඉතිරි වන ආහාර අපද්‍රව්‍ය ජීව වායු බලාගාරයේ යෙදවුම් ලෙස භාවිතයට ගැනේ. මෙම බලාගාරය සඳහා එක් දිනකට සාමාන්‍ය යෙදවුම් ලෙස ආහාර අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 25 ක් යොදා ගැනේ. මෙම බලාගාරයේ නිපදවන ජීව වායුව, පිළියන්දල ලංකා විදුලිබල මණ්ඩල ආපන ශාලාවේ ආහාර පිසීම සඳහා යොදා ගැනෙයි.

ජීවවායු බලාගාරයේ දියර අතුරු නිෂ්පාදිතය, ලංකා විදුලිබල මණ්ඩල පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ වගා කර ඇති එළවළු වගාවන්ට පොහොර ලෙස යොදා ගැනේ.

### 2. විශේෂ වැඩසටහන්

තාක්ෂණ විද්‍යාවේ නවීන පරිවර්තනයන් සැලකිල්ලට ගනිමින් ද ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ අත්දැකීම් හා දැනුම බෙදා හදා ගනිමින් ද, 2012 වර්ෂය තුළ පහත සඳහන් තාක්ෂණ පුහුණු සැසි පිළියෙල කරනු ලැබීය.

1. මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන් ඉදිකිරීම
2. සේවක මණ්ඩල ආරක්ෂණය සඳහා බිම්ගැන්වීම
3. බෙදාහැරීමේ රැහැන් සැලසුම් කිරීම




**පුහුණු විස්තර සැසඳීම 2011 - 2012**

WS/Semi - වැඩමුළු හා සම්මන්ත්‍රණ
CPD - අඛණ්ඩ වෘත්තීය සං. පුහුණුව
Frg. Tr. - විදේශ පුහුණුව
Int. Tr. - අභ්‍යන්තර පුහුණුව
Pro. Tr. - වෘත්තීය පුහුණුව
OHS - වෘත්තීය සෞඛ්‍යය හා නිරාපද ඒකකය

### වැඩපල හා උපකාරක සේවා ශාඛාව

වැඩපල හා උපකාරක සේවා ශාඛාව යටතේ ඒකක හතරක් පවතී. ඒවා නම්:

- වායු සමීකරණ හා ශීත කරණ
- ජනක යන්ත්‍ර
- විදුලි සෝපාන
- මධ්‍යම වැඩපල හා මධ්‍යම ගරාජය

### වායු සමීකරණ හා ශීතකරණ අංශය

1. 2012 වසර තුළ, වායු සමීකරණ හා ශීතකරණ ශාඛාව මගින් ආරෝග්‍යශාලා හා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ වෙනත් රජයේ සංවිධානයන්ට පහත සඳහන් සේවාවන් සැපයීය.

   අ . වායු සමීකරණ හා ශීතකරණ යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු හා බිඳ වැටීම් අළුත්වැඩියා කිරීම

   ආ . වායු සමීකරණ හා ශීතකරණ යන්ත්‍රෝපකරණ අලුතින් සවිකිරීම හා නවීකරණය කිරීම

   ඇ. වායු සමීකරණ හා ශීතකරණ යන්ත්‍රෝපකරණ අලුතින් සවිකිරීම සැලසුම් කිරීම හා උපදේශාත්මක සේවා සැපයීම

2. වැඩ සංඛ්‍යාව සහ එම වැඩ සඳහා ඇස්තමේන්තු ගත වටිනාකම පහත දැක්වෙන පරිදි වේ.

**නඩත්තු වැඩ**

| සේවා සපයන්නා | වැඩ ගණන | | බදු නැතිව ඇස්තමේන්තු ගත වටිනාකම (රු.) | |
|---|---|---|---|---|
| | වි.ගෙ | ලංවිම | ලංවිම | වි.ගෙ |
| ලංවිම | 38 | 44 | 6,269,550 | 135,815,251 |
| කොන්ත්‍රාත්කරු | 9 | 63 | 8,408,039 | 3,000,000 |
| එකතුව | 47 | 107 | 14,677,589 | 138,815,251 |

**නඩත්තු වැඩ**

| සේවා සපයන්නා | වැඩ ගණන | | බදු නැතිව ඇස්තමේන්තු ගත වටිනාකම (රු.) | |
|---|---|---|---|---|
| | වි.ගෙ | ලංවිම | ලංවිම | වි.ගෙ |
| ලංවිම | 0 | 0 | - | - |
| කොන්ත්‍රාත්කරු | 5 | 27 | 8,021,288 | 3,040,794 |
| එකතුව | 5 | 27 | 8,021,288 | 3,040,794 |

සේවාදායකයා තෘප්තිමත් වන ආකාරයෙන් සියළුම වැඩ සාර්ථකව නිම කරනු ලැබීය.

### ජනක යන්ත්‍ර ඒකකය

ජනක යන්ත්‍ර ඒකකයේ ප්‍රධාන වගකීම් වූයේ,

- රජයේ ආරෝග්‍යශාලා වල සහ අනෙකුත් රජයේ ආයතනයන්හි, ඩීසල් ජනක යන්ත්‍ර සැපයීම, සවි කිරීම සහ විදුලි පද්ධතියට සම්බන්ධ කිරීම.

## වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

- ඩීසල් ජනක යන්ත්‍ර සවි කිරීම, දෝෂ නිවැරදි කිරීම හා අළුත්වැඩියා කිරීමේදී උපදේශාත්මක සේවාවන් සැපයීම
- ජාතික ජාලයේ ප්‍රධාන විදුලි සැපයුම සමග ඒකාබද්ධව ඩීසල් ජනක යන්ත්‍ර ක්‍රියාකරවීම
- ප්‍රභූන් සහභාගී වන හා රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් වන සහ වෙනත් වැදගත් ජාතික කටයුතුවලදී ජංගම ඩීසල් ජනක යන්ත්‍ර ක්‍රියාකරවීමෙන්, උපස්ථ/පොරොත්තු විදුලිබල සැපයුම
- නොයෙකුත් ආයතනයන්ට කුලී පදනමින් ඩීසල් ජනක යන්ත්‍ර සැපයීම
- ඩීසල් ජනක යන්ත්‍රවල අළුත්වැඩියාවන් සිදු කිරීම
- රජයේ ආරෝග්‍ය ශාලාවල සහ වෙනත් රජයේ ආයතනයන්හි සවිකර ඇති පොරොත්තු ජනක යන්ත්‍රයන්හි නිවාරණ නඩත්තු කටයුතු සිදුකිරීම
- 2012 වසර තුළ ජනක යන්ත්‍ර ඒකකයේ කාර්යසාධනය

### 2012 වසර තුළ ඇරඹූ වැඩවල සාරාංශය

| අංකය. | වැඩ ප්‍රභේදය | වැඩ සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය. |
|---|---|---|---|
| 1 | වාර්ෂික නඩත්තු කටයුතු | 117 | 69,957,863 |
| 2 | අළුත්වැඩියාවන් | 43 | 11,609,976 |
| 3 | ජනකයන්ත්‍ර කුලියට දීම-ලංවීම | 50 | 43,853,188 |
| 4 | ජනකයන්ත්‍ර කුලියට දීම-, ජනාධිපති ආරක්ෂක අංශය, අ.ආ.අංශය | 351 | 144,741,424 |
| 5 | ජනකයන්ත්‍ර සවිකිරීම | 03 | 56,566,116 |
| 6 | වෙනත් වැඩ | 47 | 2,285,621 |

### අනාගත සැලසුම්

- ජංගම ඩීසල් ජනක යන්ත්‍ර භාවිතයෙන් ප්‍රභූන් සහභාගී වන උත්සව සඳහා විදුලි සැපයුම ලබාදීම
- ජංගම ඩීසල් ජනක යන්ත්‍ර භාවිතයෙන් රජයට සහ බාහිර ආයතනයන්ට පොරොත්තු සහ අඛණ්ඩ විදුලි බලය සැපයීම
- ලංකා විදුලිබල මණ්ඩලයට අයත්වන්නාවූ ද, ප්‍රභූන් සඳහා සවිකර ඇත්තාවූ ද, රජයේ ආරෝග්‍යශාලා වල හා වෙනත් රජයේ ආයතනවල සවිකර ඇතත්තා වූ ද, පොරොත්තු ජනන යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.
- බාහිර ආයතනයන්ට අයත් ඩීසල් ජනන යන්ත්‍රවල අළුත්වැඩියාවන් සහ පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම
- බාහිර ආයතනයන් සඳහා ඩීසල් ජනක යන්ත්‍ර සැපයීම හා සවිකිරීම
- උපදෙස්, පිරිවිතර හා කොන්ත්‍රාත් ලිපි ලේඛන සැපයීම මගින් උපදේශන සේවා සැපයීම, කොන්ත්‍රාත් මිල ගණන් අගැයීම, සවිකිරීම් හා විදුලි ජාලයට සම්බන්ධ කිරීම් මගින් සහ රජයේ හා පෞද්ගලික ආයතනයන්හි ප්‍රසම්පාදන ක්‍රියාවලිවලදී තාක්ෂණ අගැයීම් කමිටුවලට සහභාගීවීම

### ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා කෙරෙන අනාගත වැඩ කටයුතු

- ජනක යන්ත්‍ර ඒකකයේ, වැඩහල්, කාර්යාල ගොඩනැගිලි, භූ දර්ශනය සකස්කිරීම් ආදිය වැනි යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීමේ කටයුතු
- ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් සඳහා විදේශ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනයන්ගෙන් පැමිණෙන පුහුණුවන්නන් සඳහා යන්ත්‍රාගාර තුළ පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම

### විදුලි සෝපාන ශාඛාවේ කාර්යසාධනය

| කාර්යය ප්‍රභේදය | වැඩ ගණන | ඇස්තමේන්තුගත වටිනාකම | ප්‍රගතිය |
|---|---|---|---|
| සේවා කිරීම හා නඩත්තු කටයුතු | 130 සෝපාන<br>01 මෙහෙයවීම්<br>01 පරීක්ෂා කිරීම් | 54,157,000 | නිමවා ඇත |
| අළුත්වැඩියාවන් | 16 | 2,470,500 | නිමවා ඇත |
| පුනරුත්ථාපනය | 02 | 1,203,500 | නිමවා ඇත |
| නව සවිකිරීම් | 02 | 11,900,000 | ගෙවා ඇත |
| | 01 | 8,800,000 | කෙරෙමින් පවතී |
| උපදේශන සේවා | 01 | 1,000,000 | 90 % නිමවා ඇත |
| | 01 | 5,000 | පරීක්ෂා කිරීම් |
| | 01 | 65,000 | කෙරෙමින් පවතී |

### සේවා හා නඩත්තු කටයුතු

පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්/දේශීය ඒජන්තවරුන් පස් දෙනෙකු විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ අධීක්ෂණය යටතේ උත්තෝලක 82 ක් නඩත්තු කටයුතු කරනු ලැබීය. ලංකා විදුලිබල මණ්ඩලය විසින් උත්තෝලකයන් 48 ක් නඩත්තු කරනු ලැබීය.

දුර්වල කාර්යය සාධනය හේතුවෙන්, පහත සඳහන් සෝපානයන්ගේ නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුගෙන් - ආපසු පවරා ගනු ලැබීය. ඒවා දැනට ලංකා විදුලිබල මණ්ඩලයේ, සෝපාන ශාඛාව මගින් නඩත්තු කරනු ලැබේ.

01. වරකාපොල මූලික රෝහලේ, "Scheilern" වර්ගයේ ඇඳන් ඔසවා ගෙන යන සෝපාන දෙකක්

02. මහනුවර මහ රෝහලේ, "Scheilern" වර්ගයේ ලෙඩුන් ඔසවා ගෙන යන සෝපාන දෙකක්

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

**පහත සඳහන් ප්‍රධාන නඩත්තු/අළුත්වැඩියා/පුනරුත්ථාපන කටයුතු කර ඇත**

01. වරකාපොල මූලික රෝහලේ, "Scheilern" වර්ගයේ ඇඳන් ඔසවා ගෙන යන සෝපාන දෙකක ක්‍රියාකරවීම යථා තත්ත්වයට පත්කිරීම සඳහා පාලන උපකරණ වෙනස් කිරීමට භාජනය කරනු ලැබීය.

02. රාගම මහ රෝහලේ අඩු වේග එතුම නැවත ඔතනු ලැබීය.

03. කොළඹ ජාතික රෝහලේ A කොටසේ එසවුම් කඹ ප්‍රතිස්ථාපනය කරනු ලැබීය

04. නාගොඩ මහ රෝහලේ A කොටසේ එසවුම් කඹ ප්‍රතිස්ථාපනය කිරීම හා පාලන උපකරණය වෙනස් කිරීම

05. කරාපිටිය මහ රෝහලේ සෝපාන දෙකක, කලින් කල සිදුකෙරෙන නිවාරක නඩත්තු කටයුතු සිදු කිරීම

06. කොළඹ ජාතික රෝහලේ B කොටසේ (B Block) පැරණි සෝපානය පුනරුත්ථාපනය කිරීම. ඇඳන් ඔසවන, වසර 70 ක් පැරණි සෝපානය, අළුත් පාලන උපකරණයක් හා සඥා තිරවුර යොදා පුනරුත්ථාපනය කිරීම

07. මහනුවර මහ රෝහලේ මගී සෝපානයක් වෙනස් කිරීම් සිදු කොට පුනරුත්ථාපනය කිරීම

**නව සවිකිරීම්**

01. යාපනය ශික්ෂණ රෝහලේ ඇදන් ඔසවන සෝපානයන් ඉවත්කර අතිරේක මහල් තුනක් සමග නැවත සවිකිරීම

    Duplex වර්ගයේ ඇඳන් ඔසවන සෝපාන දෙකෙන් එකක් අළුත්වැඩියා කර ක්‍රියාකිරීමට සලස්වනු ලැබීය. අනිත් සෝපානය දැනට අළුත් වැඩියා කරමින් පවතී. අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය හා ගොඩනැගිල්ල ඉදිකරන අවස්ථාවේ ඇතිවී තිබෙන ව්‍යුහාත්මක ගැටළු හේතුවෙන් අළුතුවැඩියා කටයුතු ප්‍රමාදවී ඇත.

02. රත්නපුර මහ රෝහලේ ඇදන් ඔසවන පැරණි සෝපානයන් ඉවත්කර අළුත් සෝපානයක් සවිකිරීම. ප්‍රසම්පාදන වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි අරමුදල් ලැබිණි.

03. ලංකා විදුලිබල මණ්ඩලයේ මහනුවර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලයේ අළුතින් ඉදි කළ ගොඩනැගිලි කොටසේ නව මගී සෝපානයක් සවිකිරීම. සවිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් වෙන්කරනු ලැබ තිබිණි.

**උපදේසාත්මක සේවා**

පහත සඳහන් ස්ථානයන් සඳහා උපදේශාත්මක සේවා ලබා දෙනු ලැබීය.

1. ලංකා බැංකු මූලස්ථානය-අධි වේගී සෝපාන 10 ක් නවීකරණය කිරීම supervisory panel හැර අනෙක් කොටස් සඳහා විදුලි සැපයුම සම්බන්ධ කරනු ලැබීය.

2. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මගී සෝපාන දෙකක් ප්‍රතිස්ථාපනය කිරීම. ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා මිල ගණන් කැඳවීමේ ලේඛන සකස් කර අවසන් කර ඇත.

3. කැළණිතිස්ස, සංයෝජිත චක්‍රීය විදුලි බලාගාරය සඳහා නව මගී සෝපානය-MRL type සෝපානයක් සඳහා පිරිවිතර ඉදිරිපත් කරනු ලැබූ අතර ප්‍රගතියක් දක්නට නැත.

4. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සෝපානයේ සවිකිරීම් අඩුපාඩු පරීක්ෂා කරන ලදී

**මධ්‍යම වැඩපල**

**විදුලි අංශය**

2012 වර්ෂය තුළ විදුලි අංශය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්‍යයන් පහත දැක්වේ.

- SPS වෙතින් ලද කිවො110, කිවො 30, කිවො22, කිවො18, කිවො 15, තෙකලා මෝටර නැවත එතීම
- ජනක යන්ත්‍ර ඒකකයේ KVA 100 Alternator හි ප්‍රධාන stater එක සහ KVA 500  130 KVA Alternator එකේ rotor නැවත එතීම
- සෝපාන මෝටරවල පිළියවනයන් සහ රෝධක දඟරය නැවත එතීම

2012 වසර තුළ, විදුලි මෝටර නැවත එතීමේ සහ සවිකිරීමේ කටයුතු සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය රුපියල් 1,799,980.00 වූ අතර සියලුම කටයුතු අවසන් කරනු ලැබ ඇත.

**මෝටර් රථ අංශය**

මෝටර්රථ අංශය යටතේ පවතින ප්‍රධාන මෙහෙයුම් කටයුතු වනුයේ,

- වාහන අළුත්වැඩියාවන් (එංජින් අළුත්වැඩියා කිරීම, බඳේ අලුත් වැඩියාවන් හා පින්තාරු කිරීමේ වැඩ සහ වෙනත් යාන්ත්‍රික අළුත්වැඩියාවන්)
- වාහන බොඩියේ කොටස් ප්‍රතිස්ථාපනයන්
- වාහන වාර්තා (හදිසි අනතුරු, වටිනාකම තක්සේරු කිරීම, අලුත්වැඩියා ඇස්තමේන්තු ආදිය) ලබා දීම
- වාහන ඉන්ධන පිරික්සුම
- වාහන සේවා කිරීම
- බැහැර කිරීම සඳහා වාහන සමීක්ෂණ මණ්ඩල කටයුතු

**2012 වර්ෂය තුළ කරන ලද ප්‍රධාන වැඩ**

- දියේ ගිළුණු හොන්ඩා CRV SUV කාරයේ එන්ජිම අළුත්වැඩියා කරවීම
- පිළියන්දල පුහුණු අංශයට අනුයුක්ත කර ඇති, මිට්සුබිෂි L200 Double cab රථයේ එංජිම හා බොඩිය සම්පූර්ණයේන්ම අළුවත්වැඩියා කරවීම
- කොලොන්නාව විදුලි බලාගාර අංශයට අනුයුක්ත කර ඇති ඉසුසු FSR ලොරි රථය බොඩියේ තහඩු අළුත්වැඩියා කරවීම
- තොරතුරු තාක්ෂණ අංශයට අනුයුක්ත කර ඇති, ටොයොටා CR41වෑන් රථයේ එන්ජිම ඉවත්කර, ප්‍රයෝජනයට ගෙන ඉවත් කළ(reconditioned) එංජිමක් සවිකරවීම

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

- වි.වි ශාඛාවට අනුයුක්ත කර ඇති, නිසාන් කැරවෑන් රථයේ එංජිම අළුත්වැඩියා කරවීම

2012 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද අළුත් වැඩියාවන්/සවිකිරීම්/සේවාවන්හි සම්පූර්ණ ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් 2,033,508.00 ක් විය.

**යාන්ත්‍රික පිරිසැකසුම් සහ සවිකිරීම් අංශය**

මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන කාර්යයන් වූයේ,

- සියළුම ආකාරයේ යාන්ත්‍රික වැඩ, වාත්තු කිරීම්, ගැලවනයිසින් කිරීම,
- පෑස්සුම් වැඩ සිදු කිරීම. අධිසැර/අඩුසැර බෙදාහැරීමේ පද්ධතියට, අධිසැර/අඩුසැර ලෝහ භාණ්ඩ කොටස් පිරිසැකසීම
- අන්තරාය පුවරු සැකසීම
- විසිරි පින්තාරුව
- ආරක්ෂක වැටවල්, මඩු, බාධකයන් සහ ආරක්ෂක අවශ්‍යතාවයන් සඳහා ඕනෑම ආකාරයේ ඉදිකිරීමක්
- සේවායෝජකයා විසින් දෙනු ලබන සාම්පල/සැලසුම්/ඇඳීම් අනුව, යාන්ත්‍රික හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඕනෑම විශේෂිත කාර්යයන්

**2012 වර්ෂය තුළ කරන ලද ප්‍රධාන වැඩ**

- අනුරාධපුරයේ 2012 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා TDL කුළුණු තුනක් ඉදිකිරීම
- මහනුවර ආරෝග්‍ය ශාලාවේ සෝපාන දොරවල් අළුත්වැඩියා කිරීම
- රජයේ මුද්‍රණාලයේ සෝපාන දොරවල් අළුත්වැඩියා කිරීම
- ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ වහලය පිරි සැකසීම සහ සවිකිරීම
- සපුගස්කන්ද විදුලි බලාගාරයේ බුමක දණ්ඩ සහ ඉසිළුම් නිවෙස්නාව යන්ත්‍ර මගින් සැකසීම
- සපුගස්කන්ද විදුලි බලාගාරයේ Al පයිප්ප විදුම් ආවරණය වාත්තු කිරීම සහ නිමා කිරීම
- කිවො 33 අන්තරාය පුවරු සෑදීම
- T කලම්ප සහ PG කලම්ප වාත්තු කිරීම හා පිරිසැකසීම

වසර තුළ සමාප්ත කරන ලද පිරිසැකසුම්/සවිකිරීම්/නිෂ්පාදන සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල්17,609,253.00 ක් විය.

**සිවිල් වැඩ සහ ගොඩනැගිලි**

2012 වර්ෂය තුළ සිවිල් වැඩ සහ ගොඩනැගිලි ශාඛාවේ වැඩ කටයුතු පහත දැක්වෙන පරිදිය.

දිවයින පුරා ඉදිකිරීම් වැඩ හා අළුත්වැඩියා කටයුතු සිවිල් ශාඛාව මගින් සිදු කරනු ලැබීය.

**ඉදිකිරීම් කටයුතු**

| | |
|---|---|
| 1 | ලංකා විදුලිබල මණ්ඩලයේ නැගෙණහිර පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ තෙමහල් කාර්යාලීය ගොඩනැගිල්ල සහ නිල නිවාස 7 ක් සඳහා ගොඩනැගිලි |
| 2 | පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ පස්මහල් කාර්යාලීය ගොඩනැගිල්ල සැලසුම් සකස් කිරීම හා ත්‍රිකුණාමලයේ ඉදිකිරීම |
| 3 | ලංකා විදුලිබල මණ්ඩලයේ මධ්‍යම පලාත් සාමාන්‍යාධිකාරීගේ සිව් මහල් කාර්යාලීය ගොඩනැගිල්ලේ දිගුව |
| 4 | පිළියන්දල තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානයේ භෝජනාගාරය නවීකරණය කිරීම හා නව වැසිකිළි සංකීර්ණය ඉදිකිරීම |
| 5 | කොලොන්නාවේ කොළඹ නගර ගබඩා ගොඩනැගිල්ල යළි සකස් කිරීම |
| 6 | බස්නාහිර පලාත් උතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කිරිබත්ගොඩ කාර්යාලයේ දෙවෙනි හා තුන් වන මහල් නවීකරණය කිරීම. |
| 7 | බස්නාහිර පලාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ කිරිබත්ගොඩ කාර්යාලයේ බිම් මහළ සහ පළමුවන මහළ නවීකරණය කිරීම. |
| 8 | දෙමටගොඩ, කෙත්ටි පාරේ පිහිටි පද්ධති පාලන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය සහ සංවර්ධනය කිරීම |
| 9 | කසල්රී පුහුණු මධ්‍යස්ථානයේ නව වැසිකිළි සමූහය ඉදිකිරීම |
| 10 | තාවකාලික ආරක්ෂක ගොඩනැගිල්ල, වැසිකිළි නවීකරණය කිරීම හා පිළියන්දල තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයේ විධායක නොවන නිලධාරීන්ගේ නේවාසිකාගාරය පින්තාරු කිරීම |
| 11 | ලංකා විදුලිබල මණ්ඩලයේ බස්නාහිර පලාත උතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කිරිබත්ගොඩ කාර්යාලයේ ගබඩා සංකීර්ණය ඉදිකිරීම |
| 12 | දිවුලපිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය නවීකරණය කිරීම |
| 13 | කොළඹ 2, GCSU ගොඩනැගිල්ලේ, තෙවන මහලේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරන හා ආයතන) ගේ කාර්යාලය පිහිටුවීම |
| 14 | බණ්ඩාරනායක අනුස්මරණ අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂන හා සංවර්ධන) ගේ කාර්යාලයේ ඇතුළත නිමාව වැඩි දියුණු කිරීම |
| 15 | ලංකා විදුලිබල මණ්ඩලයේ බස්නාහිර පලාත උතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ කිරිබත්ගොඩ කාර්යාලයේ ඉදිරිපස කොටස වැඩි දියුණු කිරීම |
| 16 | ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ කාර්යාලයේ ඇතුළත නිමාව වැඩි දියුණු කිරීම |
| 17 | චුන්නාකම්හි පිහිටි පැරණි විදුලි බලාගාර පරිශ්‍රය පිරිසිදු කිරීම හා පස් පිරවීම |
| 18 | කැළණිතිස්ස විදුලි බලාගාරය සංනිවේදන පාලන මධ්‍යස්ථානයේ කෑම කාමරය නවීකරණය කිරීම හා අඟුවේ වහල අළුත්වැඩියා කිරීම |

## වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය











### ප්‍රධාන කාර්යාලීය නඩත්තු ඒකකයට සම්බන්ධ කටයුතු

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ විවිධ ශාඛාවන්හි සහ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ හා අමාත්‍යාංශයට හා නියෝජ්‍ය ඇමතිවරයාට අයත් නිල නිවාසයන්හි හදිසි නඩත්තු කටයුතු සිදු කිරීම සිවිල් නඩත්තු ඒකකයේ වගකීමයි. ප්‍රධාන කාර්යාලීය නඩත්තු කටයුතු සඳහා යොදවන ලද පිරිස සෘජුව යොදා ගනිමින් සිවිල් වැඩ සහ ගොඩනැගිලි ශාඛාව මගින් අළුත්වැඩියා කටයුතු කරනු ලැබීය.

### විදුලක්පාය ව්‍යාපෘතිය

ලංකා විදුලිබල මණ්ඩලය සඳහා නව මූලස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2012 ජනවාරි මාසයේ මුල්ගල තබනු ලැබීය. යෝජිත මහල් තුනේ කුඩා වේදිකාවකින් සැදි මහල් හතක් බැගින් ඇති කුළුණු දෙකකින් යුක්තවේ. භූමිතලයේ ප්‍රමාණය වර්ග කිලෝ මීටර 27, 800 ක් වේ.

### කුළුණු ඉදිකිරීමේ වැඩ Piling Work

2012-02-23 දින ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබීය. 2012-11-06 දින වැඩ නිම කිරීමට නියමිතව තිබිණි. එසේ වුවත්, ඉදිකිරීම් කටයුතු කර ගෙන යමින් සිටින අතර කුළුණු සංඛ්‍යාව 370 සිට 400 දක්වා වැඩි කරමින් උපදේශක ආයතනය විසින් ව්‍යුහ සැලැස්ම සංශෝධනය කරනු ලැබීය. කුළුණු 370 ක වැඩ නිම කර ඇත.

# වත්කම් කළමනාකරණ සහ මධ්‍යගත සේවා අංශය

## උපරි ව්‍යුහය

වසර අවසාන වන විට ලංසු තැබීමේ ලේඛන සැකසීම සිදු කෙරෙමින් පැවතිණි.

## ආරක්ෂක අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි බලාගාර සහ ජල විදුලි ජලාශ ඇතුලු, සියලුම ගොඩනැගිලි සහ පරිශ්‍රයන්හි ආරක්ෂක විධිවිධානයන් සම්බන්ධයෙන්, ලංකා විදුලිබල මණ්ඩලයේ ආරක්ෂක අංශය වගකිව යුතුය.

ලංකා විදුලිබල මණ්ඩලයේ, ජනන අංශය, සම්ප්‍රේෂණ අංශය හා බෙදාහැරීමේ අංශය ප්‍රධාන අංශ තුනෙහි, ආරක්ෂාව සඳහා ස්ථාපිත ආරක්ෂක ඒකක තුනක් ක්‍රියාත්මකව පවතින අතර මෙම ප්‍රධාන අංශ තුන යටතේ උප ආරක්ෂක ඒකක 98 ක් ක්‍රියා කරයි.





ලංකා විදුලිබල මණ්ඩලයේ ඇතැම් ස්ථානයන්හි සේවයේ යොදවා සිටින පෞද්ගලික ආරක්ෂක සේවාවන් ද අධීක්ෂණය හා නිරීක්ෂණය ආරක්ෂක අංශය මගින් සිදු කෙරෙයි.





ආරක්ෂක අංශයේ ප්‍රධානියා ද වූ ආරක්ෂක කළමනාකරු යටතේ සේවයේ නියුතු, ආරක්ෂණ නියෝජ්‍ය කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් තිදෙනෙක් සහ ආරක්ෂක නිලධාරීන් 22 ක් ඇතුළුව, 743 ක ආරක්ෂක කාර්යය මණ්ඩලයකින් යුත් ආරක්ෂක බලකායක් පැවතිණි.

## ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව

ආයුධ පරිහරණය, වෙඩි තැබීම, ගිණි ආරක්ෂණය, මුදල් රැගෙන යාමට ආරක්ෂාව සැලසීම හා ප්‍රභූන්ට ආරක්ෂාව සැලසීමේ රාජකාරි, ප්‍රථමාධාර, ආපදාවන් ඉවත්කිරීමේ විදුම් යන්ත්‍රය සහ එස් 5 සංකල්පය පිළිබඳව ආර්ක්ෂක සේවක මණ්ඩලයට විශේෂ පුහුණුවක් සපයනු ලැබිණි.

# ආයතනික ක්‍රමෝපාය අංශය

### ව්‍යාපාරික හා මෙහෙයුම් ක්‍රමෝපාය

ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතනික කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ හා එයට පහසුකම් සැපයීමේ කාර්යය, ව්‍යාපාරික හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවට පවරනු ලැබ ඇත. මීට අමතරව, ආයතනික ප්‍රතිරූපය හා ආයතනික සභ්‍යත්වය ඉහළ නැන්වීම හා ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ ශාඛා අතර ප්‍රමිතිකරණයක් ඇති කිරීම ද මෙම ශාඛාව මගින් හසුරුවනු ලබයි.

ක්‍රමෝපාය කළමනාකරණ මෙවලම ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පියවරක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩලයේ තුළිත ලකුණු පත්‍රය, ආයතනික මට්ටමේ ප්‍රධාන කාර්යසාධන දර්ශකය තීරණය කරනු ලැබූ අතර ආයතනික ලකුණු පත්‍රය ඇති කරනු ලැබිණි. ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රථම ක්‍රියාකාරී සමාලෝචන රැස්වීම ද, ආයතනික කළමනාකරණ කාණ්ඩායම විසින්, 2012 දී පවත්වනු ලැබිණි. මීට අමතරව, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ඉන් පිටත විෂය ප්‍රවීණයන් සමග සාකච්ඡා කිරීමෙන් හා උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, ලංකා විදුලිබල මණ්ඩලයට උපායමාර්ගික වශයෙන් ඉතා වැදගත් මාතෘකා/ක්ෂේත්‍රයන් පිළිබඳව නිර්දේශිත විසඳුම් සොයා ගැනීම සඳහා පහසුකම් සපයන්නෙකු හා සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීමට කළමනාකරණය විසින් මෙම ශාඛාවට බලය පවරනු ලැබීය.2012 වර්ෂයේදී මුල්වරට පවත්වන ලද ක්‍රමෝපාය සංවර්ධන සංසදය මෙම අවශ්‍යතාවයේ ප්‍රතිඵලයක් විය.

ක්‍රමෝපාය සංවර්ධන සංසදය, සුළං විදුලිබලය හා පුනර්ජනනීය සම්පතක් ලෙස එහි ඇති වැදගත්කම සහ කලින් කල සිදුවන දේ නිසා ඇති වන ගැටළු යන තේමාව යටතේ පදනම් විය. ක්‍රමෝපාය සංවර්ධන සංසදය වෙතින් නික්මෙන නිර්දේශයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, ලංකා විදුබල මණ්ඩලය සතු වන හා විදුලිබල මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන, "semi dispatchable type" මෙගාවොට් 100 ක ධාරිතාවක් ඇති සුළං උද්‍යානයක් ක්‍රියාත්මක කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය මගින් තීරණය කර තිබිණි. එහි සේවකයන්ගේ කාර්යය විලාසයන් අඛණ්ඩව වඩා යහපත් බවට පත්කර ගැනීමේ අවශ්‍යතාවය දැක, ඔවුන් අතර නව අදහස් වලින් යුත් සංස්කෘතියක් ඔවුන් තුළ ඇතිවීමට අනුබල දීමට, මෙම ශාඛාව මගින් සේවකයන් අතර නවෝත්පාදන තරඟයක් ආරම්භ කරනු ලැබීය. ඉතාම ප්‍රාථමික මට්ටමේ සිට ඉතා උසස් තත්ත්වයේ නවෝත්පාදනයන් මෙම තරඟයේදී අගය කරනු ලැබීය. ඊට අමතරව, නවෝත්පාදන අදහස් ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් ද ස්ථාපනය කරනු ලැබීය. එසේ ඉදිරිපත් කරනු ලබන නවෝත්පාදන අදහස් ප්‍රමාණය, තුළිත ළකුණු පත්‍රයේ ඇතුළත් ප්‍රධාන කාර්යසාධන දර්ශකයක් ලෙස සළකනු ලැබිණි. 2012 වර්ෂයේ දී ද එස් 5 තරඟය සාර්ථකව පවත්වනු ලැබීය. එස් 5 සහ නවෝත්පාදන තරඟයන්හි ජයග්‍රාහකයන් මහා සම්මාන උත්සවයේදී බුහුමන් කරනු ලැබීය.

ඇතිවූ දරුණු නියඟය හා වෙනත් නොවැළැක්විය හැකි හේතූන් නිසා 2012 වර්ෂයේදී ඉල්ලුම සපුරාලීමේදී ලංකා විදුලිබල මණ්ඩලය අර්බුදයකට මුහුණ පානු ලැබීය. මෙම අර්බුදයට විසඳුම් සෙවීමේ ඉල්ලුම් පාර්ශවයේ කළමනාකරණ ක්‍රියාමාර්ගයක් ලෙස මහජනතාව සඳහා බලශක්ති ඉතිරි කිරීමේ තරඟයක් පවත්වනු ලැබීය. මෙම තරඟය ක්‍රියාත්මක කිරීමේදී, ව්‍යාපාරික හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව උපකාරී විය.

### ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු

විදුලිබල ජනනය, සම්ප්‍රේෂණය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ අංශයන්ට බෙදාහැරීමේ බලපත්‍ර මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා ඒ ආශ්‍රිතව පැන නගින කරුනු, ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු ශාඛාව මගින් සම්බන්ධීකරණය කෙරෙයි. නියාමන කටයුතුවලට අමතරව, අනෙකුත් අංශ සමග එක්ව ක්‍රමෝපාය සැලසුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම පිළිබඳව ද මෙම අංශය වගකිව යුතුය.

ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ, ලංකා විදුලිබල මණ්ඩලය එහි ප්‍රථම බහු වාර්ෂික ආදායම් අවශ්‍යතා පිළිබඳ විස්තර ගොනු කිරීම 2010 වර්ෂයේ ජූලි මස සිදු කෙරිණි. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම 2010 ජූලි මාසයේ දී විශේෂයෙන් නියම කළ පරිදි, ගාස්තු අය කිරීමේ විධි ක්‍රමය යටතේ, 2011:2015 කාලය සඳහා ඔවුන්ගේ ආදායම් අවශ්‍යතා ගොනු කරන ලෙස බලපත්‍රලාභීන් වෙතින් ඉල්ලා සිටිනු ලැබීය. නීති ප්‍රකාර උපදේශන ක්‍රියාවලිය අනුව කටයුතු කිරීමෙන් පසු, 2011 ජනවාරි මාසයෙන් පසු ක්‍රියාත්මක විය යුතු වූ නව අයක්‍රම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිවේදනය කරනු ලැබීය. 2011 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ආදායම් අවශ්‍යතාවන් හා නිවේදනය කරනු ලැබූ අයක්‍රම යටතේ ප්‍රත්‍යක්ෂ වශයෙන් ලද ආදායම අතර රුපියල් බිලියන 11 පරතරයක්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එලෙස නිවේදනය කළ අයක්‍රම මගින් ආරෝපණය කරනු ලැබීය. පසුව, අයක්‍රම පිළිබඳ සුවිශේෂී විස්තර ගොනු කිරීමක් 2011 අගෝස්තු මාසයේදී සිදුකරනු ලැබූ නමුත් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ තීරණය දන්වනු නොලැබීය. 2012 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ආදායම් අවශ්‍යතාවන් හා නිවේදනය කරනු ලැබූ අයක්‍රම යටතේ සැබැවින්ම ලද ආදායම අතර ආරෝපණය කරන ලද පරතරය රුපියල් බිලියන 61 ක් විය.

ඉහත ගාස්තු අය කිරීමේ විධික්‍රමය යටතේ විශේෂයෙන් නියම කරන ලද අවශ්‍යතාවයක් ලෙස තොග සැපයුම් ආදායම් අවශ්‍යතා පිළිබඳ විස්තර ගොනු කිරීම සහ 2013 වසර සඳහා අනුමත ගාස්තු සැලකර සිටීම සිදු කරනු ලැබීය.

ලංකා විදුලිබල මණ්ඩලයේ පහත සඳහන් ආයතනික ලියකියවිලි ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය මෙම ශාඛාව විසින් භාර ගත් අතර 2012 වර්ෂය තුළ එම කටයුතු සිදුකර අවසන් කරනු ලැබීය.

- ආයතනික සැලැස්ම (යාවත්කාලීන කිරීම) 2009 - 2013
- වාර්ෂික වාර්තාව - 2011
- සංඛ්‍යාලේඛන සඟරාව - 2011
- විකුණුම් සහ ජනන දත්ත පොත - 2011

2012 වසර තුළ, පහත සඳහන් ලේඛන සකස් කොට අවසන් කිරීම සඳහා, ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු ශාඛාව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා ඔවුන්ගේ උපදේශකයින් සමඟ ඉතා සමීපව කටයුතු කරනු ලැබීය.

- බෙදාහැරීමේ නීති සංග්‍රහය
- කාර්යසාධන නියාමනය
- විදුලි සුරක්ෂිතතාවය, ගුණාත්මකබව සහ අඛණ්ඩව සැපයීමේ රෙගුලාසි

- ජාලක කෙටුම්පත් සංග්‍රහය
- සැපයුම් සේවා සංග්‍රහය

ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානයන් අනුව, 2012 වර්ෂය සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ අයක්‍රම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබීය.

එම වර්ෂය තුළදීම, ලංකා විදුලිබල මණ්ඩලයට දැනටමත් ලබාදී ඇති විදුලි ජනන බලපත්‍රයට ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය ද ඇතුළත් කරන ලෙස හා බෙදාහැරීමේ අංශය 2 හා බෙදාහැරීමේ අංශය 3 හි මායිම් නැවත බෙදා වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබීය.

### ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව

2010 අවසාන භාගයේදී ආයතනික ක්‍රමෝපාය අංශය ඇති කරන අවස්ථාවේදී ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව සංස්ථාපිත කිරීම අනුමත කරනු ලැබ තිබිණි. පසුව 2012 ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාවේ සංවිධාන ව්‍යුහයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රධානය කර ඇති අතර මෙම අංශය නිල වශයෙන් එහි කටයුතු අරඹනු ලැබීය.

ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාවේ ප්‍රධාන අරමුණ වනුයේ, ක්‍රියාකාරී ක්‍රමෝපාය සංවර්ධනය, ප්‍රතිපත්ති හා කාර්යක්‍රම සංවර්ධන කටයුතු වල නිරත වීමයි. තවදුරටත් ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව මගින් පහත සඳහන් කටයුතු ආරම්භ කර ඇත.

- අධ්‍යයනය, ප්‍රතිශෝධනය හා අනාගත ප්‍රයෝජනය පිණිස වැඩිදියුණු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරී හා මෙහෙයුම් අත්පොත් එක් රැස්කර තැබීම
- චක්‍රලේඛ කළමනාකරණ ක්‍රමය යොදා ගනිමින් ලංවිම අභ්‍යන්තර අන්තර් ජාලයේ පරිඝණක දත්ත ගබඩාවෙන් ලබා ගත හැකි පරිදි, චක්‍රලේඛ එක්රැස් කොට අන්තර්ජාල ගත කිරීම
- මෙම ශාඛාව මුළුමණින්ම ක්‍රියාකාරී බවට පත් කිරීම සඳහා අවශ්‍ය කාර්ය්‍ය මණ්ඩලය, පරිඝණක, කාර්යාලීය උපකරණ ආදිය ඇතුළු සම්පත් සපුරාලීම

### තොරතුරු තාක්ෂණය

තොරතුරු තාක්ෂණ ශාඛාව, 2012 වසර තුළ දී, පහත සඳහන් කටයුතු ඉටුකරණු ලැබීය.

- මෘදුකාංග සංවර්ධනය
- සංඛ්‍යාංක වාර්තා කළමනාකරණ පද්ධතිය සැලසුම් කොට වැඩිදියුණු කිරීම හා බස්නාහිර පලාත දකුණ 1 පලාතෙහි ක්‍රියාවට නැන්වීම
- ලංකා විදුලිබල මණ්ඩලයේ Texting Service සැලසුම් කොට, සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම
- නෛතික කරුණු කළමනාකරණ පද්ධතිය සැලසුම් කොට වැඩි දියුණු කිරීම සහ නීති අංශයේ ක්‍රියාවට නැන්වීම
- ඇමතුම් මධ්‍යස්ථානය පදනම් කොටගත් විදුලිබලය ඇණ හිටවන කාල සීමා කළමනාකරණය කිරීමේ ක්‍රමයක් බස්නාහිර පලාත දකුණේ ක්‍රියාත්මක කිරීම
- සම්ප්‍රේෂණ අංශයෙන් කෙරෙන විදුලි විකුණුම් සඳහා ලංකා විදුලි සමාගමට ඉන්වොයිස් පත්‍ර සකස් කිරීම සඳහා ස්ම්ප්‍රේෂණ බිල්පත් නිකුත් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- ජයවර්ධනපුර ප්‍රදේශයේ තොග පාරිභෝගිකයන් සඳහා ඉලෙක්ට්‍රොනික බිල්පත් ක්‍රමය හඳුන්වා දීම
- පාරිභෝගිකයන්ට ඔවුන්ගේ විදුලි ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීමට හා විස්තර එස්එම්එස් මගින් දැන ගැනීමට හැකි වන පරිදි පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දීම
- ලංකා විදුලිබල මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ණය පතක් (credit card) භාවිතයෙන් විදුලි බිල්පත් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම
- බලශක්ති සංරක්ෂණ තරඟ පැවැත්වීමේදී උදව් දීම සහ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම
- බෙදාහැරීමේ අංශය 4 හි, සම්ප්‍රේෂණ අංශය සහ සේවක මණ්ඩල ශාඛාවේ මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාවට නැන්වීම

### තොරතුරු තාක්ෂණ යටතල ව්‍යුහ සංවර්ධනය

ගබඩා ක්ෂේත්‍ර ජාලයක් ස්ථාපනය කරනු ලැබූ අතර පහසුවෙන් තොරතුරු පද්ධතිය කරා පිවිසීමේ අවස්ථාව සලසාලීමට සහ විශ්වසනීයතාව වැඩි දියුණු කිරීම සඳහා ආපදා හානි යලි ප්‍රකෘති තත්ත්වයට ගෙන ඒමේ ස්ථානයක් ද පිහිටවනු ලැබීය.

මධ්‍යගත මෘදුකාංග සේවා පරිහරණය කිරීමේ හැකියාව ඇති කරමින් ලංකා විදුලිබල මණ්ඩලය අතිරේක පිහිටීම් 44 ක් නියම පුද්ගලික ජාලයන් සමග සම්බන්ධ කරනු ලැබීය. 2012 වසර අවසාන වන විට සම්පූර්ණ VPN සම්බන්ධතා සංඛ්‍යාව 246 ක් වීය.



- පිරිස් ශාඛාව
- නීති ඒකකය
- විශේෂ විමර්ෂණ ඒකකය
- අභ්‍යන්තර විගණන ශාඛාව

# පිරිස් ශාඛාව

ස්වාධිකාරයේ සාරය, නිර්මාණශීලීතාව සහ වගකීම පිළිබඳව උනන්දු කරවීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය සියළුම සේවකයින්ට හිතකාමී වැඩ කිරීමේ වාතාවරණයක් අඛණ්ඩව සැපයීමට කටයුතු කරයි. තමාගේ පරිහරණයට ලබා දෙන ලද සීමිත සම්පත් ඇතිව හා අතිවිශාල සීමා කිරීම් මධ්‍යයේ සේවයේ යෙදෙමින් තම සේවකයන් විසින් අත්කර ගන්නා ලද ජයග්‍රහණයන් පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය ආඩම්බරයට පත්වෙයි. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක මණ්ඩල ශාඛාව මගින් පහත සඳහන් කාර්‍යයන් අඛණ්ඩව සිදුකරන අතර අනෙකුත් මානව සම්පත් කටයුතු අදාළ අංශයන්හි මානව සම්පත් ඒකකයන් මගින් ක්‍රියාත්මක කරයි.

- ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවක මණ්ඩලයට සේවකයන් බඳවා ගැනීම
- සීමාකිරීම් වලට යටත් වන සේවක මණ්ඩලවල සේවකයන්ගේ උසස්වීම්
- ලංකා විදුලිබල මණ්ඩලයේ මානව සම්පත් පිළිවෙත් සකස්කිරීම
- ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා හා සාමාන්‍යාධිකාරීවරයා යටතේ ඇති ශාඛාවන්හි සියළුම සේවකයන්ගේ මානව සම්පත් පරිපාලනය

2012 වර්ෂය අවසාන වනවිට ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ කාර්‍යය මණ්ඩලය 16,709 ක් වූ අතර වසර තුළදී 1,106 ක සේවක මණ්ඩලයක් බඳවා ගන්නා ලදී. සේවයෙන් විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම ආදිය නිසා සේවකයන් 589 ක් සේවයෙන් ඉවත්ව ගියහ. 2011 වර්ෂයේ පැවති 298 ක් වූ පාරිභෝගික සේවක අනුපාතය 2012 වර්ෂය තුළදී 291 ක් දක්වා වෙනස්වී ඇත. ලංකා විදුලිබල මණ්ඩල වයස් විශ්ලේෂණයෙන් පෙන්නුම් කරනුයේ, ඉදිරි පස් වසර තුළ, සෙවකයන් 2,637 සේවයෙන් විශ්‍රම ගන්නා බවයි. 15.78% ක් වයස අවුරුදු 55 ට වැඩි වන අතර 18.85 ක් අවුරුදු 51 - 55 අතර වයස් කාණ්ඩයේ වෙයි. ලංකා විදුලිබල මණ්ඩලය බොහෝ කාලයක සිට පැවත එන ආයතනයක් බව මෙයින් පෙන්නුම් කරන අතර පුහුණු හා වෘත්තීය මානව සම්පත් වල ඇතිවේ යයි අපේක්ෂිත හිඟය සපුරා ගැනීම පිණිස වෘත්තීය පරම්පරාවක් බිහි කිරීමේ ප්‍රවේශම්කාරී සැලැස්මක් ඇවැසි වනු ඇත.




**ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ වයස් විශ්ලේෂණය**

පහත දක්වා ඇති සේවා විශ්ලේෂණ ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙනුයේ, බොහෝ වසර ගණනක සේවා පළපුරුද්දක් සහිත මනා පළපුරුදු සේවක පිරිසක් ලංකා විදුලිබල මණ්ඩලය සතුව ඇති බවයි. සේවකයින්ගෙන් 45.5 % කට පමණ වසර 20 කට වැඩි සේවා පළපුරුද්දක් ඇත.




**ලංකා විදුලිබල මණ්ඩල සේවකයන්ගේ සේවා විශ්ලේෂණය**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා ප්‍රභේදයන් මගින් පෙන්නුම් කරනුයේ, සේවකයන්ගෙන් 7.9% ක් පමණ විධායක ශ්‍රේණිවලට අයත් වන අතර සේවකයන්ගෙන් 56.3% ක් පුහුණු හා නුපුහුණු ප්‍රභේදයට ගැනෙන බවයි.




**ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක ප්‍රභේදයන්**

## පත්කිරීම්

බෙදාහැරීමේ අංශය 1 හි අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරෙන් ඊ.පී.අබේසේකර මහතා ද බෙදාහැරීමේ අංශය 4 හි අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරෙන් ඩී.ජී.සී.රත්නපාල මහතා ද වත්කම් කළමනාකරණ හා මධ්‍යගත සේවා අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරෙන් එම්.ජී.ලියනගේ මහතා ද අතිරේක සාමාන්‍යාධිකාරී සම්ප්‍රේෂණ තනතුරෙන් ආර්.ලොකුබාලසූරිය මහතා ද බෙදාහැරීමේ අංශය 2 හි අතිරේක සාමාන්‍යාධිකාරී ආර්.ජී.ගුණවර්ධන මහතා ද වසර තුළ දී සේවයෙන් විශ්‍රාම ගැනීම හා එල්.ඩී.එස්.ප්‍රනාන්දු, එම්.ජී.තිකරත්න, කේ.ඩබ්.එල්.විජේවර්ධන හා ඩී.දන්තනාරායන යන මහතුන් සහ වයි.එම්.සමරසිංහ මහත්මිය අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරුවලට පත්කිරීමෙන් පසු ලංකා විදුල්බල මණ්ඩලයේ ඉහළ කළමනාකරණ ව්‍යුහයේ ප්‍රධාන වෙනස්කම් සිදුවිය.

# පිරිස් ශාඛාව

බෙදාහැරීමේ අංශය 2 හි අතිරේක සාමාන්‍යාධිකාරී ඒ.දන්තනාරායන මහතා සේවයෙන් විශ්‍රාම ලැබූ අතර බෙදාහැරීමේ අංශය දෙකෙහි අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස ටී.ඩී.හඳගම මහතා 2012 නොවැම්බර් මස 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරනු ලැබීය.

එන්.ආර්.මහමූත් මෙනෙවිය 2012 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කළමනාකාර ධුරයෙන් විශ්‍රාම ගනු ලැබීය.

## මානව සම්පත් ප්‍රතිපත්ති

නව ප්‍රතිපත්ති සකස් කිරීම සහ පවත්නා පිළිවෙත් සංශෝධනය කිරීම, ලංකා විදුලිබල මණ්ඩලයේ සියළුම අංශයන්හි මානව සම්පත් පරිපාලන භාරව සිටින සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගෙන් සමන්විත මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවක් මගින් අඛණ්ඩව ක්‍රියාවේ යොදවමින් සිටිති. ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුණු සාක්සාත් කරගැනීම කෙරේ සේවකයන් අභිප්‍රේරණය කරනු ලබන්නාවූ පරිසරයක් ඇති කිරීම සඳහා 2012 වසර තුළ දීද, සේවකයන්ගේ යහපත උදෙසා ලංකා විදුලිබල මණ්ඩලය මගින් යෝජනාක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ප්‍රසාද දීමනා ගෙවීම, ලබා නොගෙන ඉතිරිව ඇති අසනීප/විවේක නිවාඩු වෙනුවෙන් දිරි දීමනා ගෙවීම විශේෂ මුදල් අත්තිකාරම් ගෙවීම මේවාට ඇතුළත්වේ.

## ප්‍රසාද දීමනා/පාරිතෝෂික ගෙවීම

පෙර වර්ෂයේ ගෙවන ලද පදනමින්ම, 2012 වර්ෂය සඳහා ද, ලංවිම සේවකයන්ට පාරිතෝෂික මුදල් ගෙවනු ලැබීය. පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා වැයවූ මුළු මුදල රුපියල් . 648,289,027.00 ක් වීය.

## ලබා නොගත් අසනීප/විවේක නිවාඩු වෙනුවෙන් දිරි දීමනා ගෙවීම

සේවයට වාර්තා නොකර සිටින දින ගණන පහත හෙළීම හා එමගින් ඵලදායිතාවය ඉහළ නැන්වීම සඳහා, ලබා නොගෙන ඉතිරිව ඇති අසනීප/විවේක නිවාඩු වෙනුවෙන් දිරි දීමනා ගෙවීමේ යෝජනා ක්‍රමයක් 1984 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතී. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ 2012 වර්ෂයේදී ද ප්‍රදානය කරනු ලැබීය. මෙම දීමනා ගෙවීම සඳහා වැය වූ සම්පූර්ණ වියදම රුපියල් 497,234,998.00 ක් විය.

## සිංහල/හින්දු අළුත් අවුරුද්ද සඳහා විශේෂ අත්තිකාරම් ගෙවීම

2012 සිංහල/හින්දු අළුත් අවුරුදු උත්සවය සඳහා විශේෂ අත්තිකාරම් සහ වැටුප් අත්තිකාරම් ලබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩල සේවකයනට අවස්ථාවන් ලබා දෙනු ලැබිණි.

## රාමසාන් උත්සවය සඳහා ලංකා විදුලිබල මණ්ඩල සේවකයින්ට විශේෂ අත්තිකාරම් ගෙවීම

රාමසාන් උත්සවය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයනට 2012 වසරේ දී ද, විශේෂ අත්තිකාරම් හා වැටුප් අත්තිකාරම් ගෙවනු ලැබීය.

## සුභ සාධක ඒකකය

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ, කාර්ය මණ්ඩල සුභ සාධනය පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට සුභ සාධන ඒකකය ස්ථාපිත කරනු ලැබීය.

සිසිල් දේශගුණය ඇති ප්‍රදේශයන්හි, හැටන් සහ බණ්ඩාරවෙල යන නගරවල ද අනුරාධපුරය, මින්නේරිය, මහනුවර, කතරගම සහ යාපනය වැනි ආගමික නගරවල ද පිහිටි ලංකා විදුලිබල මණ්ඩලයේ සංචාරක බංගලා ජාලයක් ලංකා විදුලිබල මණ්ඩලය මගින් පවත්වා ගෙන යනු ලැබේ. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් විසින් බොහෝවිට ඔවුන්ගේ නිවාඩු අරමුණු උදෙසා යොදා ගනු ලබන මෙම පහසුව ඔවුන් ලබන එක් ප්‍රධාන ප්‍රතිලාභයක්වේ. මෙම බංගලාවන්හි සංචාරක නේවාසිකයනට සලසනු ලබන සුව පහසුව උපරිම මට්ටමින් ලබාදීම සඳහා මෙම පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරනු ලැබේ.

ක්‍රීඩා හා විනෝද ක්‍රියා සමාජයේ කටයුතු සඳහා වාර්ෂිකව රුපියල් 125,000.00 ප්‍රදානයක් ලබා දෙමින් ක්‍රීඩා හා විනෝද ක්‍රියා සමාජයේ කටයුතු කෙරේ ලංකා විදුලිබල මණ්ඩලය සහයෝගය ලබා දෙයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්, ආගමික කටයුතු කෙරේ දිරි ගැන්වීමේ උපක්‍රමයක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩල බෞද්ධ සමිතිය, ක්‍රිස්තියානි සංවිධානය වැනි නොයෙකුත් සමාජයන් මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් විසින් සංවිධානය කරනු ලබන, වෙසක්, පොසොන් හා ක්‍රිස්තියානි උත්සව සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් වාර්ෂිකව ප්‍රදානයන් සිදු කරනු ලබයි. ලංකා විදුලිබල මණ්ඩලය විසින් අගෝස්තු මාසයේ දළදා මාළිගාවේ ද මාදැස්සා කැලේ සමන් දේවාලයේ දෙසැම්බර් මාසයේදී ද මිහින්තලේ පුනි මාසයේ දී ද කතරගම කිරිවෙහෙර අගෝස්තු මාසයේදී ද වාර්ෂිකව සංවිධානය කරනු ලබන උත්සවවලට අමතරව ඉහත කී සහභාගිත්වය ලබා දෙයි.

2012.07.28 දින බලශක්ති සංරක්ෂණ පාගමනක් සාර්ථකව පවත්වනු ලැබිණි. විදලමු ලංකා කලා උළෙල, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2012 වසරේ දී අරඹන ලද වැදගත් කටයුත්තක් විය. ගායනය, නැටුම්, සංගීත ආදී ක්ෂේත්‍රයන්හි තම හැකියාවන් පෙන්වීමට හා මුවහත් කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු සේවකයන්ට එමගින් අවස්ථාවක් උදාකර දෙනු ලැබිණි. ඩී.ජේ.විමලසුරේන්ද්‍ර මහතාගේ 138 වෙනි ජන්ම ශත සංවත්සරය සැමරීම සඳහා පැවැත්වෙන උත්සවයන්ට හා නොවැම්බර් මස 1 වැනි දිනට එළඹෙන ලංකා විදුලිබල මණ්ඩල දිනය සැමරීමට පැවැත්වෙන උත්සවයන්ට සමගාමීව, ලංකා විදුලිබල මණ්ඩලයේ සුභ සාධක සමිතිය මගින් සැප්තැම්බර් 17 වෙනි දින විමලසුරේන්ද්‍ර දිනය සංවිධානය කරනු ලැබීය.

විදුලි බලාගාරයන් පිහිටි දුර බැහැර ප්‍රදේශයන්හි සේවයේ නියුතු සේවකයන්ගේ පීඩනය සැහැල්ලු කිරීම උදෙසා, ජනන කාණ්ඩායමේ සියලූ විදුලි බලාගාරයන් ආශ්‍රිතව මොන්ටිසෝරි පාසල් පවත්වා ගෙන යාමට ලංකා විදුලිබල මණ්ඩලය මගින් අරමුදල් සපයයි.

## දිගු කාලයක් සේවය කළ සේවකයන් සඳහා තිළිණ

දිගු කාලයක් සේවය කළ සේවකයනට සේවා තිළිණ ප්‍රදානය කිරීම මගින්, සිය සේවකයන් විසින් ඉටුකරන ලද ප්‍රසංසනීය සේවය අගැයීමට ලංකා විදුලිබල මණ්ඩලය අඛණ්ඩව කටයුතු කරයි. මෙය, ශ්‍රී ලාංකිකයන්ගේ යහපත උදෙසා සිය ජීවිතවලින් වැඩි කොටස කැපකර ඇති, ලංකා

විදුලිබල මණ්ඩලයේ සේවකයනට කෘතඥතාවය පළකිරීමේ සළකුණක් වන අතර ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රගතිය උදෙසා ඔවුන් විසින් ලබාදුන් වටිනා සේවය වෙනුවෙන් පිළිගැනීමක් ද වනු ඇත.



කලා උළෙල - 2012

කලින් පැවති, රජයේ විදුලි කටයුතු දෙපාර්තමේන්තුවේ සහ අනුප්‍රාප්තික ලංකා විදුලිබල මණ්ඩලයේ වසර 35 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයනට තිළිණ ප්‍රදානය කරමින්, දිගු කාලයක් සේවය කර ඇති සේවකයනට තිළිණ පිරිනැමීමේ සම්ප්‍රදාය 1984 වර්ෂයේදී ආරම්භ කරනු ලැබීය. 1991 සිට, වසර 30 කාලයක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයනට, මෙම ත්‍යාගය ප්‍රදානය කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ, 2012 වර්ෂය තුළ දී, සේවකයන් 250 දෙනෙකුට තිළින ලබා දෙනු ලැබ ඇත. ලංකා විදුලිබල මණ්ඩල සේවකයන් 4,980 දෙනෙකුට මේ දක්වා මෙම වැඩසටහන යටතේ තිළිණ ලබා දී ඇත.

### ප්‍රචාරක ඒකකය (Publicity Unit)

ලංකා විදුලිබල මණ්ඩලය මගින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ට මුදාහරිනු ලබන පුවත්පත් නිවේදන සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සජීවී වැඩසටහන් ලංකා විදුලිබල මණ්ඩලයේ මෙම ඒකකය මගින් සම්බන්ධීකරණය කෙරෙයි. මෙම ඒකකය මගින් ඉටු කරනු ලබන අනෙකුත් කාර්යයන් වනුයේ, නොයෙකුත් අන්තර්ජාල ප්‍රකාශනයන් ප්‍රකාශයට පත්කිරීම හා ලංකා විදුලිබල මණ්ඩලයේ විශේෂ ආගමික හෝ පොදු උත්සව අවස්ථාවන්හි දී මාධ්‍ය වැඩසටහන් සංවිධානය කිරීමත්ය. ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රචාරක ඒකකය මගින් 2012 වසර තුළදී පහත සඳහන් වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබීය.

- ජාතික පුවත්පත් හරහා විවිධ දැන්වීම්, පුවත්පත් අතිරේකයන් සහ පුවත්පත් නිවේදන නිකුත් කිරීම
- පුවත්පත් සාකච්ඡා සහ විවිධ මාධ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම
- ජාතික මට්ටමේ ප්‍රදර්ශණ සංවිධානය කිරීම
- ලංවිම විශේෂ ආගමික හෝ පොදු උත්සව සම්බන්ධීකරණය කිරීමේ කටයුතු
- විවිධ කාර්යාලීය පොත් පිංච සහ ප්‍රකාශණයන් ප්‍රකාශයට පත් කිරීම

# නීති ඒකකය

ලංකා විදුලිබල මණ්ඩලය හා සම්බන්ධිත සියලු නෛතික කාර්යයන් හා නඩු මගට බැසීමේ කටයුතු නීති ඒකකය මගින් හසුරුවනු ලබයි. නීති ඒකකය, ප්‍රධාන නීති නිලධාරී, තවත් නීති නිලධාරීන් පස් දෙනෙකු සහ කාර්යාලීය කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවරනු ලබන නඩු කටයුතු හා ලංකා විදුලිබල මණ්ඩලයට එරෙහිව පවරණු ලබන නඩු කටයුතු ඇතුලු නඩු මගට පිවිසීමේ කාර්යයන් නීති ඒකකය මගින් ප්‍රධාන වශයෙන් මෙහෙයවයි.

ප්‍රථම කාණ්ඩය, පහත සඳහන් කාර්යයන්ගෙන් ආවරණය වේ.

(අ) විදුලිය විසන්දි කිරීමේ/මනු දෝෂයන්ට සම්බන්ධිත විදුලි බිල්පත් සංශෝධනය කිරීම/අනවසරයෙන් විදුලිය ලබා ගැනීම ආදිය සම්බන්ධ හිඟ මුදල් අයකර ගැනීම

(ආ)ගිවිසුම්/කොන්ත්‍රාත් කඩකිරීම ආශ්‍රිතව පැන නගින ගැටළු

(ඇ)ලංකා විදුලිබල මණ්ඩලය දේපල/වාහනවලට සිදු කරන අලාභයන් අයකර ගැනීම

(ඈ)ලංකා විදුලිබල මණ්ඩලයේ නිල නිවාස/ඉඩම් ආපසු ලබා ගැනීම

දෙවන කාණ්ඩය පහත දැක්වෙන කාර්යයන් ආවරණය කරයි.

(අ) විදුලිය සැපයුම විසන්ධි කිරීම හා බිල්පත් සංශෝධනය කිරීමට එරෙහිව නඩු පැවරීමට අදාළ කටයුතු

(ආ)තෙවැනි පාර්ශවයේ දේපලවලට ඉහළින් විදුලි රැහැන් ඇදීම/එකී දේපලවල ඉඩම්, ශාක/වෘක්ෂලතාදිය ආදියට සිදු කළ අලාභය සඳහා වන්දි ඉල්ලීමට එරෙහිව තහනම් ආඥාවක්/රැඳවුම් නියෝගයක් ඉල්ලා සිටීම

(ඇ)ටෙන්ඩර් හා කොන්ත්‍රාත්වලට අදාළ කාරණා කඩ කිරීම, පිළිවෙත් උල්ලංඝණය කිරීම, හානි සඳහා වන්දි ඉල්ලා සිටීම

නීති ඒකකය 2012 වර්ෂය තුළ, පහත සඳහන් උසාවි කටයුතුවල යෙදී ඇත.

| උසාවියේ නම | නඩු ගණන |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 12 |
| අභියාචනාධිකරණය | 35 |
| සිවිල් අභියාචනා මහාධිකරණය | 5 |
| මහාධිකරණයන් | 12 |
| දිස්ත්‍රික් උසාවි | 165 |
| කම්කරු උසාවි | 9 |
| කාර්මික අධිකරණය | 3 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 2 |

සේවා-සේවක ආරවුල්, සේවය අවසන් කිරීමට අදාළ කරුණු, තනතුරු අතහැර යාම හා සේවක දුක් ගැනවිලි කෙරේ අවධානය යොමු කළ අතර ඒවා පහත සඳහන් උසාවිවල විනිශ්චයට භාජනය කරනු ලැබ සමාදානයට පත් කර හෝ පවත්නා නීතියට අනුව අවසන් කරනු ලැබ ඇත.

- කම්කරු උසාවි
- කම්කරු දෙපාර්තමේන්තුව
- මානව අයිතිවාසිකම් කොමිසම
- කාර්මික අධිකරණය

චෝදනා පත්‍රයන්ට අමතරව, නිශ්චිත කොන්දේසි මත නිකුත් කෙරෙන පත්වීම් ලිපි ආදිය සහ සම්බන්ධිත ලේඛන නීති ඒකකය මගින් සියුම් ලෙස පරීක්ෂා කරනු ලැබෙයි.

මූල්‍ය ගිවිසුම්, වාණිජ ගිවිසුම්, විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් ඇතුළු ලංකා විදුලිබල මණ්ඩලයේ අනෙකුත් අවශ්‍යතාවන් සඳහා මෙන්ම ප්‍රධාන ව්‍යාපෘතිවලට අදාළව විදේශීය සමාගම්, දේශීය සමාගම් හා පුද්ගලයන් සමග ලංකා විදුලිබල මණ්ඩලය අත්සන් කරනු ලැබූ ගිවිසුම්/කොන්ත්‍රාත් විශාල ප්‍රමාණයක් නෛතික වශයෙන් විධිමත්ව සපයා තිබේ ද යන්න නිශ්චිතව දැන ගැනීමට පරීක්ෂා කර බලනු ලැබෙයි.

**නෛතික මතය**

ලංකා විදුලිබල මණ්ඩලයට අදාළ සියළු කාරණා සම්බන්ධයෙන් නෛතික මතය දැක්වීමට කටයුතු කරනු ලැබිණි.

**නොතාරිස් වැඩ**

i ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවන් මත, මණ්ඩලයේ ගොඩනැගිලි/ඉඩම් බදු දී ඇති අවස්ථාවන්හිදී නීති ඒකකය මගින් බදු ගිවිසුම් පරීක්ෂා කර බලනු ලැබෙයි.

ii බාහිර පාර්ශවයන්ගෙන් ලංකා විදුලිබල මණ්ඩලය දේපල මිලදී ඇති අවස්ථාවන්හිදී ඔප්පු පැවරීමේ කටයුතු ක්‍රියාවට නන්වනු ලැබ ඇත.

**ආරවුල් බේරුම් කිරීම**

1995 අංක 11 ආරවුල් බේරුම් කිරීමේ පනත අනුව, බේරුම් කිරීම සඳහා යොමු කරනු ලැබූ, ලංකා විදුලිබල බල මණ්ඩලය සහ බාහිර පාර්ශවයන් අතර ආරාවුල්. ලංකා විදුලිබල මණ්ඩලයේ නීති ඒකකය ආරවුල් බේරුම් කිරීමේ කාරනා හතරකට සම්බන්ධවී ඇත.

# විශේෂ විමර්ෂණ ඒකකය

නීති විරෝධී ලෙස විදුලිය ලබා ගැනීම සහ මනු අනවසරයෙන් වෙනස් කිරීම සම්බන්ධ විමර්ෂණ කඩිනම් කිරීම සඳහා, විමර්ෂණ කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන විශේෂ විමර්ෂණ ඒකකය 1995 දී ස්ථාපනය කරනු ලැබීය. පලාත්බද විමර්ෂණ කටයුතු පවත්වා ගෙන යාම සඳහා කඩා පණින හමුදා ඒකක 16 ක් යොදවා ඇත.

2012 වසර තුළ විශේෂ විමර්ෂණ ඒකකය ලබා ඇති ප්‍රගතිය

| අවස්ථා ගණන | සාර්ථකවූ අවස්ථා ගණන | උසාවි දඩ (රු. මිලියන) | ලංවීම පාඩුව (රු. මිලියන) | එකතුව (රු. මිලියන) |
|---|---|---|---|---|
| මනු වෙනස් කිරීම් | 1940 | 23.21 | 157.04 | 180.26 |
| කොකු ගසා විදුලිය ලබා ගැනීම් | 1629 | 14.97 | 16.08 | 31.78 |
| එකතුව | 3569 | 38.18 | 173.85 | 212.03 |




කැපී පෙනෙන එම කටයුතුවලට අමතරව, නොයෙකුත් මූලාශ්‍රයන් මගින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත යොමු කරන ලද, පරීක්ෂණයන් ප්‍රමාණයක් සිදු කරනු ලැබ ඇති අතර වරදට වගකිවයුතු නිලධාරීන්ට, සේවකයන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත.

# අභ්‍යන්තර විගණන ශාඛාව

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා වෙත සෘජුවම වග කියන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින්, අභ්‍යන්තර විගණන ශාඛාව අධීක්ෂණය කරනු ලබයි. විධායක නිලධාරීන් විසි පස් දෙනෙක්, විධායක නොවන නිලධාරීන් විසි දෙනෙක් හා සහායක සේවකයන් නව දෙනෙකුගෙන් අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මන්ඩලය සමන්විත වේ. ධනාත්මක විශ්ලේෂණයන් (objective analysis), අගැයුම් (appraisals), නිර්දේශයන් සහ සමාලෝචනය කරනු ලැබූ කාර්යයට අදාළ විවේචනාත්මක විස්තර සටහන් ඉදිරිපත් කරමින්, කළමනාකරණයේ යුතුකම් හා වගකීම් ඵලදායි ලෙස ඉටුකිරීමට ඔවුනට අභ්‍යන්තර විගණන ශාඛාව උපකාරී වෙයි.

2012 වර්ෂය තුළ දී, විගණන ශාඛාව මගින් පහත සඳහන් විගණන කටයුතු සිදු කරනු ලැබීය.

| | |
|---|---|
| • සිරිත් හුරු විගණනයන් | 8 |
| • ආදායම් විගණනයන් | 14 |
| • පද්ධති විගණනයන් | 41 |
| • විශේෂ විමර්ෂණයන් | 13 |
| | 76 |

### විගණන කමිටුව

මූල්‍ය වාර්ථාකරණය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාව, ආචාරධර්ම සහ බාහිර හා අභ්‍යන්තර විගණනයන්, විගණන කමිටුව මගින් සහතික කිරීමත් අධීක්ෂණය කිරීමත් සිදු කෙරෙයි. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයන් මගින් නියම කර ඇති පරිදි ස්වාධීනව කටයුතු කරන, මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන් හතර දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විතවේ. වර්ෂය තුළ දී රැස්වීම් පහක් පවත්වන ලද අතර ජනන අංශයේ බඩුවට්ටෝරු කළමනාකරණ ක්‍රමය, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ අයිතිය, කාර්ය මණ්ඩලය සඳහා පොලී සහන යෝජනා ක්‍රම, ලංකා විදුලිබල මණ්ඩලය මගින් පරිපාලිත ආයතන සහ ගෙවීම් ව්‍යුහයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි සංවර්ධනයන් පිළිබඳව සමාලෝචනය කිරීමට සහ වඩා හොඳ ක්‍රියාමාර්ගයන් යොදා ගැනීම නිර්දේශ කිරීමට හැකිවීය.

# මූල්‍ය තොරතුරු


| | |
|---|---|
| මූල්‍ය අංශය | 106 |
| මූල්‍ය සමාලෝචනය | 107 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 108 |
| ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය | 109 |
| ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 110 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 111 |
| සමූහය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 112 |
| මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 114 |
| ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 115 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 116 |
| විගණකාධිපති වාර්තාව | 164 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 179 |




# මූල්‍ය අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලියේදී, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය අංශය සැළකිය යුතු කාර්‍යභාරයක් ඉටුකර ඇත. මූල්‍ය අංශය මගින් ඵලදායි සහ කාර්‍යක්ෂම ආකාරයෙන් මූල්‍ය කටයුතු කළමනාකරනය කිරීම එහි එදිනෙදා කටයුතු සාර්ථකව ඉටුකිරීමට මග පෙන්වා ඇත.

විධිමත් ආකාරයෙන් මූල්‍ය කටයුතු සැලසුම් කිරීම, අයවැය පාලනය, මූල්‍ය ආයතන සමග ගණුදෙනු කිරීම සහ මූල්‍ය කටයුතු සමීපව අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම වඩාත් හොඳ මූල්‍ය කළමනාකරණයක් සඳහා අනුග මනය කරන ලද ක්‍රියා මාර්ගයන් අතරින් සමහරකි.

ලංකා විදුලි බල මණ්ඩලයේ කටයුතු අනාකූල කරනු ලැබූ අතර කාර්‍යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා නොයෙකුත් ක්‍රියාමාර්ගවන් ගනු ලැබීය. එස් 5 සංකල්පය හඳුන්වා දෙනු ලැබූ අතර පද්ධතිය හා පාලනය, සේවක ආකල්ප හා කාර්ය මණ්ඩලය අතර සහයෝගය වැඩි දියුණු කිරීමටත් මෙගින් මග පෙන්වනු ලබයි. මෙම විශ්ෂ්ඨ ජයග්‍රහණය අගැයීමක් ලෙස, ලංකා විදුල්බල මණ්ඩලය විසින් සංවිධානය කරන ලද වාර්ෂික එස් 5 තරඟයේදී, ලංකා විදුලිබල මංඩලයේ ගිණුම් අංශයට තුන් වන ස්ථානය ප්‍රදානය කරනු ලැබීය.

ලංකා විදුලිබල මණ්ඩලය තුළ, අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ක්‍රියාවට නැන්වීම, ලංකා විදුලිබල මණ්ඩල මංඩලයේ මූල්‍ය විසින් භාර ගන්නා ලද විශාල අභියෝගයක් වීය. උපදේශකවරයෙකු පත් කරනු ලැබූ අතර ලංවිම සේවකයන් අතර වැඩ මුළු හා දැනුවක් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී, ශ්‍රී ලංකාවේ ආයතන හා සංවිධාන තවමත් පසු පසින් සිටී. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවන් අනුව 2012 ගිණුම් සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීමට හැකිවීම ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ සැලකිය යුතු ජයග්‍රහණයකි.

ප්‍රවර්තන වර්ෂයේ දී, ආදායම් රැස්කිරීම තවදුරටත් අඛණ්ඩව වර්ධනය විණි. HDFC බැංකුව වැනි පුද්ගලික අංශයේ ආයතන කිහිපයක් ලංකා විදුලිබල මණ්ඩලයේ ආදායම් රැස් කරන්නන් ලෙස පත් කරනු ලැබූ අතර මහජන බැංකුවේ මාර්ග ගත නව කවුළු සංඛ්‍යාව වසර තුළදී 222 දක්වා ඉහළ නන්වනු ලැබීය.

නිලධාරීන්ගේ දැණුම වැඩිදියුණු කිරීමහා ඉහළ නැන්වීම සඳහා දේශීය හා විදේශීය නව පුහුණු වැඩසටහන් හා වැඩමුළු පවත්වනු ලැබීය.

### විශ්‍රාම වැටුප් අරමුදල

මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වනුයේ, විසි වසරකට වැඩි කාලයක් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතුව සිට සේවයෙන් විශ්‍රාම ලැබූ සේවකයන්ය. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලය අනුව, අවසානයට ලැබූ වැටුපෙන් 30% - 34% දක්වා කොටසක් විශ්‍රාම වැටුප ලෙස ගෙවනු ලැබේ. විශ්‍රාමිකයා මිය යාමෙන් පසු විශ්‍රාම අරමුදලින් ලැබෙන ප්‍රතිලාභ අත්හිටු වනු ඇත.

මෙම වසර තුළ, විශ්‍රාමික සේවකයන් 523 විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලැබූ අතර විශ්‍රාමිකයන් 73 දෙනෙකු අභාවප්‍රාප්තවීය. වර්ෂය අවසානය වන විට සිටි අතීත හා වර්තමාන විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව 5,498 ක් වීය. 2012 දෙසැම්බර් මස 31 දින වන විට අරමුදලේ පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 13,044 ක් වීය. අරමුදලේ වත්කම් ආයෝජනයෙන් 2012 වසර තුළ උපයා ගන්නා ලද ආදායම රුපියල් මිලියන 1,319 ක් වීය.

### විශ්‍රාම වැටුප් දීමනා ගෙවීම ප්‍රතිශෝධනය කිරීම - 2012





ලංක විදුලිබල මණ්ඩලයේ සේවකයන් සඳහා ක්‍රියාත්මක කෙරෙන සෑම වැටපු වැඩවීමකදීම, අරමුදලේ ප්‍රායෝගික බව අනුව, එයින් නිශ්චිත ප්‍රතිශතයක් ලැබීමට ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාමිකයන් හිමිකම් ලැබීය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම තීරණයන් ගනු ලැබූ අතර ඒ අනුව ප්‍රථම වරට වැඩි කරන ලද විශ්‍රාම වැටුප් දීමනාව, 2012 වර්ෂයේදී ඇමතිවරයා මුලසුන ගත් උත්සව සභාවක දී ප්‍රදානය කරනු ලැබීය.

### ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල

1958 අංක 15 දරණ අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධානයන් අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල, පෞද්ගලික අර්ථ සාධක අරමුදලක් ලෙස ක්‍රියාත්මක කෙරේ. සාමාජිකයන් අට දෙනෙකුගෙ න් සමන්විත කළමනාකරණ කමිටුවක් මගින් එම අරමුදල පාලනය කෙරේ. ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා නිල බලයෙන් මෙම අරමුදලේ සභාපති බවට පත්වන අතර නිල බලයෙන් මෙම කමිටුවේ සාමාජිකයන් වනුයේ, ලංකා විදුලිබල මණඩලයේ සාමාන්‍යාධිකාරීවරයා සහ සේවක මණ්ඩල කටයුතු භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාය. ඉතිරි සාමාජිකයන් පස් දෙනා විදුලිබල මණ්ඩලය විසින් පත් කරනු ලැබේ.

2012 වර්ෂය තුළ අරමුදලට බැර කරන ලද මුළු දායක මුදල රුපියල් මිලියන 2,080 ක් වූ අතර ඒ අතරින් රුපියල් මිලියන 832 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් විසින් දායක කරනු ලැබ ඇත. 2012 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ අරමුදලේ සමුච්චිත වටිනාකම රුපියල් මිලියන 33

776 ක් වූ අතර මෙය පසු ගිය වසරට වඩා 10.54% වැඩිවීමකි. අරමුදල එහි ආයෝජනයන් මගින් 2012 වසර තුළ රුපියල් මිලියන 3,921 ක් ආදායමක් උපයා ඇති අතර 2012 වර්ෂය සඳහා 11.17% ලාභාංශ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. නිවාස සහ අනෙකුත් අරමුණු සඳහා සාමාජිකයන්ට ලබා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් මිලියන 1,693 ක් වේ. සේවයෙන් විශ්‍රාම ගත් සේවකයන්ට ගෙවීම සඳහා රුපියල් මිලියන 2,391 ක් 2012 වර්ෂය තුළ අරමුදලින් ආපසු ලබා ගෙන ඇත.

# මූල්‍ය සමාලෝචනය

### පොදු

2011 වර්ෂයට සාපේක්ෂකව මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය 2012 වර්ෂයේ දී තවදුරටත් පිරිහිණි. ධන ශේෂයක් වශයෙන් පැවති රඳවාගත් ලාභරුපියල් මිලියන 136,848 සිට රුපියල් මිලියන 57,940 දක්වා වසර තුළ පහත වැටිණි. මෙම අසතුටුදායක තත්ත්වයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ, වසර පුරා පැවති අසතුටුදායක වර්ෂාපතන තත්ත්වය හේතුවෙන් විදුලි ජනනය පහත වැටීම හා ඉන්ධන මිල ඉහළ යාමයි. විදුලි ඒකක මිලියන 1,291 කින් ජල විදුලිබල ජනනය පහත වැටීමක් 2012 දී වාර්තා වූ අතර 2011 ට සාපේක්ෂකව මෙය 29% කින් පහත වැටීමක් වූ අතර 2011 වර්ෂයට සාපේක්ෂකව තාප විදුලිබල ජනනය 23% කිනන් ඉහළ යාමකි. මෙම සාධකවල බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස පසුව විකුණුම් මිල 47% කින් ඉහළ ගියේය.

### මෙහෙයුම්

සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන ගැලපුම් ගාස්තුව නොමැතිව මණ්ඩලයේ පිරිවැටුම 8.7% කින් වැඩි විය. තාප විදුලිබල උත්පාදන වියදමින් කොටසක් ආපසු අයකර ගැනීමේ අරමුණෙන් ලංකා විදුලිබල මණ්ඩලය 2012 පෙබරවාරි මාසයේ දී ඉන්ධන ගැලපුම් ගාස්තුව හඳුන්වා දෙනු ලැබීය. ඉන්ධන ගැලපුම් ගාස්තුව හඳුන්වා දීම නිසා මණ්ඩලයේ පිරිවැටුම පසු ගිය වර්ෂයට සාපේක්ෂකව 23% කින් වර්ධනය වීය. ලංකා විදුලිබල මණ්ඩලය වසර තුළ විදුලිය ඒකක මිලියන 10,474 ක් විකිණූ අතර එම ප්‍රමාණය 2011 දී විකුණූ ඒකක මිලියන 10,023 ට වඩා 4.5 % වැඩි වීමකි.

### මුදල් ප්‍රවාහය

සමාලෝචනයට භාජනය වන වසර අවසානයේදී ශුද්ධ මුදල් ප්‍රවාහයක් පවත්වා ගෙන යාමට හා අසතුටුදායක මුදල් ශේෂය රුපියල් මිලියන 3,102 සිට රුපියල් මිලියන 1,178 දක්වා අඩු කර ගැනීමට මණ්ඩලයට හැකිවිය. කෙසේ වෙතත්, වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වූ ශේෂය රුපියල් මිලියන 14, 848 කින් අඩුවීය.

### ණය ගැණුම්

2011 වර්ෂයේ දී දිගු කාලීන මුළු ණය රුපියල් මිලියන 202,346 සිට 2012 වර්ෂයේ දී රුපියල් මිලියන 305, 715 දක්වා ඉහළ ගියේය.

### ස්ථාවර වත්කම්

ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අංශයන්හි වත්කම්වල ඉහළයාම නිසා සින්නක්කර දේපල, යන්ත්‍ර හා උපකරණවල සම්පූර්ණ වටිනාකම 14% කින් වැඩිවිය. සමාලෝචනයට භාජනය වන කාලය තුළ දී, බෙදා හැරීමේ අංශයේ වර්ධනය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ.

වර්ෂය තුළ රුපියල් මිලියන 76,838 ක් දක්වා සහභාගී ප්‍රාග්ධන (contributed Capital) සහ සංචිතවල ශුද්ධ වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සම්පූර්ණ වගකීම් රුපියල් මිලියන 141,072 දක්වා වැඩිවූ අතර සම්පූර්ණ වත්කම් රුපියල් මිලියන 64,235 කින් වර්ධනය වීය. වෙනම රක්ෂණ මුදලක් (Escrow) මහජන බැංකුවේ පවත්වා ගෙන යමින්, මණ්ඩලය එහි වත්කම් රක්ෂණය අතර දළ ස්ථාවර වත්කම්වල අගයෙන් 0.1% මුදල් වාර්ෂිකව එයට සපයයි. පසු ගිය වර්ෂයේ පැවති රුපියල් මිලියන 4,027 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ අරමුදල රුපියල් මිලියන 4,433 ක්ව පැවතිණි.

| | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| බෙදාහැරීමේ උප පොලවල් ගණන | 24,322 | 22,839 | 21,930 | 21,319 |
| මධ්‍යම වෝල්ටීයතා රැහැන් කි.මී. | 28,433 | 27,590 | 26,684 | 25,212 |
| අඩු වෝල්ටීයතා රැහැන් කි.මී. | 112,995 | 108,468 | 104,153 | 99,445 |
| සේවා සම්බන්ධතා ගණන | 4,979,862 | 4,717,448 | 4,480,423 | 4,280,168 |

### සමූහ ගිණුම්

ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම්වලට අමතරව, එහි පරිපාලිත සමාගම් වන, සීමා සහිත ලිංකා විදුලි (පුද්.) සමාගම, සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්)සමාගම, සීමා සහිත ලංකා කෝල් සමාගම, සීමා සහිත ශ්‍රී ලංකා ඉංජිනියර්ස් (පුද්) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල හවුල් ව්‍යාපාරයේ සමූහ ගිණුම් මණ්ඩලය මගින් පිළියෙල කරයි.

| **ලාභලාභ ගිණුම 2012** | **රුපි. මිලියන** 2012 | **රුපි. මිලියන** 2011 | **රුපි. මිලියන** 2010 | **රුපි. මිලියන** 2009 | **රුපි. මිලියන** 2008 |
|---|---|---|---|---|---|
| පිරිවැටුම | 163,513 | 132,460 | 121,862 | 110,518 | 111,287 |
| සෘජු පිරිවැය | (222,419) | (151,448) | (116,168) | (118,186) | (145,712) |
| දළ ලාභය/(අලාභය) | (58,906) | (18,988) | 5,694 | (7,668) | (34,425) |
| පරිපාලන වියදම් | (2,997) | (1,636) | (1,851) | (2,870) | (1,487) |
| වෙනත් ආදායම් | 4,225 | 3,810 | 3,062 | 3,412 | 3,580 |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | (57,678) | (16,814) | 6,905 | (7,126) | (32,332) |
| මූල්‍ය පිරිවැය/ශුද්ධ | (3,769) | (3,371) | (2,047) | (2,212) | (1,537) |
| බදු අයකිරීමට පෙර ලාභය/(අලාභය) | (61,447) | (20,185) | 4,858 | (9,338) | (33,869) |
| **ශේෂ පත්‍රය** | | | | | |
| මුළු වත්කම් | 738,171 | 661,333 | 605,422 | 516,021 | 465,296 |
| ප්‍රාග් ධන හා සංචිත | 193,230 | 257,464 | 282,631 | 275,208 | 270,176 |
| ජංගම නොවන වගකීම් (Non)Current) | 407,585 | 281,835 | 229,128 | 141,883 | 110,419 |
| ජංගම වගකීම් | 137,356 | 122,034 | 93,663 | 98,930 | 84,700 |
| මුදල් | (17,812) | (1,178) | (3,102) | (4,039) | (2,261) |
| විකුණුම් (ගිවොපැ) | 10,474 | 10,023 | 9,263 | 8,441 | 8,418 |
| ජනනය (ගිවොපැ) | 11,801 | 11,528 | 10,689 | 9,882 | 9,901 |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ඔවුන්ගේ වාර්තාව සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරති.

## ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර සමාලෝචනයන්

මණ්ඩලයේ ප්‍රධාන කටයුතු වනුයේ, විදුලිබලය ජනනය කිරීම, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, ඵලදායි බෙදාහැරීම සහ විකණීමයි.

## මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය සඳහා 8.7 % ක පිරිවැටුමේ වර්ධනයක් වාර්තාවිණි. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 77,645 ක ශුද්ධ අලාභයක් වාර්තාවිණි.

## ආයෝජනය

සීමා සහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ කොටස්වලින් 55.2% ක් ද, එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගමේ කොටස්වලින් 63% ක්ද, සීමාසහිත ලංකා කෝල් (පුද්) සමාගමේ කොටස්වලින් 60% ක් ද, සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්)සමාගමේ කොටස්වලින් 100% ක් ද, ලංකා විදුලිබල මණ්ඩලය මගින් ආයෝජනය කර ඇත. තව ද ලංකා විදුලිබල මණ්ඩලය හා ඉන්දියාවේ NTPC සමාගම අතර හවුල් ව්‍යාපාරයක් වන ත්‍රිකුණාමල විදුලි සමාගමේ ආයෝජනයන්ගෙන් 50% ක් ලංකා විදුලිබල මණ්ඩලය සතුය.

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම 2011/2012 වර්ෂය සඳහා රුපියල් මිලියන 500 ක අවසාන ලාභාංශ ද 2012/2013 මූල්‍ය වර්ෂය සඳහා අතුරු ලාභාංශ රුපියල් මිලියන 2,750 ක් ප්‍රකාශයට පත්කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ 2012 වර්ෂය සඳහා ලාභාංශ ආදායම ලෙස රුපියල් මිලියන 2,035 ක් ලැබී ඇත. සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගම 2011/2012 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 172 ලාභාංශ ප්‍රකාශයට පත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ 2012 වර්ෂයේ ලාභාංශ ආදායම ලෙස රුපියල් මිලියන 94 ක් ලබා ඇත.

## ස්වයං රක්ෂණ සංචිතය (Self Insurance Reserve)

ලංකා විදුලිබල මණ්ඩලය සිය ස්ථාවර වත්කම් සඳහා ස්වයං රක්ෂණයක් පවත්වා ගෙන යන අතර දළ ප්‍රත්‍යාගණිත ස්ථාවර වටිනාකමින් 1% ක් වාර්ෂිකව ඒ සඳහා ගෙවනු ලබයි. ශේෂ පත්‍ර දිනයට මෙම රක්ෂණයේ මුළු සමුච්චිත අරමුදලේ වටිනාකම රුපියල් මිලියන 4,433 ක් වීය.

## දේපල, යන්ත්‍ර හා උපකරණවලට එකතු කිරීම්

පසු ගිය වසරේ එකතු කළ රුපියල් මිලියන 17,183 ට සාපේක්ෂව 2012 වසර තුළ දී රුපියල් මිලියන 21,069 ක් වටිනා දේපල, යන්ත්‍ර හා උපකරණ ප්‍රාග්ධන වත්කම්වලට එකතු කරනු ලැබීය. මෙම එකතු කිරීම් ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ වත්කම් සම්බන්ධයෙනි.

## ණය ගැණුම්

පෙර වර්ෂයේ පැවති රුපියල් මිලියන 213,352 ක් වූ ණය ප්‍රමාණයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ පැවති ප්‍රමාණය රුපියල් මිලියන 346,900 ක් වීය.

## 2012 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මහතා ලංකා විදුලිබල මණ්ඩල සභාපති තනතුර දරණු ලැබීය. සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගම සහ එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඔහු කටයුතු කළේය. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර තුළ ඉංජිනේරු ඩබ්.ඩී.අනුර සේනක විජයපාල මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපතිවරයෙකු ලෙස කටයුතු කළ අතර පී.පී.ගුණසේන මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු වීය. තව ද ඔවුහු සීමාසහිත ලංකා කෝල් (පුද්) සමාගම, ශ්‍රී ලංකා ඉංජිනියර්ස් (පුද්) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමලය විදුලි (පුද්ගලික) සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයන් ලෙස ද සේවය කළෝය. 2012.12.31 දිනෙන් අවසන් වූ වසර තුළ, ආචාර්ය බී.එම්.එස්.බටගොඩ සහ ජයසිංහ මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සේවය කරනු ලැබීය.

කේ.ඩී.රණසිංහ මහතා 2012.07.23 දින ද, ආචාර්ය වයි.ඩී.නිහාල් ජයතිලක 2012.07.16 දින ද සේවයෙන් ඉල්ලා අස්වී ඇත. පලාත් පාලන හා ප්‍රාදේශිය සභා අමාත්‍යාංශයේ ලේකම් ආර්.ඒ.ඒ.කේ.රණවක මහතා 2012.07.16 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති සී.පී.සිරිවර්ධන මහතා 2012.08.13 දින ලංකා විදුල්බල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබීය.

## සේවක අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම අරමුදල

ලංකා විදුලිබල මණ්ඩලසේ සේවක අර්ථ සාධක අරමුදල හා විශ්‍රාම වැටුප් අරමුදල සේවකයන් උදෙසා ස්වාධීන අරමුදල් ලෙස මණ්ඩලය විසින් පවත්වා ගෙන යයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල 2012 වසර තුළ ආයෝජන මගින් රුපියල් මිලියන 3,921 ක ආදායමක් උපයා ගෙන ඇති අතර 11.17% ක ලාභාංශ ප්‍රකාශයට පත්කරනු ලැබීය. විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල් ආයෝජනයෙන් 2012 වසර තුළ ලැබූ ආදායම රුපියල් මිලියන 1, 319 ක් වීය.

## සේවකයින්

වසර අවසානයේ සේවක සංඛ්‍යාව 16,709 ක් වූ අතර 2012 සම්පූර්ණ පාරිභෝගික සේවක අනුපාතය 298 ක් විය.

## විගණකවරු

1971 අංක 38 දරණ මුදල් පනත අනුව ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍ය ප්‍රකාශය, විගණකාධිපති විසින් විගණනය කරනු ලැබීය.

## විගණන කමිටුව

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව රැස්වීම් හයක් පැවැත්වූ අතර 2011 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව සහ කළමනාකරණය වෙත ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවන් සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලැබීය. විගණන කමිටුව, ඔවුන්ගේ පෘථුල අත්දැකීම් සහ ප්‍රවීණතාව යොදා ගනිමින්, පුනරාවර්තනය වීමේ ශක්‍යතාව, දෝෂ හා වැරදිවල බලපෑම් සහ ආයතනය මුහුණපානු ලබන මූල්‍ය අවදානම අවම කරමින් මෙලෙසින් පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමට අවශ්‍ය වන විට ක්‍රියාත්මක කළ හැකි අමතර පාලන උපක්‍රමයන් සහ අවදානම සැහැල්ලු කරන උපාය මාර්ග යන් නිර්දේශ කරනු ලැබීය. විගණන කමිටුව මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු ද විමර්ෂණයට ලක් කළ අතර සැලසුම් සකස් කිරීම, සිදු කිරීමට ඇති විගණනයන්හි විෂය පථය හා ගුණාත්මකබව පිළිබඳව මාර්ගෝපදේශකත්වයක් ද සපයනු ලැබීය.

# ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්) | | සමූහය 2012 රු. | සමූහය 2011 රු. | මණ්ඩලය 2012 රු. | මණ්ඩලය 2011 රු. |
|---|---|---|---|---|---|
| **අඛණ්ඩ මෙහෙයුම්** | | | | | |
| ආදායම | 3 | 180,516,200 | 142,540,999 | 163,512,580 | 132,459,860 |
| විකුණුම් පිරිවැය | | (231,319,947) | (155,587,266) | (222,419,279) | (151,448,504) |
| දළ අලාභය | | **(50,803,747)** | **(13,046,268)** | **(58,906,699)** | **(18,988,644)** |
| වෙනත් ආදායම් සහ ලාභ | 4 | 5,630,063 | 4,420,540 | 4,225,332 | 3,810,426 |
| බෙදාහැරීමේ පිරිවැය | | (53,247) | (79,423) | - | - |
| වෙනත් | | (335,901) | (230,991) | - | - |
| පරිපාලන වියදම් | | (5,127,526) | (3,391,488) | (2,997,355) | (1,636,103) |
| **මෙහෙයුම් ලාභ** | | **(50,690,357)** | **(12,327,630)** | **(57,678,722)** | **(16,814,321)** |
| මූල්‍ය ආදායම් | 5.1 | 2,574,594 | 1,435,208 | 2,428,969 | 416,133 |
| මූල්‍ය පිරිවැය | 5.2 | (6,356,251) | (4,050,956) | (6,197,562) | (3,787,193) |
| මූල්‍ය පිරිවැය-ශුද්ධ | | (3,781,657) | (2,615,748) | (3,768,593) | (3,371,060) |
| ඒකාබද්ධ ව්‍යාපාරයෙන් අලාභ කොටස | 11 | (37,421) | (27,737) | - | - |
| **බදු ගෙවීමට පෙර අලාභය** | **6** | **(54,509,434)** | **(14,971,115)** | **(61,447,315)** | **(20,185,381)** |
| ආදායම් බදු වියදම | 7.1 | (1,453,825) | (951,711) | - | - |
| විලම්බිත බදු ගාස්තු / (ප්‍රත්‍යාවර්තන) | 7.2 | (15,982,615) | (673,028) | (16,198,080) | (829,953) |
| **අඛණ්ඩ මෙහෙයුම් මගින් වර්ෂය සඳහා අලාභය** | | **(71,945,874)** | **(16,595,854)** | **(77,645,395)** | **(21,015,334)** |
| සුළු කොටස් හිමි අයිතිය | | (3,646,791) | (2,162,456) | - | - |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | **(75,592,666)** | **(18,758,310)** | **(77,645,395)** | **(21,015,334)** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

# ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා<br>(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්) | සමූහය<br>2012<br>රු. | <br>2011<br>රු. | මණ්ඩලය<br>2012<br>රු. | <br>2011<br>රු. |
|---|---|---|---|---|
| **අඛණ්ඩ මෙහෙයුම්වලින් වර්ෂය සඳහා අලාභය** | **(71,945,874)** | **(16,595,854)** | **(77,645,396)** | **(21,015,333)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | - | 379,306 | - | - |
| ප්‍රති ඇගයූ ගොඩනැගිල්ල කෙරෙහි විලම්බිත බදු බලපෑම | - | (34,255) | - | - |
| පොත්වලින් ඉවත් කළ ඉඩම් | - | (11,300) | - | - |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් කෙරෙහි ආයුගණක අලාභය | (124,403) | (307,977) | (124,403.00) | (307,977) |
| සහාය මෙහෙයුම් | 7,029 | 3,987 | - | - |
| විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම් මත සාධාරණ අගයෙහි ලාභය | 57,114 | 581,404 | - | - |
| මුදල් ණය | (17,927) | (14,161) | - | - |
| **බද්ද** | **(72,024,062)** | **(15,998,850)** | **(77,769,799)** | **(21,323,310)** |
| **ආරෝපනීය සාධකः** | | | | |
| පරිපාලන හිමි අයිතිය | (75,693,400) | (18,587,958) | | |
| සුළු කොටස් හිමි අයිතිය | 3,669,337 | 2,589,109 | | |
| | **(72,024,062)** | **(15,998,850)** | | |

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

| 2012 දෙසැම්බර් 31 දිනට (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්) | සටහන | සමූහය 2012 | සමූහය 2011 | සමූහය 2011 1 වන දිනට | මණ්ඩලය 2012 | මණ්ඩලය 2011 | මණ්ඩලය 2011 1 වන දිනට |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 8 | 637,647,777 | 559,719,351 | 506,746,081 | 622,340,524 | 545,606,651 | 493,050,260 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරිකය | | 5,903 | - | - | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 22,025 | 23,327 | 25,748 | - | - | - |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 10 | - | - | - | 761,902 | 736,902 | 736,902 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 11 | 84,843 | 122,264 | - | 150,000 | 150,000 | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 12 | 4,864,344 | 5,057,495 | 5,510,688 | - | - | - |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 13 | 4,433,045 | 4,027,412 | 3,710,485 | 4,433,045 | 4,027,412 | 3,710,485 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 647,057,936 | 568,949,849 | 515,993,001 | 627,685,471 | 550,520,965 | 497,497,647 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| භාණ්ඩ තොග | 14 | 32,597,217 | 21,172,864 | 18,645,058 | 29,949,063 | 18,916,632 | 16,669,168 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 78,367,473 | 87,701,726 | 89,268,547 | 71,120,194 | 84,624,353 | 85,435,368 |
| සම්බන්ධිත පාර්ශ්වවලින් ලැබිය යුතු මුදල් | 16 | - | - | - | 1,810,852 | 1,627,537 | 1,831,493 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 12 | 14,186,296 | 14,211,385 | 9,868,553 | 5,035,090 | 4,164,890 | 3,690,470 |
| ආපසු ලැබිය යුතු බදු | | 232,601 | 222,800 | 470,672 | - | - | |
| මුදල් සහ බැංකු ශේෂ | 26 | 5,717,455 | 7,118,700 | 4,616,516 | 2,570,748 | 1,479,258 | 1,546,976 |
| **සම්පූර්ණ ජංගම වත්කම්** | | 131,101,043 | 130,427,474 | 122,869,346 | 110,485,947 | 110,812,670 | 109,173,475 |
| **මුළු වත්කම්** | | 778,158,979 | 699,377,323 | 638,862,347 | 738,171,418 | 661,333,635 | 606,671,122 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය සහ ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 17 | 109,567,864 | 96,090,404 | 83,311,423 | 109,567,864 | 96,090,404 | 83,311,423 |
| සංචිත | 18 | 32,259,936 | 31,011,415 | 29,388,050 | 25,721,509 | 24,525,260 | 23,436,293 |
| රඳවාගත් ලාභ / (අලාභ) | | 68,577,432 | 145,478,078 | 165,191,016 | 57,940,887 | 136,848,860 | 158,729,823 |
| **මූල සංවිධානයේ ධාරකයෝ** | | 210,405,232 | 272,579,897 | 277,890,489 | 193,230,260 | 257,464,524 | 265,477,539 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | 16,023,522 | 14,018,587 | 11,282,136 | - | - | - |
| **මුළු ස්කන්ධය** | | 226,428,754 | 286,598,484 | 289,172,625 | 193,230,260 | 257,464,524 | 265,477,539 |
| **ජංගම නොවන වත්කම් සහ විලම්බිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය සහ ණය ගැනීම් | 19 | 304,295,360 | 203,721,934 | 175,054,426 | 305,714,769 | 202,346,713 | 174,264,109 |
| පාරිභෝගික තැන්පතු | 20 | 8,899,445 | 8,162,181 | 7,543,940 | 8,899,444 | 8,162,181 | 7,543,940 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භීත වගකීම් | 21 | 4,144,075 | 3,577,866 | 3,355,504 | 3,592,799 | 3,092,032 | 2,929,958 |
| විලම්බිත ආදායම | 22 | 58,285,116 | 53,049,813 | 47,081,839 | 55,208,276 | 50,262,392 | 44,390,174 |
| විලම්බිත බදු | 23 | 34,602,781 | 18,620,167 | 17,912,883 | 34,169,764 | 17,971,684 | 17,141,731 |
| **මුළු ජංගම නොවන වගකීම් හා විලම්බිත ආදායම** | | 410,226,777 | 287,131,961 | 250,948,592 | 407,585,052 | 281,835,002 | 246,269,912 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 24 | 91,649,271 | 105,953,976 | 80,905,259 | 86,959,050 | 103,832,911 | 78,596,719 |
| ගෙවිය යුතු ලාභාංශ | | 19,322 | 328,953 | 282,273 | - | - | - |
| සම්බන්ධිත පාර්ශ්වවලට ගෙවිය යුතු මුදල් | 25 | - | - | - | 4,311,820 | 2,294,474 | 1,447,831 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 19 | 42,993,289 | 12,891,733 | 11,600,070 | 41,185,236 | 11,006,724 | 9,979,121 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 6,841,566 | 6,472,216 | 5,953,529 | 4,900,000 | 4,900,000 | 4,900,000 |
| **මුළු ජංගම වගකීම්** | | 141,503,449 | 125,646,878 | 98,741,130 | 137,356,106 | 122,034,109 | 94,923,671 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | 778,158,979 | 699,377,323 | 638,862,347 | 738,171,418 | 661,333,635 | 606,671,122 |

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය වගකීම දරයි.

මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ:



සභාපති | සාමාන්‍යාධිකාරී | මූල්‍ය කළමනාකරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

23.04.2014

කොළඹ

# සමූහය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

**2012 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**
(සියළුම මුල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අපේක්ෂිත පිරිවැය සඳහා ගැලපීම | ප්‍රත්‍යාගණන සංචිත |
|---|---|---|---|---|
| **2011 ජනවාරි 01 දිනට යළි ප්‍රකාශිත ශේෂය** | **83,311,423** | **17,792,799** | **4,529,883** | **403,244** |
| දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තය | | | | |
| වර්ෂය තුළ ගැලපීම් | | | | |
| වර්ෂය සඳහා අලාභය | | | | |
| ස්වරක්ෂණ සංචිතයට / සංචිතයෙන් මාරු කිරීම | | | | |
| රක්ෂණ Escrow අරමුදල මත පොලී ආදායම | | | | |
| නිනිදු කොටස් නිකුතුව | | | | |
| පවත් දනවි කොටස් නිකුතුව | | | | |
| තාප අනුපාතික සංචිතය | | 12,489 | | |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | | | | |
| පොදුකාර්ය සංචිතය | | | | |
| සාමාන්‍ය කොටස් ලාභාංශ | | | | |
| AREP ව්‍යාපෘතිය | 1,560,000 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 08 (ඉරානය) | 5,566,289 | | | |
| CAARP ව්‍යාපෘතිය | 95,902 | | | |
| IDC ව්‍යාපෘති ණය | 7 | | | |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 139,994 | | | |
| ආලෝකවත් කරමු ශ්‍රී ලංකා | 1,914,000 | | | |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 1,046,052 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 04 (පුළුල් කිරීම) | 1,160,072 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 04 (පැරණි) | 1,296,666 | | | |
| **වෙනත් විස්තරාත්මක ආදායම්** | | | | |
| නැවත නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය හෝ අලාභය | | | | |
| පොත්වලින් ඉවත් කළ ඉඩම් | | | | (6,238) |
| ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | | | | 209,377 |
| ස්කන්ධයට ගලපන ලද විලම්බිත බදු | | | | (18,909) |
| ප්‍රකාශිත / අප්‍රකාශිත කොටස් සඳහා සාධාරණ මිල | | | | |
| විදේශීය සහාය මෙහෙයුම පරිවර්තනය මත විනිමය වෙනස | | 2,052 | | |
| විදේශීය මුදල් ණය විනිමය අනුවර්තනයේ දී ශුද්ධ ලාභය / අලාභය | | (7,289) | | |
| **2011 දෙසැම්බර් 31ට ශේෂය** | **96,090,405** | **17,800,051** | **4,529,883** | **587,475** |
| IFRS ගැලපීම - ප්‍රත්‍යාගණනය | - | | | |
| වර්ෂය තුළ ගැලපීම් | - | | | |
| වර්ෂය සඳහා පාඩුව | - | | | |
| රක්ෂණ සංචිතයෙන් / සංචිතයට මාරුව | - | | | |
| රක්ෂණ Escrow අරමුදල මත පොලී ආදායම | - | | | |
| වකවානුව තුළ හානි ගාස්තු අය කිරීම් | - | | | |
| පවත් දනවි කොටස් නිකුතුව | | | | |
| තාප අනුපාතික සංචිතය | | 2,093 | | |
| ආයෝජන සංචිතය | | | | |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | | | | |
| පොදුකාර්ය සංචිතය | | | | |
| CAARP ව්‍යාපෘතිය | 105,769 | | | |
| AREP ව්‍යාපෘති | 140,000 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-08 (ඉරානය) | 3,153,437 | | | |
| IDC ව්‍යාපෘති ණය | 8 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පුළුල් කිරීම) | 3,064,325 | | | |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පැරණි) | 463,364 | | | |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 966,970 | | | |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 646,080 | | | |
| බටහිර රන් අරුණ ව්‍යාපෘතිය | 35,000 | | | |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 1,062,959 | | | |
| රුහුණු උදානය ව්‍යාපෘතිය | 160,000 | | | |
| ඌව උදානය ව්‍යාපෘතිය | 1,396,516 | | | |
| රජරට නවෝදය ව්‍යාපෘතිය | 75,000 | | | |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 315,825 | | | |
| චිරස්ථායී විදුලිබල අංශයේ ආධාරක ව්‍යාපෘතිය | 129,960 | | | |
| උතුරු වසන්තය | 1,757,069 | | | |
| DSMSLP ව්‍යාපෘතිය | 5,178 | | | |
| වෙනත් විස්තරාත්මක ආදායම් | | | | |
| නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභ / පාඩු | | | | |
| ප්‍රකාශිත / අප්‍රකාශිත කොටස් සඳහා සාධාරණ අගය වැඩිවීම | | | | |
| විදේශීය සහාය මෙහෙයුම් පරිවර්තනය මත විනිමය වෙනස්කම් | | 3,618 | | |
| විදේශීය මුදල් ණය විනිමය අනුවර්තනයේ දී ශුද්ධ ලාභය / අලාභය | | (9,227) | | |
| අවසාන ලාභාංශ-සාමාන්‍ය කොටස්-2011/12 (LTL) | | | | |
| අතුරු ලාභාංශ-සාමාන්‍ය කොටස්-2012/13 (LTL) | | | | |
| ලාභාංශ ගෙවීම (LECO) | | | | |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **109,567,865** | **17,796,535** | **4,529,883** | **587,475** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

| පොදු කාර්ය සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත | ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | අලෙවිය සඳහා පවත්නා සංචිත | රඳවාගත ඉපයීම් | සුළු කොටස් හිමියන්ගේ අයිතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2,984** | **23,000** | **189,615** | **60,530** | **5,816,735** | **569,259** | **165,191,016** | **11,282,136** | **289,172,625** |
| | | | | | | 45,439,094 | | 45,439,094 |
| | | | | | | (45,224,706) | | (45,224,706) |
| | | | | | | (18,758,310) | 2,162,456 | (16,595,854) |
| | | | | 772,040 | | (772,040) | | - |
| | | | | 316,927 | | | | 316,927 |
| | | | | | | | 14,667 | 14,667 |
| | | | | | | | 470,400 | 470,400 |
| | | | | | | (19,824) | 7,335 | - |
| | | 9,892 | | | | (15,702) | 5,810 | (0) |
| 33,689 | | | | | | (53,474) | 19,785 | (0) |
| | | | | | | - | (370,654) | (370,654) |
| | | | | | | | | 1,560,000 |
| | | | | | | | | 5,566,289 |
| | | | | | | | | 95,902 |
| | | | | | | | | 7 |
| | | | | | | | | 139,994 |
| | | | | | | | | 1,914,000 |
| | | | | | | | | 1,046,052 |
| | | | | | | | | 1,160,072 |
| | | | | | | | | 1,296,666 |
| | | | | | | | | - |
| | | | | | | (307,977) | | (307,977) |
| | | | | | | | (5,062) | (11,300) |
| | | | | | | | 169,929 | 379,306 |
| | | | | | | | (15,346) | (34,255) |
| | | | | | 299,335 | | 282,070 | 581,405 |
| | | | | | | | 1,935 | 3,987 |
| | | | | | | | (6,872) | (14,161) |
| **36,673** | **23,000** | **199,507** | **60,530** | **6,905,702** | **868,594** | **145,478,078** | **14,018,587** | **286,598,485** |
| | | | | | | (366,345) | | (366,345) |
| | | | | | | 9,524 | | 9,524 |
| | | | | | | (75,592,666) | 3,646,791 | (71,945,874) |
| | | | | 781,354 | | (781,354) | | - |
| | | | | 470,933 | | | | 470,933 |
| | | | | (56,038) | | | | (56,038) |
| | | | | | | | 49,000 | 49,000 |
| | | | | | | (3,322) | 1,229 | (0) |
| | | | 6,319 | | | (10,030) | 3,711 | 0 |
| | | 14,193 | | | | (22,529) | 8,336 | (0) |
| 5,999 | | | | | | (9,521) | 3,523 | 0 |
| | | | | | | | | 105,769 |
| | | | | | | | | 140,000 |
| | | | | | | | | 3,153,437 |
| | | | | | | | | 8 |
| | | | | | | | | 3,064,325 |
| | | | | | | | | 463,364 |
| | | | | | | | | 966,970 |
| | | | | | | | | 646,080 |
| | | | | | | | | 35,000 |
| | | | | | | | | 1,062,959 |
| | | | | | | | | 160,000 |
| | | | | | | | | 1,396,516 |
| | | | | | | | | 75,000 |
| | | | | | | | | 315,825 |
| | | | | | | | | 129,960 |
| | | | | | | | | 1,757,069 |
| | | | | | | | | 5,178 |
| | | | | | | | | - |
| | | | | | | (124,403) | | (124,403) |
| | | | | | 29,277 | | 27,836 | 57,114 |
| | | | | | | | 3,411 | 7,029 |
| | | | | | | | (8,700) | (17,927) |
| | | | | | | - | (412,447) | (412,447) |
| | | | | | | - | (1,240,195) | (1,240,195) |
| | | | | | | 0 | (77,560) | (77,560) |
| **42,671** | **23,000** | **213,700** | **66,849** | **8,101,951** | **897,871** | **68,577,432** | **16,023,522** | **226,428,756** |

# මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| (සියළුම මුල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්) | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රාග්ධනය නිදහස් කිරීමේ සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | ක්ෂය සංචිතය | ස්ව රක්ෂණ සංචිතය | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2011 ජනවාරි 01ට ශේෂය** | 83,311,423 | 17,447,062 | 165,446 | - | 23,000 | 5,800,785 | 158,729,823 | 265,477,538 |
| දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | - | - | - | - | - | - | 45,439,094 | 45,439,094 |
| වර්ෂය තුළ ගැලපීම් | - | - | - | - | - | - | (45,224,706) | (45,224,706) |
| වර්ෂය සඳහා පාඩුව | - | - | - | - | - | - | (21,015,334) | (21,015,334) |
| රක්ෂණ සංචිතයට / සංචිතයෙන් මාරු කිරීම | - | - | - | - | - | 772,040 | (772,040) | - |
| රක්ෂණ Escrow අරමුදල මත ආදායම් පොලිය | - | - | - | - | - | 316,927 | - | 316,927 |
| AREP ව්‍යාපෘති | 1,560,000 | - | - | - | - | - | - | 1,560,000 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-08 (ඉරානය) | 5,566,289 | - | - | - | - | - | - | 5,566,289 |
| CAARP ව්‍යාපෘතිය | 95,902 | - | - | - | - | - | - | 95,902 |
| IDC ව්‍යාපෘති ණය | 7 | - | - | - | - | - | - | 7 |
| කිලිනොච්චි-චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 139,994 | - | - | - | - | - | - | 139,994 |
| ශ්‍රී ලංකාව ආලෝකමත් කරමු ව්‍යාපෘතිය | 1,914,000 | - | - | - | - | - | - | 1,914,000 |
| වවුනියා-කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 1,046,052 | - | - | - | - | - | - | 1,046,052 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පුළුල් කිරීම) | 1,160,072 | - | - | - | - | - | - | 1,160,072 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පැරණි) | 1,296,666 | - | - | - | - | - | - | 1,296,666 |
| වෙනත් විස්තරාත්මක ආදායම් | - | | | | | | | |
| නිර්ණය කළ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය හෝ පාඩුව | - | - | - | - | - | - | (307,977) | (307,977) |
| **2011 දෙසැම්බර් 31ට ශේෂය** | 96,090,404 | 17,447,062 | 165,446 | - | 23,000 | 6,889,752 | 136,848,860 | 257,464,524 |
| **2012 ජනවාරි 01ට යළි*ප්‍රකාශිත ශේෂය** | 96,090,404 | 17,447,062 | 165,446 | - | 23,000 | 6,889,752 | 136,848,860 | 257,464,525 |
| IFRS ගැලපීම-ප්‍රත්‍යාගණක | - | - | - | - | - | - | (366,345) | (366,345) |
| වර්ෂය තුළ ගැලපීම් | - | - | - | - | - | - | 9,524 | 9,524 |
| වර්ෂය සඳහා පාඩුව | - | - | - | - | - | - | (77,645,395) | (77,645,395) |
| රක්ෂණ සංචිතයෙන් / සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | 781,354 | (781,354) | - |
| රක්ෂණ Escrow අරමුදල මත පොලී ආදායම | - | - | - | - | - | 470,933 | - | 470,933 |
| වකවානුව තුළ හානි ගාස්තු | - | - | - | - | - | (56,038) | - | (56,038) |
| CAARP ව්‍යාපෘතිය | 105,769 | - | - | - | - | - | - | 105,769 |
| AREP ව්‍යාපෘති | 140,000 | - | - | - | - | - | - | 140,000 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-08 (ඉරානය) | 3,153,437 | - | - | - | - | - | - | 3,153,437 |
| IDC ව්‍යාපෘති ණය | 8 | - | - | - | - | - | - | 8 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පුළුල් කිරීම) | 3,064,325 | - | - | - | - | - | - | 3,064,325 |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය-04 (පැරණි) | 463,364 | - | - | - | - | - | - | 463,364 |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 966,970 | - | - | - | - | - | - | 966,970 |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 646,080 | - | - | - | - | - | - | 646,080 |
| බටහිර රන් අරුණ ව්‍යාපෘතිය | 35,000 | - | - | - | - | - | - | 35,000 |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 1,062,959 | - | - | - | - | - | - | 1,062,959 |
| රුහුණු උදානය ව්‍යාපෘතිය | 160,000 | - | - | - | - | - | - | 160,000 |
| ඌව උදානය ව්‍යාපෘතිය | 1,396,516 | - | - | - | - | - | - | 1,396,516 |
| රජරට නවෝදය ව්‍යාපෘතිය | 75,000 | - | - | - | - | - | - | 75,000 |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 315,825 | - | - | - | - | - | - | 315,825 |
| චිරස්ථායී බලශක්ති අංශයේ ආධාරක ව්‍යාපෘතිය | 129,960 | - | - | - | - | - | - | 129,960 |
| උතුරු වසන්තය | 1,757,069 | - | - | - | - | - | - | 1,757,069 |
| DSMSLP ව්‍යාපෘතිය | 5,178 | - | - | - | - | - | - | 5,178 |
| වෙනත් විස්තරාත්මක ආදායම් | | | | | | | | - |
| නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය / පාඩුව | - | - | - | - | - | - | (124,403) | (124,403) |
| **2012 දෙසැම්බර් 31ට ශේෂය** | 109,567,865 | 17,447,062 | 165,446 | - | 23,000 | 8,086,001 | 57,940,887 | 193,230,261 |

# ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2012 දෙසැම්බර් 31 දිනට<br>(සියළුම මුල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්) | සමූහය<br>2012<br>රු. | <br>2011<br>රු. | මණ්ඩලය<br>2012<br>රු. | <br>2011<br>රු. |
|---|---|---|---|---|
| මෙහෙයුම් කටයුතුවල යෙදවූ / කටයුතුවලින් මුදල් ප්‍රවාහය බද්දට පෙර අලාභය | (54,509,434) | (14,971,115) | (61,447,315) | (20,185,380) |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය - වර්ෂය සඳහා අයවීම | 21,256,910 | 18,288,543 | 21,131,465 | 16,944,263 |
| පාරිභෝගික දායකත්වය - වර්ෂය තුළ ක්‍රමක්ෂය කළ ප්‍රමාණය | (2,189,202) | (2,155,369) | (2,053,541) | (1,853,318) |
| රජයේ ප්‍රදාන - වර්ෂය තුළ ක්‍රමක්ෂය කළ ප්‍රමාණය | (12,391) | (12,391) | (12,391) | (12,391) |
| ආයෝජනවලින් ආදායම | (5,664,925) | (1,507,541) | (2,401,213) | (385,887) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් (ලාභය / අලාභය) | (68,608) | (56,437) | (54,678) | (56,437) |
| මූල්‍ය පිරිවැය | 6,356,122 | 4,050,956 | 6,197,563 | 3,787,193 |
| යල් පැනගිය හා භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | 172,452 | 241,069 | 135,343 | 241,069 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | 779,295 | 228,809 | 779,295 | 228,809 |
| වෙළෙඳ ණයකරුවන් හානිකරනය වීම සඳහා ප්‍රතිපාදන | 623,981 | 72,876 | 597,181 | 72,896 |
| වෙනත් ණයකරුවන් හානිකරනය වීම සඳහා ප්‍රතිපාදන | (1,214,839) | 29,255 | (1,209,009) | 29,255 |
| විශ්‍රාමික අරමුදල - ලාභය කෙරෙහි ශුද්ධ බලපෑම | (353,781) | (145,904) | (353,781) | (145,904) |
| IFRS ක්ෂය සහ විකුණුම් ගැලපීම් කෙරෙහි බලපෑම | (1,498,464) | - | (1,498,464) | - |
| නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් ප්‍රතිපාදන | 1,244,447 | 400,729 | 1,162,056 | 320,874 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ / (අලාභ)** | **(35,078,436)** | **4,463,480** | **(39,027,489)** | **(1,014,958)** |
| භාණ්ඩ තොග (වැඩිවීම) / අඩුවීම | (12,172,320) | (2,997,684) | (11,743,287) | (2,717,342) |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම | 10,009,365 | 1,698,927 | 13,150,100 | 2,438,419 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම | (14,296,395) | 25,041,138 | (14,856,518) | 26,075,130 |
| **මෙහෙයුම්වලින් ජනිත මුදල්** | **(51,537,786)** | **28,205,861** | **(52,477,194)** | **24,781,249** |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (3,567,132) | (1,489,668) | (3,408,444) | (1,225,905) |
| ගෙවූ නිර්ණය කළ ප්‍රතිපාදන සැලසුම් පිරිවැය | (448,859) | (340,440) | (431,911) | (320,873) |
| ගෙවූ ආදායම් බදු | (1,084,474) | (433,024) | - | (2,000,000) |
| **මෙහෙයුම් කටයුතුවල (යෙදවූ) / කටයුතුවලින් (ජනනය වූ) ශුද්ධ මුදල්** | **(56,638,251)** | **25,942,729** | **(56,317,549)** | **21,234,471** |
| **ආයෝජන කටයුතුවල (යෙදවූ) / කටයුතුවලින් (ජනනය) මුදල් ප්‍රවාහ** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ ඉටුවන ප්‍රාග්ධන වැඩ | (89,211,205) | (63,795,772) | (88,022,279) | (62,420,017) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 1,302 | 2,421 | | |
| ඒකාබද්ධ ව්‍යාපාරවල ආයෝජන | 37,421 | (122,264) | - | (150,000) |
| රක්ෂණ සංචිත අරමුදලෙහි ආයෝජනය | (405,633) | (316,927) | (405,633) | (316,927) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලිය | 405,633 | 316,927 | 405,633 | 316,927 |
| ජංගම නොවන මූල්‍ය වත්කම්වල ආයෝජනය | 250,264 | 1,034,598 | - | - |
| ජංගම මූල්‍ය වත්කම්වල ආයෝජනය | 25,088 | (4,342,832) | - | - |
| ආයෝජන අත්පත් කර ගැනීම | - | - | (25,000) | - |
| විදේශීය ආයෝජනයෙන් ලැබුණ ආදායම | 960,883 | 72,334 | - | - |
| ආයෝජනවලින් ලැබුණ ආදායම | 4,704,042 | 1,435,208 | 2,401,213 | 385,887 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | 51,750 | 235,036 | 37,820 | 235,036 |
| ගෙවූ ලාභාංශ | (2,039,833) | (323,974) | - | - |
| **ආයෝජන කටයුතුවලින් ජනනය වූ / (කටයුතුවල යෙදවීමෙන්) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(85,220,288)** | **(65,805,245)** | **(85,608,246)** | **(61,949,094)** |
| **මුදල් යෙදවීමේ කටයුතුවලින් ජනනය වූ / (කටයුතුවල යෙදවීමෙන්) මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දායක ප්‍රාග්ධනයෙන් ලත් මුදල | 13,400,253 | 12,778,981 | 13,400,254 | 12,778,981 |
| පාරිභෝගික දායකත්වය | 7,436,897 | 8,135,735 | 7,011,818 | 7,737,927 |
| වරාය කොටස් නිදහස් කිරීම | - | (7,516) | - | - |
| පාරිභෝගික තැන්පතු - ශුද්ධ මුදල් | 729,556 | 625,949 | 737,264 | 625,949 |
| කල්බදු ණයකරුවන් / (කල්බදු ගෙවීම්) ශුද්ධ සංචලය | (23,094) | (8,286) | 114,734 | 5,956 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම්වලින් ලත් මුදල් | 110,219,457 | 28,441,292 | 112,395,167 | 26,833,093 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම | (9,178,880) | (6,174,290) | (8,368,039) | (5,343,133) |
| පවන් දනව් කොටස් නිකුතුව | 49,000 | 470,400 | - | - |
| නිව්දු කොටස් නිකුතුව | - | 14,667 | - | - |
| **මූල්‍ය (කටයුතුවල යෙදවීමෙන්) / කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **122,633,189** | **44,276,932** | **125,291,198** | **42,638,773** |
| **මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **(19,225,350)** | **4,414,414** | **(16,634,597)** | **1,924,150** |
| **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල්වලට සමාන දෑ** | **3,402,380** | **(1,012,034)** | **(1,178,067)** | **(3,102,216)** |
| **වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල්වලට සමාන දෑ** | **(15,822,970)** | **3,402,380** | **(17,812,664)** | **(1,178,067)** |

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2012 දෙසැම්බර් 31 දිනට

**1.0 සංයුක්ත තොරතුරු**

**1.1 පොදු**

1969 අංකද 17 දරණ පනත යටතේ, ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, අංකද 50, සර් චිත්තමපලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

**1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි ජනනය, ප්‍රසම්පාදනය, එලදායි බෙදාහැරීම සහ විකිණීම යි.

මණ්ඩලයේ පර්පාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

**සීමා සහිත ලංකා විදුලි සමාගම (පුද්ගලික)**

වර්ෂය තුළ දී සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම සහ ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුව යන ස්ථානයන්හි පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහස්ථ සහ කාර්මික පාරිභෝගිකයනට සිල්ලරට බෙදා හැරීමයි.

**එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**

ආයතනික ව්‍යාපාර උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම වශයෙන් සමූහ ව්‍යාපාරයන්හි ආයෝජන කාර්යයන්හි නිරතවීම.

**සී.සහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම**

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි නොරොච්චෝල ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා, ගෙන්දගම් ප්‍රමාණය අඩු, උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීම

**සීමාසහිත එනර්ජීස් (පුද්ගලික) සමාගම**

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ ව්‍යාපාර කටයුතුවල නිරතවීම, පුනර් ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා පුනර් ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම යි.

**බද්ධ ව්‍යාපාරය**

**සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම**

විදුලිබල ජනනය හා ලංකා විදුල්බල මණ්ඩලයේ ජාතික ජාලයට විදුලිබලය විකි,ම සමාගමේ ප්‍රධාන කාර්යයවේ.

**1.3 නිකුතුව සඳහා බලය පවරනු ලැබූ දිනය**

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට 2014 අප්‍රේල් 23 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කරගනු ලැබූ යෝජනාවක් අනුව බලය ලබා දී ඇත.

**2.0 පොදු ප්‍රතිපත්ති**

**2.1 පිළියෙල කිරීමේ පදනම සහ 2012 ජනවාරි මස 01 දින හෝ එදිනෙන් පසු ආරම්භ වන කාලය සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS and LKAS) යොදාගැනීම**

සමාගම් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරණ ලද SLFRS/LKAS මින් ඉදිරියට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතී (SLFRS) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කරනු ලැබ ඇත.

2011දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය අතුළු සහ ඒ දක්වා සියලු කාල පරිච්ඡේදයන් සඳහා සමාගම් සමූහය විසින් එහි මූල්‍ය ප්‍රකාශ කලින් පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS)/ අනුව සකස් කරනු ලැබීය. 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මෙම ගිණුම් ප්‍රකාශ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අනුව සමාගම් සමූහය විසින් සකස් කරනු ලැබූ ප්‍රථම මූල්‍ය ප්‍රකාශනයන්වේ.

2011 ජනවාරි මස 01 වන දින දිනට සහ ඉදිරිපත් කරන ලද සියලු කාල පරිච්ඡේදයන් පුරා, මූල්‍ය තත්ත්වය පිළිබඳ ආරම්භක SLFRS / LKAS ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, සටහන 05 මගින් අනාවරණය කරන ලද ඇතැම් සංක්‍රමන නිදහස් කිරීම් හා ව්‍යතිරේකයන්ට යටත්ව, සමාගම් සමූහය සංගතභාවයෙන් යුතුව, ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරනු ලැබ ඇත.

පහත දැක්වෙන ආකාරයෙන්, ඇතැම් වත්කම් හා වගකීම් සාධාරණ අගැයීම (fair valuation) මගින් වෙනස් කර ඇති පරිදි, ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ, උපචිත පදනමක් මත අවසාන ගිණුම් පිළියෙල කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතී SLFRS /LKAS සම්මතයන්ට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, ඇතැම් අර්බුදකාරී (critical) ගිණුම් ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවේ. ගිණුම්කරණ ප්‍රත්පත්ති භාවිතා කිරීමේ ක්‍රියාවලියේ දී, කළමනාකරණයට එහි විනිසුම (judgment) පාවිච්චි කිරීමට ද සිදුවනු ඇත. උසස් තත්ත්වයේ විනිසුමක් හෝ සංකීර්ණතාවක් ඇතුලත්වන ක්ෂේත්‍රයන් නැතහොත් මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන හා ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍රයන් සටහන 04 මගින් අනාවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යටතේ පිළියෙල කළ, 2012 දෙසැම්බර් මාසයේ 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන, සමාගම් සමූහයේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනයන්හි යොදා

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ඇත්වූ, සැලකිය යුතු වෙනස්කම්වල ස්වභාවය හා බලපෑම ඇතුළු, සමාගම් සමූහයේ වාර්තා ගත කළ මූල්‍ය තත්ත්වය,

කාර්‍යසාධනය සහ මුදල් ප්‍රවාහයන් SLFRS සම්මතයන් වෙත සංක්‍රමනය වීමේදී ඇතිවන බලපෑම, සටහන 2.6 මගින් අනාවරණය කෙරේ.

2.1.1 **අනුකුලතා ප්‍රකාශයද** සමාගම් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව පිළියෙල කරනු ලැබ ඇත(SLFRS).

2.1.2 **ඒකාබද්ධ කිරීමේ පදනමද** ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වන සීමා සහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) (LTL), සීමා සහිත ලංකා විදුලි (පුද්ගලික) සමාග ම(LECO), සීමා සහිත කෝල් (පුද්ගලික) සමාගම, (LCC), සීමා සහිත එනර්ජීස්(පුද්ගලික) යන ආයතනවල ඒකාබද්ධ ගිණුම්වලින් සමූහ ගිණුම් සමන්විත වේ.

සීමා සහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ පරිපාලිත සමාගම්, අර්ධ වශයෙන් අයිති පරිපාලිත සමාගමක් ලෙස, සීමා සහිත පවන් දනව් (පුද්ගලික) සමාගම ලෙස සංස්ථාගත කර ඇත. ඊට අමතරව, සීමාසහිත එල්ටීඑල් ගැලවනයිසර්ස් (පුද්ගලික) සමාගම, සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම, සීමාසහිත ලක්දනව්(පුද්ගලික) සමාගම, සීමාසහිත නිව්දු සීමාසහිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම, සීමා සහිත නිව්දු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම සහ සීමා සහිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම යන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ පදිංචිකාරයෙකු සේ ලියාපදිංචි වී ඇති සීමිත වගකීම් සමාග ම්වේ. මෙම සමාගම්වල ලියාපදිංචි කාර්යාල, කොළඹ 2, පාර්ක් වීදියේ අංකද 67 යන ස්ථානයේ පිහිටා ඇත. සීමා සහිත ලක්දනව් සමාගමේ පූර්ණ හිමිකම් සහිත පරිපාලිත සමාගමක් වන සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංකද 8, පයනියර් ස්ට්‍රීට්, සිංගප්පූරුව 628420 යන ස්ථානයේ පිහිටා ඇත. සීමා සහිත ලක්දනව් සහ සීමා සහිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාග මේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයන් ලිංඩල් කාර්මික වත්ත, සපුග ස්කන්ද යන ස්ථානයේ පිහිටා ඇත. සීමා සහිත එල්ටීඑල් එනර්ජි පුද්ගලික සමාගම සහ සීමාසහිත නව්දු (පුද්ගලික) සමාගම බෙලිහුල්ඔය, බලංගොඩ යන ලිපිනයේ සහ සීමාසහිත නිව්දු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම අරනායක යන ලිපිනයේ පිහිටා ඇත.

සීමා සහිත හෙලදනව් යනු සීමාසහිත ලක්දනව් සහ සීමාසහිත හේමාස් පවර් (පෞද්ගලික) සමාගම අතර පවත්නා බද්ධ ව්‍යාපාරයකි. මෙම සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 1, බ්‍රිස්ට්ල් වීදියේ අංකද 36 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හේලා ස්ටේට්, පුත්තලම යන ස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ (LECO) පරිපාලිත සමාගම් වනුයේ, සීමා සහිත ලංකා විදුලි සමාගම ව්‍යාපෘති (පුද්ගලික) සහ සීමාසහිත ඇන්ටේ LECO මීටරින් (පුද්ගලික) සමාගම යි. මෙම සමාගම්වල ලියාපදිංචි කාර්යාල, අංකද 411, ඊ.එච්.කුරේ ගොඩනැගිල්ල , ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයේ පිහිටා ඇත.

සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංකද 51/3, දුටුගැමුණු වීදිය, දෙහිවල යන ලිපිනයේ පිහිටා ඇත. සීමා සහිත ලංකා ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංකද 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ලිපිනයේ පිහිටා ඇත. එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කාමර අංකද 126 සහ 128, බ්ලොක් 2, බණ්ඩාරනායක අනුස්මරණ අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 7 යන ලිපිනයේ පිහිටා ඇත.

සීමා සහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ සීමා සහිත NTPC සමාගම අතර බද්ධ ව්‍යාපාරයකි. ලියාපදිංචි කාර්යාලය, ශ්‍රී ලංකාවේ කිරුළපන, හයිලෙවල් පාරේ අංකද 240 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ තෙවන මහලේ පිහිටා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය, සීමා සහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමා සහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම සහ සීමා සහිත ශ්‍රී ලංකා ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමා සහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමා සහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම යන සමාගම්වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වෙතත්, සමූහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හැකි වන සේ, එම සමාගම්වල විගණකවරුන් විසින් සහතික කර ඇති මූල්‍ය ප්‍රකාශයන් තනි මූල්‍ය ප්‍රකාශයක් ලෙස සකසා ඇත.

මණ්ඩලයේ සහ එහි සියලු පරිපාලිත සමාගම්වල සියලු වත්කම් හා බැරකම් සමූහ ශේෂ පත්‍රයට ඇතුළත් කර ඇත.පිටස්තර කොටස් කරුවන්ට අදාළ බදු අය කිරීමෙන් පසු හිමි ලාභ හෝ අලාභ අනුපාතයන්, සම කොටස් හිමියන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේ දී සුළු කොටස් හිමියන්ගේ හිමිකම් යන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් හා වගකීම් ඒකාබද්ධ ශේෂ පත්‍රයට ඇතුළත් කර ඇත.බාහිර කොටස් හිමියන්ට බදු ගැලපීමෙන් පසු ලාභ හෝ අලාභ කොටසින් ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකම් කොටස් කරුවන්ට හිමි ලාභය හෝ අලාභය ලබා දී ඉතිරිය සුළු කොටස් හිමියන් ගේ ශීර්ෂය යටතේ ගලපයි. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඉවත් කරනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

**2.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

**2.2.1 බද්ධව පාලනය කෙරෙන ආයතනය**

**සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**

සීමාසහිත හේමාස් පවර් සමාගම සහ සීමාසහිත ලක්දනවි සමාගම ආයතන දෙක අතර බද්ධ පාලනය වන, සීමාසහිත හෙලදනවි සමාගමේ මූල්‍ය ප්‍රකාශ, සීමාසහිත ලක්දනවි සමාග මේ වත්කම් හා වගකීම්වල කොටස, බද්ධව පාලනය කෙරෙන ඒකකයේ (entity) ආදායම් හා වියදම් යන පදනම මත, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කරනු ලැබ ඇත.(සමානුපාතික ඒකාබද්ධ කිරීම)

**ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ NTPC (පුද්ගලික) සමාගම අතර බද්ධව පාලනය වන ඒකකයක් (entity) වන සීමාසහිත ත්‍රිකුණාමලය විදුලි සමාගමේ ගිණුම් ප්‍රකාශ, හිමිකම් ක්‍රමය (Equity Method) අනුව ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශවල ඇතුළත් කර ඇත.

**2.2.2 විදේශ මුදල් පරිවර්තනය**

**අ). ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල්.**

ව්‍යවහාරික මූල්‍ය හා ඉදිරිපත්වීමේ මුදල් ඒකක (Functional and presentation currency) ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශවල අතුළත් කර ඇති අයිතම මනිනු ලැබේ. (ව්‍යවහාරික මුදල්) මෙම ඒකකයේ, ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක ලෙස සළකනු ලබන, ''ශ්‍රී ලංකා රුපියල්'' භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

**ආ). ගනුදෙනු සහ ශේෂයන්**

ගනුදෙනුව සිදුවන දිනයේ පවත්නා විනිමය අනුපාතිකයන් යොදා ගනිමින්, මණ්ඩලය විසින් විදේශ මුදල් ගනුදෙනු ආරම්භයේදී ව්‍යවහාර මුදල් ලෙස වාර්තා කරයි. එවැනි ගනුදෙනු නිරාකරණය කිරීමේ හා විදේශ ව්‍යවහාර මුදල්වල නම් කරනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම්වල වර්ෂාවසාන විනිමය අනුපාතයන් අනුව පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විදේශ විනිමය වාසි සහ හානි, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගනු ලැබේ.

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වන වගන්තියේ 06 වන උප වගන්තිය අනුව, විදේශීය ව්‍යවහාර මුදලින් ලබා ගන්නා ලද ණයවලට අදාළ මූලධනය සහ පොලිය ශ්‍රී ලංකා රජය මගින් දරණ බැවින්, ඒ සම්බන්ධයෙන් වාසි විනිමය උච්චාවචනයන්ගෙන් හටගන්නා කිසිදු ලාභයක් හෝ පාඩුවක් සැලකිල්ලට ගනු නොලැබේ. ආපසු ගෙවිය යුතු නොපිය වූ ණය, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා ගන්නා අවස්ථාවේ පැවති එකඟවූ විනිමය අනුපාතය අනුව අගයනු ලැබේ.

**ඇ) විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම**

විදේශ මෙහෙයුම් වන එතෙර පරිපාලිතසමාගම්වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්, පහත දැක්වෙන පරිදි, සමූහයේ ඉදිරිපත් වීමේ මුදල් ඒකක බවට පරිවර්තනය කළ යුතුය.

- ශේෂ පත්‍ර දිනයේදී නියම කරන ලද විනිමය අනුපාතය අනුව, වත්කම් හා වගකීම් පරිවර්තනය කරනු ලැබේ.
- මෙම සාමාන්‍ය අනුපාතය ගනුදෙනු දිනයේදී පැවති සාමාන්‍ය අනුපාතයට ආසන්න සාධාරණ අනුපාතයන් නොවන්නේ නම් මිස, ගනු දෙනු දිනයේදී නියම කරන ලද විනිමය අනුපාතය අනුව ආදායම් හා වියදම් පරිවර්තනය කරන අවස්ථාවේදී, අදාළ කාලය සඳහා පැවති සාමාන්‍ය විනිමය අනුපාතය අනුව ආදායම් හා වියදම් පරිවර්තනය කරනු ලැබේ.
- ඒකාබද්ධ කිරීම සඳහා කෙරෙන ගනුදෙනුවලදී හට ගන්නා හුවමාරු වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේදී හඳුනාගනු ලැබේ.

**2.2.3 බදු අයකිරීම**

**(අ) ප්‍රවර්තන බදු**

අදාළ කාලය සඳහා බදු වියදම්, ප්‍රවර්තන හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ප්‍රවර්තන හා පසු ගිය කාලයන් සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම්, ආපසු අයකර ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය හෝ දේශීය ආදායම් කොමසාරිස්- ජනරාල් වෙත ගෙවන ලද ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වන හෝ බදු පැනවිය හැකි ආදායම් උපදවන රටේ, පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ නිත්‍ය ලෙස පනවනු ලබන නීති, වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද බදු අනුපාතයන් හා බදු නීති වෙයි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ බදු හඳුනා ගැනෙයි. වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනා ගන්නා ආදායම් හෝ වියදම් අයිතමයකට ආරෝපණය වන වෙනසක් හැර වෙනත් විස්තීර්ණ ආදායම් ද සෘජු ලෙසම වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කර ඇති පරිදි හා ආදායම් බදු සඳහා වන විධිවිධානයන් ආදායම් හා වියදම් මූලිකාංග මත පදනම් වන අතර 2006 අංකද 10 දරණ පනත හා එහි සංශෝධනයන්ට අනුව ආදායම් බදු ගණනය කරනු ලැබේ.

**ලංකා විදුලිබල මණ්ඩලය**

2006 අංකද 10 දරණ දේශීය ආදායම් පනත හා එම පනතට කරෙන්නා වූ සංශෝධනයන් අනුව, 2011 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට පස් වසරක කාලයක් සඳහා සියළුම ආදායම් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වන බද්දෙන්, ලංකා විදුලිබල මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

නිදහස් කරනු ලැබේ. මේ අනුව, 2015/16 ආදායම් වර්ෂයෙන් බදු විරාමය අවසන් වන අතර ලාභ 28% ක ආදායම් බද්දට යටත්වේ.

### (ආ). විලම්බිත බදුකරණය

බැරකම් ක්‍රමය භාවිතා කරමින් වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇති වන සියලු තාවකාලික අන්තරයන් සහ මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ ධාරක වටිනාකම් මත විලම්භිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත. ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුල් හඳුනා ගැනීමේදී විලම්බිත ආදායම් බදු වගකීම් හටගන්නා අවස්ථාවක ද ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදුවන අවස්ථාවකදී ද ගිණුම්කරණ ලාභය හෝ පාඩුව බල නොපාන ගනුදෙනුවක් සිදුවන අවස්ථාවක ද හැර බදු අය කළ හැකි සියලු තාවකාලික අන්තරයන් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලබයි.

විලම්බිත ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ අඩු කළ හැකි සියලු කාල වෙනස්කම් හා හිලවු නොකර ඉදිරියට ගෙන ගිය බදු අලාභ හා අඩු කළ හැකි කාල වෙනස්කම් වලට එරෙහිව බදු අයකළ හැකි ලාභ තිබෙන පමණට හිලවු නොකළ ඉදිරියට ගෙන ගිය බදු අලාභ භාවිතා කළ හැකි වන පමණටය. ගනු දෙනුවක් සිදුවන අවස්ථාවේදී හෝ ව්‍යාපාරික සම්බන්ධතාවයක් නොමැති ගනුදෙනුවකදී පිළිගැනෙන වත්කම් හෝ බැරකම්වලදී විලම්බිත බදු වත්කම් සම්බන්ධ ලාභ හෝ අලාභ බල නොපාන පරිදි ගනුදෙනුව සිදුවන කාලයේ දී සහ ව්‍යාපාරික සම්බන්ධතාවයක් නොමැති ගනුදෙනුවකදී වත්කම් හා බැරකම් ලෙස මූලිකව නොසලකා විලම්බිත බදු බැරකම් හැරෙන්නට සියලුම තාවකාලික බදු වෙනස්කම් පදනම් කර ගෙන විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලබයි. විලම්බිත බදු වත්කම්වල ධාරණ අගයයන් එක් එක් වාර්තා කරන දිනයේදී සමාලෝචනය කරන විලම්බිත බදු සියල්ල හෝ ඉන් කොටසක් උපයෝගී කර ගැනීමට සෑහෙන තරම් බදු අයකර ගත හැකි නොවන පමණට අඩු කරනු ලබයි.

සෑම වාර්තා කරන දිනයකදීම නොහඳුනාගත් විලම්බිත බදු වත්කම් නැවත තක්සේරු කරන අතර බදු අය කළ හැකි අනාගත ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට හැකි පමණට පත්ව ඇති බවට හඳුනා ගැනෙයි.

විලම්බිත බදු වත්කම් හා බැරකම් මිනුනු ලබන්නේ, බදු වත්කම් උපලබ්ධි වන හෝ බදු බැරකම් නිරවුල් කරනු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසු කාලීනව පනවනු ලබන බදු අනුපාතිකයන් (සහ බදු නීති) අනුව වේ.

ස්කන්ධ ප්‍රාග්ධන විෂයයන් හා සම්බන්ධිත විලම්බිත ආදායම් බදු සෘජුවම ස්කන්ධ ප්‍රාග්ධනයට හඳුනා ගන්නා අතර ඒවා ආදායම් ප්‍රකාශයට හඳුනා නොගනී. විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක වූ අයිතියක් ඇත්තේ නම් හා විලම්බිත බදු එකම බදු අය කළ හැකි ආයතනයක් සම්බන්ධයෙන් වන විට හා සමාන බදු අධිකාරියක් ඇති විටය.

### 2.2.4 ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවන පොලී සහ අනෙකුත් වියදම්වලින් ණය ගැනීම් පිරිවැය සමන්විතවේ. අපේක්ෂිත භාවිතය හෝ විකි,ම සඳහා සූදානම් කිරීම පිණිස අත්‍යවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගනු ලබන යෝග්‍යතා වත්කම්, පවරාගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපනය කළ හැකි පොදු හා විශේෂිත ණය ගැනීමේ පිරිවැය, මෙම වත්කම් අපේක්ෂිත භාවිතය හෝ විකි,ම සඳහා සාර්ථක ලෙස සූදානම් කෙරෙන තෙක් මෙම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ. සියලුම ණය ගැනීමේ වියදම්, ම වියදම් දරණ කාලය තුළ වියදම් කරනු ලැබේ.

### 2.2.5 භාණ්ඩ තොග

භාණ්ඩ ලේඛන අගය කරනු ලැබ ඇත්තේ, යල්පැන ගිය හා සෙමෙන් අලෙවි වන භාණ්ඩ සඳහා නිසි දීමනාවන් වෙන් කිරීමෙන් පසු පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය යනු ඇස්තමේන්තු ගත නිමකිරීමේ පිරිවැය සහ විකුණුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත පිරිවැය අඩු කොට ව්‍යාපාර කටයුතු කෙරෙන සාමාන්‍ය කාල සීමාව තුළ භාණ්ඩ විකිණිය හැකි මිලයි. බඩු තොග ඒවා දැනට ඇති ස්ථානයට ගෙන ඒම සහ වර්තමාන තත්ත්වයට පත්කිරීමට දරන ලද වියදම් පහත සඳහන් ලෙස ගණනය කෙරේ.

**සීමා සහිත ලංකා විදුලි සමාගම**

| | | |
|---|---|---|
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | - | හරිත සාමාන්‍ය පදනමින් තථ්‍ය පිරිවැය |
| මාර්ගස්ථ භාණ්ඩ සහ වෙනත් පිරිවැය | - | තථ්‍ය පිරිවැය |

**සීමා සහිත එල්ටීඑල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම**

| | | |
|---|---|---|
| අමු ද්‍රව්‍ය අගැයීම | - | තථ්‍ය පිරිවැයට ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනමින් |
| නිමි භාණ්ඩ සහ කෙරෙමින් පවතින වැඩ | - | සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ නිසි ස්ථාවර නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය සමානුපාතය |
| පරිභෝජන ද්‍රව්‍ය සහ අමතර කොටස් | - | තථ්‍ය පිරිවැයට ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනමින් |
| මාර්ගස්ථ භාණ්ඩ | - | තථ්‍ය පිරිවැයට |

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

**ලංකා විදුලිබල මණ්ඩලය**

වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගන්නා සහ වාර්ෂික මිල ලේඛනයේ ලැයිස්තු ගත කෙරෙන භාණ්ඩ තොග සම්මත මිලට අගය කෙරෙන අතර පරිභෝජන භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් භාණ්ඩ පිරිවැය හා උපලබ්ධි කළ හැකි ශුද්ධ වටිනාකම යන දෙකෙන් අඩු මිලට අගය කරනු ලැබේ. කෙසේ වෙතත්, සම්මත මිලට අගය කරනු ලැබූ භාණ්ඩ තොගවල උපලබ්ධි නොවූ ලාභය මගින් අගය මිල දක්වා පහත හෙළීමට අවශ්‍ය විධිවිධාන ලංකා විදුලිබල මණ්ඩලය මගින් සලසනු ලැබීය.

### 2.2.6 මුදල් සහ මුදල්වලට සමාන වෙනත් දේ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ ඉක්මණින් හා පහසුවෙන් නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පරිවර්තනය කළ හැකි හා අගය වෙනස්වීම පිළිබඳව අල්ප අවදානමට ලක්වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්, මුදල් සහ මුදල්වලට සමාන වෙනත් දේ යනුවෙන් නිර්වචනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට, අතැති මුදල් හා බැංකු අයිරා අඩු කළ පසු බැංකු තැන්පතු අන්තර්ගතවේ. කෙටි කාලීන වශයෙන් පරිණත බවට පත්වන ආයෝජනයන්, එනම්, පවරාගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් පරිණත වන කෙටි කාලීන ආයෝජන ද ඇතුලත් වේ.

### 2.2.7 දේපල, පිරියත සහ උපකරණ

#### (අ) පිරිවැය සහ අගැයීමද දේපල, පිරියත හා උපකරණ

සම්බන්ධයෙන් දක්වා ඇත්තේ, සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් විනි නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැයටය. දේපල, පිරියත හා උපකරණයන්හි උපාංග, කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, හඳුනාගැනීමේ නිර්ණායකයන් යෝග්‍ය වන්නේ නම්, දිගු කාලීන ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණයන්හි වැදගත් කොටස් වරින් වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවූ විට, ප්‍රතිස්ථාපිත කොටස්වල ශුද්ධ පොත් අගය, සමූහය විසින් හඳුනා නොගන්නා අතර අලුතින් සවි කළ කොටස සහ ඒ ආශ්‍රිත කාර්යක්ෂම පැවැත්ම සහ ක්ෂයවීම පමණක් හඳුනා ගනී. ඒ හා සමානවම, ප්‍රධාන පරීක්ෂණයක් සිදු කළ විට, හඳුනා ගැනීමේ නිර්ණායකයන් තෘප්තිමත් කරන්නේ නම්, එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනෙයි.

දේපල, පිරියත හා උපකරණයන්හි අයිතමයන් පසුව ප්‍රත්‍යාග ණනයට ලක් කරන්නේ නම්, එවැනි වත්කම්වල සමස්ථ පංතියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි මෙම ඉහළයාම පිළිගන්නා විට අදායම් ප්‍රකාශයෙහි කලින් පිළිගත් එම වත්කමෙහිම ප්‍රත්‍යාගණනය අඩුවීමක් ප්‍රතිවර්තනය වන ප්‍රමාණයට හැර, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙහි අනෙකුත් සම්පූර්ණ ආදායමේ සහ සමුච්චිත සම කොටස්වල යම් ප්‍රත්‍යාග ණන අතිරික්තයක් හඳුනා ගනු ලැබෙයි.

වත්කමේ දළ ධාරණ වටිනාකමට එදිරිව ප්‍රත්‍යාගණන දිනට වන සමුච්චිත ක්ෂය කිරීම් අත් හැර දමන අතර ශුද්ධ වටිනාකම, වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට අනුව නැවත නිශ්චය කෙරේ. යම් විශේෂ වත්කමකට සම්බන්ධිත යම් ප්‍රත්‍යාගණන සංචිතයක් ඉවත් කිරීමට විකුණනු ලබන විට එය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ.

#### (ආ) දැනට සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් වැයවූ පිරිවැය මත ප්‍රකාශ කෙරේ. මේවා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වන අතර දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතුවලට ඍජුව ඇතුලත් කෙරේ. ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තුරු හා ඒ හා ආශ්‍රිත වත්කම් පරිහරණය සඳහා ලබා ගත හැකිවන තුරු ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් දැනට සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් ලෙස සලකා ගිණුම් තබනු ලැබේ.

#### (ඇ) හඳුනා ගත් වත්කම් පොත්වලින් ඉවත් කිරීම.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් අපහරණයේදී හෝ එය අපේක්ෂිත අනාගත ආර්ථික වාසි නොලැබෙන විට හඳුනා නොගනියි. වත්කමක් පොත් පත් වලින් ඉවත් කිරීමෙන් ඇති වන වාසියක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලබා ගන්නා ශුද්ධ ඉපැයුම හා වත්කමේ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ), වත්කම හඳුනා නොගැනෙනන්නාවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

#### (ඈ) යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන වියදම්, මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන මට්ටමින් අනාගත ආර්ථික වාසි මුලින් පැවති තත්ත්වයට ගෙන ඒමට හෝ පවත්වා ගෙන යාම සඳහා දරන ලද වියදම්, ගාස්තුවක් ලෙස සළකනු ලැබේ.

#### (ඉ) ක්ෂය කිරීම්

සින්නක්කර ඉඩමක් හැර වෙනත් වත්කමක් ප්‍රයෝජනය සඳහා යොදාගත හැකිව ඇති විට වත්කමක ඵලදායි ජීවිත කාලය තුළ සරල මාර්ග ක්‍රමය යොදාගනිමින් ක්ෂයවීම ගණනය කරනු ලැබේ.බදු ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක ක්ෂය ගණනය කරන්නේ, වත්කමේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලයත්, කල්බදු වාරිකයත් යන දෙකෙන් අඩු අගයටය. වත්කම්වල ඵලදායී ජීවිත කාලය පහත සඳහන් ලෙස ඇස්තමේන්තු කරනු ලැබේ.

| | |
|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය | |
| සින්නක්කර ගොඩනැගිලි සහ | |
| බදු ඉඩම් හා ගොඩනැගිලි | අවුරුදු 40 |
| සිවිල් වැඩ | |
| වාන්මගවල් හා වේලි | අවුරුදු 100 |
| වානේ ජලනල හා රැඳවුම් ජලය | අවුරුදු 40 |
| උප පොළ හා වහරු අංගනය | අවුරුදු 35 |

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

| | |
|---|---|
| උත්පාදන යන්ත්‍රද යන්ත්‍ර ඇතුළුව | |
| විදුලි බලාගාර (ජල) | අවුරුදු 35 |
| යන්ත්‍ර ඇතුළු විදුලි බලාගාර (තාප) | අවුරුදු 25 |
| යන්ත්‍ර ඇතුළු විදුලි බලාගාර (ඩීසල්) | අවුරුදු 15 |
| යන්ත්‍ර ඇතුළු විදුලි බලාගාර (ගෑස් ටර්බයින්) | අවුරුදු 12 |
| සම්ප්‍රේෂණ මාර්ග කිවො 220, කිවො 132, කිවො 66 | අවුරුදු 35 |
| බෙදාහැරීමේ මාර්ග | |
| අධි සැර යටිබිහන් * 33 | අවුරුදු 50 |
| අධි සැර යටිබිහන් * 132 | අවුරුදු 50 |
| අධි සැර යටිබිහන් * 11 | අවුරුදු 40 |
| අධි සැර උඩිස් | අවුරුදු 35 |
| අඩු සැර යටිබිහන් * | අවුරුදු 40 |
| අඩුසැර උඩිස් | අවුරුදු 35 |
| අඩුසැර පෝෂක කුළුණ | අවුරුදු 35 |
| පාරිභෝගික උපපොළ | අවුරුදු 35 |
| අධිසැර Switchgear | අවුරුදු 35 |
| ප්‍රාථමික හා ජාලක උපපොල | අවුරුදු 35 |
| සේවා නඩත්තු | අවුරුදු 35 |
| SCADA (මධ්‍යම පහසුකම්) හා සංනිවේදන උපකරණ | අවුරුදු 15 |
| මෝටර් වාහන | අවුරුදු 07 |
| මෝටර් බෝට්ටු | අවුරුදු 07 |
| යන්ත්‍ර හා මෙවලම් | අවුරුදු 05 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 05 |
| ලී බඩු සහ සවිකිරීම් | අවුරුදු 05 |

**සී/ස එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 25-50 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවුරුදු 8-15 |
| කර්මාන්තශාලා උපකරණ | අවුරුදු 10 |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | අවුරුදු 10 |
| ගිනි නිවීමේ උපකරණ | අවුරුදු 10 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 10 |
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 03-10 |
| මෝටර් වාහන | අවුරුදු 04 |
| උණුසුම් කිරීමේ උපකරණ | අවුරුදු 06 |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් තථ්‍යභාවිතය | |

**සී/ස ලංකා විදුලි (පුද්) සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 |
| වැඩි | |
| බදු ඉඩම් | කල්බදු |
| කාලසීමාව තුළ | |
| යටිතල පහසුකම් සැපයීම | |
| උප පොළවල්, උඩිස් රැහැන් සහ පලාත් පාලන ආයතන හා ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් පවරා ගත් සේවා රැහැන්, | අවුරුදු 10 |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගම මගින් ඉදි කළ උප පොළවල්, උඩිස් රැහැන් සහ සේවා රැහැන් | අවුරුදු 20-25 |
| මෝටර් වාහන | අවුරුදු 7 |
| පරිගණක | අවුරුදු 5 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 7 |
| පිරියත සහ යන්ත්‍ර | අවුරුදු 4 |

**සී/ස ලංකා කෝල් (පුද්) සමාගම**

| | |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 5 |
| උපකරණ | අවුරුදු 4 |
| මෝටර් වාහන | අවුරුදු 4 |
| පරිගණක | අවුරුදු 4 |

**සී/ස ත්‍රිකුණාමලය විදුලිබල සමාගම**

| | |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | අවුරුදු 5 |
| උපකරණ | අවුරුදු 5 |

### 2.2.8 කල් බදු

**(අ)** **මූල්‍ය කල්බදු** ද මූල්‍ය කල්බදු යනු, කල් බද්ද ආරම්භ වන අවස්ථාවේදී, කල්බදු වත්කම් සම්බන්ධයෙන් අදාළ වන සෑම ප්‍රතිලාභයක් හා අවදානමක් මණ්ඩලය වෙත මාරුකරන ලද වත්කම්ය. කල්බදු වත්කමේ සාධාරණ වටිනාකමත්, අවම කල්බදු වාරිකවල වර්තමාන අගයත් යන දෙකෙන් වඩා අඩු අගය ප්‍රාග්ධනිත කරනු ලැබේ. වගකීමෙහි පවත්නා ශේෂය මත නොවෙනස් වන පොලී අනුපාතිකයක් සාක්ෂාත් කර ගැනීම් වස් කල්බදු ගෙවීම් මූල්‍ය කල්බදු අයකිරීම් හා කල්බදු වගකීම්වල අඩුවීම අතර විභජනය කෙරේ. මූල්‍ය ගාස්තු අයකරනු ලබන අතර එය අදායම් ප්‍රකාශයෙහි පිළිබිඹු කෙරේ. වත්කමෙහි අයිතිය පිළිබඳව සාධාරණ නිශ්චිතතාවක් නැත්නම් කල්බදු කාලසීමාව අවසානයේදී මණ්ඩලය විසින් වත්කමෙහි අයිතිය පවරා ගනු ලබයි නම්, ප්‍රාග්ධනිත කරන ලද කල්බදු වත්කම් වත්කමෙහි ඇස්තමේන්තු ගත ඵලදායි ආයුකාලය හා කල්බදු කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදයට ක්ෂය කරනු ලැබේ. ක්ෂය කළ හැකි කල්බදු වත්කම්වල ක්ෂය ප්‍රතිපත්තිය, අයිතිය අනුව ක්ෂය කළ හැකි වත්කම් ක්ෂය කරන ආකාරය දැක්වෙන 2.2.4(ඊ) දෙය අනුව වේ.

**(ආ)** **මෙහෙයුම් කල්බදු** ද මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කාලය තුළ සරල රේඛීය පදනමින්, ආදායම් ප්‍රකාශයෙහි මෙහෙයුම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.2.9 **අස්පෘශ්‍ය වත්කම්** ද වෙන් වෙන්ව අත් කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේදී පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කමක පිරිවැය වනුයේ, එය අත්පත් කර ගනු ලබන දිනයේදී එහි පවත්නා සාධාරණ වටිනාකමයි. අස්පෘශ්‍ය වත්කම් මූලික හඳුනා ගනීමෙන් පසු, යම් සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ අලාභයක් වෙතොත් එය අඩු කළ පසු මිල ඉදිරියට ගෙන යනු ලබයි. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර, අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරනු ලබන අතර වියදම් සිදුවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් පිළිබිඹු කෙරේ. අස්පෘශ්‍ය වත්කමක ඵලදායි ආයු කාලය පරිමිත හෝ අසීමිත (indefinite) ලෙස තක්සේරු කරනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

### 2012 දෙසැම්බර් 31 දිනට

පරිමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, ඒවායේ ඵලදායි ආර්ථික ආයුකාලය තුළ ක්‍රමක්ෂයට පත් කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට පත්වනු ඇති බවට පෙන්නුම් කෙරෙන විට හානිවූ ලෙස තක්සේරු කරනු ලැබේ. පරිමිත ඵලදායි ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය අවධිය හා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, අවම වශයෙන්, වාර්තා කරනු ලබන සෑම කාල පරිච්ඡේදයකම අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ඵලදායි ආයුකාලය හෝ වත්කමේ අපේක්ෂිත අනාගත ආර්ථික වාසි, පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාවන්ගෙන් ඇතිවන වෙනස්කම්, ක්‍රමක්ෂය සිදුවන අවධිය හෝ ක්‍රමය, යෝග්‍ය වෙනස්කම් කරමින් සිදු කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කෙරෙන වෙනස්කම් ලෙස සළකනු ලැබේ. පරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කාර්යය සමග සංගත වන වියදම් ප්‍රභේදය, ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. අසීමිත ඵලදායි ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකරන නමුත්, වෙන වෙනම හෝ මුදල් උපදවන ඒකක මට්ටමින් හෝ හානි සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතී දැයි තීරණය කර බැලීමට, අසීමිත ජීවිත කාලය කත්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙයි. එසේ නොවන්නේ නම් අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා ඵලදායි ජීවිතයේ වෙනස්වීම අනාගතය සඳහා බලපවත්නා පරිදි සිදුකෙරේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් හට ගන්නා ලාභය හෝ පාඩු, බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ මුදල සහ වත්කම්වල ධාරණ වටිනාකමත් අතර වෙනසින් ගණනය කෙරේ.වත්කම් පොත්පත්වලින් ඉවත් කරන විට එම ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### 2.2.10 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම හා පසුකාලින මිනුම්කරණය

### 2.2.10.1 මූල්‍යමය වත්කම්

### අ) මූලික හඳුනාගැනීම ලංකා ගිණුම් ප්‍රමිතිකරණ

අංක 39 යේ විෂයක් ක්ෂේත්‍රය අනුව මූල්‍යමය වත්කම් ලාභ හෝ අලාභ, ණය හා හා අයවිය යුතු මුදල්, කල්පිරීම් තෙක් රඳවාගෙන තිබෙන ආයෝජන හා අලෙවි කළ හැකි මූල්‍ය වත්කම් තුළින් සාධාරණ අගය මත උචිත පරිදි වර්ගකරනු ලබන අතර, මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම්වල වර්ග තීරණය කරනු ලැබේ. ලාභ හෝ අලාභ මගින් සාධරණ අගය මත සටහන් වන මූල්‍ය වත්කම් හැර සියලුම මූල්‍යමය වත්කම් මුලදී හඳුනාගනු ලබන්නේ ගනුදෙනුවට අදාළ පිරිවැය එකතු කළ සාධාරණ අගය මතය. මූල්‍ය වත්කම්වලට මුදල්, කෙටිකාලීන තැන්පතු, වෙළඳ හා වෙනත් අයවිය යුතු මුදල්, ණය හා වෙනත් අයවිය යුතු මුදල් හා ප්‍රකාශිත හා අප්‍රකාශිත මූල්‍ය උපකරණ අයත්වේ.

### ආ) පසුකාලින මිනුම්කරණය.

මූල්‍යමය වත්කම්වල පසුකාලින මිනුම්කරණය රඳා පවතිනුයේ පහත දැක්වෙන ඒවායේ වර්ග අනුවය.

**ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්.** ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්වලට, ගනුදෙනු කිරීම් පිණිස රඳවාගත් මූල්‍යමය වත්කම් හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූලිකව හඳුනාගැනීමෙන් පසු නම් කළ මූල්‍ය වත්කම් ඇතුලත්ය. සමීප කාලීනව අලෙවි කිරීමේ හෝ නැවත මිලදී ගැනීමේ කාර්යයන් සඳහා ඒවා අත්පත් කරගෙන තිබේනම්, අදාල මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීම් පිණිස රඳවාගත් ඒවා ලෙස වර්ග කරනු ලැබේ. ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශවල සඳහන් වනුයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනු ලබන සාධාරණ අගයේ වෙනස්වීම් සහිතව සාධාරණ අගය මතය. ගෙවීම් ලබාගැනීමට සමූහයට තිබෙන අයිතිය ස්ථිරවූ පසු ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්වල ලාභාංශ ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**ණය හා අයවිය යුතු මුදල්.** ණය හා අයවිය යුතු මුදල් යනු සක්‍රිය වෙළඳපලක ප්‍රකාශිත නොවන ස්ථිර හෝ තීරණය කරන ලද ගෙවීම් සහිත නිර්ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්ය. මූලික මාපනයෙන් පසු එවන් මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂය කළ පිරිවැය මත හානිකරණය අඩුකර සඵල පොලී අනුපාතය අනුව මනිනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත්කර ගැනීමට අදාල කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් හා සඵල පොලී අනුපාතයේ අන්තර්ගත කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුළත්ය. හානිකරණය තුලින් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

### අලෙවිකල හැකි මූල්‍ය ආයෝජන.

ස්කන්ධ හා ණය සුරැකුම්පත් අලෙවි කළ හැකි මූල්‍ය ආයොජනවලට ඇතුලත්ය. අලෙවි කළ හැකි වශයෙන් වර්ග කර තිබෙන්නේ ගනුදෙනු කිරීම පිණිස රඳවාගෙන නොමැති හෝ ලාභ හෝ අලාභ මගින් සාධරණ අගයක් මත නම් නොකළ ඒවාය. මෙම ප්‍රවර්ගයේ ණය සුරැකුම්පත් යනු අසීමිත කාලසීමාවකට රඳවා තබාගැනීමට අපේක්ෂිත හා ද්‍රවශීලත්වයේ අවශ්‍යතාවලට ප්‍රතිචාරයක් වශයෙන් හෝ වෙළඳපල තත්වයන්ට ප්‍රතිචාර වශෙයන් අලෙවි කිරීමට ඉඩ ඇති ඒවාය.

මූලික මූලික මිනුම්කරණයෙන් පසු, අලෙවි කළ හැකි මූල්‍ය ආයෝජන පසුකාලීනව මිනුම්කරණය කරනු ලබන්නේ උපලබ්ධි නොවූ ලාභ/අලාභ සමග සාධාරණ අගයට වන අතර එය පොත්වලින් ඉවත් කරන තෙක් වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස විකිණීම සඳහා පවත්නා සංචිතයේ තබා ගනියි. මෙසේ කරනුයේ හදුනාගත් ආයෝජනය පොත්පත් වලින් ඉවත්කරන තෙක් වන අතර, ඒ වන විට සමුච්චිත ලාභය හෝ පාඩුව වෙනත් මෙහෙයුම් ආදායම්වල හඳුනාගෙන හෝ හානිකරණය කිරීමට නිශ්චය කර තිබෙනු ඇත. මේ වන විට සමුච්චිත පාඩුව මූල්‍ය පිරිවැය අනුව ආදායම් ප්‍රකාශයේ නැවත වර්ගකර සඳහන්ව සහ අලෙවිකල හැකි සංචිතයෙන් ඉවත් කරනු ඇත. අලෙවි කල හැකි ණය සුරැකුම්පත්වල පොලී ආදායම ගණනය කරනු ලබන්නේ සඵල පොලී අනුපාත ක්‍රමය යෙදාගෙන වන අතර, ලාභයේදී හෝ පාඩුවේදී හඳුනාගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

නුදුරු අනාගතයේදී ඒවා අලෙවිකිරීම ඒ වනවිටත් උචිතදැයි නිශ්චය කිරීම පිණිස අලෙවිකල හැකි සිය මූල්‍ය වත්කම් සමූහය විසින් අගැයුම් කරනු ලැබේ. සමූහයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වනුයේ, අක්‍රීය වෙළඳපල හා එසේ කිරීම සඳහා වන කළමනාකරණයේ අදහස සැලකිය හැකි ලෙස වෙනස් විය හැකි නිසාය. එවිට ඇතැම් අවස්ථාවන්හිදී සමූහය මෙම වත්කම් නැවත වර්ගීකරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම්, ණය හා අයවිය යුතු මුදල් යන නිර්වචනයට ගැලපෙන විට සහ නුදුරු අනාගතය හෝ කල්පිරීම් තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට සමූහයට අභිප්‍රාය හා හැකියාව ඇත්නම් ණය හා අයවිය යුතු මුදල් නැවත වර්ග කිරීමට අනුමැතිය තිබේ. ඒ අනුව මූල්‍ය වත්කම රඳවා ගැනීමට ආයතනයට අභිප්‍රාය හා හැකියාව තිබේ නම් පමණක් කල්පිරීම දක්වා රඳවා ගැනීමේ වර්ගයට නැවත වර්ග කිරීම අනුමත කළ හැක.

අලෙවි කළ හැකි වර්ගයක් වෙතින් නැවත වර්ග කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් පූර්ව ලාභයක් හෝ පාඩුවක් ඇත්නම් එය ස්කන්ධය තුල හඳුනා ගන්නා ලද අතර සඵල පොලී අනුපාතය යොදාගෙන ආයෝජනයේ ඉතිරි අයුකාලය ඔස්සේ එය ලාභයට හෝ පාඩුවට ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කල නව පිරිවැය හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර කිසියම් වෙනසක් තිබේ නම් සඵල පොලී අනුපාතය යොදාගෙන වත්කමේ ඉතිරි අයුකාලය ඔස්සේ එයද ක්‍රමක්ෂය කරනු ලැබේ. වත්කම පසුකලක හානිකරණය කිරීමට නියමිත නම්, එවිට ස්කන්ධයේ සටහන්වී තිබෙන ගණන ආදායම් ප්‍රකාශයට නැවත වර්ග කරනු ඇත.

**කල්පිරීම තෙක් රඳවා ඇති ආයෝජන**

කල්පිරීම් තෙක් ඒවා රඳවා ගැනීම පිණිස සමූහයට නියත අභිප්‍රාය හා හැකියාව ඇත්නම් ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත නිර්ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් කල්පිරීම තෙක් රඳවා ගැනීම් වශයෙන් වර්ග කරනු ලැබේ. මූලික මිණුම් කිරීමෙන් පසු කල් පිරීම් තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ක්‍රමක්ෂය කල පිරිවැය මත හානිකරණය අඩුකර සඵල පොලී අනුපාතය අනුව මිණුම් කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට අදාල කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් හා සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුලත්ය. හානිකරණය තුලින් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගැනේ.

**ඇ) හඳුනාගත් වත්කම් පොත්පත් වලින් ඉවත් කිරීම**

හඳුනාගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත්පත් වලින් ඉවත්කිරීම සිදුවනුයේ පහත අවස්ථාවලදීයද

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතිය ඉකුත්වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පැවරීම හෝ ලැබී තිබෙන මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව, පරික්‍රමණ, (pass-through) වැඩපිළිවෙලක් යටතේ තෙවන පාර්ශ්වයකට සම්පූර්ණයෙන්ම ගෙවීමට බැඳියාවක් භාරගෙන තිබීම සහ පහත දෙකෙන් එකක්ද

(අ) සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව මාරුකිරීම, හෝ

(ආ) සමූහය විසින් වත්කම් සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව මාරුකර නොමැතිව හෝ එවා සාරානුකූලව රඳවාගෙන නොමැතිව වත්කම් පාලනය මාරුකිරීම.

වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පවරා ඇත්නම් හෝ, පරික්‍රමණ, (pass-through) වැඩපිළිවෙලකට එළඹී ඇත්නම්, සහ සමූහය විසින් වත්කම් සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව මාරුකර හෝ රඳවා ගෙන නොමැතිනම්, වත්කම හඳුනා ගනු ලබන්නේ ඒ ගැන සමාගමේ තිබෙන අඛණ්ඩ සහභාගීත්වයේ විස්තාරය අනුවය. එවන් අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරුකරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව මනිනු ලබන්නේ, සමූහය විසින් රඳවාගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් පිළිබිඹු වන ආකාරයටය.

මාරු කරන ලද වත්කම සම්බන්ධයෙන්වූ ඇප සහතිකයක ස්වරූපය ගන්නාවූ අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමේ මුල් ඉදිරියට ගෙනයන මුදලත් සමූහයට ගෙවීමට නියමිත වියහැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

**2.2.10.1.1 මූල්‍ය වත්කම් හානිකරණය**

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේදැයි වාර්තා කරන සෑම දිනකම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට සලකනු ලබන්නේ, වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසු හටගත් සිදුවීම් එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් වශයෙන් (දරා තිබෙන පාඩු සිද්ධියක්) වන අතර, එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවලට විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් කළවිටය. ණයකරුවා හෝ ණයකරුවන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පැහැර හැරීම් හෝ පොළී හෝ මුල් වාරික ගෙවීම පැහැර හැරීම් හෝ සුළු සුළු වැරදි සැලකිය යුතු පරිදි අත්විඳින බවට වූ ඇඟවීම්, ඔවුන් බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධානයකට එළෙඹීමේ සම්භාවිතාවය සහ ඇස්තමේන්තු ගත අනාගත මූල්‍ය ප්‍රවාහවල මැනිය හැකි අඩුවීමක් තිබෙන බව නිරීක්ෂිත දත්තවලින් පෙන්වීමද, (උදා. හිඟවීම්වල වෙනස් වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස් වීම් අතපසුවීම් සමග සහසම්බන්ධතාවයක් ඇතිබව) හානිකරණ සාක්ෂිවලට අයත් විය හැක.

**ක්‍රමක්ෂය කළ පිරිවැය මතවූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය කල පිරිවැය මත ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනි වශයෙන් ගත්කල වැදගත් වන මූල්‍ය වත්කම් තනි වශයෙන්ද තනි වශයෙන් ගත්කල වැදගත් නොවන මූල්‍ය වත්කම් සාමූහිකවද හානිකරණය වීමේ වාස්තවික සාක්ෂි

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 2012 දෙසැම්බර් 31 දිනට

තිබේදැයි සමූහය විසින් මුලින්ම තක්සේරු කරනු ලැබේ. තනි වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වැදගත් වුවද නොවුවද හානිකරණය වීමේ වාස්තවික සාක්ෂි නොතිබෙන බව සමූහය විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, එම වත්කම සමාන ණය අවදානම් ගති ලක්ෂණ සහිත සමූහයකට ඇතුලත් වන අතර, හානිකරණය ගැන සාමූහිකව තක්සේරුවට ලක්වේ. හානිකරණය ගැන තනි වශයෙන් තක්සේරුවට භාජනය වන වත්කම්වල හානිකරණ අලාභයක් හඳුනා ගෙන තිබේ නම් හෝ හඳුනා ගැනීම දිගටම පවතී නම් ඒවා සාමූහික හානිකරණ තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.

හානිකරණ අලාභයක් සිදුවූ බවට වාස්තවික සාක්ෂි තිබේ නම්, අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙන යන ගණන හා ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් වල වත්මන් අගය (තවමත් දරා නොමැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු හැර) අතරවූ වෙනස වශයෙනි. ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතය මත වට්ටම් කෙරේ. ණයකට විචල්‍ය පොලී අනුපාතයක් තිබේ නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම පිණිස යොදාගනු ලබන්නේ පවත්නා සඵල පොලී අනුපාතයයි.

දීමනා ගිණුමක් පාවිච්චි කිරීම නිසා වත්කමේ ඉදිරියට ගෙන යන මුදල් ප්‍රමාණය අඩුවන අතර, ආදායම් ප්‍රකාශයේ පාඩුවූ මුදල හඳුනා ගැනේ. අඩුවූ ඉදිරියට ගෙන යන මුදලට අදාලවූ පොලී ආදායම උපචිත කිරීම දිගටම කෙරෙනු අතර, හානිකරණ අලාභයක් මැනීම සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට යොදා ගන්නා පොලී අනුපාතය යොදාගනිමින් උපචිත කෙරේ. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් වශයෙන් ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ. අනාගතයේදී ආපසු ලබාගැනීමේ අවස්ථාවක තාත්වික පිරික්සුමක් නොමැති විට හා සියලු සමපාර්ශ්වීයයන් ලබාගෙන ඇත්නම් හෝ සමූහය වෙත මාරුකර ඇත්නම්, ආශ්‍රිත දීමනා ද සහිත ණය මුදල් කපා හරිනු ලැබේ. හානිකරණ අලාභ හඳුනා ගැනීමෙන් පසු, පසුකාලීන වර්ෂයකදී සිද්ධියක් ඇතිවීම නිසා හානිකරණ අලාභය වැඩිවේ නම් හෝ අඩුවේ නම්, දීමනා ගිණුමට ගැලපීම් කර පෙර හඳුනා ගත් හානිකරණ අලාභය නිවැරදි කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව ආපසු ලැබේ නම් මුදල් ප්‍රකාශනවල මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

**අලෙවි කිරීමට තිබෙන මූල්‍ය ආයෝජන**

අලෙවි කිරීමට තිබෙන මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන් ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂි තිබේදැයි වාර්තා කරන සෑම දිනකම සමූහය විසින් අගය කරනු ලබයි. ස්කන්ධ ආයෝජන, විකි,ම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස වර්ග කරන විට එම ආයෝජනයේ සාධාරණ අගයේ සැලකිය යුතු හා දීර්ඝ කාලීන අඩුවීමක් ඇති බවට වාස්තවික සාක්ෂි තිබිය යුතු අතර එය එහි පිරිවැයට වඩා අඩු වෙයි. ,වැදගත්කම, යන්න අගයනුයේ ආයෝජනයේ මුල් මිල පදනම්ව වන අතර, ,දීර්ඝ කාලය, ලෙස සැලකිල්ලට ගනුයේ, මුල් පිරිවැයට වඩා අඩු සාධාරණ අගයක් ඇති කාලයයි . හානිකරණය ගැන සාක්ෂි තිබෙන විට සමුච්චිත අලාභය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයත් වර්තමාන සාධාරණ අගයත් අතර වෙනසින් ආදායම් ප්‍රකාශය තුළ කලින් හඳුනා ගන්නා ලද ආයෝජන වල හානිකරණ ලාභ අඩු කිරීමෙනි. මෙය අනෙකුත් විස්තීර්ණ ආදායම් වලින් ඉවත් කර ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. ස්කන්ධ ආයෝජනවලට අදාළ පාඩු ආදායම් ප්‍රකාශය හරහා ප්‍රතිවර්ත කිරීමක් සිදු නොවේ. හානිකරණයවීමෙන් පසු ඒවායේ සාධාරණ අගය වෙනත් ව්‍යාප්ති ආදායම් යටතේ සෘජුව හඳුනා ගැනේ.

### 2.2.10.2 මූල්‍ය වගකීම්

අ) **මූලික හඳුනා ගැනීම හා මිනුම් කිරීම.** ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 යේ විෂය ක්ෂේත්‍රය ඇතුලත මූල්‍ය වගකීම් වර්ග කරනු ලබන්නේ ලාභ හා අලාභ, ණය ලබාගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් හෝ උචිත පරිදි සඵල ඉදිරි රැකුමක, ඉදිරි රැ කුම් උපකරණ ලෙස නම් කළ ව්‍යුත්පන්න ලෙසටය. සමූහය විසින් සිය මූල්‍ය වගකීම් වර්ග කිරීම නිශ්චය කරනු ලබන්නේ මූලික හඳුනා ගැනීමේදීය. සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය ලබා ගැනීම් හා වෙනත් මූල්‍ය බැඳීම් ඉදිරියට ගෙන යනුයේ ක්‍රමක්ෂය කළ පිරිවැය මතය. මෙයට සෘජු ආරෝප,ය ගනුදෙනු පිරිවැය ඇතුළත්ය. සමූහයේ මූල්‍ය බැඳීම්වලට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්, බැංකු අයිරා, ණය ලබාගැනීම් හා වෙනත් මූල්‍ය බැඳීම් අයත්ය.

ආ) **පසුකාලීන මිනුම්කරණය**
මූල්‍ය බැඳීම් මිනුම්කරණය රැඳී තිබෙනුයේ පහත දැක්වෙන වර්ග කිරීම් මතය.

**ණය ලබාගැනීම්**

මූලික හඳුනා ගැනීමෙන් පසු සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගෙන පොලිය සහිත ණය ලබාගැනීම් පසුකාලීනව මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කළ මිල මතය. ආදායම් ප්‍රකාශයේ ලාභ හඳුනා ගනු ලබන්නේ සඵල පොලී අනුපාත ක්‍රමය මතවූ ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේද බැඳීම් හඳුනා ගන්නා විටය. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේ සහ ගාස්තු හෝ පිරිවැය ට අදාළ සඵල පොලී අනුපාත ක්‍රමයේ වැදගත් කොටසක් වන කිසියම් වට්ටම් හෝ අධිමිල සැලකිල්ලට භාජනය කරමිනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ ඇතුලත්ය.

**හඳුනා ගත් මූල්‍ය වගකීම් පොත් පත් වලින් ඉවත්කිරීම**

අවසාන බැඳීමක හඳුනාගැනීම ඉවත්කරනු ලබන්නේ අදාල බැඳීම යටතේවූ වගකීම ඉටුවූ විට හෝ අවලංගුවූ විට හෝ එහි කල් ඉකුත්වූ විටය. පවත්නා මූල්‍ය බැඳීමක් සාරානුකූලව වෙනස් නියමයන් මත එම ණය දෙන්නාගෙන්ම ප්‍රතිස්ථාපනය වුවහොත් හෝ පවත්නා බැඳීම සාරානුකූලව වෙනස් වුවහොත්, එවැනි හුවමාරුවක් හෝ වෙනස් වීමක් මුල් බැඳීමේ හඳුනා ගැනීම ඉවත්කරනු ලැබීමක් හා නව හඳුනා ගැනීමක් වශයෙන් සලකනු ලබන අතර, ඉදිරියට ගෙනයනු ලබන වී වී ගණන්වල වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

**2.2.10.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ මුදල, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනුයේ, හඳුනාගත් ගණන් හිලව් කිරීමට දැනට බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබෙන විට හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කොට සමගාමීව බැඳියාවන් පියවීමට අභිප්‍රායක් තිබෙන විට හෝ පමණි.

**2.2.10.4 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

වාර්තා කරනු ලබන සෑම දිනකම සක්‍රීය වෙළඳපලේ ගනුදෙනු වන මූල්‍ය උපකරණවල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ගනුදෙනු පිරිවැය වෙනුවෙන් කිසිම අඩුකිරීමක් නොකර, ප්‍රකාශිත වෙළඳපල මිල ගණන්වලට හෝ ගනුදෙනුකරුවන්ගේ මිල කථනය පදනම්වය (දිගු කාලීන ඒවා සඳහා ලංසු ඉදිරිපත් කිරීම හා කෙටි කාලීන ඒවා සඳහා මිලක් ඉල්ලා සිටීම). සක්‍රීය වෙළඳපලක ගනුදෙනු නොවන මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ උචිත තක්සේරු ශිල්පක්‍රම යොදා ගනිමිනි. එවැනි ක්‍රමවේදවලට මෑත කාලීන අතේ දුරින් සිදුවන වෙළඳපල ගනුදෙනු, සාරානුකූලව එයම වන වෙනත් පත්‍රකයක පවත්නා සාධාරණ අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහ විග්‍රහයක් හෝ වෙනත් තක්සේරු ආකෘති අඩංගු විය හැක.

**2.2.10.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

වත්කමක් හානිකරණය වී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි, වාර්තා කරන සෑම දිනකම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය වූවිට, සමූහය විසින් වත්කමේ නැවත අය කරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක නැවත අයකරගත හැකි මුදල වනුයේ, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කර ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකින් වඩා වැඩි අගයටය. වෙනත් වත්කම් හෝ වත්කම් සමූහවලින් බොහෝ දුරට ස්වාධීනව එම වත්කම මුදල් ගලා ඒම් ජනනය වන්නේ නම් මිස එය අදාළ වනුයේ තනි වත්කමක් සඳහාය. වත්කමක ඉදිරියට ගෙන ගිය ගණන එහි නැවත අයකර ගතහැකි අගය අභිබවා යන්නේ නම්, එම වත්කම හානිකරණයවූවක් ලෙස සලකා එහි නැවත අයකර ගතහැකි අගය දක්වා අඩුකරනු ලැබේ. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව සහ වත්කමට සුවිශේෂී අවදානම් පිළිබිඹු වන, බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් උපයෝගී කරගෙන, ඇස්තමේන්තු කල අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ පවත්නා අගය දක්වා වට්ටම් කරනු ලැබේ.

පෙර ප්‍රත්‍යාගණනය කර, වෙනත් විස්තීර්ණ ආදායම්වලට ඇතුළත්ව ඇති ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇති වත්කම් හැර, අඛණ්ඩ මෙහෙයුම්වල හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශයේ වියදම් වර්ගීකරණ යටතේ හඳුනා ගනී. මෙම අවස්ථාවේදී කිසියම් පූර්ව ප්‍රත්‍යාගණනයක ගණන දක්වා වෙනත් විස්තීර්ණ ආදායම්වලට හානිකරණය හඳුනාගනු ලැබේ.

වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනා ගනු ලැබූ හානිකරණ අලාභ තවදුරටත් නොතිබෙන බවට හෝ අඩුවී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි වාර්තා කරන සෑම දිනකම තක්සේරුවක් කරනු ලබයි. එවැනි ඇඟවීමක් තිබේ නම් සමූහය විසින් නැවත අයකරගත යුතු මුදලේ ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. මෙයට පෙර හඳුනා ගෙන තිබූ හානිකරණ පාඩුවක් ප්‍රතිවර්තනය කරනුයේ නැවත අය කරගත හැකි අගය නිශ්චය කිරීමට යොදාගත් ඇස්තමේන්තුවල වෙනසක් තිබුනහොත් පමණි. පෙර වර්ෂවලදී වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනා ගෙන නොතිබුනි නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකර ගැනීමේ අගය අභිබවා නොයන තෙක් ප්‍රතිවර්තනය සීමාවේ. වත්කම් ප්‍රතිවර්තිත ගණනක් වශයෙන් ඉදිරියට ගෙන ගියහොත් ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ. ඒ හැර එවැනි ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

**2.2.11 ප්‍රතිපාදන**

අතීත සිද්ධියක් හේතුකොට ගෙන සමූහයට ප්‍රවර්තන බැඳීමක් තිබෙන විට (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) බැඳියාවන් ඉටුකිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායෑමේ සම්භාවිතාවයක් පවතී නම් සහ බැඳියාවට අදාල මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකිනම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. උදාහරණයක් වශයෙන් රක්ෂණ ගිවිසුමකට අදාළව වැනි, ප්‍රතිපාදනයේ මුළු මුදලම හෝ ඉන් කොටසක් ප්‍රතිපූරණය වීම සමූහය විසින් අපේක්ෂා කරනු ලැබුවහොත් ප්‍රතිපූරණය වෙනමවූ වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ. එසේ කරනුයේ ප්‍රතිපූරණය ලැබීම ඇත්ත වශයෙන්ම නියත නම් පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වූ වියදම්, ආදායම් ප්‍රකාශයට ඉදිරිපත් කරනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයකින් තොරවය. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් නම්, මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිතවූ අවදානම පිළිබිඹු වන අයුරින් බදුගෙවීමට පෙර අනුපාතයක් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ. වට්ටම් කිරීම උපයෝගී කර ගැනීමේදී කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ..

**2.2.12 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්**

**අ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මෙන් විග්‍රහ වනුයේ සාමාන්‍යයෙන් සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ කීපයක් මුල් කරගත්, විශ්‍රාම යනවිට සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභීය මුදලකි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මට 1983 අංක 12 දරණ පනත යටතේ සලසා තිබෙන පාරිතෝෂිකය අතුලත්ය.

පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභවල වත්මන් අගය සමූහය විසින් මනිනු ලබන අතර, එය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) මත පාදකවූ ආයුගණක තක්සේරු ක්‍රමවේදය භාවිතා කර ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයුගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාලව

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනාගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා මුදල් බාහිරව ලබා ගනු නොලැබේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාවන් යටතේ වර්ග කරනු ලැබේ.

**ආ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳියාව.**

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මෙන් විග්‍රහ වනුයේ සාමාන්‍යයෙන් සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ කීපයක් මුල් කරගත් විශ්‍රාම යනවිට සේවකයෙකුට ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභීය මුදලකි.

කාල පරිච්ඡේදය අවසානයේදී අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාවේ වර්තමානයේ අගයෙන් සැලසුම් කළ වත්කම්වල සාධාරණ අගය අඩු කරයි. මෙහිදී හඳුනා නොගන්නා ලද අතීත සේවක පිරිවැයටද ගැලපුම් කරයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාව ස්වාධීන ආයුගණකයින් විසින් වාර්ෂිකව ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර ගනිමිනි.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාවේ වත්මන් අගය නිශ්චය කරනු ලබන්නේ, ශ්‍රී ලංකාවේ උසස් තත්වයේ බලවත් සංයුක්ත පිලිනපත් වෙළඳපලක් නොමැති නිසා රජයේ පිලිනපත්වල පොලී අනුපාත යොදා ගනිමින් අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරමිනි. රජයේ පිලිනපත් නාමනය කෙරෙනුයේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයෙන් වන අතර, අදාළ විශ්‍රාම වැටුප්වල නියමයන්ට සමීපව කල්පිරිය යුතුවේ.

සේවා කාලය ගැලපුම් හා ආයුගණක උපකල්පිතවල වෙනස්වීම් තුලින් පැනනගින ආයුගණක ලාභ හා පාඩු ඒවා පැනනගින කාලසීමාව තුළ දී වෙනත් විස්තීර්ණ ආදායම්වල ස්කන්ධයට හර හෝ බැර කරනු ලැබේ.

නියම කළ කාලසීමාවක් තුළ පැවරීමේ කාලසීමාව සේවයේ රැඳී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මට කරන වෙනස්වීම් කොන්දේසිගත නම් මිස, අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශවල වහාම හඳුනාගනු ලැබේ. මේ අවස්ථාවේදී අතීත සේවා පිරිවැය පැවරීමේ කාලසීමාව මුළුල්ලේ සරල රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

**ඇ) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්ත භාරකාර අරමුදල**

අදාල නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලේ දායකත්වය හා සේවා නියුක්ත භාරකාර අරමුදෙල් දායකත්වය සේවකයින්ට හිමිය. ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට සේවකයින්ගේ දළ වැටුප්වලින් 15% ක දායකත්වයක් සපයන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුප්වලින් අනුපිලිවෙලින් 12% හා 3% බැගින් සමූහය විසින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ත භාරකාර අරමුදලට දායකවනු ලැබේ.

**2.2.13 ස්වයං රක්ෂණ සංචිතය**

සෑම වසරකම වසර අවසානයේදී ලංවිම විසින් ස්ථාවර වත්කම්වල දළ ප්‍රත්‍යාගණනය කළ අගයෙන් 0.1% ක් ස්වයං රක්ෂණ සංචිතයකට මාරුකරනු ලබයි. දේපල හා යන්ත්‍රෝපකරණ වල

පාඩු හා හානි මෙම රක්ෂණ සංචිතෙයන් අය කරනු ලැබේ. මෙම කාර්යය සඳහා අරමුදල් බැංකුවක ආයෝජනය කර තිබෙන වෙනම ගිණුමකින් සපිරේ.

**2.2.14 විලම්බිත ආදායම්**

**අ) පාරිභෝගික දායකත්වය මණ්ඩලය**

ලංවිම නව සේවා සම්බන්ධතා සඳහා පාරිභෝගික දායක මුදල් 1996 සිට ප්‍රාග්ධන සංචිතයක් වශයෙන් සලකන ලදී. ලංවිම දායක මුදල් විලම්බිත කොට ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කරනු ලබන අතර, අදාල වත්කම් ක්ෂය කිරීමේ කාලය වනුයේ වසර 35 කට අධික කාලයකි.

**සීමාසහිත ලංකා විදුලිබල (පුද්) සමාගම.**
නව සේවා සම්බන්ධතා සවිකිරීම පිණිසවූ වත්කම්වල පිරිවැය ඉසිලීම සඳහා පාරිභෝගිකයින් විසින් ගෙවා ඇති දායක මුදල් විලම්බිත බැඳියාවන් ලෙස හඳුනා ගැනේ. නව සේවා සම්බන්ධතා වත්කම් 20 වසරක කාලයක් මුලුල්ලේ ක්ෂය කරනු ලැබේ. අනුරූප පාරිභෝගික දායක මුදල් එවැනි 20 වසරක කාලසීමාවක් මුළුල්ලේ 2008 දෙසැම්බර් මස 31 දින දක්වා ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කරනු ලැබේ. 2009 ජනවාරි මස 01 දින සිට පාරිභෝගික දායක මුදල් 08 වසරක කාලයක් මුළුල්ලේ ක්ෂය කරනු ලබන අතර, 2008 දෙසැම්බර් මස 31 දිනට පෙර පාරිභෝගික දායක මුදල් 20 වසරක කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

**ආ) රජයේ ආධාර මුදල්**

යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම පිණිස ලැබී ඇති රජයේ ආධාර විලම්බිත ආදායම් ලෙස සලකනු ලැබේ. සීතාවක කර්මාන්ත උද්‍යානයේ ස්ථාපිත කර තිබෙන ජාල උපපොළ හා සම්ප්‍රේෂණ මාර්ග සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද අගය 21.2 සටහනෙහි නියෝජනය කරනු ලබන අතර, එය ආදායම් ප්‍රවේශය මත පදනම්ව 35 වසරක කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබීමට නියමිතය.

**2.2.15 ආදායම් හඳුනා ගැනීම.** සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාවයේ ප්‍රමාණය මත හා ආදායම් සහ දරා තිබෙන ආශ්‍රිත වියදම් හෝ දැරීමට නියමිත වියදම් විශ්වාසනීය පරිදි මැනිය හැකි තාක් ආදායම් හඳුනා ගනු ලැබේ. ලැබී තිබෙන හෝ ලැබීමට නියමිත, ශුද්ධ වෙළඳ වට්ටම් හා විකිණුම් බදු රහිතවූ, ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදායම මැනීම කරනු ලැබේ. ලිත් වර්ෂය අවසානයේදී සීමාසහිත ලක්දනව් හා සීමාසහිත හෙලදනව් සමාගම්වල ආදායම් අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (Minimum Guaranteed Energy Amount)

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 2012 දෙසැම්බර් 31 දිනට

සඳහා ධාරිතා ගාස්තු වෙනුවෙන් ගලපනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා පහත දැක්වෙන විශේෂිත උපමානයන් භාවිතා කරනු ලැබේ.

**2.2.16**

**අ) සේවා පිරිනැමීම**

අයිතිය සමග සාමාන්‍යයෙන් සම්බන්ධිත මට්ටම දක්වා අඛණ්ඩ කළමනාකරණ සහභාගීත්වය හෝ විකුණන ලද භාණ්ඩ මත සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගෙන තිබියදී භාණ්ඩවල අයිතියට අදාල සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණයවූ පසු භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම් හඳුනා ගනු ලැබේ.

**ආ) භාණ්ඩ විකණිම**

අයිතිය සමග සාමාන්‍යයෙන් සම්බන්ධිත මට්ටම දක්වා අඛණ්ඩ කළමනාකරණ සහභාගීත්වයක් හෝ විකුණන ලද භාණ්ඩ මත සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගෙන තිබියදී භාණ්ඩවල අයිතියට අදාළ සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණයවූ පසු භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම් හඳුනා ගනු ලැබේ.

**ඇ) පොලිය**

එක්රැස් කිරීමේ හැකියාව සැක සහිත නැත්නම්, පොලිය උපචිත වන විට පොලී ආදායම් හඳුනා ගනු ලැබේ.

**ඈ) ලාභාංශ**

ගෙවීම් ලබාගැනීමට කොටස්කරුවන්ට තිබෙන අයිතිය ස්ථාපිත වූ පසු ලාභාංශ ආදායම් හඳුනා ගනු ලැබේ.

**ඉ) වෙනත්**

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනමක් මතය. දේපල, පිරියත උපකරණ හා ආයෝජන ඇතුලු ජංගම නොවන වෙනත් වත්කම් බැහැර කිරීම්වලට අදාළ ආදායම් ස්වභාවයක ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම් බැර කරනුයේ ධාරණ අගය හා අදාළ විකුණුම් වියදම් අඩු කළ පසුවය.ප්‍රත්‍යාග ණනය කරන ලද දේපල හා යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේදී, එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයේ ශේෂව තිබෙන ගණන සෘජුවම සමුච්චිත ලාභයට මාරුකරනු ලැබේ. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වලට අනුශාංගික ක්‍රියාකාරකම් තුළින් පැන නගින ලාභ හා අලාභය සහ ඒවයට සමාන ගනුදෙනු සමූහයකින් පැන නගින වැදගත් නොවන ඒවා එකතුකර, වාර්තා කර ශුද්ධ පදනමක් මත ඉදිරිපත් කරනු ලැබේ.

**2.3 වැදගත් ගිණුම්කරණ උපකල්පන, තීරණ හා ඇස්තමේන්තු.**

සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරනු ලබන වටිනාකම් ගැලපීම් කිරීම සඳහා ඇස්තමේන්තු වලට අමතරව කළමනාකරණ විනිශ්චයන් ද අවශ්‍ය වේ. තවදුරටත් අනාගතය සම්බන්ධ ප්‍රධාන උපකල්පන හා අවිනිශ්චිතතාවයන් පිලිබඳ ඇස්තමේන්තු කිරීමේ ප්‍රධාන ප්‍රභවයන් ශේෂ පත්‍ර දිනයේදී කළමනාකරණය සලකා බැලේ. එහිදී ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදාගන්නා නිසා, සැලකිය යුතු අවදානම් ඊළඟ වර්ෂය තුළ ඇතිවිය හැකි අතර, ඒවා පසුව සාකච්ඡා කෙරේ. ඉදිරියට ගෙනයන වත්කම් හා බැරකම්වලට විශේෂවූ ගණන් මූල්‍ය ප්‍රකාශ ගැනවූ අදාළ සටහන්වල සඳහන්ය. එම නිසා, ප්‍රධාන අයිතම පහත සාකච්ඡා කෙරේ.

**කල්බදු**

වත්කම් හෝ වත්කම්වල භාවිතය හෝ වත්කම් භාවිතයට ඇති අයිතිය පැවරීම මත කල්බද්ද කුමක්ද යන්න කල්බදු ගිවිසුම ආරම්භයේදී තීරණය කෙරේ. ඒ අනුව වත්කම්වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සියල්ලම සාරානුකූලව සමූහය විසින් මාරු නොකරන තාප බලාගාර යන්ත්‍රෝපකරණ වර්ග කරනු ලබන්නේ මෙහෙයුම් කල්බදු වශයෙනි. කල්බද්දක් මූල්‍ය කල්බද්දක්ද නැතහොත් මෙහෙයුම් කල්බද්දක්ද යන්න වර්ග කිරීමට නියමු වන තනි හෝ සංයුක්ත නිර්ණායක නිශ්චය කිරීමේදී සමූහය විසින් ප්‍රමාණාත්මක විනිශ්චයන් ගන්නා ලදී.

**මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශවල වාර්තා වී තිබෙන මූල්‍ය වත්කම්වල හා මූල්‍ය බැරකම්වල සාධාරණ අගය සක්‍රීය වෙළඳපල තුළින් ලබාගත නොහැකිවූ විට, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමයද ඇතුලු තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගය නිශ්චය කරනු ලැබේ. නිරීක්ෂණය කළ හැකි වෙළඳපල වලින් හැකි අවස්ථාවලදී මෙම ක්‍රම සඳහා ආදාන ලබාගන්නා අතර, මෙසේ කළ නොහැකි අවස්ථාවලදී සාධාරණ අගය ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍ය වේ. විනිශ්චයන් සිදුකිරීමේදී ද්‍රවශීලතාවය, අවදානම හා චංචල භාවය වැනි ආදාන ගැන සලකා බැලේ. මෙම සාධකවලට අදාල උපකල්පන ගැන වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තා කළ සාධාරණ අගයන්ට බලපෑමක් කළ හැක.

මූල්‍ය නොවන වත්කම්වලට හානිවීමෙන් වන පාඩු සමාලෝචනය වත්කම් හානිකරණය වී ඇත්දැයි සමූහය විසින් නිශ්චය කරනු ලබන්නේ සිදුවූ හානි පිළිබඳව සමාලෝචනයක් පැවැත්වීමෙනි. මේ සඳහා මුදල් ජනනය කරන ඒකකවල ,ප්‍රයෝජ්‍ය අගය, ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. ,ප්‍රයෝජ්‍ය අගය, ඇස්තමේන්තු කිරීම පිණිස මුදල් ජනනය කරන ඒකක වල අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ගැන ඇස්තමේන්තු කිරීමද, අදාල මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරාගැනීමද පාලන අධිකාරිය විසින් කරනු ලැබීම අවශ්‍ය වේ. මෙම තක්සේරුව හේතුකොට ගෙන, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාත පිලිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලැබීම අවශ්‍ය බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයෙන් යුක්තය.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 2012 දෙසැම්බර් 31 දිනට

### වෙළඳ හා වෙනත් අයවිය යුතු මුදල් හානිකරණයෙන් සිදුවන පාඩු

වාස්තවික සාක්ෂි ඇති පාඩු උපදවන සිද්ධීන් නිසා වෙන්කිරීමක් සිදු කිරීම අවශ්‍යදැයි තීරණය තීරණය කිරීමට, සමාන අවධානම් සහිත වත්කම් කාණ්ඩය තුළ තනි තනිව අගය කර ඇති සහ හානිකරණය නොවන බවට සොයා ගෙන ඇති වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සාමුහිකව අගය කරන ලදී. නමුත් මෙහි බලපෑමක් තවමත් දක්නට නොමැත. ලැබිය යුතු මුදල් පිලිබඳ වගකීම් සමූහයේ (portfolio) දත්තවල (හිඟ මුදල්වල මට්ටම්, ණය මුදල් උපයෝගී කරගැනීම් යනාදිය) සහ අවදානම් ඒකරාශීවීම සහ ආර්ථික දත්තවල (විරැකියා මට්ටම්, දේපල මිල දර්ශක, රට තුළ අවදානම සහ විවිධ තනි කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය යනාදිය ඇතුලු) බලපෑම් ගැන තිරණ සාමූහික තක්සේරුව සැලකිල්ලට ගනු ලැබේ.

### අයබදු

ආදායම් බදු හා වැට් ඇතුලූ වෙනත් බදු ගෙවනු ලැබීමට සමූහය යටත්ය. බදු පැනවීමේ කාර්යය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සහ බදු ගෙවිය යුතු ලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මුදල් වර්තාකරණ ප්‍රමිති වලට අනුගත වීම පිණිස පිලිපැදිය යුතු බදු උපෙදස් මාලාව ලැබෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විචාර බුද්ධියක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශණ සකස් කරනු ලැබූ අවස්ථාවේදී බදු නීති උපයෝගී කරගැනීම අර්ථනිරූපනය කිරීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි. ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් අතිරේක බදු ගෙවීමට නියමිතද යන්න පදනම්ව සමූහය විසින් වත්කම් හා බැරකම් හඳුනා ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් අවසාන බදු ප්‍රතිඵලය මුලදී වාර්තා කරන ලද ගණන්වලට වෙනස්වන විට, එවැනි වෙනස්වීම් හේතුකොට ගෙන තීරණය ගන්නා ලද කාලසීමාවේ ආදායම්, විලම්බිත හා වෙනත් බදුවලට බලපෑමක් ඇතිවේ.

### දේපල, පිරියත හා උපකරණවල ඵලදායි ආයුකාලය

වාර්තා කරන සෑම දිනයකදීම සමූහය විසින් වත්කම්වල අවශේෂ අගයයන්, ඵලදායි ආයුකාල හා ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරනු ලබයි. මෙම අගයන්, අනුපාතයන් හා ක්‍රම නිර්ණය කිරීමේදී පාලන අධිකාරිය විසින් ඔවුන්ගේ විනිශ්චයන් යොදාගනු ලැබේ.

### නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්-පාරිතෝෂිකය

අර්ථ විග්‍රහ කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික පිරිවැය නිශ්චය කරනු ලබන්නේ ආයුගණක තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමිනි. ආයුගණක තක්සේරු ශිල්පක්‍රමවලට වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත සහ අනාගත වැටුප් වැඩිවීම් ගැන උපකල්පනවලට එළඹීම ඇතුළත්ය. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තෙමින්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයන්ට යටත්ය.

### 2.4 භාවිතය පිණිස නිකුත් කර තිබෙන නමුත් මෙතෙක් ක්‍රියාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම

2013 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව ඇරඹෙන මූල්‍ය කාලසීමාවන් සඳහා බලාත්මක වීම පිණිස ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් පහත දැක්වෙන ප්‍රමිතීන් නිකුත් කර තිබේ.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09, "මූල්‍ය උපකරණ"**

මෙතුළින් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්ග කිරීම, මැනීම හා හඳුනා ගැනීම ගැන සාකච්ඡා කෙරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 මූල්‍ය උපකරණ වර්ග කිරීම හා මැනීම අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යේ කොටස් වෙනුවට ඇතුළත් කරනු ලබයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 අනුව මූල්‍ය උපකරණ ප්‍රධාන මිනුම්කරණ ඒකක දෙකක වර්ග කරනු ලැබේ. ඒවානම්ද සාධාරණ අගය මත මනිනු ලබන ඒවා සහ ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන ඒවා ය.

අදාළ නිශ්චය කිරීම සිදුවනුයේ මූලික හඳුනා ගැනීමේදී ය. මූල්‍ය උපකරණ වර්ගකිරීම, මූල්‍ය උපකරණ කළමනාකරණය සඳහා වන ආකෘති සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගති ලක්ෂණ මත පදනම් වේ.

මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යේ බොහෝ අවශ්‍යතා මෙම ප්‍රමිතිය නියුක්ත කරනු ලබයි. ප්‍රධාන වෙනස්කම වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 27 හි ඇති අවශ්‍යතාවයන් සමඟ සසඳා පරිපාලකයෙකු සමග ඒකාබද්ධ වීමයි. මුලදී මෙම ප්‍රමිතිය 2014 ජනවාරි මස 01 දින හෝ එයට පසු ආරම්භ කරන වාර්ෂික කාලසීමාවන් සඳහා අදාළ විය.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 31 - බද්ධ ව්‍යාපාර** සඳහා වන ඇල්ම හා SIC - 13 ඒකාබද්ධ පරිපාලිත ආයතනයන්, ව්‍යවසායකයින්ගේ අනිවාර්ය නොවන දායකවීම් වෙනුවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 11, ,ඒකාබද්ධ ප්‍රතිඥානය, ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. අනුපාත ඒකාබද්ධ කිරීම භාවිතා කරමින් ඒකාබද්ධව පාලිත ආයතනයන්ට (JCEs) ගිණුම් තැබීමට ඉඩ දුන් විකල්පය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 11 තුළින් ඉවත් කර ඇත. ඒ වෙනුවට ඒකාබද්ධ ව්‍යවසායක් යන අර්ථකථනයට ගැලපෙන ඒකාබද්ධව පාලිත ආයතනයන් (JCEs) විසින් ගිණුම්කරණය කළ යුත්තේ ස්කන්ධ ක්‍රමය භාවිතා කරමිනි. මෙම ප්‍රමිතිය 2014 ජනවාරි මස 01 දින හෝ එයට පසු ආරම්භ කරන වාර්ෂික කාලසීමාවන් සඳහා අදාළවූ අතර, මූලික යෙදවීමේ දිනය වනවිට පැවතුන ඒකාබද්ධ ප්‍රතිඥාන සඳහා අතීතයට බලපාන අයුරින් යොදාගත යුතුයි.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 12, අනෙකුත් ආයතනයන්ට ඇති ඇල්ම හෙළිදරව් කිරීම.**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණයන්ට සම්බන්ධිතව මුලදී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 හි අඩංගු සියළුම අනාවරණය කිරීම් මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 31 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 28 අඩංගු වූ සියළුම අනාවරණය කිරීම් ද ශ්‍රී ලංකා මූල්‍ය

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

වාර්තාකරණ ප්‍රමිති 12 හි ඇතුළත් වේ. පර්පාලිත සමාගම්, බද්ධ ගිවිසුම්, ආශ්‍රිත වෙළඳ සමාගම් සහ ව්‍යුහගත ආයතනයන් (entity) සම්බන්ධයෙන් යම් ආයතනයක් (entity) දක්වන උනන්දුව, මෙම අනාවරණයන්ගෙන් විස්තර කෙරෙයි. නව අනාවරණය කිරීම් සංඛ්‍යාව ද අවශ්‍යවන නමුදු සමූහයේ මූල්‍ය තත්ත්වයන්ට හෝ ක්‍රියාකාරිත්වය කෙරෙහි එම අනාවරණය කිරීම් මගින් බලපෑමක් ඇති නොකෙරේ. ආරම්භයේදී මෙම ප්‍රමිතිය, 2014 ජනවාරි 1 දින හෝ එදිනෙන් පසු ආරම්භ වන කාලච්ඡේදයන් සඳහා අදාළ විණි.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13, සාධාරණ වටිනාකම අගැයීම.**

සාධාරණ අගය යන්නට ඉතා නිවැරදි අර්ථ කථනයක් ද සාධාරණ වටිනාකම අගැයීමට තනි මූලාශ්‍රයක් ද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හරහා යොදා ගැනීමට අනාවරණ අවශ්‍යතාවන් ද සලසාලමින්, සංගතතාව ඉහළ නංවාලීමට සහ සංකීර්ණත්වය පහත හෙළීමට මෙමගින් අරමුණු කෙරේ. කළමනාකරණය විසින් මෙම ප්‍රමිතියේ බලපෑම තවමත් නිශ්චය කරමින් පවතී. ආයතනය කෙරේ ද්‍රව්‍යාත්මක බලපෑමක් ඇති කරතැයි අපේක්ෂා කළ හැකි, තවමත් බලසහිත නොවන, වෙනත් ප්‍රමිතීන්, සංශෝධනයන් සහ අර්ථකථනයන් නොමැත.

### 2.5 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රථම වරට යොදා ගැනීම

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයන්, සමූහය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව සකස් කර ඇති ප්‍රථම මූල්‍ය වාර්තා කට්ටලය වේ. 2001 දෙසැම්බර් මස 31 දින දක්වා සහ එම කාලය ඇතුළු කාලච්ඡේදයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සමූහය විසින් එහි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරනු ලැබීය. මේ අනුව, 2012 දෙසැම්බර් 31 දින හෝ එදිනෙන් පසුව අවසන් වූ කාලච්ඡේදයන් සඳහා අදාළ වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පිළිපදිමින්, ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් විස්තර කර ඇති පරිදි, සංසන්දනාත්මක කාලය සඳහා අදාළ වන දත්ත සමග, 2011 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා, සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත. 2011 ජනවාරි මස 1 වන දිනට මූල්‍ය තත්ත්වය සහ 2011 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුලින් ප්‍රකාශයට පත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස්කරණ ලද ගිණුම් ප්‍රකාශ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාශනය නැවත ප්‍රකාශයට පත්කරමින් සමූහය විසින් සිදුකරන ලද ප්‍රධාන ගැලපුම් පිළිබඳව මෙම සටහන මගින් පැහැදිලි කෙරේ.

### 2.6 යොදාගත් විවර්ජනයන් (Exemptions Applied) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1

SLFRS 1 අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රථමවරට භාවිතා කරන්නන්ට ඇතැම් නිදහස් කිරීම් ලබාදී ඇති අතර අතීතයට බලපාන පරිදි ගැලපීම් කිරීමට අවශ්‍ය නොවීම ද ඒ අතර වෙයි.

31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රථම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී සමූහය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 යටතේ යොදාගන්නා ලද අදාළ නිදහස් කිරීම් හා ව්‍යතිරේකයන් පහත දක්වා ඇත.

**ලංකා විදුලිබල මණ්ඩලය**

**සම්පූර්ණයෙන්ම අතීතයට බලපාන පරිදි භාවිතයට ගැනීමෙන් නිදහස් කිරීම සහ නිදහස් කිරීම්**

ලංකා විදුලිබල මණ්ඩලය මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට මුල් වරට මාරුවීමේදී යොදාගන්නා ලද අදාළ නිදහස් කිරීම් හා ව්‍යතිරේකයන් පහත දක්වා ඇත.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලින් නිදහස්කිරීමේ විකල්පයන්**

පහත සඳහන් නිදහස් කිරීම් ලංකා විදුලි බල මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබීය.

(අ) කල්පිත පිරිවැය ලෙස සාධාරණ අගය හෝ ප්‍රත්‍යාගණනය

(ආ)සේවක ප්‍රතිලාභ

(ඇ)ණය ගැනීම් පිරිවැය

ලංකා විදුලිබල මණ්ඩලයට අදාල නොවන බැවින් අනෙකුත් විකල්ප ව්‍යතිරේකයන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් යොදා ගෙන නැත.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව අනිවාර්ය ව්‍යතිරේකයන්**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මුළුමනින්ම අතීතයට බලපාන පරිදි භාවිතා කිරීමෙන් පැන නගින සියළු නිදහස් කිරීම් ලංකා විදුලිබල මණ්ඩලයට අදාළ නොවේ.

**සමාගම් සමූහය භාවිතා කිරීමට තීරණය කර ඇති විකල්ප නිදහස් කිරීම්**

**සීමාසහිත ලංකා විදුලි පුද්ගලික සමාගම - ලෙකෝ**

**ව්‍යාපාර සංයෝජනයන්**

2011 ජනවාරි 1 දිනට පෙර අත්පත් කරගත් පර්පාලිත සමාගම් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 03 අදාළ නොවේ. මෙම නිදහස් කිරීමේ භාවිතයෙන් අදහස් කරනුයේ, ස්ථානීය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ හඳුනාගත යුතුව ඇති වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකම් අත්පත්කර ගන්නා දිනයේ ඒවායේ කල්පිත පිරිවැයයි. අත්කරගත් දිනෙන් පසු අගැයීම සිදුවනුයේ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුවය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ හඳුනාගැනීම පිණිස යෝග්‍යවන වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳව ආරම්භක මූල්‍ය තත්ව විස්තරයට ඇතුළත් නොවේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

**2012 දෙසැම්බර් 31 දිනට**

ප්‍රමිති හඳුනාගැනීමේ අවශ්‍යතාවන්හි ප්‍රතිඵලයක් ලෙස, කලින් හඳුනාගත් කුමන වටිනාකම් හෝ සමූහය හඳුනාගත්තේ හෝ බැහැර කළේ හෝ නැත.

### පරිපාලිත සමාගම්වල ආයෝජන

පරිපාලිත සමාගමක ආයෝජනයක් අගැයීමේ පදනම වනුයේ, පරිපාලිත සමාගමක වෙනම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක මූල්‍ය ප්‍රකාශනයන්හි කල්පිත පිරිවැයයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යටතේ කලින් පැවති ධාරණ වටිනාකම් එවැනි ආයෝජනයන්හි කල්පිත පිරිවැය ලෙස සමූහය විසින් 2011 ජනවාරි 1 වන දින යොදා ගෙන තිබිණි.

### කලින් හඳුනාගත් මූල්‍ය උපකරණයන්හි විස්තර

2011 ජනවාරි 1 වන දින වන විට අයිතිව තිබූ මිල නොකළ සම කොටස් අළෙවි ආයෝජනයන් සඳහා ලැබිය හැකි බව සමූහය විසින් නිශ්චය කර ඇත.

### අතීතයට බලපාන ලෙස සමූහය අයදුම් කර නැති ව්‍යතිරේකයන්

### ඇස්තමේන්තු

2011 ජනවාරි 1 සහ 2011 දෙසැම්බර් 31 දිනට ඇති ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව (ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යම් වෙනස්කම් වෙතොත් පිළිබිඹු වන සේ නිවැරදි කිරීමෙන් පසු) එම දින සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු හා අනුරූප වේ.

### හඳුනාගත් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පොත්පත්වලින් ඉවත් කිරීම

2011.01.01 දිනෙන් පසුව සිදුවූ ගනුදෙනු සඳහා LKAS 39 අනුව, හඳුනාගත් මූල්‍ය වත්කම් සහ වගකීම් පොත්පත් වලින් ඉවත් කිරීම සමූහය විසින් අනාගතයට බලපැවැත්වෙන පරිදි සිදු කරනු ලැබේ. එමනිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යටතේ 2011 ජනවාරි 1 දින සංක්‍රාන්ති දිනට කලින් සිදුවූ ගනුදෙනුවක් ලෙස හඳුනා නොගත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හෝ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව නැවත හඳුනාගනු ලැබ ඇත.

### පාලනය කළ නොහැකි පොලී (Non-controlling Interests)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 හි දැක්වෙන පහත සඳහන් අවශ්‍යතාවන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති කරා මාරුවූ දිනයේ සිට අනුගමනය කෙරේ. එමගින් ඌණ ශේෂයක් ඇතිවීමට ඉවහල් වේද යන්න සැළකිල්ලට නොගෙන, සමස්ථ විස්තීර්ණ ආදායම පාලනය කළ නොහැකි පොලීයට ආරෝපණය කිරීමට මව් සමාගමේ අයිතිය පිළිබඳ දක්වන උනන්දුව වෙනස්වීමෙන් සාමාන්‍ය කොටස් අයිතිය මාරුවන විට පාලනය අහිමිවීමක් සිදු නොවන බව සැලකීමට පරිපාලිත සමාගමක පාලනය ගිලිහෙන විට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 යොදවන ලදී.

### සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

### භාවිත නිදහස් කිරීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 01* ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රථම වරට අනුගමනය කිරීම, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රථම වරට අනුගමනය කරන්නන්ට ඇතැම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අතීතයට බලපාන ආකාරයෙන් භාවිතා කිරීමෙන් නිදහස් කිරීමට හා ව්‍යතිරේකයන් ඇති කිරීමට ඉඩ සලසයි. මිල නොකළ හිමිකම් උපකරණ, විකුණුම් සඳහා ඇති ආයෝජන ලෙසට 2011 ජනවාරි 1 දින සමූහය නම් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මාරු වන දිනයේදී, මූල්‍ය වත්කම් හා වගකීම් සාධාරණ මිලට ලාභ හෝ අලාභ හෝ විකිණීම සඳහා ඇති බවට හෝ නම් කිරීමට, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 මගින් සමූහයට අවසර ලබා දෙයි. මිල නොකළ සම කොටස් හිමිකම් උපකරණ විකි,ම සඳහා ඇතිබවට සමූහය නම් කරනු ලැබීය. මෙම නම් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 මගින් දක්වන පරිදි අතීතයට බලපාන පරිදි අගැයීමේ විධිවිධානයන් බලපවත්වයි. මූල්‍ය උපකරණ විකිණීමට තිබේ යනුවෙන් අතීතයට බලපාන පරිදි නම් කළ විට සාමාන්‍ය කොටස් වෙනම ප්‍රමාණයක සාධාරණ අගයේ සමුච්චිත වෙනස්වීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ආරම්භක ප්‍රකාශයෙහි සමූහය මගින් හඳුනා ගැනීම සහ ලාභයට හෝ පාඩුවට එම සාධරණ වටිනාකමේ වෙනස්වීම් වත්කම්වල ඊළග බැහැර කිරීමේදී හෝ අගය අඩු කිරීමේ දී මාරු කළ යුතුය.

සමූහය විසින් සැලසුමක කල්බද්දක් අඩංගුවේද යන්න නිවැරදිව තහවුරු කරමින් IFRIC 4 මගින් දක්වා ඇති පරිදි සංක්‍රාන්ති විධිවිධානයන් යොදාගෙන ඇති අතර සියලු සැකසුම් සංක්‍රාන්ති දිනට පැවති තත්ත්වයන් මත පදනම්ව අගැයීමට ලක්කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 හි දැක්වෙන පහත සඳහන් අවශ්‍යතාවන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සංක්‍රමණය වන දිනයේ සිට බලාපොරොත්තු විය හැකි ආකාරයෙන් අයදුම් කර ඇත.

- එමගින් ඌණ ශේෂයක් ඇතිවේද යන්න නොසළකා, සමස්ථ විස්තීර්ණ ආදායම පාලනය කළ නොහැකි පොලියට ආරෝපණය කිරීම
- මව් සමාගමේ අයිතිය පිළිබඳ දක්වන උනන්දුව වෙනස්වීමෙන් සාමාන්‍ය කොටස් අයිතිය මාරුවන විට පාලනය අහිමිවීමක් සිදු නොවන බව සැලකීමට
- පරිපාලිත සමාගමක පාලනය ගිලිහෙන විට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 අනුගමනය කිරීමට

### ඇස්තමේන්තු

2011 ජනවාරි 1 සහ 2011 දෙසැම්බර් 31 දිනට පැවති ඇස්තමේන්තු, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව එම දින සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු හා අනුරූප වේ. මෙම වටිනාකම් ඉදිරිපත් කිරීමට සමූහය යොදාගත් ඇස්තමේන්තු, ශ්‍රී

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

### 2012 දෙසැම්බර් 31 දිනට

ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව, 2011 ජනවාරි 1 වන දින, එනම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සංක්‍රමණය වූ දින සහ 2011 දෙසැම්බර් 31 වන දින පැවති තත්ත්වයන් පිළිබිඹු කරයි.

### 2.7 SLAS සහ SLFRS සංසන්දනය

SLFRS වලට අනුව සමාගමක් පිළියෙල කිරීමට අවශ්‍ය වනුයේ,

(අ) 2011 ජනවාරි 01 දිනට පෙර පැවති මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුව සහ SLFRS වලට අනුව ස්කන්ධය සංසන්දනය කිරීමේ ප්‍රකාශය

(ආ)2011 දෙසැම්බර් 31 වන දිනට පෙර පැවති මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුව සහ SLFRS වලට අනුව ස්කන්ධය සංසන්දනය කිරීමේ ප්‍රකාශය

(ඇ)2011 දෙසැම්බර් 31 න් දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා SLAS සහ SLFRS/LKAS වලට අනුව ලාභ හා අලාභ සංසන්දනය කිරීම

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 2012 දෙසැම්බර් 31 දිනට

**(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ප්‍රථමවරට අනුගමනය කිරීම.**

**2.7 (a) 2011 ජනවාරි 01 දිනට ස්කන්ධය සමූහ සැසඳීමට භාජන කිරීම (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් වලට අනුගත වූ දිනය)**

| | 2010/12/31 ප්‍රකාශිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව | නැවත වර්ග කිරීම 2011/1/1 | නැවත ඇගයීම | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුව. |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ඇගයීමේ දී දේපල, පිරියත හා උපකරණ | 502,995,637 | - | 3,750,446 | 506,746,081 |
| අස්පෘශ්‍ය වත්කම් | 1,915 | - | 23,833 | 25,748 |
| පරිපාලන ණය ගැනීම් | 570,000 | (570,000) | - | - |
| වෙනත් ආයෝජන | 3,814,514 | (4,920,046) | 1,105,532 | - |
| විලම්බිත බදු වත්කම් | 4,712 | (4,712) | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | - | 5,510,688 | - | 5,510,688 |
| රක්ෂණ සංචිතය ආයෝජනය | 3,710,485 | - | - | 3,710,485 |
| **සම්පූර්ණ ජංගම නොවන වත්කම්** | 511,097,263 | 15,930 | 4,879,811 | 515,993,001 |
| | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| භාණ්ඩ තොග | 18,645,058 | - | - | 18,645,058 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 93,437,410 | (4,020,460) | (148,404) | 89,268,547 |
| ආශ්‍රිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල | - | - | - | |
| ආයෝජන - වෙනත් | 7,404,851 | (7,405,218) | 366 | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | - | 9,866,573 | 1,980 | 9,868,553 |
| ලැබිය යුතු බදු ආපසු ලැබීම | 470,672 | - | - | 470,672 |
| මුදල් සහ බැංකු ශේෂ | 3,078,053 | 1,538,463 | - | 4,616,516 |
| **සම්පූර්ණ ජංගම වත්කම්** | 123,036,045 | (20,642) | (146,057) | 122,869,346 |
| **සම්පූර්ණ වත්කම්** | 634,133,308 | (4,712) | 4,733,754 | 638,862,347 |
| | | | | |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධන සහ ස්කන්ධ** | | | | |
| දායක ප්‍රාග්ධනය | 83,311,423 | - | - | 83,311,423 |
| නිකුත් කළ ප්‍රාග්ධනය | - | - | - | - |
| සංචිත | 320,550,127 | - | (291,162,077) | 29,388,050 |
| රඳවාගත් ඉපැයුම් / අලාභ | (111,994,093) | - | 277,185,109 | 165,191,016 |
| | 291,867,457 | - | (13,976,967) | 277,890,489 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | 9,697,583 | - | 1,584,553 | 11,282,136 |
| **සම්පූර්ණ ස්කන්ධය** | 301,565,039 | - | (12,392,414) | 289,172,625 |
| | | | | |
| **ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම** | | | | |
| පොලී සහිත ණය දීම සහ ණය ගැනීම | 175,054,426 | - | - | 175,054,426 |
| පාරිභෝජක තැන්පතු | 7,543,940 | - | - | 7,543,940 |
| ප්‍රතිපාදන සහ වෙනත් විලම්බිත වගකීම් | 3,357,020 | (1,662) | 147 | 3,355,504 |
| විලම්බිත ආදායම | 47,081,838 | - | - | 47,081,838 |
| විලම්බිත බදු | 791,574 | (4,712.00) | 17,126,020 | 17,912,882 |
| **සම්පූර්ණ ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම** | 233,828,797 | (6,374) | 17,126,167 | 250,948,590 |
| | | | | |
| **ජංගම වගකීම්** | | | | |
ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) හා එහි පරිපාලිත සමාගම්වල 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 ජනවාරි 31 දින නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## විගණකාධිපති වාර්තාව

අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

### 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය - මණ්ඩලය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 දෙවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

පහත සඳහන් පරිපාලිත සමාගම් පිළිබඳ ලංකා විදුලිබල මණ්ඩලයේ අයිතිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

| සමාගමේ නම | එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට % | සෘජු අයිතිය සමූහය ලෙකෝ (පුද්ගලික) සමාගමට % | Interest to the CEB % |
|---|---|---|---|
| (i) පවන් දනව් (පුද්ගලික) සමාගම | 51 | - | 32 |
| (ii) නිවිඳු (පුද්ගලික) සමාගම | 48 | - | 30 |
| (iii) නිවිඳු අසුපිනෙල්ලා (පුද්ගලික) සමාගම | 48 | - | 48 |
| (iv) ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම) | - | 70 | 38.5 |

### 2.3 ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම්

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලගිප්‍ර) හා ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රීලංගිප්‍ර 2 - තොග** ද ප්‍රමිතියට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට තොග ගණනය කළ යුතු අතර තොගවල පිරිවැය පිළිවෙලින් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) හෝ බර තැබූ සාමාන්‍ය පිරිවැය සූත්‍රය යොදා ගනිමින් ගණනය කළ යුතුය. එහෙත් ප්‍රමිතියට පටහැනිව, මණ්ඩලය තම බෙදාහැරීම් කලාපවල ඇති තොග අගය කිරීම සඳහා සම්මත මිල යොදා ගෙන තිබුණි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුව, මිල උච්චාවචනයට යටත් තොග අගය කිරීම සඳහා ප්‍රමිත පිරිවැය යොදා ගැනීමට ඉඩදිය හැකි අතර එසේ නොමැති නම් තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට ගණනය කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පවත්නා තත්ත්වයට අනුව මිල ඉහළ යන නමුත් උච්චාවචනය නොවේ. මණ්ඩලය බොහෝ අවස්ථාවලදී තථ්‍ය ප්‍රමාණයට වඩා ඔවුන්ගේ සම්මත මිල අධි ඇස්තමේන්තුගත කර ඇති බව පැහැදිලි විය. උදාහරණයක් වශයෙන් 2012 වර්ෂයේදී ද්‍රව්‍ය මිල හා ශ්‍රම රේටයන් අධි ඇස්තමේන්තුගත කිරීමෙන් හඳුනාගත් ශුද්ධ ආදායම පිළිවෙලින් රු.මිලියන 1,647 (2011 - රු.මිලියන 2,920) ක් හා රු.මිලියන 1,034 (2011 - රු.මිලියන 803) ක් විය. එයට අමතරව ආදායම් ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබූ රු.මිලියන 1,574 (2011 - රු.මිලියන 1,255) ක මුදලක් පොදු කාර්ය පිරිවැය (භාවිතා කළ තථ්‍ය ශ්‍රම පැය සඳහා යොදා ගත් ප්‍රමිත රේටයට ගණනය කළ) ලෙස කාර්ය පිරිවැයට අයකර තිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට තොග, කෙරීගෙන යන වැඩ, නඩත්තු හා නිම කරන ලද කාර්ය පිළිබඳ සාධාරණ අගය නිරීක්ෂණය නොවීය.

(ii) මණ්ඩලය විසින් ඉදිකරන ලද වත්කම් අගය කිරීම සඳහා ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවලින් ඉදිකරන ලද සම්ප්‍රේෂණ රැහැන් (Transmission Line) හා සමහර බෙදාහැරීම් රැහැන් තථ්‍ය පිරිවැයට අගය කර තිබූ අතර වෙනත් කාර්යයන් එනම් සේවා ප්‍රධාන සම්බන්ධතා (Service Main Connection ) පද්ධති විශාලනය (System Augmentation) ඉරාන මූල්‍යයන ව්‍යාපෘතිවලින් සිදුකරන ලද කාර්යයන්, ගම නැගුම, විමධ්‍යගත අයවැය (Decentralized Budget ) ආදිය ප්‍රමිත පිරිවැයට අගය කර තිබුණි.

(ආ) **ශ්‍රීලංගිප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම**

ග්‍රාමීය විදුලි බල සැපයුම් වැඩ සටහන් ඇතුළත් විදුලි බල උත්පාදනය, හුවමාරු කිරීම හා බෙදාහැරීම් වැඩ සටහන් සඳහා මණ්ඩලය විසින් ලද විදේශ ආධාර සහ ප්‍රාග්ධන ප්‍රදාන දීර්ඝ කාලයක් දායක ප්‍රාග්ධනය ලෙස සලකා තිබුණි. එසේ වුවද මහා භාණ්ඩාගාරය විසින් එවැනි සමහර ප්‍රදාන, ප්‍රාග්ධන දායකය ලෙස සලකා නොතිබුණි. 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලය සඳහා මුළු ප්‍රාග්ධන දායකය රු.බිලියන 96 ක් වූ අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.බිලියන 110 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.බිලියන 14 ක රජයේ ප්‍රදාන වෙනස සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කරන ලද ගිණුම්කරණ ගැලපීම ප්‍රමිතිය සමඟ අනුකූලවී නොතිබුණි.

(ඇ) **ශ්‍රීලංමුවාප්‍ර 1 - ප්‍රථම වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදා ගැනීම** - සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් විෂයයන් සඳහා ගැලපීම් කර නොතිබුණි.

(අ) තොග හා වෙනත්
(ආ) සේවක ණයගැතියන්
(ඇ) බදුකර /දේපල පිරියත උපකරණ
(ඈ) රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනය
(ඉ) ගෙවිය යුතු වෙළඳ ශේෂ
(ඊ) සම්බන්ධිත පාර්ශ්වයන්ට ලැබිය යුතු මුදල
(උ) ගෙවිය යුතු වෙළඳ ශේෂ

(ඈ) **ශ්‍රීලංගිප්‍ර 24 - සම්බන්ධිත පාර්ශ්වයන් හෙළිදරව් කිරීම**

ශ්‍රීලංගිප්‍ර 24 හි අවශ්‍යතාවය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශ්වයන්හි සම්බන්ධතාවයේ ස්වභාවය මෙන්ම සම්බන්ධතාවය පිළිබඳ විය හැකි බලපෑම අවබෝධ කර ගැනීම සඳහා ගනුදෙනු සහ හිඟශේෂයන් පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු හෙළිදරව් කිරීම මගින් සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මණ්ඩලය සමඟ සම්බන්ධතාවය ඇති සමාගම් සමඟ වූ පහත සඳහන් කොන්ත්‍රාත් විගණනයේදී නිරීක්ෂණය විය.

(i) වවුනියා, කිලිනොච්චි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය - cdicne මූල්‍යයන ව්‍යාපෘතිය

(ii) සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය - wdine මූල්‍යයන ව්‍යාපෘතිය

(iii) සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ නැගෙනහිර පළාත් ව්‍යාපෘතිය - wdine මූල්‍යයන ව්‍යාපෘතිය (කොන්ත්‍රාත් මුදල රු.මිලියන 1,345 ක් විය)

(iv) උතුරු නැගෙනහිර විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය - wdine මූල්‍යයන ව්‍යාපෘතිය (කොන්ත්‍රාත් මුදල රු.මිලියන 425)

(v) ජාලක උප පොළ විශාලන ව්‍යාපෘතිය අදියර II - (Augmentation Grid Substation Project Phase II) wdine මූල්‍යයන ව්‍යාපෘතිය (කොන්ත්‍රාත් මුදල රු.මිලියන 1,815 කි)

(vi) ජාලක උප පොළ විශාලන ව්‍යාපෘතිය අදියර I - (Augmentation Grid Substation Project Phase I) ශ්‍රීලංර මූල්‍යයන ව්‍යාපෘතිය

(vii) ගාල්ල ජාලක උපපොළ - විශාලන හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය

(viii) පුනර්ජනනීය බලය ව්‍යාපෘතිය අන්තර්ග්‍රහණය කිරීම සඳහා ජාලක උප පොළ විශාලන ව්‍යාපෘතිය - සීතාවක, බලංගොඩ, බදුල්ල, නුවරඑළිය, උකුවෙළ ජාලක උපපොළවල් විශාලනය හා නව මහියංගන ජාලක උප පොළ ඉදිකිරීම (කොන්ත්‍රාත් මුදල රු.මිලියන 2,336 කි.)

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ ප්‍රතිපත්තියට පටහැනිව විශාල හානි හැර දේපල, පිරියත හා උපකරණවලට සිදුවූ හානි ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලට අයකර නොතිබූ අතර එම පාඩු හා හානි ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල්වලින් දරා තිබුණි. එබැවින් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි. එවැනි වියදම් රු.මිලියන 71 ක් 2012 වර්ෂයේදී රක්ෂණ අරමුදලින් දැරීමෙන් තොරව මණ්ඩලයේ අරමුදල්වලින් දරා තිබුණු බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. තවද, එම හානියෙන් මණ්ඩලයට සිදු වූ පාඩුව නිශ්චය කර නොතිබූ අතර, ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. එසේම එම පාඩු සෑපුවම ආදායමට එරෙහිව අයකිරීමේ ක්‍රමයක් අනුගමනය කිරීමේ හේතුවෙන් මණ්ඩලයේ දේපලවලට සිදුවන පාඩුව නිශ්චය කිරීමට විධිමත් වාර්තා ලබා ගැනීමට නොතිබුණි.

(ආ) ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදල ආරම්භයේ සිටම එම අරමුදලේ ආයෝජනයන්ගෙන් උපයන පොලී ආදායම එස්ක්‍රෝ අරමුදලේ ආදායමක් ලෙස සලකනු වෙනුවට මණ්ඩලයේ ආදායමක් ලෙස සලකා තිබුණි. කෙසේ වුවද, එම දෝෂය විගණනයේදී පෙන්වාදීමෙන් පසුව, 2011 වර්ෂයේ සිට එම දෝෂය නිවැරදි කර තිබුණද පෙර වර්ෂවල සිදුවී තිබූ දෝෂයන් සඳහා ගැලපීම් කර නොතිබුණි. මේ නිසා ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ශේෂය හා එහි ආයෝජන ශේෂය සැසඳිය නොහැකි විය. උදාහරණයක් ලෙස 2005 සිට 2010 වර්ෂය දක්වා වූ පසුගිය වර්ෂ හයක් සඳහා නොගැලපුණු ශේෂය රු.මිලියන 3,082 ක් විය.

(ඇ) 2010 / 2011 තක්සේරු වර්ෂයේදී අයකරගත් රඳවා ගැනීම් බදු රු.මිලියන 119 ක් අයකර ගත යුතු ලෙස අදාළ නොවන පරිදි දක්වා තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු ශේෂ හා පාඩුව පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) විශේෂ අවස්ථා සඳහා ආලෝකය සැපයීම සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 62 ක බැර ශේෂයක් වුවද අදාළ ලිපිගොනුවේ අනුරූපී වාර්තා පදනම් කර ගෙන විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව ලැබිය යුතු තථ්‍ය මුදල රු. මිලියන 14 ක් විය. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණයගැතියන් රු.මිලියන 76 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආරක්ෂක ආලෝකකරණය සැපයීම සම්බන්ධයෙන් විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.මිලියන 8 ක් වුවද අමාත්‍යාංශය විසින් පවත්වා තිබූ වාර්තා අනුව ලැබිය යුතු තථ්‍ය මුදල රු.මිලියන 6 ක් විය. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් රු.මිලියන 2 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2011 ජනවාරි 01 දිනට, 2011 දෙසැම්බර් 31 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ වාහනවල සාධාරණ අගය නිශ්චය කිරීම හා ඒවායේ ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අදාළ කමිටුවලට විධිමත් උපදෙස් හා මගපෙන්වීම් ලබාදී නොතිබූ බැවින්, වෙළඳපොළ වටිනාකම් නිශ්චය කිරීමේදී ඒකාකාරී ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන්, පරිපාලන මූලස්ථාන කමිටුව, වත්කම් කළමනාකරණ හා මධ්‍යගත සේවා සහ බෙදාහැරීම් කලාප 1 කමිටු විසින් 2011 ජනවාරි 01 දිනට වෙළඳපොළ වටිනාකම නිශ්චය කර ඉන්පසු මිලදී ගත් වාහනවල පිරිවැය එකතු කර තිබුණි. කෙසේ වුවද, අනෙකුත් අංශයන්හි ඇගයීම් කමිටු විසින් පළමුව 2012 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ අගයන් හා ඉන්පසු 2011 දෙසැම්බර් 31 දිනට හා 2011 ජනවාරි 01 දිනට වාහන වල වෙළඳපොළ අගයන් පිළිවෙලින් සියයට 6.7 කින් හා සියයට 7.6 කින් එම වෙළඳපොළ අගයන් වට්ටම් කිරීම් මගින් ගණනය කර තිබුණි.

(ii) ඉහත ප්‍රමාද දෝෂය (2011 වර්ෂයේ මෝටර් වාහනවල සාධාරණ අගය 2012 වර්ෂයේ වෙළඳපොළ අගය පදනම් කර ගෙන ගණනය කිරීම) හේතුවෙන් කමිටුව නිර්දේශ කරන ලද වෙළඳපොළ අගයන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වී නොතිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෝටර් වාහන ගිණුමේ ශේෂය රු.මිලියන 396 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) වාහන 63 ක් ධාවනයට නුසුදුසු වූ හෙයින් ඇගයීම් කමිටු විසින් ගර්හිත කර අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, එම වාහනවල අපහරණ වටිනාකම් නිශ්චය කර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාද බදු ගැලපීම් 2012 වර්ෂයේදී පළමුවරට අනුගමනය කර තිබූ අතර, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි 2012 ජනවාරි 01 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට පූර්ව මූල්‍ය ප්‍රකාශනවල නැවත දක්වා තිබුණි.

1982 සිට බදු වාර්තාවලට ඇතුළත් කර නොතිබූ වත්කම්වල මුළු වටිනාකම රු.මිලියන 43,894 ක් විය. එම ප්‍රමාද දෝෂය හේතුවෙන් බදු බැරකම නිශ්චය කිරීමේදී බදු ආදායමෙන් එම වත්කම්වල ප්‍රාග්ධන ඉඩහැරීමේ අදාළ කොටස අඩු කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. එම නිසා ප්‍රමාද බදු ගණනය කිරීමේදී රු.බිලියන 43,894 ක වත්කම් වටිනාකම ස්ථිර වෙනස්කම් ලෙස මණ්ඩලය සලකා තිබූ අතර ඉදිරියට ගෙන ආ බදු පාඩුව දළ වශයෙන් රු.බිලියන 12 කින් අඩුවෙන් දැක්වීමට එය හේතුවී තිබුණි. එම රු.බිලියන 12 අනාගත බදු බැරකමෙන් හිමිකම්පෑමට නොහැකිවීම නිසා අවසානයේදී එම දෝෂය මණ්ඩලයට පාඩුවක් බවට පත් විය.

(ඌ) දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් 2012 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 55 ක් හා රු.57 ක් වූ ලාභ, නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් යොදා ගැනීම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශනවලට කරන ලද සංශෝධනවලට අනුව නැවත ගලපා නොතිබුණි. අපහරණය කරන ලද වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් අඩුපාඩුවේ බලපෑම නිශ්චය කළ නොහැකි විය.

(එ) 2011 වර්ෂයේදී සිදුකරන ලද වාර්ෂික තොග සමීක්ෂණයේදී හානිවූ තොග ලෙස හඳුනාගත් රු.මිලියන 30 ක් වූ තොග විෂයයන් 2012 වර්ෂයේ සමීක්ෂණ කණ්ඩායම විසින් ගිණුම්වලට ගෙන නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග ශේෂය සහ චලනය නොවන, සෙමින් චලනය වන හා හානිවූ තොග සඳහා ප්‍රතිපාදන එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) 2012 වර්ෂයේදී බස්නාහිර පළාත දකුණ (බපද) 11 කාර්යාලය විසින් සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.මිලියන 18 ක් වූ ගෙවීම් 7 ක් අදාළ නොවන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණද 2012 දෙසැම්බර් 31 දිනට එම විෂයයන් ඔවුන් විසින් සපයා තිබුණි.

(ඔ) හම්බන්තොට ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හේතුවෙන් හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය රු.මිලියන 1,505 ක් වූ අධි බල (High Tension) හා අඩුබල (Low Tension) විදුලි රැහැන් ඉවත් කර තිබූ නමුත්, 2009 වර්ෂයේ සිට වාර්ෂික භෞතික සමීක්ෂණවලදී නැවත නැවත සඳහන් කර තිබුණද, කිසිඳු ගැලපීමක් සිදුකිරීමෙන් තොරව ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ හා ලෙජර ගිණුම්වල ඇතුළත් වී තිබුණි. මෙම ප්‍රමාද දෝෂ හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

තවද, එම අධි බල (HT) හා අඩු බල (LT) විදුලි රැහැන්වල පිරිවැය ලෙජර ගිණුම්වලින් ඉවත් නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රත්‍යාගණන සංචිතයට වන බලපෑම, ප්‍රත්‍යාගණිත ප්‍රමාණයන්, ඉවත් කළ දිනයන්, සුන්බුන් වටිනාකම වැනි අදාළ තොරතුරු නොමැතිවීම හේතුවෙන් විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඕ) පෙර වර්ෂවලදී දැනටමත් ප්‍රාග්ධනීත කරන ලද සීඩා (SIDA) ව්‍යාපෘතිය යටතේ බෙදා හැරීම් කලාප 4 හි ඉදි කරන ලද සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් රැහැන්වලට අදාළ රු.මිලියන 121 ක්වූ මිල විචලනය සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනීත කර තිබුණි. මෙම මිල විචලනය අදාළ වත්කම් ගිණුමට (අදාළ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන්) එකතු කිරීමෙන් තොරව ස්ථාවර වත්කම් ලේඛනයේ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන් යටතේ වෙනම විෂයයක් ලෙස දක්වා තිබුණි. තවද ඉහත නිවැරදි කිරීම් හේතුවෙන් වූ හානිකරණ බලපෑම තහවුරු කර නොතිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

### 2.3.3 නොසැසඳූ වෙනස්කම්

පහත දැක්වෙන නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය

(අ). මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි සමාගමෙන් (LECO) ලැබිය යුතු මුදල ලංකා විදුලි සමාගමේ (LECO) මූල්‍ය ප්‍රකාශන සමඟ සසඳා නොතිබුණි. එබැවින් එම මූල්‍ය ප්‍රකාශනයන් දෙක අතර රු.මිලියන 19 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ). ප්‍රධාන කාර්යාලයේ හා මණ්ඩලයේ උප අංශයන් අතර අන්තර් ජංගම ගිණුම් ශේෂයන් සැසඳී නොතිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.මිලියන 2 ක හා රු.මිලියන 269 ක ශුද්ධ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ එම ශේෂයන් අදාළ නොවන පරිදි දක්වා තිබුණි.

(ඇ). 2012 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ වලින් (WIP) දේපල, පිරියත හා උපකරණවලට මාරු කරන ලද නිම කරන ලද කාර්යයන් අතර රු. මිලියන 307 ක වෙනසක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද වත්කම් උපලේඛනය හා කෙරීගෙන යන වැඩ උප ලේඛනය අනුව නිරීක්ෂණය විය.

(ඈ). බෙදාහැරීම් කලාප 3 හි 2012 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ (WIP) ගිණුමෙන් මාරු කරන ලද නිම කරන ලද කාර්යයන්හි වටිනාකම හා කෙරීගෙන යන වැඩ වලින් දේපල, පිරියත හා උපකරණවලට මාරු කරන ලද කාර්යයන්හි වටිනාකම අතර රු.මිලියන 39 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ප්‍රාදේශීය අවිනිශ්චිත ගිණුමේ ශේෂය හා ප්‍රධාන අවිනිශ්චිත ගිණුමේ ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.මිලියන 16 ක් හා රු මිලියන 8 ක් විය. එම අවිනිශ්චිත ගිණුම් පිළිබඳව කාල විශ්ලේෂණයන් පිළියෙල කර නොතිබූ අතර එම අවිනිශ්චිත ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 ජනවාරි 24 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් උපදෙස් දී ඇති පරිදි පසු වර්ෂවලදී පැන නගින මණ්ඩලයේ බදු බැරකමකට එරෙහිව නිරවුල් කිරීමෙන් තොරව, රු.මිලියන 38 ක භාණ්ඩ හා සේවා බදු (GST) වැඩිපුර ගෙවීමක් 2002 ජනවාරි සිට අයකරගත යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) ලංකා විදුලි සමාගමේ බස්නාහිර පළාත දකුණ - II (බපද II) හි පහත සඳහන් හර හා බැර ශේෂයන්, 2012 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

| ශාඛාව | ගිණුම් අංකය | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන |
| නුගේගොඩ | 9742661/8 | (11) | |
| | 9742662/8 | 5 | |
| | 9742009/8 | (7) | (13) |
| කෝට්ටේ | 9742663/8 | (9) | |
| | 9742008/8 | 14 | |
| | FAC | 19 | 24 |
| එකතුව | | | 11 |

## විගණකාධිපති වාර්තාව

(ඈ) 2003 දෙසැම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සඳහා වු ජපන් බැංකුවෙන් (JABIC) SL-C 15 යටතේ වු රු.මිලියන 3,047 ක වැඩසටහන් ණය භාණ්ඩාගාරය මගින් ලැබිය යුතු ලෙස මණ්ඩලය විසින් ගිණුම්ගත කර තිබුණි. පසුව, 2006 දෙසැම්බර් 02 දිනැති අංක ටීඕ/ආර්ඊවී/එස්එල්/ 2/96 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන්, එම මුදල භාණ්ඩාගාරයට ලැබුණු වැඩ සටහන් ණයක් හෙයින් නිරවුල් කිරීමට සැලකිය නොහැකි බව මණ්ඩලයට දන්වා තිබුණි. එම මුදල 2003 වර්ෂයේදී ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබු අතර, අයකර ගැනීම පිළිබඳ තහවුරු කර ගැනීමෙන් තොරව එදින සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.

එම ලැබිය යුතු ශේෂය මණ්ඩලයේ ගිණුම්වලින් ලියාහැරීමට 2013 වර්ෂයේදී තීරණයක් ගෙන තිබුණද, ශ්‍රීලංගිප්‍ර 10 - වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු සිදුවීම්, යටතේ අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

### 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් කාර්යාලයට අයත් රු.මිලියන 38 ක් වටිනා ඉඩම් 12 ක හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බස්නාහිර පළාත දකුණ II (බපදII) ට අදාළ පහත සඳහන් කාර්යයන් වර්ෂයකට වැඩි කාලයක් සම්පූර්ණ නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| කාල විශ්ලේෂණය | කාර්යයන් සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන |
|---|---|---|
| වර්ෂ 1 සිට 2 දක්වා | 2,344 | 450 |
| වර්ෂ 2 සිට 3 දක්වා | 1,016 | 268 |
| වර්ෂ 3 සිට 4 දක්වා | 317 | 124 |
| වර්ෂ 4 සිට 5 දක්වා | 121 | 58 |
| වර්ෂ 5 ට වැඩි | 350 | 64 |
| **එකතුව** | **4,148** | **964** |

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට මාස 6 කට වැඩි කාලයකට පෙර මණ්ඩලයට ලැබී තිබුණු එකතුව රු.මිලියන 14 ක් වටිනාකම වු තොග විෂයයන් 7 ක් වර්ෂයේ අවසාන තොගයට ගෙන නොතිබු අතර එයට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු.මිලියන 128,240 ක් වටිනා ණය මුදල් හතරකට අදාළව මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම්වලට එළඹ නොතිබු අතර ඒ හේතුවෙන් ආපසු ගෙවීම් උපලේඛනය හා එම ණය සඳහා පොලිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත

(i) 47(1) (ආ) වගන්තිය - මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය ආපසු ගෙවීමට අදාළව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ නිදන් අරමුදලක් ස්ථාපනය කර පවත්වා ගත යුතුය. මූල්‍ය ප්‍රකාශනවල ණය නිදහස් කිරීමේ සංචිතයක් (Loan Redemption Reserve) දක්වා තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 17,447 ක් විය.

(ii) 47(2)(අ) වගන්තිය - මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද මෙම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කිරීම මගින් මණ්ඩලය එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයක් ඇති කර තිබූ අතර ඉන් පසු කිසිදුසංචලනයක් සිදුවී නොතිබුණි. එදිනට සමුච්චිතව පැවති රු.මිලියන 23 ක මුදල කිසිඳු සමාලෝචනයකින් තොරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iii) 47(2)(ආ) වගන්තිය - මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා හා මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා ආදායම් මුදල්වලින් ප්‍රාග්ධන වැඩ සඳහා මූල්‍යයනය කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ එක්ව පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ස්ථාපිත කර තිබූ නමුත් එය 2000 වර්ෂය සිට යාවත්කාලීන කර නොතිබුණි. එම සංචිත ගිණුමේ ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 165.446 ක් විය.

(ආ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනතේ 46 වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 කොටසේ 11(අ) හා (ආ) වගන්තිවල විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 දායකයක් පදනම් කර ගෙන 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,433 ක් වූ එහි අරමුදල් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ඊලඟ වැටුප් සංශෝධනයේ සිට උපයන විට ගෙවීම් බදු බැරකම එහි සේවකයන් වෙත මාරු කිරීම සඳහා 2007 දෙසැම්බර් 13 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය ඉක්මවා යමින් සේවකයන් විසින් දැරිය යුතු උපයන විට ගෙවීම් බදු මණ්ඩලය විසින් එහි සේවකයන් වෙනුවෙන් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය ඉක්මවා යමින් මණ්ඩලය විසින් ගෙවන ලද උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 981 ක් වූ අතර විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුදල<br>රු. |
|---|---|
| 2009 | 215,052,824 |
| 2010 | 362,275,677 |
| 2011 | 194,306,233 |
| 2012 | 269,762,012 |
| **එකතුව** | **981,396,746** |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු මිලියන 61,447 ක බදු වලට පෙර පාඩුවක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු මිලියන 20,185 ක් වූ බැවින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල රු මිලියන 41,262 කින් තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

එම පිරිහීම සඳහා ප්‍රධාන හේතූන් පහත දැක්වේ.

(අ) පහත විග්‍රහ කර ඇති පරිදි, 2011 වර්ෂයේ ගිවොපැ (Gwh) 4,619 ක් වූ ජල විදුලිබල උත්පාදනය ජල විදුලි බල ජලාශයන්හි අඩු ජල මට්ටම හේතුවෙන් 2012 වර්ෂයේදී ගිවොපැ (Gwh) 1,327 කින් එනම් සියයට 29 කින් පහත වැටී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේ ගිවොපැ (Gwh& 451 ක වැඩි වූ ඉල්ලුමට සරිලන පරිදි තාප විදුලි බලය ගිවොපැ (Gwh) 1552 කින් (ගිවොපැ 1,404 ක් ගල් අඟුරු යොදා ගනිමින් උත්පාදනය කර තිබුණි.) එනම් සියයට 23 කින් වැඩි කිරීමට සිදුවී තිබුණි.

# විගණකාධිපති වාර්තාව

**විදුලිබල උත්පාදන තොරතුරු**

| මූලාශ්‍රය | 2012 | 2011 | Change | |
|---|---|---|---|---|
| | ගි.වො.පැ | ගි.වො.පැ | ගි.වො.පැ | % |
| ජල විදුලි | 3,292 | 4,619 | -1,327 | 29 |
| තාප | 8,338 | 6,786 | 1,552 | 23 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලය | 171 | 125 | 46 | 37 |
| **එකතුව** | **1,801** | **11,530** | **271** | **02** |

මෙම සිදුවීම් හේතුවෙන් ඉන්ධන වලට සහ ස්වාධීන විදුලිබල සැපයුම්කරුවන්ගෙන් විදුලිබලය මිලදී ගැනීමට සිදුවීම නිසා මණ්ඩලයට විශාල වියදමක් දැරීමට සිදු විය. 2012 වර්ෂයේ මෙම කරුණු දෙක සඳහා දරන ලද පිරිවැය ඉහළයාම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.මිලියන 21,622 ක් හා රු මිලියන 36,120 ක් විය. එය මුළු පාඩුව වැඩිවීමට පිළිවෙලින් සියයට 52 කින් හා 87 කින් දායක වී තිබුණි.

(ආ) ඉල්ලුමේ සුළු වැඩිවීමක ප්‍රතිඵලයක් ලෙස රු මිලියන 31,052 ක අතිරේක ආදායමක් උපයා තිබුණද, ප්‍රධාන වශයෙන් පවත්නා ගාස්තු ව්‍යුහය හේතුවෙන් 2012 වර්ෂයේදී මණ්ඩලය පාඩු තත්ත්වයට ඇදී ගොස් තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් සිදු කරන ලද ජාතික දායකත්වය මිල කළ නොහැක.

**Composition of Loss - 2012**

| වර්ගය | ලාභය / පාඩුව | % |
|---|---|---|
| | රු මිලියන | |
| ගෘහස්ථ | (32,716) | (54) |
| ආගමික | (795) | (01) |
| සාමාන්‍ය ගාස්තු | 8,413 | 14 |
| කර්මාන්ත | (24,528) | (40) |
| හෝටල් | (771) | (01) |
| වීථි ආලෝකකරණය | (2,346) | (04) |
| ලෙකො (LECO) විකුණුම් | (8,420) | (14) |
| **එකතුව** | **(61,164)** | **100** |

ඒ අනුව, සාමාන්‍ය කටයුතු පාරිභෝගික වර්ගය හැර අන් සියළු පාරිභෝගිකයන් ලංකා විදුලි බල මණ්ඩලයේ පාඩුවට විවිධ ප්‍රතිශතයන්ගෙන් දායක වේ. ගෘහස්ථ හා කර්මාන්ත පාරිභෝගිකයන් පාඩුවට ඉහළම දායකත්වය සපයන අතර ඔවුන්ගේ එම මුළු දායකත්වය සියයට 94 කි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ විශේෂ තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| විෂයය | පෙර වර්ෂය ප්‍රවර්ථන වර්ෂය | පෙර වර්ෂය නැවත සඳහන් කරන ලද | පෙර වර්ෂයට වැඩි |
|---|---|---|---|
| | රු මිලියන | රු මිලියන | වෙනසෙහි ප්‍රතිශතය |
| ජංගම නොවන වත්කම් | 627,685 | 550,521 | 14 |
| ජංගම වත්කම් | 110,486 | 110,813 | (40) |
| මුළු වත්කම් | 738,171 | 661,334 | 12 |
| ජංගම බැරකම් | 137,356 | 122,026 | 13 |
| **කාරක ප්‍රාග්ධනය** | **(26,870)** | **(11,214)** | **140** |
| යෙද වූ මුළු ප්‍රාග්ධනය | 600,815 | 539,307 | 11 |
| ජංගම - නොවන බැරකම් | 407,585 | 281,843 | 45 |
| **හිමිකම්** | **193,230** | **257,464** | **(25)** |

## විගණකාධිපති වාර්තාව

ඒ අනුව, ජංගම නොවන වත්කම් රු බිලියන 77 කින් එනම් සියයට 14 කින් වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් සියයට 12 කින් ඉහළ ගොස් තිබුණි. මේ අතර පෙර වර්ෂයේ රු බිලියන 11 ක් වූ ශුද්ධ ජංගම වත්කම් සෘණ සංඛ්‍යාව 2012 වර්ෂයේදී රු බිලියන 27 ක සෘණ සංඛ්‍යාවක් වුයෙන් එය සියයට 140 ක වැඩි වීමක් විය. මෙම බිඳවැටීමට ප්‍රධාන වශයෙන් හේතු වුයේ දිගු කාලීන ණය ගැනීම්වල ප්‍රවර්ථන කොටස රු.බිලියන 30 කින් වැඩිවීම හා ස්වාධීන විදුලි බල සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ප්‍රමාණය රු බිලියන 14 කින් එනම් පෙර වර්ෂයේ රු බිලියන 15 ක වැඩිවීම සමග සැසඳීමේදී සියයට 93 කින් වැඩි වීමයි.

2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මුළු ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණයෙන් සියයට 68 ක්වූ රු බිලියන 600 ක් ණය අරමුදල් වලින් මූල්‍යයනය කර තිබූ අතර පෙර වර්ෂයේ එම ප්‍රමාණය සියයට 52 ක් විය.

ඉහත විශ්ලේෂණයට අනුව, 2012 වර්ෂයේදීත් මණ්ඩලය පෙර වර්ෂවලදී මුහුණ දුන් පරිදි ද්‍රව්‍යවල මූල්‍ය කළමනාකරණය නිරූපනය කෙරෙන බරපතල ද්‍රවශීලතා ගැටළුවලට මුහුණ දී ඇති බව අනාවරණය විය.

### 3.3 <u>මෙහෙයුම් සමාලෝචනය.</u>

### 3.3.1 <u>විදුලිබල උත්පාදනය.</u>

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ දෙකෙහි විදුලිබල උත්පාදනය පිළිබඳ විශ්ලේෂණයක් පහත වගුවෙන් දැක්වේ.

| **මූලාශ්‍රය** | **2012** | | **2011** | | **2010** | |
|---|---|---|---|---|---|---|
| | **ගි.වො.පැ** | **%** | **ගි.වො.පැ** | **%** | **ගි.වො.පැ** | **%** |
| ජල විදුලි | 3292 | 28 | 4619 | 40 | 5634 | 53 |
| තාප | 8338 | 71 | 6786 | 59 | 4994 | 47 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලය | 171 | 1 | 125 | 1 | 86 | 1 |
| **එකතුව** | **11,801** | **100** | **11,530** | **100** | **10,714** | **100** |

ඒ අනුව, පසුගිය වර්ෂ තුන තුළදී ජල විදුලිබල උත්පාදනය ක්‍රමයෙන් අඩු වී ඇති බව අනාවරණය වූ අතර රටෙහි අඛණ්ඩ විදුලි බල සැපයුම පවත්වා ගෙන යාම සඳහා තාප විදුලි බල උත්පාදනය කෙරෙහි යොමු වීම හැර වෙනත් විකල්පයක් මණ්ඩලයට නොවීය. කෙසේ වුවද ඉතා වැදගත් අරමුණු වලින් එකක් වූ සාමාන්‍ය මහජනතාවට අඩු පිරිවැයකට විදුලි බල ඒකකයක් සැපයීමේ අරමුණ සමාලෝචිත වර්ෂයේදීත් මණ්ඩලයට ඉටු කර ගත නොහැකි විය.

### 3.3.2. <u>සෘජු පිරිවැය විශ්ලේෂණය.</u>

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ විකුණුම් පිරිවැය පිළිබඳ සාරාංශයක් පෙර වර්ෂය සමඟ සසඳා පහත වගුවෙහි දැක්වේ.

| | **2012** | | **2011** | |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | **වියදම මුළු සෘජු පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස** | **රු.මිලියන** | **වියදම මුළු සෘජු පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස** |
| ඉන්ධන | 53,614 | 24 | 31,992 | 21 |
| විදුලි බල මිලදී ගැනීම් | 120,264 | 54 | 84,144 | 56 |
| මෙහෙයුම් හා නඩත්තු | 27,530 | 12 | 18,629 | 12 |
| ක්ෂය | 21,011 | 10 | 16,684 | 11 |
| **එකතුව** | **222,419** | **100** | **151,449** | **100** |

ඉහත තොරතුරු අනුව, මුළු පිරිවැයෙන් සියයට 70 කට වැඩි ප්‍රමාණයක් විදුලි බල මිලදී ගැනීම හා උත්පාදනය සඳහා සෘජුවම සම්බන්ධවන බව අනාවරණය විය.

### 3.3.3. ඒකක මිල විශ්ලේෂණය.

2010 වර්ෂයේදී ඉතා සුළු ලාභයක් ඉපයීම හැර පසු ගිය වර්ෂ පහ තුළදී එක් විදුලි ඒකකයක් විකිණීමෙන් සාමාන්‍ය පාඩුව පහත සඳහන් වගුවෙන් දැක්වේ.ඒ අනුව එක් ඒකකයට වාර්තා වූ ඉහළම පාඩුව 2012 වර්ෂයේදී වාර්තා විය.

| වර්ෂය | ඒකක මිල විශ්ලේෂණය<br>සාමාන්‍ය විකුණුම් මිල කි.වො. පැ 1 කට | සාමාන්‍ය පිරිවැය කි.වො. පැ 1 කට | එක් ඒකකයකට ලාභය/ (පාඩුව) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2008 | 13.22 | 18.15 | (4.93) |
| 2009 | 13.13 | 14.71 | (1.58) |
| 2010 | 13.16 | 13.02 | 0.14 |
| 2011 | 13.22 | 15.59 | (2.37) |
| 2012 | 15.66 | 21.50 | (5.84) |

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය සංස්ථා හා මණ්ඩල ඇතුළත් සියළුම රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය හා පරිපාලනය සම්බන්ධයෙන් ඒකාකාරී පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීමට වරින්වර රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලංකා විදුලි බල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලන රීති වශයෙන් අනුගමනය නොකරන්නේ නම් ඔවුන්ට ඒවා අදාළ නොවන බවත් 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා කා විදුලි බල මණ්ඩල පනතට අනුකූලව තත්ත්වය පවත්වා ගෙන තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයෙන් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි විවිධ කාර්ය මණ්ඩල දීමනා 39 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. එවැනි දීමනා රු මිලියන 612 ක් 2012 වර්ෂයේදී ගෙවා තිබූ බව සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ii) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, මණ්ඩලය විසින් වාර්ෂිකව නුපුහුණු හා අර්ධ පුහුණු සේවකයන් ලිපිකරුවන්, කැෂියර්වරුන්, ගබඩාපාලකවරුන්, යතුරුලියන්නන්, රියැදුරන්, කාර්යාල සහායකයන්, කම්කරුවන් ලෙස චක්‍රලේඛ මගින් දක්වා ඇති පරිදි සුදුසුකම් ඇති අයදුම්කරුවන් දීපව්‍යාප්තව පුවත්පත් දැන්වීම්, ගැසට් නිවේදන ආදිය මගින් අයදුම්පත් කැඳවීමකින් තොරව බඳවා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ තනතුරුවලට වඩාත් දක්ෂ පුද්ගලයන් බඳවා ගැනීමේ අවස්ථාව මණ්ඩලය විසින් අහිමි කර ගෙන තිබුණි.

(iii) මණ්ඩලයේ සේවකයන්ට තාවකාලිකව රු 1000 ක් මාසික දීමනාවක ගෙවීම සම්බන්ධයෙන් පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද තත්ත්වය සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(iv) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා පොලියකට වාහන ණය ලබා දීම වෙනුවට මණ්ඩලය විසින් සියයට 4.2 පොලියකට වාහන ලබා දී තිබුණි. තවද මණ්ඩලය විශාල ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දී සිටියද කිසිදු පාලනයකින් තොරව සේවක ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ආයෝජන තීරණ ගැනීම සඳහා මණ්ඩලය විසින් ලංවීම මුදල් කළමනාකරුට බලතල පවරා නොතිබුණ ද පසුගිය වර්ෂවල රක්ෂණ සංචිතයේ ආයෝජන කිරීමේ තීරණ 1990 වර්ෂයේ සිට එනම් අරමුදල සංස්ථාගත කිරීමේ දින සිට මුදල් කළමනාකරු විසින් ගෙන තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට අවශ්‍ය අනුමැතිය නොමැතිව ආයෝජනය කරන ලද මුළු මුදල රු.මිලියන 4,433 ක් විය.

(ඇ) 2003 සිට 2012 වර්ෂය දක්වා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,200 ක ණය ශේෂය මහා භාණ්ඩාගාරයේ ලිපිගොනුවක තිබූ ලංකා විදුලිබල මණ්ඩලයට පිටපතක් නොමැතිව 2004 වර්ෂයේදී විදේශ ප්‍රදාන ආයතනයකට ලියන ලද ලිපියක් පදනම් කරගෙන 2013 වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. මහා භාණ්ඩාගාර ලේකම් සමග සන්නිවේදනයකින් තොරව එවැනි තීරණයක් ගැනීම ගැටළු සහගතවේ.

## විගණකාධිපති වාර්තාව

(ඈ) 2008 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මණ්ඩලයේ පුනර්ජනනීය බලය පිරිවැයවලින් සියයට 10 ක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය (S E A) විසින් ආපසු ගෙවිය යුතුය. කෙසේවුවද, 2008 වර්ෂයේ සිට මණ්ඩලයට ලැබිය යුතු එම පුනර්ජනනීය බලය පිරිවැය සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආපසු ගෙවා නොතිබුණි. සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස වාර්තාකර නොතිබුණු එම ආපසු ගෙවිය යුතු මුළු මුදල 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 897 ක් විය.

(ඉ) රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා 2010 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජන අතර නිරීක්ෂණය වූ රු.මිලියන 3,724 ක ඌනතාවය මණ්ඩලයේ ස්වයං - රක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව ආයෝජනය කර නොතිබුණි.එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක නොවීය.

(ඊ) වර්ෂ ගණනාවක් සඳහා ලංකා විදුලි සමාගමට මණ්ඩලය විසින් විදුලි බලය විකුණා තිබූ අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගෙන තිබුණි. එහෙත් මෙම පාර්ශවයන් දෙක සමග විකුණුම් හා මිලදී ගැණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(උ) 2012 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ වටිනාකම රු මිලියන 32 ක්වූ මණ්ඩලයට අයත් වාහන 31 ක් සඳහා බෙදා හැරීම් කලාප තුනෙහි සමීක්ෂණ කණ්ඩායම විසින් වාර්තා කරන ලද පහත සඳහන් තත්ත්වයන්, එසේ කිරීමට අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් විගණනයේදී සතුටුදායක ලෙස පිළිගත නොහැකි විය.

- සමාන ඒකකයකින් (Unit) ඉදිරිපස රියදුරු කුටි (Cab) ආදේශ කිරීම (වාහන 24)
- පාවිච්චි කරන ලද A2T ක්‍රේන් මෙහිදී සවි කිරීම (වාහන 2)
- මුල් (Original) ඉදිරිපස කැබ් කොටස වෙනුවට (Cab) පාවිච්චි කරන ලද කැබ් වලින් ආදේශ කිරීම. (වාහන 2)
- මුල් (Original) ඉදිරිපස කැබ් කොටස හා පසුපස ට්‍රැරි කොටස් පාවිච්චිකරන ලද විවිධ වර්ගයේ කැබ් සහ ට්‍රක් වලින් ආදේශ කිරීම. (වාහන 1)
- පාවිච්චි කරන ලද කොටස්වලින් ඉදිරිපස කැබ් කොටස සහ පසුපස ට්‍රැරි කොටස් ආදේශ කිරීම. (වාහන 1)
- ක්‍රේන් එකක් ප්‍රාදේශීයව සවි කිරීම. (වාහන 1)

(ඌ) ස්වාධීන විදුලි බල නිෂ්පාදකයින්ට ගෙවන ලද (IPPS) ධාරිතා ගාස්තු උප සංරචක දෙකකින් එනම් වැඩිවන (escalable) (සියළුම පරිපාලන වියදම්, මෙහෙයුම් හා නඩත්තු ස්ථාවර ගාස්තු සහ අදාළ වියදම්) සහ වැඩි - නොවන ( non - escalable) (සමාගමේ ණය සේවා වගකීම) යනුවෙන් සමන්විත වේ. වැඩි නොවන සංරචකය (ණය ප්‍රතිපූරණය) ප්‍රතිපූරණය කිරීම සඳහා කාලය ඉක්ම ගොස් තිබුණද මණ්ඩලය එම සංරචකය ප්‍රතිපූරණය කර තිබුණ බව නිරීක්ෂණය වූ අතර 2012 වර්ෂයේදී එසේ ප්‍රතිපූරණය කරන ලද මුදල USD මිලියන 15 ක් හා ජපන් යෙන් මිලියන 183 ක් විය.

(එ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ට අයත්ව තිබූ විදුලිබල පිරියතවල මෙහෙයුම් හා නඩත්තු පිරිවැය ධාරිතා අය කිරීම් වැඩිවන පිරිවැය සංරචකයේ (Escalable Cost Component) ඇතුළත් කර තිබූ අතර ඒවා දැරීම හෝ නොදැරීම පිළිබඳව නොසලකා මණ්ඩලය විසින් එම පිරිවැය ගෙවා තිබුණි. තවද එම නඩත්තු සඳහා ද්‍රව්‍ය හා අමතර කොටස් ආනයනය කිරීමට අදාළ බදු මණ්ඩලය විසින් වෙනම ප්‍රතිපූරණය කර තිබුණි. එම වියදම ප්‍රතිපූරණය කිරීම සඳහා සීමාවක් නොතිබුණි. සමහර ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් වෙනත් සමහර නිෂ්පාදකයින්ගේ නඩත්තු කොන්ත්‍රාත් භාරගෙන තිබෙන අතර ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් අතර සම්බන්ධිත පාර්ශව හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදු වී තිබුණි. එබැවින් විදුලිබල පිරියත සඳහා ආනයනික ද්‍රව්‍ය පිළිබඳ තථ්‍ය උපයෝජනය පරීක්ෂා කිරීමෙන් තොරව බදු ඇතුළත් වියදම් ප්‍රතිපූරණය කිරීම පිළිබඳ විචක්ෂණභාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය. එලෙස 2012 වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කළ මුළු බදු ප්‍රමාණය රු.මිලියන 1,261 ක් විය.

### 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලනොදර්න් පවර් හවුස්ල (Northern Power House) යනු උතුරු පළාතේ ගිගා වොට් පැය (Gwh) 30 ක පිරියත ධාරිතාවයක් ඇති පුද්ගලික විදුලිබල නිෂ්පාදකයෙකි. කෙසේ වුවද ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂාව අසමත් වීම හේතුවෙන් විදුලිබල පිරියත ආරම්භයේ සිටම එකතුවූ විදුලිබල ගිගා වොට් පැය (Gwh) ප්‍රමාණය සැපයීමට සමාගමට නොහැකි වී තිබුණු අතර පසුගිය වර්ෂ තුන තුළ සපයන ලද ගිගාවොට් සාමාන්‍යය ගිගාවොට් පැය 15 කට වඩා අඩුවිය. තවද වෙනත් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ ඒකක මිලට වඩා මෙම ඒකක පිරිවැයද ඉතා වැඩි වී තිබුණු අතර පසුගිය වර්ෂ තුනක් තුළ එම සමාගමෙන් මිලදී ගැනීමෙන් වූ පාඩුව පහත පරිදි වේ.

## විගණකාධිපති වාර්තාව

| වර්ෂය | සාමාන්‍ය ඒකක පිරිවැය කි වො පැ / රු. | සාමාන්‍ය විකුණුම් මිල කි වො පැ / රු. | පාඩුව කි වො පැ / රු. | මුළු පාඩුව රු. මිලියන |
|---|---|---|---|---|
| 2010 | 17 | 13 | 4 | 223 |
| 2011 | 18 | 13 | 5 | 429 |
| 2012 | 24 | 16 | 8 | 407 |

(ආ) ගැල්වනයිසින් කිරීම සඳහා කලාප - 1 කාර්යාලය විසින් සම්බන්ධිත පාර්ශව සමාගමකට භාර දී තිබුණු රු මිලියන 9 ක් වටිනා ගැල්වනයිස් නොකළ විෂයයන් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් ගතවිත් ආපසු භාර දී නොතිබුණු අතර සම්බන්ධිත පාර්ශවයෙන් මෙම පාඩුව අයකර ගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) කලාප 3 හි ඇගයීම් කණ්ඩායම විසින් රු මිලියන 76 කට අගය කරන ලද වාහන 79 ක් ධාවනයට නුසුදුසු ලෙස හඳුනාගෙන තිබූ නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒ පිළිබඳව තවදුරටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 වසරේදී සිදු කරන ලද තොග සමීක්ෂණයේදී හානි වූ තොග ලෙස හඳුනාගන්නා ලද රු මිලියන 30 ක් පිරිවැය වූ තොග විෂයයන් 2013 ජුලි 31 දින වන විටත් කිසිදු සුදුසු පියවරක් ගැනීමෙන් තොරව බස්නාහිර පළාත දකුණ II තොග පරිශ්‍රයේ නිෂ්කාර්ය ලෙස පැවතුණි.

(ඉ) මණ්ඩලයේ පිළිගත් පරිපාටියට අනුකූලව පැවැත්විය යුතු රු මිලියන 86 ක අවශ්‍ය ආරක්ෂක තැන්පතුවට අඩුවෙන් රු මිලියන 61 ක ආරක්ෂක තැන්පතුවක් බස්නාහිර පළාත දකුණ II කාර්යාලයෙහි පාරිභෝගිකයන් 172 ක් විසින් පවත්වා තිබුණි. එබැවින් මණ්ඩලය එම පාරිභෝගිකයන් සමග ඉතා ඉහළ ණය අවදානමක් සහිතව ගනුදෙනු කෙරේ.

(ඊ) 2003 ජුලි 02 දිනැති අංක PEC / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදයට අනුව සියළුම රාජ්‍ය ව්‍යවසායයන් සියළුම ප්‍රධාන මෙහෙයුම්, ආවරණය කර, ක්‍රමානුකූලව සංශෝධනය කර හා යාවත්කාලීන කර ස්වකීය පද්ධති / අත්පොත් තබා ගත යුතුය. කෙසේ වුවද 1987 කාලයේදී පිළියෙල කරන ලද මණ්ඩලයේ පරිපාටි සංග්‍රහයන් මණ්ඩලය විසින් සංශෝධනය කර යාවත්කාලීන කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී පවතින විශාල මූල්‍ය අර්බුදය තිබියදීත් කිසිදු සීමාවකින් තොරව මණ්ඩලය විසින් රු මිලියන 2,472 ක සේවක ණය එහි සේවකයන් 12,880 කට ලබා දී තිබුණි.

(i) බාහිර ණය දෙන ආයතනවලින් ලබා ගන්නා ලද නිවාස ණය සඳහා සේවකයන්ට 2/3 ක පොලිය ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පොදු දුර්වලතා නිරීක්ෂණය විය. 2012 වර්ෂයේදී එසේ ප්‍රතිපූර්ණය කරන ලද මුදල රු මිලියන 892 ක් විය.

- ණය හිමිකම් සීමාව ඉක්ම වූ සේවකයන්ගේ ණය මුදල් සඳහා ණය පොලී ප්‍රතිපූරණය කිරීම.
- ස්ථාවර තැන්පතු උකස් කිරීම මගින් පුද්ගලික ඇප සහතික ආදිය මගින් ලබාගන්නා ලද පුද්ගලික ණය සඳහා පොලිය ප්‍රතිපූරණය කිරීම.
- කලත්‍රයා හැර වෙනත් පාර්ශව සමග ඒකාබද්ධව නිලධාරීන් විසින් ලබා ගන්නා ණය සඳහා පොලිය ප්‍රතිපූරණය කිරීම.
- මූල්‍ය ආයතනවල අවිධිමත් ලිපි පදනම් කරගෙන ණය පොලිය ප්‍රතිපූරණය කිරීම.
- වෙනත් ණය නිරවුල් කිරීම සඳහා ලබා ගන්නා ලද ණය සඳහා වූ පොලී ප්‍රතිපූරණය කිරීම.
- නිලධාරියා හෝ කලත්‍රයා නමින් නොවන දේපල සම්බන්ධ ණය සඳහා ණය පොලී නිලධාරීන්ට ප්‍රතිපූරණය කිරීම.

(ii) 2012 වර්ෂයේදී මණ්ඩලයේ සේවකයන් 172 කට යතුරු පැදි හැර, වාහන සඳහා ණය වෙනුවෙන් රු මිලියන 332 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් පොදු දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

- ණය සම්බන්ධයෙන් වූ ලියකියවිලි ඉදිරිපත් නොකිරීමේ අවස්ථා නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, අරමුණු කළ කාර්යයන් සඳහා සම්පූර්ණ ණය මුදලම උපයෝජනය කිරීම පිළිබඳව තහවුරු කළ නොහැකි විය.
- බොහෝ අවස්ථාවලදී ණය මුදලෙන් මිලදී ගන්නා ලද වාහන මණ්ඩලයට උකස් කර නොතිබුණි.

- ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් (ප්‍රධානීන්) විසින් ලබා ගන්නා ලද ණය සඳහා පහළ ශ්‍රේණිවල නිලධාරීන් (සහාය නිලධාරීන්) සහතික වී තිබුණි.
- ණය ගන්නන් හා ඔවුන්ගේ ඇපකරුවන් සියයට හතළිහ හෝ සියයට හැටක වැටුප් සීමාව වන සුදුසුකම් නිර්ණායකය නොසලකා ණය ලබා දීමේ අවස්ථා නිරීක්ෂණය විය.
- පරිවාස කාලයේ සිටින නිලධාරීන්ට ණය ලබා දී තිබුණි.
- සුදුසුකම් සීමාව ඉක්මවමින් ණය ලබා දී තිබුණි.
- පෙර ණයවල වර්ෂ 5 ක කාලය සම්පූර්ණවීමට පෙර නව ණය ලබා දී තිබුණි.
- පෙර හිඟ ණය ශේෂය නිරවුල් කිරීම පිළිබඳ සැලකිමෙන් තොරව නව ණය සම්පූර්ණයෙන් ලබා දී තිබුණි.
- අසම්පූර්ණ ණය ගිවිසුම් නිරීක්ෂණය විය.
- රේගු බදු සහනදායී කොන්දේසි මත වාහනයක් ආනයනය කිරීම සඳහා ලබාදී තිබූ ණයක් වෙනුවෙන්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ණයකරු විසින් ණයවර ලිපිය විවෘත කළ බැංකුවේ නමින් වෙනුවට මණ්ඩලයෙන් ණය මුදල ලබාගත් නිලධාරියාගේ නමින් චෙක්පතක් ලියා තිබුණි.
- අදාළ අංශ මගින් ලබා දෙන ණය සම්පූර්ණයෙන් නිරවුල් කරන තුරු ඒකාකාරී ආකාරයකින් වාර්ෂික ආදායම් බලපත්‍ර හා සර්වග්‍රාහී රක්ෂණ සහතිකවල පිටපත් පරීක්ෂා නොකිරීමේ හා ලබා නොගැනීමේ අවස්ථා නිරීක්ෂණය විය.

## 3.6 මානව සම්පත් කළමනාකරණය.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ බඳවා ගැනීම් යෝජනා ක්‍රමය (SOR) දීර්ඝ කාලයක් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව මිනිස් බල සමාගම්වලින් බඳවාගැනීම් කර තිබුණි.

(ඇ) 2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩල සැලැස්ම අභිබවා සේවකයන් 946 ක් බාහිරින් බඳවා ගෙන තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට බාහිරින් බඳවා ගන්නා ලද මුළු සේවක සංඛ්‍යාව 4,045 ක් වූ අතර එය මණ්ඩලයේ මුළු සේවක ප්‍රමාණයෙන් සියයට 25 ක් නියෝජනය විය.

(ඈ) අනුමත සේවක සංඛ්‍යාවෙන් පහත දැක්වෙන අත්‍යවශ්‍ය තනතුරු 2012 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී තිබුණි.

| සේවක වර්ගය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|
| විධායක | 186 |
| මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවය | 177 |
| පුහුණු තාක්ෂණ සේවය | 579 |
| අර්ධ පුහුණු තාක්ෂණ සේවය | 1,599 |
| වෙනත් පුහුණු ශ්‍රේණි | 34 |
| **එකතුව** | **2,575** |

(ඉ) නුපුහුණු ක්ෂේත්‍ර සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 1,716 කින් ඉක්මවා තිබුණි.

(ඊ) උසස්වීම් සඳහා සලකා බලන එකම කරුණ ජ්‍යෙෂ්ඨත්වය වූ අතර අනුප්‍රාප්තික සැලැස්මක් නොවීය. එම නිසා, උසස්වීම සේවකයාට ප්‍රතිලාභී වූ අතර ආයතනයට ප්‍රතිලාභයක් නොවීය. උසස් තනතුරු සඳහා උසස්වීම් ඉතා කෙටිකලකදී එනම් අර්ධ වර්ෂයකට අඩු කාලයක් තුළ දීත් ලබා දී තිබූ අතර එය මණ්ඩලයේ අයහපත් පරිචයක් විය.

(උ) විධිමත් මාරු කිරීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය නොවීය. ඇතැම් සේවකයන් විශේෂයෙන් ප්‍රධාන තනතුරුවල වර්ෂ 10 සිට 20 දක්වා කාලයක් එකම තනතුරෙහි එකම ස්ථානයෙහි සේවයේ යෙදී තිබුණි. තවද එවැනි ක්‍රියා පරිපාටියක් ඔවුන් උසස්වීම් සඳහා සුදුසුකම් ලබන විට සමස්ත පලපුරුද්ද ලබා ගැනීම සඳහා යහපත් පරිසරයක් නොසපයයි. උදාහරණයක් ලෙස දැනට බෙදා හැරීම් අංශ සඳහා තීරණ ගන්නා ප්‍රධාන ස්ථානය වන බෙදාහැරීම් සම්බන්ධීකරණ කමිටුවේ (DCC) සාමාජිකයන් වන බෙදා හැරීම් මුළු කලාප 4 හිම සමාන්‍යාධිකාරීන් (AGMM) හට බෙදා හැරීම් ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් නොවීය.

# විගණකාධිපති වාර්තාව

(ඌ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන අතර එම තනතුර වෙනත් සේවාවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරුවරු සඳහා විවෘත වීමට හැකිවන පරිදි බඳවා ගැනීම් පරිපාටියේ (SOR) එම තනතුර සඳහා අවශ්‍ය මානව සම්පත් සුදුසුකම් හා පළපුරුද්ද විශේෂයෙන් සඳහන් කර නොතිබුණි. එම නිසා දැනට පවත්නා බඳවා ගැනීම් පරිපාටිය (SOR) සම්පූර්ණ හා නිවැරදි ලෙස සැලකිය නොහැක.

(එ) තනතුරු දෙකක් අතර නොගැලපීමක් ඇති කරමින් මණ්ඩලයේ පිරිස් කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තනතුර (මානව සම්පත් ප්‍රතිපත්ති) ඇති කර තිබුණි.

(ඒ) පවත්නා බඳවා ගැනීම් පරිපාටිය (SOR) අනුව, මානව සම්පත් (HRO) සේවයේ මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරව පුරවන අතර එම ප්‍රතිශතය වර්ෂයෙන් වර්ෂයට සියයට 85 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, මණ්ඩල ඉතිහාසයේ දීර්ඝම කාලයක් ඉංජිනේරුවරුන් දෙදෙනෙකු විසින් ප්‍රධාන කාර්යයන් ආවරණය කරන බැවින් හා එම අංශයේ 4 ශ්‍රේණියට වැඩි තනතුරු මානව සම්පත් ක්ෂේත්‍රය හැර වෙනත් සේවා වලට විවෘතව තිබු බැවින්, එම බාහිරව බඳවා ගන්නා සේවකයන්ට උසස්වීම් යෝජනාක්‍රමයේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් ඇති බවට නිරීක්ෂණය නොවීය.

(ඔ) මානව සම්පත් කළමනාකරු (HRM) හා මානව සම්පත් නිලධාරී (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා 100 ට වැඩි සේවකයන් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ අවශ්‍යවන වර්ෂ 06 ක පළපුරුද්ද මෙම ආයතනයේ කටයුතු කරන මුළු සේවක සංඛ්‍යාව සමඟසැසඳීමේදී ප්‍රමාණවත් නොවේ.

## 3.7. අයවැය පාලනය.

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(a) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යෙමු කිරීම අවශ්‍ය වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඇ) තොග පාලනය හා ගබඩා කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ගිණුම් කරණය හා මූල්‍ය කළමනාකරණය
(ඊ) ආයෝජන හා පරිපාලිතයන් පිළිබඳ පාලනය
(උ) කෙරීගෙන යන වැඩ
(ඌ) ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය
(එ) අයවැය
(ඒ) සේවක ණය
(ඔ) විකුණුම්

**එච්.ඒ.එස්. සමරවීර**
විගණකාධිපති.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**ලංකා විදුලිබල මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෙටුම්පත් විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

දැන ගැනීම සඳහා

**1.3 විගණකගේ වගකීම**

දැන ගැනීම සඳහා

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

දැන ගැනීම සඳහා

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ විගණන මතය - මණ්ඩලය හා සමූහය**

**2.2 සමූහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

ලංවීම සමූහයේ පරිපාලිත සමාගම්වල අයිතිය (සෘජු හා වක්‍ර අයිතිය) මූල්‍ය ප්‍රකාශනවල සටහන් 10.1 යටතේ හෙළිදරව් කරන ලදී.

කෙසේ වුවද විමසුමේ සඳහන් කර ඇති සමාගම් ලංකා විදුලි බල මණ්ඩලය යටතට වැටෙන නමුත් පාලන බලතල පදනම් කරගෙන එම සමාගම් ඒකාබද්ධ කිරීමේ අරමුණ සඳහා පරිපාලිතයන් ලෙස සැලකේ. (එල්.ටී.එල්. අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩි දෙනෙක් ලංවීම නියෝජිතයන් වන බැවින්)

අයිතිය පිළිබඳ % වක්‍ර සම්බන්ධතාවයන් හෙළිදරව් නොකිරීමට හේතු වූයේ මූල්‍ය ප්‍රකාශන භාවිතා කරමින් යම් නොමග යැවීමක් වැළැක්වීමටය.

**3. ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.3.1 (අ) ශ්‍රී ලං ගි ප්‍ර 5 - තොග**

**(ආ) (1) තථ්‍ය මිලට වඩා ප්‍රමිත මිල අධි ඇස්තමේන්තු කිරීම**

2013 මාර්තු 21 දින විගණකාධිපතිවරයා සමග ලංවීම උසස් නිලධාරීන්ගේ රැස්වීමේදී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර තීරණයන් පහත පරිදි වේ.

**මිල ප්‍රකාශිත**
තථ්‍ය හා ප්‍රමිත පිරිවැය අතර පරතරය අවම කිරීම සඳහා උපරිම ප්‍රයත්නයක් ගැනීමට වැඩ බලන සාමාන්‍යාධිකාරී එකඟ වූ අතර, බෙදාහැරීම් කලාපවල තොග, ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් හා බර තැබූ ක්‍රමය යොදා ගැනීමට වඩා ප්‍රමිත පිරිවැය යොදා ගැනීම වඩාත් ප්‍රතිඵලදායක හෙයින් එම තොග අඛණ්ඩව ප්‍රමිත පිරිවැයට අගය කිරීම අනුමත කරන ලෙස විගණකාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරන ලදී.

ප්‍රමිත පිරිවැයට අගය කිරීම පිළිබඳ නිලධාරීන් වඩාත් තර්ක කළ හෙයින් විගණකාධිපති ඒ සඳහා විරෝධය පළ නොකළද, ඉහළ ප්‍රමිත පිරිවැය අගය කිරීමක් හේතුවෙන් යම්කිසි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇති වුවහොත් මූල්‍ය ප්‍රකාශන තත්ත්වාගණනය නොකරන බව අවධාරණය කරන ලදී.

**මිල ප්‍රකාශිත නොවන**

සාකච්ඡාවේදී එකඟවූ පරිදි ප්‍රමිත පිරිවැය හා තථ්‍ය පිරිවැය අතර පරතරය අඩු කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය පරිශ්‍රමයක් ගත් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2011 වර්ෂයේ රු. 2,920 ක්වූ ද්‍රව්‍ය මිල විචලනය හා සැසඳීමේදී 2012 වර්ෂයේ එය රු. 1,273 කින් අඩුකර ගැනීමට හැකි විය.

**2.3.1 (අ) මණ්ඩලය විසින් ඉදිකරන ලද වත්කම් අගය කිරීම සඳහා ඒකාකාරිප්‍රතිපත්තිය**

එක් ආයතනයක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම කරනු ලැබේ. කෙසේ වුවද මෙම ප්‍රධාන කාර්යයන් තුනෙහි ස්වභාවය අනුව එකින් එක සැසදිය නොහැක.

අනික් අතට සම්ප්‍රේෂණ අංශයේ සම්ප්‍රේෂණ රැහැන් විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවලින් වත්කමේ සාධාරණ අගය වඩාත් නිවැරදිව නිරූපනය වන ක්‍රමය වන තථ්‍ය පිරිවැයට අගය කළ හැකි ටර්න් කී (turnkey basi) පදනම මත ඉදිකරන ලදී.

කෙසේ වුවද ගනුදෙනුවේ සංකීර්ණතාවය හේතුවෙන් බෙදාහැරීම් අංශයේ තොග විෂයයන් ප්‍රමිත මිලට නිකුත් කරනු ලැබේ. එබැවින් කාර්යයන්හි තථ්‍ය පිරිවැය වෙන වෙනම නිශ්චය කළ නොහැක. එබැවින් වත්කම ප්‍රමිත පිරිවැයට අගය කරනු ලැබේ.

**2.3.1 (ආ) ශ්‍රීලංගිප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම් තැබීම හා රජයේ සහාය හෙළිදරව් කිරීම**

විදේශාධාර හා ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම් තැබීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) විසින් එකඟ වූ ලංවීම විසින් අනුගමනය කරන පරිපාටි ප්‍රකාරව විදුලිබල ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන රජයේ අරමුදල් ලංවීම විසින් හිමිකම් ආයෝජනයක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. පසුව, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.109,567,865,042.06 ක දායකය ලෙස ලංවීම විසින් සනාථ කර ඇත.

කෙසේ වුවද 2012 වර්ෂය තුළදී ලබා දෙන ලද දායක ප්‍රාග්ධනය එකතුව රු.13,477,460,864 ක මුදල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පොත්වල 2012 වර්ෂය අවසානයට ලංවීම හි ආයෝජනය ලෙස යාවත්කාලීන කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. ඉහත කරුණු හේතුවෙන් එය ලංවීම පොත් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පොත් අතර රු.13,477,460,864 ක දායක ප්‍රාග්ධනයේ වෙනසකි.

ලංවීම පොත් අනුව, ප්‍රාග්ධන දායකයේ මුළු මුදල රු.121,603,239,853.22 (2013 වර්ෂය සඳහා රු.12,035,374,811.16 ඇතුළත්ව) 2013 දෙසැම්බර් 31 දක්වා ප්‍රාග්ධනිත කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු පොත් ගැලපීම සඳහා එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට දන්වා ඇත.

**2.3.1 (ඇ) ශ්‍රී ලං මූ වා ප්‍ර 1 - පළමුවරට ශ්‍රී ලං මූ වා ප්‍ර අනුගමනය කිරීම**

ලංවීම වාර්තා හා ගනුදෙනු පරීක්ෂා කිරීමෙන් පසුව උපදේශක විසින් වාර්තාව (Gap Report) පිළියෙල කර ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි අවශ්‍යතාවන් සඳහා බලපාන ක්ෂේත්‍රයන් සඳහන් කරමින් ලංකා විදුලි බල මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව අනුව, බැඳීසිටීම් ඉවත්කිරීම් (decommissioning obligation) විෂයන් එවැනි බැඳීම් ලංවීම සඳහා නොවූ බැවින් එය අදාළ නොවේ. කෙසේ වුවද හෙළිදරව් කිරීම් අවශ්‍යතාවය යටතේ අදාළ නොවන ක්ෂේත්‍ර හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ

**2.3.1 (ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 24 - සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම**

වාර්තාවේ සඳහන් කර තිබුණු ලැයිස්තුගත ව්‍යාපෘති හා ලංවීම සම්බන්ධිත සමාගම් අතර සම්බන්ධිත පාර්ශව ගනුදෙනු නොමැත. සමහර ව්‍යාපෘති කොන්ත්‍රාත් LTL (ව්‍යාපෘති) සමාගම්වලට ප්‍රදානය කර ඇත. කෙසේ වුවද එල්ටීඑල් (ව්‍යාපෘති) එල්ටීඑල් (LTL) සමූහය යටතට නොඑන අතර එය වෙනම සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. එම නිසා ඒවා සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් නොවීය.

2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

2.3.2 **(අ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන ලද ප්‍රතිපත්තිවලට පටහැනිව විශාල හානි හැර දේපල පිරියත උපකරණ වලට සිදුවූ හානි රක්ෂණ සංචිත අරමුදලට අයකර නොතිබුණු අතර එම පාඩු හා හානි ලංවීම අරමුදල්වලින් දරා තිබුණි.**

දේපල, පිරියත හා උපකරණ වලට සිදුවන පාඩු හා හානි දැරීම සඳහා රක්ෂණ සංචිත අරමුදල ස්ථාපිත කරන ලදී. සාමාන්‍යාධිකාරීගේ අංක 287 දරන චක්‍රලේඛය අනුව, පහත දැක්වෙන නිර්නායකයන් පදනම් කරගෙන රක්ෂණ සංචිත අරමුදලින් දරන ලද පාඩු හඳුනා ගැනේ.

(i) ස්ථාවර වත්කම් සඳහා රු. 10,000 ට වැඩියෙන් දරන ලද පාඩු රක්ෂණ සංචිතයට අයකරන අතර, අනෙකුත් පාඩු අළුත්වැඩියා හා නඩත්තු පිරිවැය ලෙස සලකනු ලැබේ.

(ii) තාක්ෂණික කරුණු හේතුවෙන් දරන ලද පාඩු මෙම සංචිතයට අය කරනු නොලැබේ.

(iii) බාහිර පාර්ශවයකින් හෝ සේවකයින්ගෙන් අයකරගත යුතු ස්ථාවර වත්කම් පිළිබඳ හානි මෙයට අයකරනු නොලැබේ.

(iv) නැති වූ හෝ සම්පූර්ණයෙන්ම හානි වූ වාහන, සන්නිවේදන උපකරණ, විවිධ උපකරණ, ට්‍රාන්ස්පෝමර්ස් හා ගොඩනැගිලි මෙම සංචිතයට අය කරනු ලැබේ.

විගණන විමසුම ප්‍රකාරව, දේපල පිරියත උපකරණ වලට සිදුවූ හානි හේතුවෙන් වූ රු. මිලියන 71 ක වියදම් රක්ෂණ සංචිත අරමුදලට අයකරනු වෙනුවට මණ්ඩලයේ අරමුදල් වලට එරෙහිව අයකර තිබුණි. කෙසේ වුවද අපගේ වාර්තාවලට අනුව දකුණු පළාතේ සුළි සුළඟින් සිදුවූ හානි හේතුවෙන් 2012 වර්ෂය තුළදී රු. මිලියන 56 ක් රක්ෂණ සංචිත අරමුදලට අයකර තිබූ අතර, රු. මිලියන 71 ක් ද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවයට (IFRS) අනුකූල වන පරිදි රක්ෂණ සංචිත අරමුදලට එරෙහිව අයකරන ලදී.

වර්ෂය අවසානයේ ශුද්ධ බලපෑම අනුව නැවත ආයෝජනය කිරීමේ හා ආයෝජනය නොකිරීමේ තීරණය ගනු ලැබේ. 1986 නොවැම්බර් 26 දිනැති අංක 88 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රක්ෂණ සංචිතය පිළිබඳ සියළුම ආයෝජන මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරන ලදී. ඒ අනුව ආයෝජනවලින් උපයන පොලිය සඳහා කල් පිරීමට පෙර ආපසු ගන්නා ලද ස්ථාවර තැන්පතුවලින් අහිතකර බලපෑමක් ඇති වේ.

2.3.2 **(ආ) රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනයෙන් උපයන පොලී ආදායම**

පෙර විගණන විමසුම ප්‍රකාරව, රක්ෂණ සංචිත අරමුදලින් උපයන පොලිය ආදායම 2011 වර්ෂය සිට ඉදිරියට අරමුදලේ ආදායම ලෙස හදුනාගෙන තිබුණි.

2.3.2 **(ඇ) 2010/ 2011 බදු වර්ෂයේ අයකර ගන්නා ලද රු. මිලියන 119 ක් වූ රඳවා ගැනීමේ බදු අයකරගත යුතු මුදලක් ලෙස අදාළ නොවන පරිදි දක්වා තිබීම.**

2012 වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග 2010/2011 ආදායම් බදු ගණනය කිරීම අවසන් නොවීම හේතුවෙන් 2009 හා 2010 වර්ෂවල අයකරගන්නා ලද රඳවා ගැනීම් බදු 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද ලැබිය යුතු රඳවා ගැනීම් බදු ගිණුමේ සමස්ථ මුදල 2013 වර්ෂයේ අවසන් කරන ලද 2010/2011 වර්ෂය සඳහා ආදායම් බදු බැරකම් වලට එරෙහිව නිරවුල් කර තිබුණි. ඒ අනුව ගිණුම 2013 වර්ෂයේදී ගලපා ඇත.

2.3.2 **(ඈ) විශේෂ අවස්ථා සඳහා ආලෝකය සැපයීම වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල**

විශේෂ අවස්ථා සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රියා මාර්ගය අදාළ ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තු පදනම් කරගෙන වේ. එම ඇස්තමේන්තුගත පිරිවැය විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් මූලස්ථාන කාර්යාලයට ප්‍රතිපූර්ණය කරන අතර තථ්‍ය පිරිවැයට මාරු කරන ලෙස අදාළ ගණකාධිකාරීට (වියදම්) දන්වනු ලැබේ. කාර්යයේ පිරිවැය ආදායම සමඟ ගැලපීම් කිරීම මගින් ඉදිරියේදී බැර ශේෂය අඩු කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

**2.3.2 (ඉ) ආරක්ෂක ආලෝකය සැපයීම සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් (MOPE) ලැබිය යුතු මුදල**

ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්තා අනුව, විදුලි බල හා බලශක්ති අමාත්‍යංශයෙන් ලැබිය යුතු මුදල රු. මිලියන 8.2 කි. දැනට අප විසින් මෙම ශේෂ විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය සමග සසඳමින් ඇත.

**2.3.2 (ඊ) මෝටර් වාහනවල සාධාරණ අගය නිශ්චය කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණයන් කර තිබුණි.**

**2.3.2 (ඊ) (i) වෙළඳපොල වටිනාකම් නිශ්චය කිරීමේදී ඒකාකාරි ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් ක්‍රියාත්මක කිරීමේදී වාහනවල සාධාරණ අගය විස්තරාත්මක අධ්‍යයනයක් මගින් කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති උපදේශක සමග 2011 වර්ෂය ආරම්භයේ සිට සාකච්ඡා අදියරයන් කිහිපයක් පවත්වන ලද අතර අවසානයේ සියළුම මෝටර් වාහනවල වෙළඳපොළ වටිනාකම ලබාගැනීම සඳහා අවසාන තීරණයට එලඹීමට විගණකාධිපති සමග සාකච්ඡා කරන ලදී.

සමහර ක්‍රමවේදයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මගින් විධිමත්ව යොමුකර නොමැති වූ හෙයින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් යොදා ගැනීමේ ක්‍රියාවලියේ විවිධ සංකීර්ණතාවයන් විය. එබැවින් අවසාන තීරණය සිදු කරන අවස්ථාවේදී සමහර අංශ 2011 ජනවාරි 01 දිනට අගය කිරීම් නිම කර තිබූ අතර තවත් සමහර අංශ 2012 දෙසැම්බර් 31 දිනට අගය කිරීම් නිම කර තිබුණි. එබැවින් සමස්ථ ක්‍රියාවලිය නැවත සිදුකිරීම සඳහා යන කාලය හා කල්පිත පිරිවැය සැලකිල්ලට ගනිමින් 2011 ජනවාරි 01 දිනට ඒකාකාරි පිරිවැය වටිනාකම ලබා ගැනීමට වට්ටම් රේටය (Discount Rate ) යොදා ගැනීමට උපදෙස් දෙන ලදී.

**2.3.2. (ඊ) (ii) රු. මිලියන 396 කින් අඩුවෙන් දැක්වීම (Transmission) Rs. 180 DD2 - DD2 හි  පෙන්වා දෙන ලද රු. මිලියන 216 වෙනස**

ඉහත විස්තර කර ඇති පිළිතුරු 1.6.2 (ii) පරිදි, 01.01.2011 අදාළ දිනය හදුනාගැනීම සඳහා අගය කිරීම් සඳහා තාක්ෂණය යොදා ගැනීමෙන් සුළු බලපෑමක් විය.

කෙසේ වුවද රු. මිලියන 396 වෙනස හුදෙක් මෙම දෝෂය නිසාම නොවේ. මෙම කාලපරිච්ඡේද දෙක අතර කරනු ලැබූ වෙනත් ගනුදෙනුද විය. එනම් 01.01.2011 සිට 31.12.2012 දක්වා

- කාලපරිච්ඡේදය තුළ එකතු කිරීම්
- කාල පරිච්ඡේදය තුළ අපහරණය කිරීම්
- සැලකිල්ලට ගත් කල්පිත පිරිවැය (deemed cost) මත ක්ෂය අය කිරීම.
- අන්තර් අංශ මාරු කිරීම්

**2.3.2 (ඊ) (iii) ගර්හිත වාහනවල අපහරණ වටිනාකම නිශ්චය කර නොතිබුණි.**

ලංවීම මෝටර් වාහන සමීක්ෂණය හා අගය කිරීමේ කාර්යය සඳහා අගය කිරීම් කමිටු පත්කරන ලදී. වෙනම සමීක්ෂණ මණ්ඩලයක් (BOS) පත්කිරීම මගින් මෝටර් වාහන අපහරණය කිරීම සඳහා වෙනම පර්පාටියක් ලංවීම සඳහා ඇත.

මෙම කාර්යය සඳහා පත්කරන ලද මණ්ඩලයෙහි යොමුගත කොන්දේසි සමීක්ෂණ මණ්ඩලයේ කාර්යයන් තුළට ඇතුළත් නොවේ. මෙම වාහන ධාවනයට නුසුදුසු බැවින් රු. 1 ධාරණ අගය කල්පිත පිරිවැය (deemed cost) ලෙස සලකන ලදී.

**2.3.2 (උ) 1982 වර්ෂයේ සිට බදු වාර්තාවල ඇතුළත් නොකරන ලද වත්කමේ මුළු වටිනාකම රු. මිලියන 43,894 ක් විය.**

ප්‍රමාද කළ බදු ගණනය කිරීමේ පළමු අවස්ථාවේදී මුහුණ දුන් සංකීර්ණත්වය හේතුවෙන් විශේෂයෙන් දේපල, පිරියත හා උපකරණවලට අදාළ ඓතිහාසික තොරතුරු නොමැති වීම නිසා අවශ්‍යතා පරිදි වඩාත් උචිත ඇස්තමේන්තුව භාවිතා කිරීම සඳහා යොමු කර තිබුණි. කෙසේ වුවද දේපල පිරියත, උපකරණ සටහන අනුව බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන ඉඩදීම හිමිකම් සඳහා එකතු කිරීම් සැසදීම අවධානයට ගන්නා ලදී.

**2.3.2 (ඌ) රු. මිලියන 55 ක් හා රු. මිලියන 57 ක් වූ දේපල පිරියත හා උපකරණ අපහරණයෙන් පිළිවෙලින් 2012 හා 2011 වර්ෂවලදී ලැබුණු ලාභය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව නැවත ගැලපීම් කර නොතිබුණි**

2011 හා 2012 මූල්‍ය වර්ෂයන්හි ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ගේ බලපෑම හදුනාගැනීම සඳහා දේපල පිරියත හා උපකරණ සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පර්පාටිය සම්බන්ධයෙන් උපදෙස් මාර්ගෝපදේශ ප්‍රකාරව 2013 මාර්තු 25 දිනැති අංක 444 දරන

චක්‍රලේඛය යටතේ විශේෂිත සංකේත 2 ක් නිකුත් කරන ලදී. දේපල පිරියත උපකරණ අපහරණයෙන් ලාභය/ (පාඩුව) සහ ක්ෂය, බලපෑම අදාල සංකේතයන්ට සෘජුවම අයකිරීමෙන් තොරව පහත සඳහන් පිරිවැය සංකේත යටතේ ගිණුම්ගත කර තිබුණි.

E 7852 - ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ගැලපීම් 2012 වර්ෂය සඳහා පමණක්
E 7853 - ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ගැලපීම් 2012 වර්ෂයට පෙර

කෙසේ වුවද වෙනම සංකේත යටතේ හඳුනාගැනීම හේතුවෙන් වර්ෂ දෙක සදහාම (එනම් 2011 හා 2012) විස්තීරණ ආදායම සඳහා බලපෑමක් නොමැත.

**2.3.2 (එ) 2011 වර්ෂයේ වාර්ෂික තොග සමීක්ෂණයේදී හානි වූ තොග ලෙස හදුනාගත් රු.මිලියන 30 ක් වූ තොග විෂයයන් මේ වන විටත් ගබඩාවේ නිශ්කාර්යව තබා තිබුණි**

2011 වර්ෂයේදී රු. මිලියන 30 ක් වටිනාකම වූ තොග විෂයයන් හානි වූ තොග ලෙස හදුනාගත් අතර ඒ අනුව පහත පරිදි ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

හර - හානි වූ තොග ලා/ ලා ගිණුම
බැර - හානි වූ හා යල් පැන ගිය තොග ගිණුම සඳහා ප්‍රතිපාදන

කෙසේ වුවද 2012 වර්ෂයේදී මෙම හානි වූ තොග එම වර්ෂයේ තොග පිළිබඳ භෞතික සමීක්ෂණයේදී අත්හැරී තිබුණු අතර ඒ හේතුවෙන් තොග ඌනතාවයක් ඇති වූ අතර පහත පරිදි ගිණුම් ගත කරන ලදී.

හර - තොග ගැලපීම් (තොග ඌනතාවය) ගිණුම
බැර- තොග ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට හානි වූ හා පාවිච්චියට ගත නොහැකි තොග සඳහා ප්‍රතිපාදන භෞතික සමීක්ෂණය මත පදනම් වේ. හානි වූ තොග ගණන් නොගැනීම හේතුවෙන් 2012 වර්ෂයේදී මෙම රු. මිලියන 30 ක හානි වූ තොග නොමැතිව ප්‍රතිපාදනය සලසන ලදී.

ඉහත විස්තර කර ඇති පරිදි තොග ඌනතාවය වාර්තා කිරීමේ හේතුවෙන් එම මුදලින් ප්‍රතිපාදන ගිණුම වෙනස් වීමෙන් ශේෂ පත්‍රයේ දැක්වෙන තොග ශේෂ සඳහා කිසිදු බලපෑමක් නැත.

**2.3.2 (ඒ) 2012 බස්නාහිර පළාත දකුණ II කාර්යාලය විසින් රු.මිලියන 18 ක ගෙවීම් 7 ක් සැපයුම්කරුවන්ට ගෙවීම**

රු.මිලියන 15.3 කට සමාන මුදලක් 2013 වර්ෂය තුළ දී නිරවුල් කළ අතර ඉතිරි ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.3.2 (ඔ) 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය රු.මිලියන 1,505 ක් වටිනා ඉවත් කරන ලද අධිබල විදුලි රැහැන් (HT) සහ අඩු බල විදුලි රැහැන් (LT) ස්ථාවර වත්කම් ලේඛනයේ හා ලෙජර් ගිණුම් වල පැවතීම**

විමසුමේ සඳහන් 2012 දෙසැම්බර් 31 දිනට රු.1,505,012,113 ක් වූ අධිබල විදුලි රැහැන් (HT) හා අඩුබල විදුලි රැහැන් (LT) හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලයෙන් සනාථ කිරීම් සඳහා යවන ලද සමීක්ෂණ වාර්තා පදනම් කරගත් ශුද්ධ පොත් අගය වූ අතර එය 2012 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන අගයන් නොවේ.

සමහර විදුලි රැහැන් ප්‍රදේශයේ නොතිබූ බව හම්බන්තොට විදුලි ඉංජිනේරු සනාථ කර තිබුණි. නිරන්තරයෙන් විදුලි රැහැන්වල සිදු කරන වැඩිදියුණු කිරීම්, දීර්ඝ කිරීම් ආදී විදුලි රැහැන්වලට සිදුකරන වෙනස්කිරීම් හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයේ රැහැන් පිළිබඳ විස්තරය හා ඔවුන්ගේ දේපල පිරියත උපකරණ ලේඛණයේ රැහැන් පිළිබඳ විස්තරය සමඟ නොගැලපීමක් නිසා මෙය සිදු විය හැක.

ලැබෙන සනාථ කිරීම් වාර්තා පමණක් පදනම් කරගෙන ප්‍රාදේශීය කාර්යාල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොකරයි. ලංවීම පරිපාටි ප්‍රකාරව ගිණුම් පොත්පත් වලින් වත්කමක වාර්තාව ඉවත් කිරීමට එම විශේෂිත රැහැන්වල හඳුනාගැනීම හා භෞතික පැවැත්ම සම්බන්ධයෙන් තවදුරටත් විස්තර අවශ්‍ය වන බැවිනි.

එබැවින් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල පිරියත උපකරණ වටිනාකම විමසුමේ දක්වා ඇති පරිදි මුදලින් වැඩියෙන් දක්වා නොතිබුණි. ඉහත කරුණු පදනම් කරගෙන ප්‍රත්‍යාගණන සංචිතයට බලපෑමක් පැන නොනගී.

**2.3.2 (ඕ) සීඩා ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන් සම්බන්ධයෙන් මිල විචලනය**

2010 සිට 2012 අවසානය දක්වා සම්පූර්ණ කරන ලද හා ප්‍රාග්ධනිත කරන ලද වැඩ සම්බන්ධයෙන් , 2012 වර්ෂය සඳහා ගිණුම් අවසන් කිරීමේදී ව්‍යාපෘති ශාඛාව විසින් 2013 ජනවාරි මාසයේදී රු.මිලියන 121 ක් වූ ද්‍රව්‍ය මිල විචලනය DD4 වෙත මාරු කර තිබුණි. පළාත් වලින් වත්කම්වල (බෙදාහැරීම් රැහැන් හා උප මධ්‍යස්ථාන) තවදුරටත් විස්තර ලබා ගැනීමෙන් පසු 2012 ගිණුම් නියමිත දිනට අවසන් කිරීම සඳහා මෙම මුදල අදාළ වත්කම්වලට එකතු කරන ලද අතර සංශෝධිත වත්කම් වටිනාකම සඳහා ක්ෂය ගැලපීම 2012 වර්ෂයේ අවසන් ගිණුම්වල සිදුකර තිබුණි . පළාත් වලින් විස්තර ලැබෙන තෙක් TV වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ වෙනම විෂයයක් ලෙස ගිණුම් වලට ගෙන තිබුණි.

මෙම වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ පසුව ගලපන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුගමනය කිරීමෙන් පසු 2012 වර්ෂය අවසානයට බෙදාහැරීම් වත්කම් සලකන ලද කල්පිත පිරිවැයට (deemed cost) දැක්විය යුතු බව තීරණය කරන ලද අතර හානිකරණ බලපෑම පැන නොනගී.

**2.3.3 නොසැසඳූ වෙනස**

**2.3.3 (අ) ලංකා විදුලිබල මණ්ඩල මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර 2012 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි සමාගමෙන් (LECO) ලැබිය යුතු මුදල ලංවිස මූල්‍ය ප්‍රකාශන සමඟ සසඳා නොතිබුණි.**

ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍ය ප්‍රකාශනවල 15.1 සටහන අනුව ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු මුදල රු.1,788,390 ක් විය. මෙම ශේෂය ලංකා විදුලි සමාගමේ සම්ප්‍රේෂණ අංශයෙන් ලැබිය යුතු මුදල සමඟ ගැලපේ. කෙසේ වුවද ලංවිම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලංවිස විසින් නිරවුල් නොකරන ලද බිල්පත්‍ර සංශෝධන ප්‍රශ්න ගත ශේෂයක් විය. මෙම ශේෂය නිරවුල් කිරීමට ක්‍රියා කරනු ලැබේ.

**(ආ) ප්‍රධාන කාර්යාලයේ අන්තර් ජංගම ගිණුම් ශේෂ හා මණ්ඩලයේ උප අංශයන්හි ශේෂ ගැලපී නොතිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2 ක හා රු.මිලියන 269 ක ශුද්ධ වෙනස්කම් විය.**

විමධ්‍යගත ක්‍රියාවලිය යටතේ පැන නැගී ඉතා පැරණි නොසැසඳූ ශේෂය මෙම ශේෂයෙන් නිරූපනය වේ. ශේෂය හර ශේෂයක් නිරූපනය කරන බැවින් ආදායම් ප්‍රකාශනයට අය කිරීම සඳහා අදාල නොවන අතර එය ලැබිය යුතු යටතේ වර්ග කරන ලදී. මෙම ශේෂ ගිණුම්වලින් ලියා හැරීම සඳහා පියවර ගත යුතුය.

**2.3.3 (ඇ) වත්කම් උපලේඛනය හා කෙරීගෙන යන වැඩ උපලේඛනය ප්‍රකාරව 2012 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ගිණුමෙන් (WIP) දේපල පිරියත හා උපකරණ ගිණුමට මාරු කරන ලද නිම කරන ලද වැඩ අතර රු. මිලියන 307 ක වෙනසක් විය.**

කෙරීගෙන යන වැඩ යටතේ නිරූපනය වන කෙරීගෙන යන වැඩ (WIP) වලින් මාරු කිරීම දේපල පිරියත උපකරණ උපලේඛණයේ එකතු කිරීම් තීරුවේ දැක්වෙන කෙරීගෙන යන වැඩ වලින් මාරු කිරීමේ සංඛ්‍යාව සමග ගැලපේ.
කෙසේ වුවද ට්‍රාන්ස්පෝමර් බිඳ වැටීමෙන් වන ආදේශ කිරීමකදී බිඳ වැටීම සඳහා ආදේශ කිරීමක් විනා වෙනත් කාර්යයක් නොවන බැවින් එය සෘජුවම දේපල පිරියත උපකරණ වලට එකතු කරයි. දේපල, පිරියත, උපකරණ උපලේඛනය යටතේ සෘජුවම ට්‍රාන්ස්පෝමර් එකතු කිරීම නිරූපනය වීම සඳහා විශේෂිත තීරුවක් නොවන බැවින් එම ආදේශ කළ ට්‍රාන්ස්පෝමර්වල පිරිවැය කෙරීගෙන යන වැඩ ශේෂයෙන් මාරු කිරීමට එකතු කරනු ලැබේ. ඒ හේතුවෙන් එම සටහනේ පරිදි කෙරීගෙන යන වැඩ මාරු කිරීම්වල වෙනසක් ඇති වී තිබේ.
කෙසේ වුවද 2013 මූල්‍ය ප්‍රකාශනවල මෙය නිරවුල් කර ඇත.

**2.3.3 (ඈ) කෙරීගෙන යන වැඩ ගිණුමෙන් 2012 වර්ෂයේදී මාරු කරන ලද නිම කළ වැඩ හා දේපල පිරියත හා උපකරණ ගිණුමට මාරු කරන ලද වැඩ වටිනාකම අතර රු.39,501,290 ක වෙනසක් විය.**

වෙනස සසඳන ලදී.

**2.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**2.3.4 (අ) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය අවිනිශ්චිත ශේෂය හා ප්‍රධාන අවිනිශ්චිත ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණය පිළියෙල කර නොතිබූ අතර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

පාරිභෝගිකයන්ගේ සාවද්‍ය ගිණුම් අංකයන්ට කරන ලද ගෙවීම්වලින් මෙම අවිනිශ්චිත ගිණුම් සමන්විත වේ. එබැවින් පාරිභෝගිකයා පැමිණිලි කරන තුරු පාරිභෝගිකයා හඳුනා ගැනීමට වර්තමාන ක්‍රමය පහසුකම් නොසපයයි. පාරිභෝගිකයාගෙන් පැමිණිලි ලැබුණු විට අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.3.4 (ආ) 2002 ජනවාරි සිට අයකරගත යුතු ලෙස රු. මිලියන 38 ක භාණ්ඩ හා සේවා බදු අතිරික්ත ගෙවීමක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි.**

මෙය මණ්ඩලයේ ආදායම් බදු බැරකමට එරෙහිව නිරවුල් කිරීම සඳහා අඛණ්ඩ පරිශ්‍රමයක් දරන ලදී. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් ධනාත්මක ප්‍රතිචාරයක් නොදක්වන ලදී. 2014 ජනවාරි 29 දිනැති මෑතදී යවන ලද ලිපියක පිටපතක් යැවීම මගින් මෙය තවදුරටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ටද සන්නිවේදනය කරන ලදී. ඒ පිළිබඳ මෑතදී යැවූ ලිපි මෙයට අමුණා ඇත.

**2.3.4 (ඇ) ලංවිම බස්නාහිර පළාත දකුණ - 11 හි හර හා බැර ශේෂයන් දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.**

ලංවිස හි ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමෙන් පසුව ශුද්ධ මුදල රු.මිලියන 11 කි. FAC මුදල රු මිලියන 18 ක් ලං.වි.ම විසින් 2012 වර්ෂයේදී සම්ප්‍රේෂණ අංශයට ගෙවන ලදී. ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කෙරේ.

**2.3.4 (ඈ) ජාත්‍යන්තර සහයෝගිතාවය සඳහාවූ ජපන් බැංකුවෙන් (JBIC) ලැබුණු රු. මිලියන 3,047 ක වැඩ සටහන් ණය**

භාණ්ඩාගාරයෙන් දිගු කාලීනව ලැබිය යුතු හිඟ රු. මිලියන 3,047 ක මුදල විගණන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය ප්‍රකාරව පෙර වර්ෂ ගැලපුම් ලෙස 2003 වර්ෂයේදී දැනටමත් කර තිබූ සටහන් සිදු කිරීම සඳහා 2013 වර්ෂය තුළදී ඉදිරියට ගෙන ආ රඳවා ගත් ලාභ හෝ පාඩු සඳහා අය කරන ලදී.

විගණන කමිටුවේ නිර්දේශය පරිදි හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස 2013 වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**2.3.5 (අ) ඌව පළාත් කාර්යාලයට අයත් රු. මිලියන 38 ක් වටිනා ඉඩම් 12 ක ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

ලංකා විදුලි බල මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් ලිය කියවිලි සොයාගැනීමට සහ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.3.5 (ආ) බස්නාහිර පළාත් දකුණ II ට අදාලව කාර්යයන් කිහිපයක් වර්ෂ 1 කට වැඩි කාලයක් සම්පූර්ණ නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

2013 වර්ෂය තුළදී රු. මිලියන 616 ක් වටිනා කාර්යයන් ස්ථාවර වත්කම්වලට මාරු කර තිබූ අතර කෙරීගෙන යන වැඩ වල දිගු කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. වර්තමාන කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| කාල විශ්ලේෂණය | 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ | 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ | 2013 වර්ෂය තුළදී මාරු කිරීම් |
|---|---|---|---|
| වර්ෂ 1 සිට 2 | 449,955,947 | 357,628,062.84 | 92,327,884.16 |
| වර්ෂ 2 සිට 3 | 268,359,156 | 172,699,582.73 | 95,659,573.27 |
| වර්ෂ 3 සිට 4 | 123,574,788 | 99,089,011.80 | 24,485,776.20 |
| වර්ෂ 4 සිට 5 | 58,049,812 | 98,928,094.05 | 23,617,902.95 |
| වර්ෂ 5 ට වැඩි | 64,496,185 | | |
| **එකතුව** | **964,435,888** | **728,344,751.42** | **236,091,136.58** |

**2.3.5 (ඇ) 2012 දෙසැම්බර් 31 දිනට මාස 6 කට වැඩි කාලයකට පෙර මණ්ඩලයට ලැබී තිබූ එකතුව රු. මිලියන 14 ක් වටිනා තොග විෂයයන් 07 ක් වර්ෂය අවසාන තොගයට ගෙන නොතිබුණි.**

විගණන වාර්තාවේ සඳහන් කර තිබූ ටෙන්ඩර් අංකයන්වලින් පහත සඳහන් ටෙන්ඩර් සඳහා තොග 2013 වර්ෂයේ දී ලැබී තිබුණි. එම නිසා එය මාර්ගස්ථ බඩු ගිණුමේ පැවතිය යුතුය.

| | |
|---|---|
| DGM (CC)/EE(MM)/PPC/2011/173 | Rs.6,396,620/- |
| R1/P&D/T/2012/18 | Rs. 2,343,552/- |
| | Rs. 8,740,172/- |

වාර්තාවේ දැක්වෙන ඉතිරි ශේෂය කොළඹ නගර පළාත් (Colombo City Province) තොගය යටතේ වාර්තා කර තිබුණු අතර 2013 වර්ෂයේදී නිරවුල් කර ඇත.

**2.3.5 (ඈ) රු. මිලියන 128,240 ක වටිනාකමට මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද ණය හතරක් සම්බන්ධයෙන් උප * ණය ගිවිසුම් නොතිබුණි.**

හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය හා ඉහළ කොත්මලේ ජල විදුලි බල ව්‍යාපෘතිය අදියර II සඳහා උප ණය ගිවිසුම් සභාපති හා එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් අත්සන් කර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අත්සන සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලදී. පැරණි ලක්ෂපාන පුනරුත්ථාපන විදුලිබල පිරියත හා නව ලක්ෂපාන හා විමල සුරේන්ද්‍ර පුනරුත්ථාපන ව්‍යාපෘතිවලට අදාළව වෙනත් උප ණය ගිවිසුම් දෙකක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඔවුන්ගේ එකඟත්වය සඳහා ඉදිරිපත් කරන ලදී. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් එය නීතිමය නිශ්කාෂණය සඳහා නීතිපතිට යවන ලද බව දන්වා තිබුණි.

ණය ගිවිසුම් අවසන් වූ පසු පොලිය හා ආපසුගෙවීම පිළිබඳ විස්තර විගණනයට දන්වා එවනු ලැබේ.

**2.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**2.3.6 (අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත**

**2.3.6 (අ) (i) 47(1) (ආ) වගන්තිය * මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ණය අරමුදල 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබීම - රු. මිලියන 17,447**

කාල පරිච්-දය තුළ ලංවිමට විඳීමට සිදුවූ අඛණ්ඩ මෙහෙයුම් පාඩු හේතුවෙන් 2000 වර්ෂය සිට ණය නිදහස් කර ගැනීමේ සංචිතය සඳහා වෙන් කිරීමක් කර නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් ප්‍රවාහ තත්ත්වය මත එම සංචිතයට අරමුදල් ප්‍රතිපාදනය සඳහා තීරණය කරනු ලැබේ.

කෙසේ වුවද 47(1) (ආ) වගන්තිය, කිසිඳු වාර්ෂික දායකයක් පිළිබඳව දක්වා නැති අතර වාර්ෂික දායකය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවසරයක් දී නැත.

**2.3.6 (ii) 47(2)(අ) වගන්තිය - මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපල වල ක්ෂය ආවරණය කිරීම සඳහා ක්ෂය සංචිතය - 2000 වර්ෂයේ සිට කිසිඳු වෙනසක් සිදුවී නැත.**

ලං.වි.ම හි අඛණ්ඩ පාඩු සිදුවීම හේතුවෙන් මෙම සංචිතයද යාවත්කාලීන කර නැත.

47(2) (අ) වගන්තිය අනුව 2000 වර්ෂය දක්වා උපයන ලද ලාභ වලින් වෙන් කරන ලද අරමුදල් වලින් ක්ෂය සංචිතයක් ස්ථාපිත කර තිබුණි.කෙසේ වුවද මෙය බාහිරව ආයෝජනය කර නැත.

**2.3.6 (අ) (iii) 47(2) (ආ) වගන්තිය * මණ්ඩලයේ මූල්‍යයන ස්ථාවරත්වය තහවුරුකර ගැනීම මගින් ආදායම් මුදල් වලින් ප්‍රාග්ධන වැඩ වලට මූල්‍යනය කිරීමේ අරමුණින් වූ පොදු සංචිතය 2000 වර්ෂය සිට යාවත්කාලීන කර නොතිබුණි. රු. මිලියන 165.446**

ඍණ මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් හා ලංවිම විසින් සිදු කරන ලද අඛණ්ඩ පාඩු හේතුවෙන් මෙම සංචිතයටද ප්‍රතිපාදනයක් 2000 වර්ෂයේ සිට සිදු කර නැත.

**2.3.6 (ආ) 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයට දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් පදනම්කරගෙන රක්ෂණ සංචිත අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 4,433 ක් පැවතීම.**

මෙසේ එය අඛණ්ඩව පවත්වාගෙන යාමට හෝ භාණ්ඩාගාරයේ වෙනම ගිණුමක් පවත්වා ගැනීමට භාණ්ඩාගාරය සමග සාකච්ඡා කරනු ලැබේ. ඕනෑම අවස්ථාවකදී සිදුවන පාඩුවක් එම පාඩුවෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණු සඳහා ක්ෂණිකව අවශ්‍යවන අරමුදල් සඳහා රක්ෂණ සංචිත අරමුදල ඇති කරන ලදී.

**2.3.6 (ඇ) සේවකයන් විසින් දැරිය යුතු උපයන විට ගෙවීම් බදු මණ්ඩලය විසින් දැරීම**

ලංවීම සේවකයන් උපයන විට ගෙවීම් බදු සඳහා වගකීමට යටත් දින සිට ලංකා විදුලි බල මණ්ඩලය විසින් එකී සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු බැරකම දරා තිබුණි. මෙය අවස්ථා කිහිපයකදී විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයට හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට දන්වා තිබූ අතර වෘත්තීය සංගම් සමග සාකච්ඡාවන්ද සිදු කරන ලදී. එහෙත් කිසිදු පොදු එකඟතාවයකට නොඑළඹුණි. යෝජිත සාමුහික ගිවිසුමට පෙර මෙම කරුණ සේවකයන් හා වෘත්තීය සංගම් සමඟ සාකච්ඡා කරනු ඇත.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

දැනගැනීම සඳහා

**3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

දැන ගැනීම සඳහා

**3.3 මෙහෙයුම් සමාලෝචනය**

**3.3.1 විදුලි උත්පාදනය**

දැන ගැනීම සඳහා

**3.3.2 සෘජු පිරිවැය විශ්ලේෂණය**

දැන ගැනීම සඳහා

**3.3.3 ඒකක මිල විශ්ලේෂණය**

දැන ගැනීම සඳහා

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**3.4 (අ) 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත, රජයවිසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත මගින්, ලංකා විදුලිබල මණ්ඩලය එයට අදාළ ව්‍යවස්ථාවලියක් මගින් ස්ථාපනය කරන ලදී.

ප්‍රතිපත්තියක් වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට නිකුත් කරන භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ බොහොමයක් අනුගමනය කරයි. සමහර අවස්ථාවලදී අදාළ පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම මගින් ලංකා විදුලිබල මණ්ඩල කටයුතුවලට අදාළ වන කරුණු මත භාණ්ඩාගාර චක්‍රලේඛ මෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලද දක්වා ඇති මාර්ගෝපදේශ ලංවීම විසින් අනුගමනය කරයි.

**3.4 (අ) (i) මණ්ඩලය විසින් විවිධ දීමනා ගෙවා තිබුණි.**

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව ලංවිම සේවකයන්ට දීමනා ගෙවීම සඳහා 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. කෙසේ වුවද දීමනා ගෙවීම හා කාර්ය සාධනය පදනම්කරගත් දිරි දීමනා ක්‍රමය වෘත්තීය සමිති සමග එළඹිය යුතු සමූහ ගිවිසුමට ඇතුළත් කිරීමට අපේක්ෂිතය.

**3.4 (අ) (ii) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව ලිපිකරුවන්, කැෂියර්වරුන්, ගබඩාකරුවන්, යතුරු ලියන්නන්, රියදුරන්, කාර්යාල සහායකයින් කම්කරුවන් ආදි නුපුහුණු හා අර්ධ පුහුණු සේවකයන් දීප ව්‍යාප්ත ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව වාර්ෂිකව බඳවා ගෙන තිබුණි.**

ලංකා විදුලි බල මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියට අනුව විධායක හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික ශ්‍රේණිවල පුරප්පාඩු ප්‍රතිශත පදනමකින් බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පිරවීම අවශ්‍ය වේ. ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන් හා MLTS ශ්‍රේණිවල විදුලි අධිකාරීන් වැනි විධායක ශ්‍රේණි අයදුම්කරුවන් සඳහා ජාතික පුවත්පත්වල දැන්වීම් පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අනිකුත් සියළුම සේවක වර්ගයන් සඳහා ඉල්ලුම්පත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් සපයනු ලබන ලැයිස්තු මගින් ලබාගෙන ලංවිම අධ්‍යක්ෂමණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනාක්‍රමයේ සුදුසුකම් සපුරාලන සමහර විධායක නොවන ශ්‍රේණිවල අයදුම්කරුවන්ට ලංවිම වෙනුවෙන් රජයේ ආයතනයක් විසින් පවත්වනු ලබන තරඟකාරීවිභාගයකට පෙනී සිටීම අවශ්‍ය වේ. තරඟකාරීවිභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව මත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් තහවුරුකර තෝරා ගනු ලැබේ. මෙම සමස්ථ බඳවාගැනීම් පරිපාටිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 මගින් හඳුන්වා දෙන ලද පරිපාටියට ඉතා සමාන වේ.

**3.4. (අ) (iii) සේවකයන්ට තාවකාලිකව ගෙවන රු. 1,000 ක මාසික දීමනාව**

මෙම තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්වීමෙන් එහි 2012 ජුනි 06 දින පවත්වන ලද රැස්වීමේදී 2008 සිට ගෙවන මෙම තාවකාලික දීමනාව නැවැත්වීමේ දුෂ්කරතාවය පැහැදිලි කරමින් විගණකාධිපතිවරයාට ලිපියක් යැවීමට තීරණය කරන ලදී. එසේම මණ්ඩලය විසින් මෙය සමූහ ගිවිසුම මගින් නිරාකරණය කිරීම සඳහා ප්‍රයත්නයක් දැරීමටද තීරණයෙහි ඇතුළත් කර තිබුණි. ඒ අනුව වෘත්තීය සමිති සමග එළඹි සමූහ ගිවිසුමෙහි මෙය ඇතුළත් කරනු ලැබේ.

**3.4 (අ) (iv) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, 10% සිට 14% දක්වා පොලියකට වාහන ණය ලබාදීම වෙනුවට 4.2% පොලියට මණ්ඩලය විසින් ලබා දීම**

ලංවිම සේවකයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සහනදායි පොලී අනුපාතයකට ආයතන සංග්‍රහයේ දක්වා ඇති කොන්දේසි හා අවශ්‍යතා ප්‍රකාරව වාහන ණය ලබාදී තිබුණි. කෙසේ වුවද, ලංවිම වර්තමාන මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාහන ණය ඇතුළත් සේවක ණය සේවයේ ස්ථිර කරන ලද සේවකයන්ට පමණක් ලබා දී තිබුණි.

**3.4 (ආ) 1990 වර්ෂයේ සිට රක්ෂණ සංචිතයේ ආයෝජන පිළිබඳ තීරණ ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු විසින් ගෙන තිබුණි.**

ලෝක බැංකුව සමග වූ ගිවිසුම් ප්‍රකාරව වාර්ෂිකව රක්ෂණ සංචිතයට මාරු කරන ගැලපීම්වල ශුද්ධ මුදල ආයෝජනය කළ යුතුය. එය පෙර වර්ෂ කිහිපයක සිට ලංවිම පරිපාටිය වන අතර රක්ෂණ සංචිත අරමුදල සම්බන්ධයෙන් ආයෝජන තීරණ ලංවිම සාමාන්‍යාධිකාරී සමඟ එකඟත්වයෙන් මුදල් කළමනාකරු විසින් ගනු ලැබේ.

**3.4 (ඇ) 2013 වර්ෂයේ රු.මිලියන 1,200 ක භාණ්ඩාගාර ණය ශේෂය ආදායමට මාරු කිරීම**

මහා භාණ්ඩාගාරයෙන් ලංකා විදුලි බල මණ්ඩලයට දෙන ලද අරමුදල් රු.මිලියන 1200 ක කෙටි කාලීන ණය සම්බන්ධයෙන් පෙර වර්ෂ වල විගණන විමසුම්වලට අනුව, එකී ණය ලංවිම විසින් ණයක් ලෙස හෙළිදරව් කර තිබුණද, භාණ්ඩාගාර පොත්වල ණයක් ලෙස සඳහන් වී නොතිබුණි. 2013 වර්ෂයේදී භාණ්ඩාගාර පොත් පරීක්ෂා කිරීමෙන් පසු එම මුදල 2003 වර්ෂය අවසානයේ ලංවිම ට ලබාදුන් ප්‍රදානයක් බව පෙනී ගියේය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම රු.මිලියන 1200 ක මුදල භාණ්ඩාගාරය වෙනුවෙන් දායක ප්‍රාග්ධන ගිණුමට නිවැරදි කරන ලදී.

**3.4 (ඈ) සුනිත්‍ය බල ශක්ති අධිකාරියෙන් (SEA) ලැබිය යුතු ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට බැරකමක් ලෙසසටහන් කිරීම - රු. මිලියන 897**

පුනර්ජනනීය බලය සඳහා පිරිවැය පදනම් ගාස්තු ඇති කරන අවස්ථාවේදී අත්හැරි පිරිවැයෙන් (avoided cost) 90% කට සමාන කොටසක් පමණක් ලංවීම දැරීමට තීරණය කරන ලදී. ගාස්තු පදනම් කරගත් මුළු මුදල ලංවීම විසින් ගෙවිය යුතු බව හා අත්හැරි පිරිවැයෙන් (avoided cost) 90% කට අතිරේක ප්‍රමාණය සුනිත්‍ය බලශක්ති අධිකාරිය ලංවීමට ප්‍රතිපූර්ණය කළ යුතු බවට තවදුරටත් එකඟවන ලදී, ප්‍රතිපූර්ණය කළ යුතු මෙම මුදල මාසිකව ලංවීම විසින් සුනිත්‍ය බලශක්ති අධිකාරියට දන්වනු ලැබේ. 2010.12.31 දක්වා ලැබිය යුතු මුදල රු. මිලියන 897 කි. ඒ අනුව සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලැබිය යුතු ලෙස ලංවීම වාර්තා කරන ලදී. මේ සම්බන්ධයෙන් අදහස් දන්වන ලෙස 2013 ඔක්තෝබර් 01 හා 2012 ජනවාරි 16 ලිපිවලින් අවස්ථා කිහිපයකදී ලංවීම විසින් ඔවුන්ට දන්වන ලදී. එහෙත් කිසිදු ප්‍රතිචාරයක් මේ දක්වා ලැබී නැත.

**3.4 (ඉ) රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනය අතර නිරීක්ෂණය වූ රු. මිලියන 3,724 ක ඌනතාවය**

ලංකා විදුලි බල මණ්ඩලයේ අහිතකර ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන් අරමුදලේ ඌනතාවය දැරිය නොහැකිය.

**3.4 (ඊ) ලෙකෝ සමග විකුණුම් ගිවිසුම් නොතිබූ අතර, ලංකා ඛණිජතෙල් සංස්ථාව අතර මිලදී ගැනීම් ගිවිසුම් නොතිබුණි.**

ලෙකෝ හා ලංකා විදුලිබල මණ්ඩලය අතර විකුණුම් ගිවිසුම කෙටුම්පත් කර එහි නීතිමය රාමුව තහවුරු කර ගැනීම සඳහා ලංවීම ප්‍රධාන නීති නිලධාරීට ඉදිරිපත් කර ඇති අතර ගිවිසුම අවසානයට ගෙන ඒමට පසු විපරම් සඳහා අපේක්ෂාවෙන් සිටී.

ලංකා ඛනිජ තෙල් සංස්ථාවද රාජ්‍ය සංස්ථාවක් වන අතර බොහෝ කාලයක් ලංකා විදුලි බල මණ්ඩලයට ඉන්ධන සපයයි. සැපයුම් කොන්දේසි රජයේ ප්‍රතිපත්තිය සමග තීරණය කෙරෙන බැවින් ඉන්ධන මිලදී ගැනීම සඳහා වෙනම ගිවිසුමක් අවශ්‍ය නොවේ.

**3.4 (උ) වාහන 31 ක් රු. මිලියන 32 ක වෙළඳපොල වටිනාකමට අගය කිරීම**

විගණන වාර්තාවේ සඳහන් වාහන පිළිබඳ වෙනස්කම් සිදුකිරීමට අදාළ අනුමැතීන් ලබාගැනීම සඳහා කටයුතු කරමින් ඇත.

**3.4 (ඌ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ට (IPPS) ගෙවන ලද ධාරිතා ගාස්තු**

මෙම සියළුම ස්වාධීන විදුලි බල නිෂ්පාදකයන්ගේ වැඩි නොවන සංචරක (non escalable components) සඳහා ගෙවීම් එක් එක් නිෂ්පාදනයේ PPAS එකඟ වූ ගාස්තු සැලැස්ම හා මූල්‍ය රටාව අනුව ගෙවනු ලැබේ. එබැවින් වැඩි නොවන සංරචක ණය සේවා කාලය ඉක්මවීමෙන් පසුවද ඍන තත්ත්වයට පත්විය නොහැක.

**3.4 (එ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ට අයත් විදුලිබල පිරියත වල මෙහෙයුම් හා නඩත්තු පිරිවැය**

සියළුම ප්‍රතිපූර්ණය කළ යුතු බදු PPA ප්‍රකාරව ගෙවනු ලැබේ. ඒ අනුව විදුලිබල පිරියත වැඩ නඩත්තුවට අදාළ ප්‍රසම්පාදන බදු ප්‍රතිපූර්ණය සඳහා සංවර්ධනය කරන්නා හිමිකම් ලබයි. කෙසේ වුවද විදුලිබල පිරියතවල එක් එක් හා සියළුම නඩත්තු වැඩ අධීක්ෂණය කිරීමේදී ලංකා විදුලිබල මණ්ඩලයට ප්‍රායෝගික දුෂ්කරතාවක් පවතී.

**3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**3.5 (අ) උතුරු විදුලිබල පිරියතින් එකඟවූ විදුලි බල ගිවොපැ (GWH) ප්‍රමාණය සපයා නොතිබුණි.**

2013 සැප්තැම්බර් 30 දින උතුරු පළාතේ විදුලිබල පිරියත ක්‍රියාත්මක කරන තෙක් විදුලිබල පිරියතේ ලබාගත හැකි තථ්‍ය ධාරිතාවය සැලකිම මගින් ස්ථාවර ගාස්තු සඳහා ගෙවීම් කර තිබූ අතර එය සහතික කරන ලද පිරියත ධාරිතාවය වන මෙ.වො. 30 පදනම් කර ගෙන නොවේ.

එකඟවූ විදුලිබල මිලදී ගැනීම් ගිවිසුමට අනුව, ලංවීම අවශ්‍යතාවය පදනම් කරගෙන මෙම විදුලිබල පිරියතවලින් බලශක්ති මිලදී ගන්නා බැවින් සියළුම ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ඒකක පිරිවැය සාමාන්‍ය විකුණුම් මිලට වඩා වැඩි වේ.

**3.5 (ආ) රු. මිලියන 9 ක් වටිනා ගැල්වනයිස් නොකළ විෂයයන් සම්බන්ධිත පාර්ශව සමාගමකට භාරදීම**

එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්ගලික) සමාගමේ නිලධාරීන් සමග සාකච්ඡා පදනම් කරගෙන සඳහන් කරන ලද ද්‍රව්‍ය ගැල්වනයිසින් කිරීමෙන් පසු පළාත්වලට බෙදා හැර තිබුණි. කෙසේ වුවද ද්‍රව්‍ය පිට කිරීමේ සටහන් පරීක්ෂා කිරීමෙන් තොරව ද්‍රව්‍ය යවන ලද නිශ්චිත පළාත් සොයා ගැනීමට නොහැක. එම නිසා තොග බෙදාහැරියේ කුමන පළාතටද යන්න තහවුරු කර ගැනීම සඳහා එල්ටීඑල් විසින් ද්‍රව්‍ය පිටකිරීමේ සටහන් පරීක්ෂා කරමින් පවතී. එම සටහන් පිළිබඳ පසු විපරම් LTL වලින් ලැබීමෙන් පසුව, 2014 වර්ෂය තුළදී ශේෂය නිරවුල් කරනු ලැබේ.

**3.5 (ඇ) ඇගයීම් කමිටුව විසින් රු. මිලියන 76 ක් වටිනා වාහන 79 ක් ධාවනයට නුසුදුසු ලෙස හඳුනාගෙන තිබුණි.**

ධාවනයට නුසුදුසු ලෙස හඳුනාගත් වාහන අපහරණය කිරීම සඳහා කමිටු පත් කිරීමට පියවර ගනු ලැබේ.

**3.5 (ඈ) පිරිවැය රු. මිලියන 30 ක් වූ තොග විෂයයන් හානි වූ තොග ලෙස හඳුනා ගැනීම**

බස්නාහිර පළාත් දකුණ II හි හානි වූ තොග අපහරණය කිරීමේ ක්‍රියාවලිය 2013 වර්ෂයේ අවසානයේ ආරම්භ කර තිබුණි. සම්පූර්ණ ක්‍රියාවලිය තවම නිම කර නොතිබුණි.

**3.5 (ඉ) බස්නාහිර පළාත් දකුණ II කාර්යාලය විසින් පාරිභෝගිකයන් 172 දෙනෙකුගෙන් අවශ්‍ය ආරක්ෂක තැන්පතුව වූ රු. මිලියන 86 ට වඩා අඩුවෙන් රු. මිලියන 61 ක තැන්පතුවක් තබා තිබුණි.**

කොන්ත්‍රාත් ඉල්ලුම ප්‍රකාරව මුලදී තැන්පතු ලබා ගන්නා ලදී. වර්තමාන පරිභෝජනය පරීක්ෂා කර අතිරේක තැන්පතු ලබා ගැනීමට අවධානය යොමු කරනු ලැබේ.

**3.5 (ඊ) (ii) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදයේ (සියළුම ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන ස්වකීය පද්ධති/ අත්පොත තිබීම හා ක්‍රමානුකූලව සංශෝධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.**

1985 - 1987 කාලය තුලදී පළමු පරිශ්‍රමයක් ලෙස ලංවීම සියළු තනතුරු සඳහා ලං.වී.ම විසින් මෙහෙයුම් හා ක්‍රියාකාරී අත්පොත් පිළියෙල කරන ලදී. බොහෝ මෙහෙයුම්/ පද්ධති සඳහා භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලං.වී.ම විසින් අනුගමනය කරන අතර අප විසින් අපගේ චක්‍රලේඛ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබාගනිමින් නිකුත් කරනු ලැබේ. පටිපාටි අත්පොත් යාවත්කාලීන කිරීමට දැනටමත් පියවර ගෙන ඇති අතර යථා කාලයේදී යාවත්කාලීන කරන ලද පටිපාටි නිකුත් කරනු ලැබේ.

**3.5 (උ) (i) නිවාස ණය සඳහා සේවකයන්ට 2/3 ක පොලිය ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් පොදු දුර්වලතා**

අභ්‍යන්තර විගණන අංශය විසින් වෙනම විගණනයක් සිදුකරන ලද අතර පද්ධතියේ පොදු දුර්වලතා සොයාගෙන විගණන කමිටුවේ අවධානයට යොමු කරන ලදී. විගණන කමිටුවේ නිර්දේශය ලැබුණු වහාම නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**3.5 (ඌ) (ii) 2012 වර්ෂයේදී මණ්ඩලයේ සේවකයන් 1,765 දෙනෙකුට රු. මිලියන 446 ක් වාහන ණය ලබා දී තිබුණි.**

පොදු දුර්වලතා නිවැරදි අරමුණින් 2014 පෙබරවාරි 11 දිනැති අංක 2014/ජීඑම්/03/එෆ්එම් දරන චක්‍රලේඛය වාහන ණය පරිපාටියට අදාළව විධිමත් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා නිකුත් කර තිබුණි. තවද ලංවීම චක්‍රලේඛ අදාළ කර ගැනීමට හා නිවැරදි පරිපාටිය අනුගමනය කිරීම සඳහා උපදෙස් දැනටමත් නිකුත් කර ඇති බවට අදාළ අංශයන් සනාථ කර තිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**3.6 (අ) මණ්ඩලයේ බඳවා ගැනීම් පරිපාටිය (SOR) දීර්ඝ කාලයක් යාවත්කාලීන කර නොතිබුණි**

බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය (SORP) සමාලෝචනය කර වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.

**3.6 (ආ) අනුමත සේවක සංඛ්‍යාවක් නොමැතිව මිනිස් බල සමාගම්වලින් බඳවා ගැනීම් සිදු කර තිබුණි.**

ලංකා විදුලි බල මණ්ඩලයේ බෙදා හැරීම් අංශයේ සේවා සඳහා බාහිරින් බදවා ගැනීම් සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද කාර්ය මණ්ඩල සැලස්මක් 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලදී.
2012 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල සැලැස්ම අනුව පහත දැක්වෙන සේවා බාහිරින් බදවා ගත යුතුය.

සේවා සම්බන්ධතා වැඩ (සේවා කොන්ත්‍රාත්තු)
බෙදා හැරීම් ඉදිකිරීම් වැඩ (සේවා කොන්ත්‍රාත්තු)
මංවර හෙළිකිරීම් (සේවා කොන්ත්‍රාත්තු)
පරිභෝගික සේවා මධ්‍යස්ථාන ආරක්ෂණ (සේවා කොන්ත්‍රාත්තු)
පිරිසිදු කිරීමේ සේවාව (සේවා කොන්ත්‍රාත්තු)
බිල්පත්‍ර සේවාව (කෑලි පදනම)
දත්ත ඇතුලත් කිරීමේ සේවාව (කෑලි පදනම)
කුලී කොන්ත්‍රාත් ලෙස වාහන සමග රියැදුරු
නුපුහුණු ක්ෂේත්‍ර සේවය
කාර්යාල සේවක
කා.කා.ස. යතුරුලියන වැඩ (සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ/
පිළිගැනීමේ නිලධාරී/ දුරකථන මෙහෙයුම්කරු/ පාරිභෝගික සේවා සහායක
ඇමතුම් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය.

} මිනිස් බල සේවා

කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා පිරිවැය අඩු කිරීමේ අරමුණින් මිනිස්බල නියෝජිතායතන මගින් මෙම ප්‍රතිපත්ති පදනම් කරගෙන බාහිරින් යොදා ගැනීම් සිදුකරන ලදී.

**3.6 (ඇ) 2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද කාර්ය මණ්ඩල සැලැස්ම අභිබවමින් මිනිස් බල සැපයුම් 946 ක් බාහිරින් යොදා ගන්නා ලදී.**

බාහිරින් යොදා ගන්නා ලද මුළු මිනිස් බල සංඛ්‍යාව 2012 දෙසැම්බර් 31 දිනට 4,045 ක් විය. ඉහත විස්තර කරන ලද පරිදි මූල්‍ය වගකීම ලිහිල් කර ගැනීම සඳහා මිනිස් බලය බාහිරින් ලබා ගැනීම සිදුකරන ලදී.

**3.6 (ඈ) අනුමත කාර්ය මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු වී පැවතුණි**

2012 දෙසැම්බර් 31 දිනට සේවකයන් මුළු ප්‍රමාණය 16,709 ක් වූ අතර පුරප්පාඩු 761 ක් විය. විගණන වාර්තාවේ දැක්වෙන තත්ත්වය 2013 සැප්තැම්බර් 30 දිනට පසු තත්ත්වයක් විය.

කෙසේ වුවද 2013 වර්ෂය තුළදී විධායක ශ්‍රේණියේ කාර්යමණ්ඩලය 85 ක්ද (ඉංජිනේරුවන් 66 ක් ගණකාධිකාරිවරුන් 13 ක් ඇතුලත්ව), මධ්‍යම ප්‍රමාණයේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩලය 53 ක් හා වෙනත් වර්ගයන් සඳහා කාර්ය මණ්ඩලය 324 ක් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් බදවා ගන්නා ලදී.

**3.6 (ඉ) නුපුහුණු ක්ෂේත්‍ර සේවාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 1,702 කින් ඉක්මවා තිබුණි.**

බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය ප්‍රකාරව නුපුහුණු ක්ෂේත්‍ර සේවාව හා අර්ධ පුහුණු සඳහා බදවා ගැනීම් නුපුහුණු සේවකයන්ට උසස්වීම් සඳහා මාර්ගය වේ. එම සේවක වර්ගයන්ගේ වැඩි වයස් සේවකයන් සිටින බැවින් විශ්‍රාම යාම් ඉල්ලා අස්වීම් ආදිය නිසා ඇතිවන පුරප්පාඩු පුහුණු හා අර්ධ පුහුණු සේවක වර්ගයන් ලංවීම මෙහෙයුම් අවශ්‍යතාවය සැලකිල්ලට ගැනීමෙන් නුපුහුණු වර්ගයන්ගෙන් පුරවනු ලැබේ. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට ඉහත වර්ගයන්ගේ ඒකාබද්ධ කරන ලද අතිරේක කාර්ය මණ්ඩලයක් නොමැත.

**3.6 (ඊ) උසස්වීම් සඳහා සලකනු ලැබූ එකම කරුණ ජ්‍යෙෂ්ඨත්වය පමණක් වූ අතර අනුප්‍රාප්තික සැලැස්මක්ද නොතිබුණි.**

ලංවීම බඳවා ගැනීම් හා උසස්වීම් යොජනා ක්‍රමයේ දක්වා ඇති නිර්නායකයට අනුව තනතුරු පුරප්පාඩු ඇති වූ විට උසස්වීම් හා බදවා ගැනීම් සිදුකරනු ලැබේ.

**3.6 (උ) විධිමත් මාරු කිරීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය නොවීය**

සේවා කොන්දේසි අනුව සියළුම ලංවීම සේවකයන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම අපේක්ෂිතය. කෙසේ වුවද මාරු කිරීම් නියමිත ක්‍රමයකට සිදු නොවන නමුත් පහත සඳහන් අවස්ථාවන්හිදී අවශ්‍ය පරිදි සාමාන්‍යයෙන් මාරු කිරීම් සිදු කරනු ලැබේ.

(1) සේවය අත්‍යවශ්‍ය අවස්ථාවකදී

(2) පරිපාලනමය කරුණු හේතුවෙන්

(3) විනය ක්‍රියා මාර්ග මත

(4) අසනීපයක් හේතුවෙන්, දරුවන්ගේ අධ්‍යාපන පහසුකම් සඳහා, ආර්ථික ආතතිය අඩු කර ගැනීමට, එකම ස්ථානයක ස්වාමිපුරුෂයා හා භාර්යාවට සේවයේ යෙදීමට පහසුකරලීමට හා වෙනත් සාධාරණ හේතූන් මත ස්ථාන මාරු කිරීම සඳහා සේවකයන්ගේ ඉල්ලීම් ලබාදීමට.

(5) සේවකයන්ට තම පදිංචි ස්ථානයන්හි අවට සේවය කිරීමට අවස්ථා ලබා දීමට සඳහා.

මාරු කිරීම් සම්බන්ධයෙන් වාර්ෂිකව සලකා බලන අතර, මාරු කිරීම් සඳහා සේවා ස්ථාන වර්ග කර ඇති අතර, සේවා ස්ථානයේ සේවය කළ යුතු අවම කාලපරිච්ඡේදය සේවය කර නොමැත්තේ නම් ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

1 පන්තියේ හා ඉහළ නිලධාරීන්ගේ මාරු කිරීම් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි වරින් වර සිදුකරනු ලැබේ.

**3.6 (ඌ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පීරිස්) නමුත් එම තනතුරට අවශ්‍ය මානව සම්පත් සුදුසුකම් හා පළපුරුද්ද, වෙනත් සේවාවල තනතුරුවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරු තනතුරුවලට විවෘත වන පරිදි බඳවා ගැනීම් යෝජනා ක්‍රමයේ දක්වා නොතිබුණි.**

අදහස් දැක්වීම් බඳවා ගැනීම් යෝජනාක්‍රම සමාලෝචිත කමිටුවේ සලකා බැලීම සඳහා ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ.

**3.6 (එ) පිරිස් කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරු (මානව සම්පත්) නම් තනතුර වෙන වෙනම වෘත්තියන් දෙකක් අතර නොගැලපීමක් ඇති කර තිබුණි.**

අදහස් දැක්වීම් බඳවා ගැනීම් යෝජනාක්‍රම සමාලෝචන කමිටුවේ සලකා බැලීම සඳහා ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ.

**3.6 (ඒ) මානව සම්පත් නිලධාරී සේවයේ මුළු සේවක සංඛ්‍යාවෙන් 50% ක් බාහිරව පුරවන අතර, උසස්වීම් යෝජනාක්‍රමයේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් නොමැතිව වර්ෂයෙන් වර්ෂයට එම ප්‍රතිශතය වැඩි කිරීමට සැලසුම් කර තිබුණි.**

අදහස් දැක්වීම් බඳවා ගැනීම් යෝජනාක්‍රම සමාලෝචන කමිටුවේ සලකා බැලීම සඳහා ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ.

**3.6 (ඔ) මානව සම්පත් කළමනාකරු හා මානව සම්පත් නිලධාරී සෘජුවම බඳවා ගැනීමට අදාළව අවශ්‍ය පළපුරුද්ද නොමැති වීම**

අදහස් දැක්වීම් බඳවා ගැනීම් යෝජනා ක්‍රම සමාලෝචන කමිටුවේ සලකා බැලීම සඳහා ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ.

**3.7 අයවැය පාලනය**

**අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.**

ලංකා විදුලි බල මණ්ඩලය විසින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදා ගනු ලැබේ. කෙසේ වුවද සෘජු උත්පාදන පිරිවැය හා වෙනත් මෙහෙයුම් හා නඩත්තු පිරිවැය පිළිබඳ පාලනය කළ නොහැකි අවස්ථාවන් ඇති වූ විට අයවැය තථ්‍ය ප්‍රතිඵල වලින් වෙනස් වේ.

**ආදායම් විචලනය**

2012 වර්ෂයේදී අයවැයගත විකුණුම් රු. මිලියන 161,524 ක් වූ අතර තථ්‍ය විකුණුම් රු. මිලියන 163,998 ක් වූයෙන් 2% ක හිතකර විකුණුම් විචලනයක් ලංවීම අත්කරගෙන තිබුණි. තවද ඒකක මිලියන 189 කින් ඒකක විකුණුම් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් මෙම විචලනයේ හිතකර විචලන පරිමාව රු. මිලියන 2,962 ක් විය. කෙසේ වුවද අයවැයගත විකුණුම් මිල ඒකකයට රු. 15.70 සිට රු. 15.65 දක්වා ඒකකයට රු. 0.05 කින් තථ්‍ය විකුණුම් මිල අඩුවීම හේතුවෙන් රු. මිලියන 488 ක අහිතකර විචලන රේටයක් වාර්තා විය.

**වියදම් විචලනය**

2012 වර්ෂය සඳහා රු. මිලියන 236,969 ක අයවැය ගත වියදමට එරෙහිව බදු නොමැතිව තථ්‍ය මුළු වියදම රු. මිලියන 231,614 ක් විය. ඒ අනුව රු. මිලියන 5,355 ක හිතකර විචලනයක් විය.

මුළු අයවැයගත සෘජු උත්පාදන පිරිවැය රු. මිලියන 181,685 ක් වුවද තථ්‍ය ප්‍රමාණය රු. මිලියන 173,878 ක් වූයෙන් රු. මිලියන 7,807 ක හිතකර විචලනයක් විය. ජල විදුලි බල හා පුනර්ජනනීය බලය උත්පාදනය වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර මෙම වැඩිවීමට පිළිවෙලින් ස්වාධීන ජල විදුලි බල නිෂ්පාදකයින්ගේ හා තාප විදුලි බල උත්පාදනයෙන් හිලව්වී තිබුණි.

මෙහෙයුම් හා නඩත්තු වර්ග වශයෙන් හා අංශ වශයෙන් අයවැය සහ තථ්‍ය ප්‍රමාණය පහත දැක්වෙන අතර එයින් ක්ෂය වලට පෙර හිතකර විචලනයක් දැක්වේ.

**මෙහෙයුම් හා නඩත්තු පිරිවැය**
**වර්ග වශයෙන්**

| | තථ්‍ය රු. මිලි | අයවැය රු. මිලි | විචලනය රු. මිලි | % | | 2011 තථ්‍ය රු. මිලි |
|---|---|---|---|---|---|---|
| කාර්ය මණ්ඩලය | 15,751 | 18,786 | 3,035 | 16% | F | 12,259 |
| ද්‍රව්‍ය | 6,362 | 8,255 | 1,893 | 23% | F | 3,084 |
| නවාතැන් | 1,067 | 1,232 | 165 | 13% | F | 940 |
| ප්‍රවාහන හා සන්නිවේදන | 2,781 | 2,759 | (22) | -1% | A | 2,373 |
| වෙනත් පිරිවැය | 6,020 | 3,039 | (2,981) | -98% | A | 2,488 |
| පොදු කාර්ය අයකිරීම් | (1,574) | - | 1,574 | - | - | (1,255) |
| **මූල්‍ය පිරිවැයට පෙර උප එකතුව** | **30,407** | **34,071** | **3,664** | **11%** | **F** | **19,890** |
| මූල්‍ය පිරිවැය | 6,197 | 3,234 | (2,963) | -92% | A | 1,828 |
| **ක්ෂය වලට පෙර උප එකතුව** | **36,604** | **37,305** | **701** | **2%** | **F** | **21,717** |
| ක්ෂය | 21,131 | 17,979 | (3,152) | -18% | A | 18,416 |
| **එකතුව** | **57,735** | **55,284** | **(2,451)** | **-4%** | **A** | **40,133** |

**මෙහෙයුම් හා නඩත්තු පිරිවැය අංශ වශයෙන් (ක්ෂය නොමැතිව)**

| | තථ්‍ය රු. මිලි | අයවැය රු. මිලි | විචලනය | | | 2011 තථ්‍ය රු. මිල |
|---|---|---|---|---|---|---|
| | | | රු. මිල | % | | |
| උත්පාදනය | 7,922 | 8,653 | 732 | 8% | F | 5,228 |
| සම්ප්‍රේෂණය | 2,105 | 2,391 | 286 | 12% | F | 1,402 |
| බෙදාහැරීම - කලාප 1 | 3,515 | 5,597 | 2,085 | 37% | F | 3,158 |
| බෙදාහැරීම - කලාප 2 | 5,408 | 6,281 | 873 | 14% | F | 3,930 |
| බෙදාහැරීම - කලාප 3 | 3,525 | 3,840 | 315 | 8% | F | 2,194 |
| බෙදාහැරීම - කලාප 4 | 3,009 | 3,658 | 649 | 18% | F | 2,423 |
| සංස්ථාගත | 2,877 | 4,010 | 1,132 | 28% | F | 1,826 |
| බැංකු අයිරා හා ණය මත පොල | 6,198 | 2,674 | (3,524) | -132% | A | 1,226 |
| ස්වාධීන විදුලි බල නිෂ්පාදකයින්ට ප්‍රමාද ගෙවීම් මත පොල | 2,049 | 200 | (1,849) | -924% | A | 332 |
| **එකතුව** | **36,604** | **37,305** | **701** | **2%** | **F** | **21,717** |

4. **පද්ධති හා පාලන**
සටහන් කර ගන්නා ලදී.

............................................
සභාපති
**ලංකා විදුලි බල මණ්ඩලය**
2014 මාර්තු 26

............................................
සාමාන්‍යාධිකාරි
**ලංකා විදුලි බල මණ්ඩලය**

Design by: Ceylon Printers PLC

**ලංකා විදුලිබල මණ්ඩලය**

ලිපිනය : නො. 50, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2 :

දුරකථනය: (011) 232 4471 (8 lines) / ෆැක්ස් (011) 244 9572

වෙබ් අඩවිය : www.ceb.lk